2025

# අයවැය, ආර්ථික සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව

**2024** අංක **44** දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ **49** වන වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලදී

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,
ශ්‍රී ලංකාව

**2025** පෙබරවාරි **17**

# අයවැය, ආර්ථික සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2025

අනුර කුමාර දිසානායක,

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය,

ශ්‍රී ලංකාව

2025 පෙබරවාරි 17

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ ගරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා විසින් නිකුත් කරනු ලැබේ.

**ISBN 978-624-5674-23-7**

**කොළඹ 08, ආචාර්ය ඩැනිස්ටර් ද සිල්වා මාවත, අංක 118 දරන ස්ථානයේ පිහිටි රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් මුද්‍රණය කරන ලදුව, ශ්‍රී ලංකාවේ කොළඹ 01, මහලේකම් කාර්යාලයේ පිහිටි මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් පළ කරන ලදී.**

## පටුන


| | පිටු අංකය |
|---|---|
| මූලික ආර්ථික දර්ශක | vii |
| 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ ඉදිරිපත් කළ යුතු වාර්තා | viii |
| අනුකූලතාව - 2024/2025 | x |
| **I කොටස** | |
| **01. මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය** | |
| 1.1 සමාලෝචනය | 5 |
| 1.2 මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය | 8 |
| 1.3 රාජ්‍ය මූල්‍ය ගමන්මග | 9 |
| 1.4 මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය රාමුව | 10 |
| **II කොටස** | |
| **02. රාජ්‍ය මූල්‍ය උපනතීන්, භාණ්ඩාගාර මෙහෙයුම් සහ විදේශ මූල්‍යයනය** | |
| 2.1 සමාලෝචනය | 19 |
| 2.2 රාජ්‍ය ආදායම | 22 |
| 2.3 රජයේ වියදම | 37 |
| 2.4 භාණ්ඩාගාර මෙහෙයුම් | 40 |
| 2.5 විදේශ මූල්‍යයනය | 41 |
| **03. ආර්ථික උපනතීන්** | |
| 3.1 සමාලෝචනය | 49 |
| 3.2 ආර්ථික වර්ධනය | 50 |
| 3.3 මුදල් අංශයේ වර්ධනයන් | 59 |
| 3.4 කොටස් වෙළෙඳපොළ | 61 |
| 3.5 විදේශ අංශයේ වර්ධනයන් | 62 |
| 3.6 ලෝක ආර්ථික සන්දර්භය | 66 |
| **04. රජය සතු ව්‍යවසායයන්හි කාර්යසාධනය** | |
| 4.1 සමාලෝචනය | 71 |
| 4.2 රජය සතු ප්‍රධාන ව්‍යවසායයන් දහය පිළිබඳ සමාලෝචනය | 71 |
| **05. 2025 අයවැය සැකසීම සඳහා පදනම් වූ සාධක** | 79 |
| **III කොටස** | |
| **06. 2023/2024 බදු ආදායම් අහිමිවීම පිළිබඳ ප්‍රකාශය** | 89 |

| | | පිටු අංකය |
|---|---|---|
| | **වගු** | |
| | **I කොටස** | |
| වගුව 1.1 | මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව : 2024-2029 | 11 |
| | **II කොටස** | |
| වගුව 2.1 | රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් සාරාංශය | 19 |
| වගුව 2.2 | 2024 වසරේ වාර්ෂික ඇස්තමේන්තුවට සාපේක්ෂව පළමු මාස දහය තුළ ආදායම හා වියදම ලඟා කර ගැනීම | 21 |
| වගුව 2.3 | රාජ්‍ය ආදායම් කාර්යසාධනයේ සාරාංශය | 23 |
| වගුව 2.4 | ආදායම් බදු කාර්යසාධනය | 24 |
| වගුව 2.5 | එකතු කළ අගය මත බදු කාර්යසාධනය | 25 |
| වගුව 2.6 | නිෂ්පාදන බදු/සුරාබදු කාර්යසාධනය | 26 |
| වගුව 2.7 | මෝටර් රථ වාහන ආනයන සහ නව ලියාපදිංචි කිරීම් | 27 |
| වගුව 2.8 | නිදහස් වෙළෙඳ ගිවිසුම් මඟින් ආවරණය වන තීරු බදු සහන යටතේ ආනයනය/ අපනයනය කරන ලද භාණ්ඩ හා වටිනාකම | 27 |
| වගුව 2.9 | ජාත්‍යන්තර වෙළෙඳාමෙන් ලද සෙස් බදු ආදායම | 28 |
| වගුව 2.10 | රාජ්‍ය ආදායමෙහි විචලතා විශ්ලේෂණය | 29 |
| වගුව 2.11 | රාජ්‍ය වියදම් කාර්යසාධනය | 37 |
| වගුව 2.12 | රජයේ සුරැකුම්පත් මත ගෙවන පොළී අනුපාතයන්හි සහ විනිමය අනුපාතයන් හි හැසිරීම - 2023 සිට 2024 | 38 |
| වගුව 2.13 | සුබසාධන වියදම් | 39 |
| වගුව 2.14 | රජයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 40 |
| වගුව 2.15 | දළ දේශීය ණය 2024 ජනවාරි සිට ඔක්තෝබර් | 41 |
| වගුව 2.16 | අදාළ මූල්‍ය කොන්දේසි සමඟ 2024 ජනවාරි 01 සිට ඔක්තෝබර් 31 දක්වා එළඹී විදේශ මූල්‍යන එකඟතා | 42 |
| වගුව 2.17 | 2024 ජනවාරි 01 සිට ඔක්තෝබර් 31 දක්වා විදේශ ණය සහ ප්‍රදාන ප්‍රතිලබ්ධි | 44 |
| වගුව 3.1 | ස්ථාවර (2015) මිල ගණන් අනුව ද.දේ.නි. යේ ආංශික සංයුතිය | 50 |
| වගුව 3.2 | සේවා අංශයේ තෝරාගත් දර්ශකයන් | 56 |
| වගුව 3.3 | සංචාරක අංශයේ කාර්යසාධනය | 57 |
| වගුව 3.4 | ද.දේ.නි. වර්ධනයේ ආංශික ව්‍යාප්තිය (%) | 58 |
| වගුව 3.5 | පාරිභෝගික මිල දර්ශකය | 60 |
| වගුව 3.6 | ප්‍රාග්ධන වෙළෙඳපොළ වෙනස්වීම් | 62 |
| වගුව 3.7 | විදේශීය වෙළෙඳාම | 65 |
| වගුව 3.8 | ලෝක ආර්ථිකය පිළිබඳ ප්‍රධාන දර්ශක - 2024 (පුරෝකථන) | 67 |
| වගුව 4.1 | විදුලි උත්පාදන සහ ධාරිතාවයේ සංයුතිය | 73 |
| වගුව 4.2 | ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් 52 හි බද්දට පෙර ලාභය | 75 |
| වගුව 4.3 | රාජ්‍ය ව්‍යවසායයන්ගෙන් ලද අයබදු ආදායම/ලාභාංශ | 76 |

පිටු
අංකය

**III කොටස**


| | | |
|---|---|---|
| වගුව 6.1 | බදු ආදායම් අභිමිවීම් වර්ගීකරණය | 91 |
| වගුව 6.2 | බදු වර්ගය අනුව අභිමිවන බදු ආදායම | 91 |
| වගුව 6.3 | යෝජිත පුද්ගල ආදායම් බදු ව්‍යුහය | 93 |
| වගුව 6.4 | අභිමිවන පුද්ගල ආදායම් බදු ප්‍රමාණය | 93 |
| වගුව 6.5 | 2023/24 සඳහා අභිමිවන සංස්ථාපිත බදු ආදායම | 93 |
| වගුව 6.6 | අංශ අනුව 2023/2024 සඳහා අභිමිවන එකතු කළ අගය මත බදු ආදායම | 94 |
| වගුව 6.7 | අංශ අනුව 2024 සඳහා රේගු ආනයන බද්ද මත අභිමිවන බදු ආදායම | 94 |
| වගුව 6.8 | 2024 වසරේ දෙසැම්බර් මස 31 වැනි දිනට මෝටර් රථ සඳහා වන සුබෝපභෝගී බදු නිදහස් කිරීමේ සාරාංශය | 94 |
| වගුව 6.9 | 2023/24 සඳහා ඒක පුද්ගල බදු ආදායම් අභිමිවීම් | 95 |
| වගුව 6.10 | 2023/24 සඳහා අභිමිවන සංස්ථාපිත බදු අදායම | 95 |
| වගුව 6.11 | 2023/24 සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල ව්‍යාපෘති සඳහා අංශ අනුව අභිමිවන එකතු කළ අගය මත බදු ආදායම | 96 |


## රූපසටහන්

**I කොටස**


| | | |
|---|---|---|
| රූපසටහන 1.1 | රාජ්‍ය මූල්‍ය සමස්තයන් 2022-2024 | 6 |


**II කොටස**


| | | |
|---|---|---|
| රූපසටහන 2.1 | මුළු ආදායම් සංයුතිය - 2024 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා | 23 |
| රූපසටහන 2.2 | මූලාශ්‍ර අනුව මුළු බදු ආදායම (%) | 24 |
| රූපසටහන 2.3 | නිෂ්පාදන බදු/සුරාබදු කාර්යසාධනය - 2024 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා | 26 |
| රූපසටහන 2.4 | දළ දේශීය ණය ගැනීම් - 2024 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා | 41 |
| රූපසටහන 2.5 | 2024 ජනවාරි 1 සිට ඔක්තෝබර් 31 දක්වා සංවර්ධන පාර්ශ්වකරුවන්/ ණයදීමේ නියෝජිතායතන අනුව ප්‍රතිලබ්ධි (එ.ජ.ඩො. මිලියන) | 45 |
| රූපසටහන 2.6 | 2024 ජනවාරි 01 සිට ඔක්තෝබර් 31 දක්වා ප්‍රධාන ආර්ථික අංශ අනුව උපයෝජනය කරන ලද ප්‍රතිලබ්ධි (එ.ජ.ඩො. මිලියන) | 45 |
| රූපසටහන 3.1 | දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය | 49 |
| රූපසටහන 3.2 | දළ දේශීය නිෂ්පාදිතයේ සංයුතිය - 2024 පළමු මාස නවය | 49 |
| රූපසටහන 3.3 | කෘෂිකාර්මික අංශයේ සංයුතිය - 2024 පළමු මාස නවය | 53 |
| රූපසටහන 3.4 | කර්මාන්ත අංශයේ සංයුතිය - 2024 පළමු මාස නවය | 54 |
| රූපසටහන 3.5 | නිෂ්පාදන අංශයේ සංයුතිය - 2024 පළමු මාස නවය | 54 |
| රූපසටහන 3.6 | සේවා අංශයේ සංයුතිය - 2024 පළමු මාස නවය | 55 |
| රූපසටහන 3.7 | ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය සහ සේවා වියුක්තිය | 58 |
| රූපසටහන 3.8 | පොලී අනුපාත, මුදල් සමස්තයන්, මුදල් සැපයුම හා පෞද්ගලික අංශයට ලබා දුන් ණයෙහි වර්ධනය | 59 |
| රූපසටහන 3.9 | මතුපිට, මූලික සහ ආහාර උද්ධමනයේ විචලතා | 60 |
| රූපසටහන 3.10 | වෙළඳ ශේෂය සහ විනිමය අනුපාත වෙනස් වීම් | 62 |
| රූපසටහන 3.11 | අපනයන සංයුතිය | 63 |
| රූපසටහන 3.12 | ආනයන සංයුතිය | 64 |

| | | පිටු අංකය |
|---|---|---|
| **III කොටස** | | |
| රූපසටහන 6.1 | අභිමිවන බදු ආදායම් සාරාංශය (රු. මිලියන) 2023/2024 සඳහා | 97 |
| **සටහන්** | | |
| සටහන 2.1 | ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග : 2024 ජනවාරි සිට 2025 ජනවාරි දක්වා | 31 |
| **ඇමුණුම්** | | |
| ඇමුණුම I | 2024 දෙසැම්බර් 31 දිනට භාණ්ඩාගාරය විසින් නිකුත් කළ භාණ්ඩාගාර ඇපකර සහ සහන ලිපි ලැයිස්තුව | 97 |
| ඇමුණුම II | සාර්ව ආර්ථික දර්ශක | 99 |
| ඇමුණුම III | 2025 ආදායම් ඇස්තමේන්තු සඳහා පාදක වූ උපකල්පන | 107 |

**මූලික ආර්ථික දර්ශක**

| දර්ශකය | කාලපරිච්ඡේදය | ඒකක | වටිනාකම 2023 | 2024 |
|---|---|---|---|---|
| **මූර්ත අංශය** | | | | |
| ආර්ථික වර්ධනය | පළමු කාර්තු තුන | % | -4.5 | 5.2 |
| කෘෂිකර්මාන්ත | පළමු කාර්තු තුන | % | 3.3 | 1.9 |
| කර්මාන්ත | පළමු කාර්තු තුන | % | -13.3 | 11.2 |
| සේවා | පළමු කාර්තු තුන | % | -1.3 | 2.6 |
| උද්ධමනය (ලක්ෂ්‍යමය) - කො.පා.මි.ද.(2021=100) | දෙසැම්බර් අවසන | % | 4.0 | -1.7 |
| උද්ධමනය (සාමාන්‍ය) - කො.පා.මි.ද. (2021=100) | දෙසැම්බර් අවසන | % | 17.4 | 1.2 |
| සේවා වියුක්ති අනුපාතය | දෙවන කාර්තුව | % | 5.2 | 4.7 |
| ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය | දෙවන කාර්තුව | % | 48.6 | 47.8 |
| **රාජ්‍ය මූල්‍ය අංශය** | | | | |
| අයවැය හිඟය | ජන-ඔක්. | රු.බිලි. | 1,547 | 1,061 |
| මුළු ආදායම | ජන-ඔක්. | රු.බිලි. | 2,425 | 3,256 |
| බදු ආදායම | ජන-ඔක්. | රු.බිලි. | 2,213 | 3,000 |
| බදු නොවන ආදායම | ජන-ඔක්. | රු.බිලි. | 212 | 255 |
| මුළු වියදම | ජන-ඔක්. | රු.බිලි. | 3,981 | 4,328 |
| වර්තන වියදම් | ජන-ඔක්. | රු.බිලි. | 3,532 | 3,796 |
| රාජ්‍ය ආයෝජන | ජන-ඔක්. | රු.බිලි. | 489 | 554 |
| රාජ්‍ය ණය | සැප්තැම්බර් අවසන | රු.බිලි. | 28,020 | 28,575 |
| **විදේශ අංශය** | | | | |
| අපනයන | ජන-දෙසැ. | ඇ.ඩො.මිලි. | 11,911 | 12,772 |
| කෘෂි අපනයන | ජන-දෙසැ. | ඇ.ඩො.මිලි. | 2,567 | 2,775 |
| කාර්මික අපනයන | ජන-දෙසැ. | ඇ.ඩො.මිලි. | 9,278 | 9,947 |
| රෙදිපිළි හා ඇඟළුම් | ජන-දෙසැ. | ඇ.ඩො.මිලි. | 4,879 | 5,061 |
| අනෙකුත් | ජන-දෙසැ. | ඇ.ඩො.මිලි. | 4,399 | 4,886 |
| ආනයන | ජන-දෙසැ. | ඇ.ඩො.මිලි. | 16,811 | 18,841 |
| පාරිභෝගික භාණ්ඩ | ජන-දෙසැ. | ඇ.ඩො.මිලි. | 3,044 | 3,466 |
| අන්තර් භාණ්ඩ | ජන-දෙසැ. | ඇ.ඩො.මිලි. | 11,007 | 11,915 |
| එයින් ඛනිජ තෙල් නිෂ්පාදන | ජන-දෙසැ. | ඇ.ඩො.මිලි. | 4,703 | 4,354 |
| ආයෝජන භාණ්ඩ | ජන-දෙසැ. | ඇ.ඩො.මිලි. | 2,745 | 3,448 |
| වෙළඳ ශේෂය | ජන-දෙසැ. | ඇ.ඩො.මිලි. | -4,900 | -6069 |
| සංචාරක පැමිණීම් | ජන-දෙසැ. | ඇ.ඩො.මිලි. | 1,487,303 | 2,053,465 |
| සංචාරක ඉපයීම් | ජන-දෙසැ. | ඇ.ඩො.මිලි. | 2,068 | 3,169 |
| ශ්‍රමික ප්‍රේෂණ | ජන-දෙසැ. | ඇ.ඩො.මිලි. | 5,970 | 6,575 |
| කළඹ ආයෝජනය (ශුද්ධ) | දෙසැම්බර් අවසන | ඇ.ඩො.මිලි. | -866 | ලැ.නො. |
| සමස්ත ගෙවුම් ශේෂය(BOP) | ජන-දෙසැ. | ඇ.ඩො.මිලි. | 2,826 | 2,890 |
| දළ නිල සංචිත | නොවැම්බර් අවසන | ඇ.ඩො.මිලි. | 3,571 | 6,451 |
| විනිමය අනුපාතය (මාසය අග) | දෙසැම්බර් අවසන | රු./ඇ.ඩො. | 323.9 | 292.6 |
| විනිමය අනුපාතය (මාසික සාමාන්‍ය ) | ජන-දෙසැ. | රු./ඇ.ඩො. | 327.5 | 302.1 |
| **මුදල් අංශය** | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) | දෙසැම්බර් අවසන | % | 9.00 | 7.50 |
| නිත්‍ය ණය පහසුකම්අනුපාතිකය (SLFR) | දෙසැම්බර් අවසන | % | 10.00 | 8.50 |
| ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) | දෙසැම්බර් අවසන | % | 2.00 | 2.00 |
| වාණිජ බැංකුවල බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය (සතිපතා) | දෙසැම්බර් අවසන | % | 12.13 | 8.90 |
| භාණ්ඩාගාර බිල්පත් බරිත සමාන්‍ය ඵලදා අනුපාතිකය (දින 91) | දෙසැම්බර් අවසන | % | 14.51 | 8.62 |
| භාණ්ඩාගාර බිල්පත් බරිත සමාන්‍ය ඵලදා අනුපාතිකය (දින 364) | දෙසැම්බර් අවසන | % | 12.93 | 8.96 |
| මුදල් සැපයුම් වර්ධනය($M_{2b}$) | 2023 දෙසැ./2024 දෙසැ. | % | 7.3 | 8.6 |
| පෞද්ගලික අංශයට ලබාදුන් ණයෙහි වර්ධනය | 2023 දෙසැ./2024 දෙසැ. | % | -0.6 | 10.7 |

*ලැ.නො. - ලැබී නොමැත*

## 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ ඉදිරිපත් කළ යුතු වාර්තා

| වගන්තිය | අවශ්‍යතාවය | අරමුණ | අනුකූලතාවය |
|---|---|---|---|
| 11 වන වගන්තිය | මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ ප්‍රකාශය ඉදිරිපත් කිරීම* | රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 11(4) වගන්තිය යටතේ දක්වා ඇති පරිදි වාර්ෂික අයවැය පිළියෙල කිරීමට පෙර ආණ්ඩුවේ මූල්‍ය ක්‍රමෝපාය පිළිබඳ විධිමත් ප්‍රකාශයක් පාර්ලිමේන්තුව වෙත සහ මහජනතාව වෙත ඉදිරිපත් කිරීම, එළඹෙන වර්ෂයට අදාළ වාර්ෂික අයවැය සඳහා උපායමාර්ගික මාර්ගෝපදේශ සැපයීම, මූල්‍ය කාර්යසාධනය වාස්තවික ලෙස ඇගයීමේ පදනම පිහිටුවීම, ආණ්ඩුවේ මූල්‍ය ක්‍රමෝපායෙහි කාර්යසාධනය පිළිබඳව වන පාර්ලිමේන්තුවේ අධීක්ෂණය ශක්තිමත් කිරීම සහ මූල්‍ය විනිවිදභාවය සහ වගවීම වැඩි කිරීම. | අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු, එක් එක් වර්ෂයේ ජුනි මස තිස්වන දින හෝ එදිනට පෙර මුදල් අමාත්‍යවරයා විසින් මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය පාර්ලිමේන්තුවේ දී නිවේදනය කළ යුතු ය. මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබිය යුතු ය. |
| 49 වන වගන්තිය | අයවැය, ආර්ථික සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම* | රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 49(2) වගන්තිය යටතේ දක්වා ඇති කරුණු ඇතුළුව මූල්‍ය සහ ආර්ථික තත්ත්වය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් කෙරෙන ආණ්ඩුවේ සියලුම තීරණ හා වෙනත් සියලු පරිවේෂණ සැලකිල්ලට ගෙන තොරතුරු සැපයීම. | සෑම වර්ෂයක දී ම විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ දෙවන වර කියවීම සඳහා නියම කර ඇති දිනයේ දී, පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට මුදල් අමාත්‍යවරයා විසින් කටයුතු යෙදිය යුතු ය. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් පසු වාර්තාව මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබිය යුතු ය. |
| 50 වන වගන්තිය | වර්ෂය මැද මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම* | රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 50(2) වගන්තිය යටතේ දක්වා ඇති කරුණු ඇතුළුව ආණ්ඩුවේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයෙහි දක්වා ඇති මූල්‍ය ක්‍රමෝපාය හා සසඳමින් ආණ්ඩුවේ වර්ෂය මැද මූල්‍ය කාර්යසාධනය ඇගයීමේ පදනමක් වශයෙන් යොදා ගැනීම. | අදාළ වර්ෂයේ ඔක්තෝබර් මස අවසාන දින හෝ අදාල වර්ෂයේ විසර්ජන පනත සම්මත කර මාස දහයක් ගතවීම හෝ යන දින දෙකෙන් පසුව එළඹෙන දිනයේ දී මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළකරනු ලැබිය යුතු ය; එමෙන්ම, වාර්තාව නිකුත් කරන ලද දිනය පාර්ලිමේන්තුව රැස්වන දිනයක් වේ නම්, ඒ වාර්තාව නිකුත් කරන ලද දින සිට සති දෙකක් තුළ දී ඒ වාර්තාවේ පිටපතක් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට කටයුතු යෙදිය යුතු ය; හෝ වාර්තාව නිකුත් කරන ලද දිනය පාර්ලිමේන්තුව රැස්වන දිනයක් නොවන්නේ නම්, පාර්ලිමේන්තුව ඊළඟට රැස්වන දින සිට සති දෙකක් තුළ දී ඒ වාර්තාවේ පිටපතක් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට කටයුතු යෙදිය යුතු ය. |

| වගන්තිය | අවශ්‍යතාවය | අරමුණ | අනුකූලතාවය |
|---|---|---|---|
| 51 වන වගන්තිය | අවසාන අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම (වාර්ෂික වාර්තාව)* | රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 51(2) වගන්තිය යටතේ දක්වා ඇති කරුණු ඇතුළුව අදාළ මුදල් වර්ෂය සඳහා වන ආණ්ඩුවේ මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයෙහි දක්වා ඇති මූල්‍ය ක්‍රමෝපාය හා සසඳමින් ආණ්ඩුවේ වාර්ෂික මූල්‍ය කාර්යසාධනය ඇගයීමේ පදනමක් වශයෙන් යොදා ගැනීම. | මුදල් වර්ෂය අවසාන වී මාස හයක් ගතවීමට පෙර මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබිය යුතු ය.; එමෙන්ම වාර්තාව නිකුත් කරන ලද දිනය පාර්ලිමේන්තුව රැස්වන දිනයක් වේ නම්, වාර්තාව නිකුත් කරන ලද දින සිට සති දෙකක් තුළ දී ඒ වාර්තාවේ පිටපතක් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට කටයුතු යෙදිය යුතු ය; හෝ වාර්තාව නිකුත් කරන ලද දිනය පාර්ලිමේන්තුව රැස්වන දිනයක් නොවන්නේ නම් ඊළඟට රැස්වන දින සිට සති දෙකක් තුළ දී ඒ වාර්තාවේ පිටපතක් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට කටයුතු යෙදිය යුතු ය. |
| 52 වන වගන්තිය | මැතිවරණ පූර්ව අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම** | රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 52(2) වගන්තිය යටතේ දක්වා ඇති කරුණු ඇතුළුව රටේ මූල්‍ය තත්ත්වය පිළිබඳ යාවත්කාලීන තොරතුරු මහජනයා වෙත නිකුත් කිරීම. | පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරුන් තෝරා පත්කර ගැනීම සඳහා මහ මැතිවරණයක් පැවැත්වීමට නියම කරමින් ප්‍රකාශනයක් හෝ ආඥාවක් ප්‍රසිද්ධ කර සති තුනක් ඇතුළත දී නිකුත් කිරීමට කටයුතු යෙදිය යුතු ය; එමෙන්ම, නව පාර්ලිමේන්තුව පළමුවරට රැස් වූ දින සිට සති දෙකක් ඇතුළත වාර්තාවේ පිටපතක් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට කටයුතු යෙදිය යුතු අතර මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ නිල වෙබ් අඩවියේ ද පළ කරනු ලැබිය යුතු ය. මෙම වාර්තාව පිළියෙල කිරීමට භාණ්ඩාගාරයේ ලේකම්වරයාට හැකි වනු පිණිස, මුදල් අමාත්‍යවරයා විසින් ඔහුගේ දැනීම අනුව, සැලකිය යුතු ප්‍රමාණයකට මූල්‍යමය හෝ ආර්ථිකමය බලපෑමක් ඇති කරවන්නා වූ හෝ ඇති කිරීමට ඉඩ ඇති ආණ්ඩුවේ තීරණ සහ වෙනත් පරිවේෂණ භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත අනාවරණය කරනු ලැබිය යුතු ය. |
| 53 වන වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ මූල්‍ය කාර්යසාධනය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කිරීම* | රජයේ ආදායම් හා වියදම් ඇතුළු මූල්‍ය කාර්යසාධනය පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කිරීම. | අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු අතර ඒ ප්‍රකාශය එක් එක් කාර්තුව අවසානයේ දින හතළිස් පහකට නොඅඩු දිනයක දී, නියම කරනු ලැබ ඇති ආකාරයට මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යංශයේ නිල වෙබ් අඩවියේ සමගාමීව පළ කරනු ලැබිය යුතු ය. |

* මුදල් ඇමතිවරයා විසින්

** භාණ්ඩාගාර ලේකම් විසින්

# අනුකූලතාවය – 2024/2025

- **මැතිවරණ පූර්ව අයවැය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2024**

  රටේ මූල්‍ය තත්ත්වය පිළිබඳ යාවත්කාලීන තොරතුරු ඉදිරිපත් කරමින් 2024 ඔක්තෝබර් මස 14 දින වන විට මහජනතාව වෙත ඉදිරිපත් කර, 2024 දෙසැම්බර් මස 03 වන දින වන විට එය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

- **වර්ෂය මැද මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව – 2024**

  වසරේ පළමු මාස හයෙහි මූල්‍ය හා ආර්ථික තත්ත්වය පිළිබඳ කරුණු ඉදිරිපත් කරමින් 2024 ඔක්තෝබර් මස අවසන් වන විට මහජනතාව වෙත ඉදිරිපත් කර, 2024 දෙසැම්බර් මස 03 දින වන විට එය පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී.

- **මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය - 2025**

  2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 11(3) වගන්තියට අනුව එක් එක් වර්ෂයේ ජූනි මස තිස්වන දින හෝ එදිනට පෙර මුදල් අමාත්‍යවරයා විසින් මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය පාර්ලිමේන්තුවේ නිවේදනය කළ යුතුය. මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය මුදල් අමාත්‍යවරයා විසින් නිවේදනය කිරීමෙන් අනතුරුව මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබිය යුතුය.

  2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත 2024 වසරේ අගෝස්තු මස 8 වන දින සිට බලාත්මක වූ බැවින් එම පනත බලාත්මක වීමෙන් පසුව වන පළමුවන මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය 2025 වසරේ ජූනි මස 30 වන දිනට පෙර නිවේදනය කිරීමට නියමිත අතර එය මුදල් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළ කරනු ඇත. කෙසේ වුවද, අයවැය, ආර්ථික සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2025 තුළ ක්‍රමෝපායික ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශයක් අන්තර්ගත වේ.

- **මෙම අයවැය ආර්ථිකය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව – 2025**

  මෙම වාර්තාවට දළ දේශීය නිෂ්පාදිතය, පාරිභෝගික මිල ගණන්, රැකියාව සහ විරැකියාව, ගෙවුම් ශේෂය, ආදායම් හා වියදම් සහ ආණ්ඩුව විසින් ගනු ලබන ණය සම්බන්ධ ඇස්තමේන්තු, ඉහත සඳහන් ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී උපයෝගී කරගනු ලැබූ පදනම්, එම ඇස්තමේන්තු පිළියෙල කිරීමේ දී උපයෝගී කරගනු ලැබූ ආර්ථික හෝ වෙනත් පදනමක් සම්බන්ධයෙන් සිදුවිය හැකි වෙනස්වීම් සහ ඇස්තමේන්තුවල සංවේදීතාවයට අදාළ ප්‍රකාශයක්, මූල්‍ය තත්ත්වය කෙරෙහි සැළකිය යුතු බලපෑමක් ඇති කළ හැකි අවදානම්, ප්‍රායෝගික වශයෙන් හැකිතාක්ද දුරට ප්‍රමාණාත්මක කළ ප්‍රකාශයක් ඇතුළු තවත් තොරතුරු ඇතුලත් වන අතර විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ දෙවන වර කියවීම සඳහා නියම කර ඇති දිනයේ දී පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට කටයුතු යෙදිය යුතු ය.

## අයවැය, ආර්ථික සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2025

මෙම වාර්තාව කොටස් තුනකින් සමන්විතය : I කොටස මඟින් මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය දැක්වේ. II කොටස මඟින් 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 49(2) වගන්තියේ ඇති කරුණු ද ඇතුළත්ව මූල්‍ය හා ආර්ථික තත්ත්වය කෙරෙහි සැළකිය යුතු බලපෑමක් කෙරෙන ආණ්ඩුවේ සියලුම තීරණ සහ වෙනත් සියලු පරිවේෂණ දැක්වේ. III කොටස මඟින් බදු සහන ලබා දීම හේතුවෙන් මේ දක්වා අහිමි වූ ආදායම සහ නව සහන ලබා දීම හේතුවෙන් අහිමිවිය හැකි ආදායම ඇතුළුව මුළු ආදායම අහිමි වීම පිළිබඳ ප්‍රකාශයක් දැක්වේ.

# I කොටස

# මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය 01

## 1.1 සමාලෝචනය

වසර දෙකක් පුරා පැවති දරුණු ආර්ථික අර්බුදයෙන් පසුව 2024 වසරේ දී ශ්‍රී ලංකා ආර්ථිකය ස්ථාවර වූ අතර, විවිධ අභියෝග හා ගැටළුවලට සාර්ථකව මුහුණ දීමට හැකි තරම් ශක්තිමත් විය. 2023 වසරේ මාර්තු මස සිට ආරම්භ වූ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සිව් අවුරුදු විස්තීරණ ණය පහසුකම් වැඩසටහනේ සහාය ලබන, 2022 වසරේ මැද සිට හඳුන්වා දුන් ප්‍රතිසංස්කරණ ක්‍රියාමාර්ගයන්ගේ ප්‍රතිඵල වර්තමානයේ දී ඵල දරමින් තිබේ. නිදහසින් පසු ශ්‍රී ලංකා ඉතිහාසයේ වඩාත්ම අභියෝගාත්මක කාලපරිච්ඡේදයක් තුළ හඳුන්වා දුන් මෙම ප්‍රතිසංස්කරණ සැලසුම් කර ඇත්තේ රාජ්‍ය පාලනය ශක්තිමත් කරමින් ආර්ථික වර්ධනය ඉහළ නංවන අතරතුර ව්‍යුහාත්මක දුර්වලතා සඳහා විසඳුම් සෙවීම, සාර්ව ආර්ථික ස්ථාවරත්වය යථා තත්ත්වයට පත් කිරීම සහ දිගු කාලීන රාජ්‍ය මූල්‍ය හා ණය තිරසරභාවය සහතික කිරීම සඳහාය.

මෙම කාලපරිච්ඡේදය තුළ දී මෑතකාලීන වශයෙන් සිදු වූ කැපී පෙනෙන වෙනසක් ලෙස පාලන තන්ත්‍රයේ සිදු වූ වෙනස දැක්විය හැකි අතර, එමඟින් ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියට, විනිවිදභාවය සහ දූෂණ විරෝධී ක්‍රියාමාර්ග ද ඇතුළත්ව නව වගකීමක් එක් කරන ලදී. සාර්ව ආර්ථික ස්ථාවරත්වය නැවත ස්ථාපනය කිරීමේදී සහ දේශීය හා ජාත්‍යන්තර පාර්ශ්වකරුවන් අතර විශ්වාසය යළි ගොඩනැංවීමේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල හා සම්බන්ධ ප්‍රතිසංස්කරණ වැඩසටහනෙහි තීරණාත්මක කාර්යභාරය හඳුනා ගනිමින්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි සහාය ලබන වැඩසටහන අඛණ්ඩව පවත්වාගෙන ගෙන යාමට නව රජය තීරණය කරන ලදී. වර්තමානයේ දී ක්‍රියාවට නංවා තිබෙන සියලුම අංග ආවරණය වන ප්‍රතිපත්තිමය මැදිහත්වීම්, අයවැය හිඟයේ අඩු වීමත්, රාජ්‍ය ආදායම ඉහළ නැංවීමත් සමඟින් මූල්‍ය අංශයේ ස්ථාවරත්වය ඉහළ නැංවීමෙනුත් පැහැදිළිව දැකගත හැකි ප්‍රතිඵල අත් කර ගනිමින් පවතී. ප්‍රතිපත්ති අඛණ්ඩව පවත්වාගෙන යාමේ වැදගත්කම මෙන්ම ආර්ථිකය නැවත යථා තත්ත්වයට පත්කිරීමේ අරමුණු සමඟ පාලනය සම්බන්ධ ප්‍රමුඛතා පෙළගැස්වීමේ වැදගත්කම මෙලෙස අත් කරගත් ආර්ථික ප්‍රගතිය මඟින් තවදුරටත් අවධාරණය කරනු ලබයි. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීරණ ණය පහසුකම් වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරන අතරම, ආර්ථික ස්ථාවරත්වය තිරසර ලෙස පවත්වාගෙන යාම සහ ඔරොත්තු දීමේ හැකියාව පවත්වාගෙන යාම සඳහා පැහැදිලි ක්‍රමවේදයක් රජය විසින් සකස් කර ඇත.

ප්‍රතිපත්ති අනුකූලතාව පවත්වා ගැනීම, ආදායම් වැඩි දියුණු කිරීම සහ වියදම් කළමනාකරණ ක්‍රියාමාර්ග තුළින් රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීරණ ණය පහසුකම් වැඩසටහන යටතේ 2024 වසරේ දෙසැම්බර් මස අවසානය වන විට ලඟා කරගත යුතුව තිබූ රු. බිලියන 300 ක ප්‍රාථමික අතිරික්තයෙහි දර්ශකගත ඉලක්කය (Indicative Target) අභිබවා යමින් 2024 වසරේ පළමු මාස දහය තුළ දී රු. බිලියන 830.7 ක ප්‍රාථමික අතිරික්තයක් ලඟා කරගෙන ඇත. කෙසේ වුවද, මතුපිට උද්ධමනය සැළකිය යුතු ලෙස අඩු වීම හේතුවෙන් සිදු වූ අවධමනය හා ශ්‍රී ලංකා රුපියල අධි ප්‍රමාණය වීම මත උද්ධමන ඉලක්කය 2024 වසරේ දෙවන හා තුන්වන කාර්තු තුළ දී, අනුයාත කාර්තු දෙකක් සඳහා එහි පහළ සීමාවට වඩා පහත වැටුණි. මෙම උද්ධමන ඉලක්කයෙන් අපගමනය වීම 2024 වසරේ අවසාන කාර්තුව දක්වා ද පැවතුණි. කොළඹ පාරිභෝගික මිල දර්ශකයේ (කො.පා.මි.ද., 2021=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මඟින් මනිනු ලබන මතුපිට උද්ධමනය 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී සියයට -1.7 දක්වා තවදුරටත් පහත වැටුණි. රුපියල මත එල්ල වන පීඩනය අඩු වීමත් සමඟ විනිමය අනුපාතිකයේ විචලනය අවම වීම හේතුවෙන්, 2024 වසරේ නොවැම්බර් මස 29 වන දින වන විට ශ්‍රී ලංකා රුපියල එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව සියයට 11.3 කින් අධිප්‍රමාණය විය. අපනයන ඉපැයීම්, සංචාරක ව්‍යාපාරය සහ සේවක ප්‍රේෂණ ආදියෙන් ලැබෙන විදේශ විනිමය සැපයුමේ සැළකිය යුතු වර්ධනය හේතුවෙන් විදේශ විනිමය වෙළෙඳපොළෙහි ද්‍රවශීලතා තත්ත්වයන්හි ලිහිල් වීමක් දක්නට ලැබුණි. දළ නිල සංචිත ප්‍රමාණය 2023 වසරේ දෙසැම්බර් මස අවසානය වන විට පැවති ඇ.ඩො බිලියන 4.4 සිට 2024 වසරේ දෙසැම්බර් මස අවසානය වන විට ඇ.ඩො බිලියන 6.1 ක් (චීන මහජන බැංකුවේ විදේශ විනිමය හුවමාරු පහසුකම ද ඇතුළුව) දක්වා වර්ධනය විය.

2023 වසරේ දෙවන භාගයේ සිට ආර්ථිකය ප්‍රකෘතිමත් වීමත් සමඟ 2024 වසරේ දී ශ්‍රී ලංකා ආර්ථිකය සාධනීය වර්ධනයක් පෙන්නුම් කරන ලදී. 2023 වසරේ තුන්වන කාර්තුව තුළ වාර්තා වූ සියයට 1.6 ක වර්ධනයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ආර්ථිකය සියයට 5.5 කින් වර්ධනය විය. 2024 වසරේ පළමු කාර්තු තුන තුළ ආර්ථික වර්ධනය සියයට 5.2 ක් වූ අතර එය ආර්ථිකයේ සියලුම ප්‍රධාන අංශවල සිදු වන කැපී පෙනෙන වර්ධනයේ ප්‍රතිපලයකි. ධනාත්මක වර්ධනයක් සහිත මෙම ඉහළ ආර්ථික වර්ධන මාවත තවදුරටත් පවත්වා ගනිමින්, කර්මාන්ත සහ සේවා අංශයේ නිමැවුම් ආශ්‍රිත වර්ධනයේ ප්‍රධාන දර්ශක (key indicators) 2024 වසරේ අවසාන කාර්තුවේ දී ද අඛණ්ඩව වර්ධනය විය. 2024 වසරේ දෙසැම්බර් මාසය සඳහා ශ්‍රී ලංකාවේ ගැණුම් කළමනාකරුවන්ගේ දර්ශකය (Purchasing Manager's Index) ආර්ථිකයේ කැපී පෙනෙන ප්‍රසාරණයක් පිළිබිඹු කරන අතර, නිෂ්පාදන සඳහා වන ගැණුම් කළමනාකරුවන්ගේ දර්ශකය 57.2 ක සහ සේවා සඳහා වන ගැණුම් කළමනාකරුවන්ගේ දර්ශකය 71.1 ක ඉහළ අගයක් වාර්තා කරන ලදී. ඉහත ප්‍රවනතාවයන් මත පදනම්ව මූර්ත දළ දේශීය නිෂ්පාදිතය 2017 වසරේ සිට එහි ඉහළම වාර්ෂික වර්ධන වේගය අත්කර ගනිමින් 2024 වසරේ දී සියයට 5.0 කින් පමණ වර්ධනය වනු ඇතැයි ඇස්තමේන්තුගත කර ඇත.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මඟින් ප්‍රකාශිත 2024 වසරේ ඔක්තෝබර් මස ලෝක ආර්ථික දැක්මට (World Economic Outlook) අනුව 2024 සහ 2025 වසරවල දී ලෝක ආර්ථික වර්ධනය සියයට 3.2 ක ස්ථාවර අගයකින් එහෙත් මධ්‍යස්ථ වශයෙන්

වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ගැටුම්, සිවිල් නොසන්සුන්තාව සහ ආන්තික කාලගුණික සිදුවීම් හේතුවෙන් භාණ්ඩ නිෂ්පාදනයට සහ නැව්ගත කිරීමට බාධා එල්ල වීම ආදී අභියෝගවලට නැගී එන වෙළෙඳපොළවල් සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්, අඛණ්ඩව මුහුණ දෙන අතර, මේ සියල්ල ගෝලීය ආර්ථික වර්ධන දැක්ම පිළිබඳ සැළකිය යුතු බලපෑමක් එල්ල කරනු ඇත.

2024 වසරේ දී රජය විසින්, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය සඳහා අදාළ පියවර අඛණ්ඩව ක්‍රියාවට නංවන ලද අතර, ආදායම් එක්රැස් කිරීම වැඩි දියුණු කිරීම සඳහා ප්‍රධාන බදු ප්‍රතිසංස්කරණ ද හඳුන්වා දෙන ලදී. මෙම ප්‍රතිසංස්කරණ අතරට එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 15 සිට සියයට 18 දක්වා ඉහළ නැංවීම, එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වීමේ සීමාව රු. මිලියන 80 සිට රු. මිලියන 60 දක්වා පහත හෙළීම සහ එකතු කළ අගය මත බදු නිදහස් කිරීම්වලින් සැළකිය යුතු ප්‍රමාණයක් (එනම් ප්‍රධාන අයිතම 137 න් 95 ක්) ඉවත් කිරීම ආදිය ඇතුළත් විය. කෙසේ වුවද, අඩු ආදායම්ලාභී පවුල් සහ අධ්‍යාපනය, සෞඛ්‍ය සහ මගී ප්‍රවාහනය වැනි ප්‍රධාන අංශ කෙරෙහි සැළකිය යුතු බලපෑමක් ඇති කරනු ලබන එකතු කළ අගය මත බදු නිදහස් කිරීම් එලෙසම රඳවා ගන්නා ලදී. 2024 වසරේ ජනවාරි මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි සියලුම නිෂ්පාදන/සුරාබදු වාර්ෂිකව උද්ධමනයට ගැලපීම් සිදු කිරීම සඳහා මත්පැන් සහ නිෂ්පාදන බදු අය කළ හැකි සියලුම අයිතම මත නිෂ්පාදන බදු සියයට 14 කින් ඉහළ නංවන ලදී. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තුළ ඉහළ වත්කම් සහිත පුද්ගල ඒකකයක් ස්ථාපිත කිරීම සහ බදු අනුකූලතාවය ඉහළ නැංවීම, ඩිජිටල්කරණය වැඩිදියුණු කිරීම, අවදානම් මත පදනම් වූ විගණනය වැඩි දියුණු කිරීම සහ ආදායම් අහිමිවීම් සහ දූෂණ අවදානම් අවම කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් ආදායම් එකතු කිරීමෙහි ප්‍රධාන ආයතනවල ඩිජිටල් ආදායම් පරිපාලන පද්ධති වැඩි දියුණු කිරීම මඟින් ආදායම් පරිපාලනය වැඩි දියුණු කිරීමට කටයුතු කරනු ලබයි.

**රූපසටහන 1.1 : රාජ්‍ය මූල්‍ය සමස්තයන් 2022-2024**




*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීරණ ණය පහසුකම් වැඩසටහන යටතේ 2024 වසරේ මාර්තු මස අවසානය, ජූනි මස අවසානය, සහ සැප්තැම්බර් මස අවසානය සඳහා එකඟ වන ලද බදු ආදායම සම්බන්ධ දර්ශකගත ඉලක්ක (Indicative Targets) පිළිවෙලින් රු. බිලියන 87 කින්, රු. බිලියන 209 කින්, සහ රු. බිලියන 288 කින් ඉක්මවා යමින් බදු මඟින් ලද ආදායම සැළකිය යුතු ලෙස වර්ධනය විය. කෙසේ වුවද, පවතින අවධමන තත්ත්වය, ශ්‍රී ලංකා රුපියල අධිප්‍රමාණය වීම සහ ආදායම් පරිපාලනයේ දුර්වලතා හේතුවෙන් ආදායම් එක් රැස් කිරීම සඳහා වන සම්පූර්ණ විභවය තවමත් ළඟා කරගෙන නොමැත. එමෙන්ම, ආදායම් පරිපාලන ක්‍රියාමාර්ග වැඩිදියුණු කිරීමට සමගාමීව, ආදායම් එකතු කිරීමේ ප්‍රධාන ආයතනවල ආයතනික ප්‍රතිසංස්කරණ කෙරෙහි රජය අවධානය යොමු කර තිබේ.

ප්‍රදාන ද ඇතුළුව රජයේ ආදායම 2023 වසරේ පළමු මාස දහය තුළ වූ රු. බිලියන 2,434.0 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 3,266.9 දක්වා සියයට 34.2 කින් වර්ධනය විය. ආදායම් බද්දෙන් ලද ආදායම 2023 වසරේ පළමු මාස දහය තුළ වූ රු. බිලියන 744.7 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 815.6 දක්වා සියයට 9.5 කින් වර්ධනය විය. මෙය වාර්ෂික ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 75.5 ක ළඟා කර ගැනීමකි. භාණ්ඩ හා සේවා මත බද්දෙන් ලද ආදායම 2023 වසරේ පළමු මාස දහය තුළ වූ රු. බිලියන 1,159.0 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 1,797.8 දක්වා සියයට 55.1 කින් වර්ධනය විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2023 සම්පූර්ණ වසර සඳහා වන රු. බිලියන 694.5 ක් වූ එකතු කළ අගය මත බද්දෙන් ලද ආදායම, රු. බිලියන 372.9 කින් ඉක්මවා යමින් 2024 වසරේ පළමු මාස දහය තුළ රු. බිලියන 1,067.4 දක්වා සියයට 86.8 කින් වර්ධනය වීම සහ 2023 සම්පූර්ණ වසර සඳහා රු.බිලියන 469.6 ක් වූ, නිෂ්පාදන බද්දෙන් ලද ආදායම රු. බිලියන 17.2 කින් ඉක්මවා යමින් රු. බිලියන 486.8 දක්වා සියයට 29.6 කින් වර්ධනය වීමය. විදේශ වෙළෙඳාම මත බදුවලින් ලද ආදායම රු. බිලියන 386.9 දක්වා සියයට 25.3 කින් වර්ධනය විය. මෙම අගය 2023 සම්පූර්ණ වසර සඳහා විදේශ වෙළෙඳාම මත බදුවලින් ලද සමස්ත ආදායම වන රු. බිලියන 389.1 ට වඩා රු. බිලියන 2.2 ක් පමණ වූ අඩු අගයකි. මෙලෙස සලකා බලන ලද කාලය තුළ විදේශ වෙළෙඳාම මත බද්දෙන් ලද ආදායම ආසන්න වශයෙන් සමාන අගයක පැවතීම, විදේශ වෙළෙඳාමේ සහ ආර්ථික ක්‍රියාකාරකම්වල සාධනීය කාර්යසාධනය පිළිබිඹු කරයි. තීරුබදු නොවන ආනයන බදු ඉවත් කිරීම හේතුවෙන් සෙස් බද්ද සහ වරාය සහ ගුවන් තොටුපළ සංවර්ධන බද්ද මඟින් ලද ආදායම මෑත කාලීන වසරවල දී යම් පසුබෑමකට ලක් වුවද 2024 වසරේ පළමු මාස දහය තුළ දී මෙම බදුවලින් ලද ආදායම නැවත යථා තත්ත්වයට පත් විය. ආනයන සීමා ලිහිල් කිරීමේ බලපෑම පිළිබිඹු කරමින් සෙස් බද්ද සහ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බද්ද මඟින් ලද ආදායම පිළිවෙළින් සියයට 47.9 කින්

සහ සියයට 0.6 කින් වර්ධනය විය. බදු නොවන ප්‍රභවයන්ගෙන් ලද ආදායම 2023 වසරේ පළමු මාස දහය තුළ දී වූ රු. බිලියන 212.3 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු.බිලියන 255.5 දක්වා සියයට 20.3කින් වර්ධනය විය. මෙය වාර්ෂික ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 89.0 ක ආදායම් ලබා කර ගැනීමකි.

රාජ්‍ය වියදම 2023 වසරේ පළමු මාස දහය තුළ දී වූ රු. බිලියන 3,981.1 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 4,327.7 දක්වා සියයට 8.7 කින් සුළු වශයෙන් පමණක් වර්ධනය විය. 2024 වසර සඳහා වන රු. බිලියන 6,527.8 ක් වූ වාර්ෂික වියදම් ඇස්තමේන්තුවට සාපේක්ෂව රාජ්‍ය වියදම සියයට 66.3 ක වියදම් කිරීමේ ප්‍රතිශතයක් සහිතව අපේක්ෂිත පරිදි නියමිත මට්ටමේ පැවතුණි. පුනරාවර්තන වියදම් 2023 වසරේ පළමු මාස දහය තුළ වූ රු.බිලියන 3,532.2 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 3,796.0 දක්වා සියයට 7.5 කින් සුළු වශයෙන් වර්ධනය විය. පොලී ගෙවීම් 2023 වසරේ පළමු මාස දහය තුළ දී වූ රු. බිලියන 1,772.4 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 1,891.5 දක්වා සියයට 6.7 කින් සුළු වශයෙන් වර්ධනය විය. පහළ උද්ධමනය සහ රුපියල අධිප්‍රමාණය වීම හේතුවෙන් භාණ්ඩ හා සේවා සඳහා වන වියදම 2023 වසරේ පළමු මාස දහය තුළ වූ රු.බිලියන 228.4 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 255.9 දක්වා සියයට 12.0 කින් සුළු වශයෙන් වර්ධනය විය.

තිරසර සාර්ව ආර්ථික ස්ථාවරත්වයක් ළඟා කර ගැනීම පිණිස 2026 වසරේ සිට ඉදිරියට අයවැය හිඟය ද.දේ නි.යෙන් සියයට 5 ට වඩා අඩු මට්ටමක තබා ගැනීම රජයේ අරමුණයි. මෑත වසරවල දී අත් දකින ලද රාජ්‍ය ආදායම සහ රාජ්‍ය වියදම් අතර පුළුල් වූ පරතරය, රාජ්‍ය ආදායමේ වැඩි දියුණු වීම සහ රාජ්‍ය වියදම් පාලනය කිරීම හේතුවෙන් 2024 වසරේ පළමු මාස දහය තුළ ක්‍රමයෙන් අඩු වෙමින් පැවතුණි. අයවැය හිඟයෙහි නාමික අගය 2023 වසරේ පළමු මාස දහය තුළ වූ රු. බිලියන 1,547.0 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 1,060.7 දක්වා අඩු විය. ප්‍රාථමික ගිණුමේ අතිරික්තය 2023 වසරේ පළමු මාස දහය තුළ වූ රු. බිලියන 225.4 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 830.7 දක්වා රු. බිලියන 605.3 කින් පුළුල් විය. ප්‍රාථමික ගිණුමේ ශේෂය 2024 වසර සඳහා වන ඇස්තමේන්තුව ඉක්මවා යනු ඇතැයි අපේක්ෂා කරන අතර, දේශීය පොලී අනුපාත පහළ යාම මඟින් පොලී ගෙවීම් අඩු වීම හේතුවෙන් සමස්ත අයවැය ශේෂය ද වැඩි දියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ප්‍රයත්නයන් සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම සහ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරීමත් සමඟ මධ්‍ය කාලීන වශයෙන් ප්‍රාථමික ශේෂය සහ සමස්ත ශේෂය වැඩිදියුණු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ජාත්‍යන්තර මූල්‍ය වෙළෙඳපොළට පැවැති ප්‍රවේශය සීමා සහිත වීම හේතුවෙන්, අයවැය හිඟය පියවීම සඳහා මූලික වශයෙන් දේශීය මූලාශ්‍ර මත රඳා පැවතීමට සිදු විය.

ඒ අනුව, 2024 වසරේ පළමු මාස දහය තුළ අයවැය හිඟය හිඟය පියවීම සඳහා සිදු කරන ලද ශුද්ධ දේශීය මූල්‍යාකරණය රු. බිලියන 786.3 ක් වූ අතර ශුද්ධ විදේශීය මූල්‍යාකරණය රු. බිලියන 274.5 ක් විය.

මධ්‍යම රජයේ නොපිය වූ සමස්ත ණය ප්‍රමාණය 2023 වසර අවසානයේ පැවැති රු. බිලියන 28,696.0 සිට 2024 වසරේ නොවැම්බර් මස අවසානය වන විට රු.බිලියන 28,240.2 දක්වා සියයට 1.6 කින් අඩු විය. 2024 වසරේ නොවැම්බර් මස අවසානය වන විට නොපිය වූ සමස්ත දේශීය ණය ප්‍රමාණය රු. බිලියන 17,572.0 දක්වා සියයට 3 කින් ඉහළ ගිය අතර නොපිය වූ විදේශීය ණය ප්‍රමාණය රු. බිලියන 10,668.3 දක්වා සියයට 8.4 කින් වැඩි විය.

විශේෂයෙන්ම ශ්‍රමික ප්‍රේෂණ ඉහළ යාම, සංචාරක ඉපැයීම් සහ අපනයන ආදායම සහ වෙළෙඳපොල පිළිබඳ සමස්ත ආකල්පය වැඩි දියුණු වීම ආදිය හේතුවෙන් විදේශ විනිමය ලැබීම් වැඩිවීම මඟින් 2024 වසරේ පළමු මාස එකොළහ තුළ විදේශ විනිමය වෙළෙඳපොළ තුළ එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල ශක්තිමත් විය. මේ අනුව, 2024 වසරේ නොවැම්බර් මස 29 වන දින වන විට එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සියයට 11.3 කින් අධිප්‍රමාණය විය. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සාකච්ඡාවල ප්‍රගතිය, රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය සඳහා වන ක්‍රියාමාර්ග සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල යටතේ එළැඹි ගිවිසුමෙහි ඇති ප්‍රතිසංස්කරණවල ස්ථාවරත්වය සහ විශ්වසනීයත්වය හේතුවෙන් ආයෝජකයින්ගේ විශ්වාසය ඉහළ යාම මේ සඳහා හේතු විය.

2024 වසරේ දෙසැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාව සිය රාජ්‍ය ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ ප්‍රධාන කොටස අවසන් කරන ලදී. 2024 වසරේ ජූනි මාසයේ දී ජපානය, ඉන්දියාව සහ ප්‍රංශය විසින් සම සභාපතිත්වය දරන රටවල් 17 කින් සමන්විත බාහිර නිල ණය හිමියන්, චීනයේ එක්සිම් බැංකුව සහ නිළ ණයහිමියන්ගේ කමිටුව සමඟ ණය සඳහා විසඳුම් සෙවීමේ ගිවිසුම්වලට එළඹුණි. වර්තමානයේ දී, රජය නිළ ණය හිමියන්ගේ කමිටුවේ සාමාජිකයින් 17 දෙනා සමඟ ද්විපාර්ශ්වික ගිවිසුම් අවසන් කරමින් සිටින අතර එමඟින් එම ක්‍රියාවලිය විධිමත් ලෙස අවසන් වනු ඇත. 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී, ශ්‍රී ලංකාව බැඳුම්කර හිමියන් සමඟ ණය හුවමාරුව අවසන් කළ අතර එහි ප්‍රතිඵලයක් ලෙස හිඟ බැඳුම්කරවලින් සියයට 98 ක් ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ නව මෙවලම් බවට හුවමාරු විය. රජයට පැවරූ සහ රාජ්‍ය බැංකු දෙක සතු ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ ණය මෙන්ම චීන සංවර්ධන බැංකුව සමඟ ඇති ණය ද 2024 දෙසැම්බර් මාසයේ දී ප්‍රතිව්‍යුහගත කරන ලදී.

ඒ අනුව, ශ්‍රී ලංකාවේ ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීම් සීමා කරන ලද ණය පැහැර හැරීම් මට්ටමේ සිට 2024 වසර අවසන් වන විට ෆිච් (Fitch) ශ්‍රේණිගත කිරීම් (CCC+) සහ මූඩීස් (Moody's) ශ්‍රේණිගත කිරීම් (Caa1) යන ශ්‍රේණිගත කිරීම් දෙවර්ගයෙන්ම

ඉහළ නංවා ඇත. සමස්ත ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය ශ්‍රී ලංකාවට සැළකිය යුතු ණය සහනයක් ලබා දෙයි. ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියෙහි ප්‍රතිඵලයක් ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි මූලික තත්ත්වයට අනුව, ශ්‍රී ලංකාවේ ණය ප්‍රමාණය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2022 වසරේ දී වූ සියයට 128 සිට ඉදිරි වසර 10 ක කාලය තුළ 2035 වසර අවසානය වන විට සියයට 84 දක්වා පහත වැටෙනු ඇත. දළ මූල්‍යයනය අවශ්‍යතාවය ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස 2022 වසරේ දී සියයට 34.6 සිට ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 13 දක්වා පහත වැටෙනු ඇති අතර විදේශ මුදලින් වන ණය සේවාකරණය 2022 වසරේ දී ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 9.2 සිට 2035 වසර වන විට ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස සියයට 4 දක්වා පහත වැටෙනු ඇත. එබැවින්, මධ්‍ය කාලීන වශයෙන් ප්‍රතිව්‍යුහගත කරන ලද ණයවල ණය සේවා ගෙවීම් කිසිඳු බාධාවකින් තොරව නැවත ආරම්භ කිරීම සඳහා ශ්‍රී ලංකාව සිය රාජ්‍ය මූල්‍ය හා බාහිර ස්වාරක්ෂක නැවත ගොඩනැගීම සඳහා ණය ප්‍රතිව්‍යුහගත කිරිම මඟින් ලබා දෙන රාජ්‍ය මූල්‍ය අවකාශය භාවිතා කළ යුතුය.

2024 වසර පුරාවටම උද්ධමනය ස්ථාවරව පහත වැටීමේ ප්‍රවනතාවයක් පෙන්නුම් කළ අතර, අවසානයේ දී 2024 වසර අවසානය වන විට උද්ධමනය අවධමනකාරී මාවතකට අවතීරණ විය. 2024 වසරේ මුල් මාසවල දී, එකතු කළ අගය මත බද්ද ඉහළ නැංවීම සහ ඇතැම් පාරිභෝගික භාණ්ඩ මත පැවැති එකතු කළ අගය මත බදු නිදහස් කිරීම් ඉවත් කිරීම ආදිය හේතුවෙන් මතුපිට උද්ධමනයෙහි තාවකාලික වැඩිවීමක් පෙන්නුම් කළේය. කෙසේ වුවද, උද්ධමනය ක්‍රමයෙන් අඩු වීමට පටන් ගත් අතර, එය සියයට 5 ඉලක්කයට ද වඩා පහත වැටුණි. මෙලෙස උද්ධමනය අඩුවීම කෙරෙහි බලශක්ති මිල ගණන් බලාපොරොත්තු වූවාට වඩා තියුණු ලෙස අඩුවීම, රුපියල ශක්තිමත් වීම සහ ආහාර මිල ගණන් පහත වැටීම ආදිය හේතු විය. 2024 වසරේ සැප්තැම්බර් මාසය වන විට, මතුපිට උද්ධමනය වසර නවයකට පසු පළමු වතාවට අවධමන මට්ටම කරා ළඟා විය. කෙසේ වුවද, උද්ධමනය 2025 වසරේ මැද භාගය වන විට ධන අගයකට ලඟා වනු ඇති බවට පුරෝකථනය කර ඇති අතර සුදුසු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග ක්‍රියාවට නැංවීම තුළින් මධ්‍ය කාලීන වශයෙන් සියයට 5 ඉලක්කයට ක්‍රමානුකූලව ලඟා වනු ඇත.

2024 වසරේ නොවැම්බර් මස 27 වන දින, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්ති රාමුව සරල කිරීම, වෙළෙඳපොළට තොරතුරු නිකුත් කිරීමේ කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම, විනිවිදභාවය වැඩි දියුණු කිරීම, ජාත්‍යන්තර වශයෙන් පවතින හොඳම භාවිතයන් සමඟ එකිනෙක ගැලපීම සහ මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය පවත්වා ගැනීමේ අරමුණු ඇතිව එක්දින ප්‍රතිපත්ති පොලි අනුපාතිකය (Overnight Policy Rate) හඳුන්වා දෙන ලදී. නව තනි ප්‍රතිපත්ති පොලී අනුපාත රාමුව යටතේ, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) තවදුරටත් මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාත ලෙස ක්‍රියා නොකරයි. ඒ වෙනුවට, ශ්‍රී ලංකා මහා බැංකුව සමඟ ගනුදෙනු සඳහා පවතින ස්ථාවර පහසුකම් සඳහා අදාළ වන අනුපාතික පදනම් ලකුණු ±50 ක ආන්තිකයක් සහිතව එක් දින ප්‍රතිපත්ති පොලී අනුපාතික සමඟ සම්බන්ධ කර ඇත. ඒ අනුව, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සියයට 7.50 ක් ලෙසත්, නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය සියයට 8.50 ක් ලෙසත් සකසා ඇත.

විස්තීරණ ප්‍රතිසංස්කරණ සහ උපාය මාර්ගික ප්‍රතිපත්ති මූලපිරීම් ක්‍රියාවට නැංවීම තුළින් 2025 වසර වන විට ද.දේ.නි.යෙන් සියයට 2.3 ක ප්‍රාථමික අතිරික්තයක් ළඟා කර ගැනීමටත් මධ්‍ය කාලීනව එය පවත්වා ගැනීමටත් රජය කටයුතු කරයි. ස්ථාවර ආදායම් උත්පාදනය සහ විචක්ෂණශීලී ලෙස වියදම් කළමනාකරණය කිරීම තුළින් මෙම ඉලක්කය සපුරා ගනු ඇත. සාර්ව ආර්ථික ස්ථාවරත්වය නැවත ඇති කිරීම සඳහා නියමිත කාල සීමාව තුළ වැඩසටහන හා සම්බන්ධ ඉලක්ක සපුරාලීමේ ප්‍රයත්න දරමින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීරණ ණය පහසුකම් වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රජය සිය කැපවීම සහතික කරයි. ආදායම් ක්‍රියාමාර්ග අඛණ්ඩව පවත්වාගෙන යාම, අනුපූරක ප්‍රතිසංස්කරණ හඳුන්වාදීම සහ බදු පදනම පුළුල් කිරීම, බදු අනුකූලතාව ඉහළ නැංවීම සහ බදු පැහැර හැරීම් සහ ආදායම් අහිමිවීම් අවම කිරීම සඳහා ආදායම් පරිපාලනය ශක්තිමත් කිරීම මෙම ප්‍රයත්නයන් සඳහා ඇතුළත් වේ. රාජ්‍ය වියදම්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා වියදම් කළමනාකරණය ඉදිරියට ගෙන යනු ඇත. අවදානමට ලක්විය හැකි ප්‍රජාවන් ආරක්ෂා කිරීම සඳහා සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන ශක්තිමත් කිරීමට රජය කැපවී සිටින අතර මධ්‍ය පාන්තික ආදායම් ලබන්නන්ගේ ජීවන තත්ත්වය පහසු කිරීම සඳහා ද රජය කැපවී සිටී. රජය සතු ව්‍යවසාය ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රයත්නයන් අඛණ්ඩව ක්‍රියාත්මක කරනු ලබන අතර මෙම ආයතන හා සම්බන්ධ රාජ්‍ය මූල්‍ය අවදානම් අවම කිරීම සඳහා අඛණ්ඩව කටයුතු කරනු ඇත. ඉලක්කගත සහ බලපෑම් සහගත ආයෝජන ඔස්සේ ලැබීම් ආකර්ෂණය කර ගැනීම සඳහා රාජ්‍ය ආයෝජන මධ්‍ය කාලීනව උපායමාර්ගිකව වැඩිදියුණු කරනු ඇත.

### 1.2 මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය

2024 වසරේ අගෝස්තු මස සිට බලපැවැත්වෙන පරිදි පනවන ලද 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් කළමනාකරණය කරනු ලබන අතර මෙම පනත සම්පූර්ණයෙන් බලාත්මක කිරීම 2025 වසරේ දෙසැම්බර් මස අවසානය වන විට සිදු කිරීමට අපේක්ෂා කෙරේ. රාජ්‍ය ණය තිරසාර මට්ටමකින් අඩු කිරීම සහ කළමනාකරණය කිරීම, අනාගත අවිනිශ්චිත තත්ත්වයන්ගෙන් ආරක්ෂා වීමට රාජ්‍ය මූල්‍ය ස්වාරක්ෂක (buffers) නිර්මාණය කිරීම සහ නඩත්තු

කිරීම, රාජ්‍ය මූල්‍ය අවදානම් කළමනාකරණය සහ අවම කිරීම සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ විනය, විනිවිදභාවය සහ වගවීම සහතික කිරීම වැනි පුළුල් අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම පනත මඟින් නීතිමය රාමුවක් සපයයි. තවද, එය වාර්ෂික රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශයක් ප්‍රකාශයට පත් කිරීමේ අවශ්‍යතාවය සහ පස් අවුරුදු මධ්‍යකාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති රාමුව ක්‍රියාත්මක කිරීම සඳහා නීත්‍යානුකූල අවශ්‍යතාවයක් නිර්මාණය කර ඇත.

රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන මධ්‍ය කාලීන සාර්ව රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති රාමුව යටතේ දක්වනු ලබන ප්‍රාථමික ශේෂ ඉලක්කය සහ දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 13.0 ක් වූ ප්‍රාථමික වියදම් සීමාව මඟින් පනත ඔස්සේ ද ණය අඩු කිරීමේ අරමුණ අධීක්ෂණය කෙරේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහනේ ප්‍රධාන අරමුණුවලින් එකක් වන පොලී නොවන වියදම් කළමනාකරණය කරන අතරම, ආදායම් වැඩි දියුණු කිරීමේ ක්‍රියාමාර්ග හරහා ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවය සඳහා මෙය පදනම සපයයි.

### රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය

රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය පාලනය වන්නේ ආදායම් පාදක කරගත් රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතාවයෙන් වන අතර එය මෙහෙයවනු ලබන්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම වැඩසටහනේ දක්වා ඇති රාජ්‍ය මූල්‍ය අංශයේ ප්‍රමාණාත්මක ඉලක්ක සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ නියම කර ඇති රාජ්‍ය මූල්‍ය රීති මඟින් වේ. 2025 වසරේ දී ද.දේ. නි.යෙන් සියයට 2.3 කට නොඅඩු ප්‍රාථමික අතිරික්තයක් ළඟා කර ගැනීමට රජය බැඳී සිටී. මේ සඳහා 2025 වසරේ රාජ්‍ය ආදායම ද.දේ. නි.යෙන් සියයට 15.1 දක්වා ඉහළ නැංවීම සඳහා රජය ආදායම් ඉහළ නැංවීමේ පියවර කිහිපයක් ක්‍රියාත්මක කර ඇත. මීට අමතරව, බදු අනුකූලතාව වැඩි කිරීම, දූෂණ අවදානම් අවම කිරීම, ඩිජිටල්කරණය සහ බදු පරිපාලනය නවීකරණය කිරීම සහ ඵලදායී කළමනාකරණය සහ පාලනය කෙරෙහි අවධානය යොමු කරමින් බදු පරිපාලනය ශක්තිමත් කිරීම සඳහා දැනටමත් පියවර ගණනාවක් ක්‍රියාත්මක වෙමින් පවතී.

රාජ්‍ය ආදායම ඉහළ නංවන අතරම, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට අනුකූලව රාජ්‍ය වියදම්වල දූරදර්ශී මට්ටම් සහ ප්‍රාථමික වියදම් ද. දේ. නි.යෙන් සියයට 13 ට අඩුවෙන් පවත්වාගෙන යාමට රජය කැපවී සිටී. කෙසේ වුවද , ප්‍රධාන සංවර්ධන අංශ සඳහා මෙන්ම සමාජ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීම සඳහා ප්‍රමාණවත් අරමුදල් වෙන් කිරීම සහතික කෙරෙනු ඇත. එමෙන්ම රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය ආර්ථික ප්‍රසාරණය සහ සංවර්ධනය උත්තේජනය කිරීම සඳහා ගනු ලබන වර්ධන හිතකාමී පියවර, මිල සහ මූල්‍ය ස්ථායීතාව සහතික කිරීම සහ පාලනය ශක්තිමත් කිරීම ඇතුළු සමස්ත ආර්ථික ස්ථායීකරණ පියවරයන් මගින් සහාය ලබනු ඇත.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීරණ ණය පහසුකම් වැඩසටහන යටතේ ණය තිරසාරභාවයට අදාළ ඉලක්කවලට අනුකූලව ණය තිරසාරභාවය යථා තත්ත්වයට පත් කිරීමට රජය කැපවී සිටී. රජය විසින් දේශීය ණය ප්‍රශස්තකරණයට අදාළ සියලුම අංග අවසන් කර ඇති අතර විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීම ද ඉහළ මට්ටමේ සහභාගිත්වයක් සහිතව සැළකිය යුතු ප්‍රගතියක් අත් කරගෙන ඇති අතර එමඟින් ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරවලට අදාළව නොපිය වූ සමස්ත හිඟ ප්‍රමාණයෙන් සියයට 98 කට ආසන්න ප්‍රමාණයක් හුවමාරු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ණය හුවමාරුව ක්‍රියාත්මක කිරීම මඟින් ශ්‍රී ලංකාවට සැලකිය යුතු ණය සහන සැලසෙන අතර, එමඟින් රාජ්‍ය ආයෝජන සඳහා අවශ්‍ය සම්පත් සැපයෙනු ඇත. තවද, 2024 අංක 33 දරන රාජ්‍ය ණය කළමනාකරණ පනත යටතේ රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය (PDMO) පිහිටුවා, එය 2024 වසරේ දෙසැම්බර් මස 02 දින සිට ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත. රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට අනුකූලව මධ්‍ය කාලීන ණය කළමනාකරණ උපාය මාර්ගය ප්‍රකාශයට පත් කරනු ඇත.

රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට අනුව, එළඹෙන වසරේ අයවැය සකස් කිරීම සඳහා ක්‍රමෝපායික සැලැස්මක් සැපයීම සඳහා අවශ්‍ය මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය රාමුව ඇතුළත් මූල්‍ය ක්‍රමෝපාය ප්‍රකාශය ජූනි මස අවසානයේ ප්‍රකාශයට පත් කළ යුතුය. කෙසේ වුවද, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත 2024 වසරේ අගෝස්තු මාසයේ සිට ක්‍රියාත්මක වූ බැවින්, එම ප්‍රකාශය 2025 වසර සඳහා ප්‍රකාශයට පත් නොකළ නමුත්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි සහාය ලබන ආර්ථික හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණ වැඩසටහනට අනුකූලව උපායමාර්ගික ප්‍රතිපත්ති මාර්ගෝපදේශයක් සකස් කරන ලදී.

2025 - 2029 වසර සඳහා වන රාජ්‍ය මූල්‍ය රාමුව සහ රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය සඳහා වන සාර්ව ආර්ථික දිශානතිය පහත දක්වා ඇත:

### 1.3 රාජ්‍ය මූල්‍ය ගමන් මඟ:

- රාජ්‍ය ආදායම ඉහළ නැංවීමේ ස්ථාවර ප්‍රයත්නයන් සහ රාජ්‍ය වියදම් තාර්කිකරණය කිරීම තුළින් 2025 වසරේ දී සහ ඊට පසු වසරවල දී ද.දේ.නි යෙන් සියයට 2.3 ක ප්‍රාථමික අතිරික්තයක් ළඟා කර ගැනීම.

- බදු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ සහ බදු පරිපාලනය ශක්තිමත් කිරීම තුළින් 2025 වසර සහ ඉන් ඔබ්බට අවම වශයෙන් ද.දේ.නි යෙන් සියයට 15ක් දක්වා ආදායම ඉහළ නැංවීම

- මූලික බදුවල බදු අනුකූලතාවය වැඩි දියුණු කිරීම, විශේෂයෙන්ම එකතු කළ අගය මත බදු අනුකූලතා වැඩිදියුණු කිරීමේ වැඩසටහන හරහා

සහ සරල කරන ලද එකතු කල අගය මත බදු පද්ධතිය සම්පූර්ණයෙන් ඉවත් කිරීම සහතික කිරීම සඳහා පූර්ණ ක්‍රියාකාරී එකතු කළ අගය මත බදු ආපසු ගෙවීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම.

- ගෙවීම, ගොනු කිරීම, වාර්තා කිරීම සහ ලියාපදිංචිය සම්බන්ධ ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs) යටතේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව අධීක්ෂණය කිරීම.

- RAMIS 3.0 හඳුන්වා දීමෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නවීකරණය කිරීම, සරල තනි පුද්ගල බදු ගොනු කිරීම සඳහා මාර්ගගත ද්වාරයක් (online portal) හඳුන්වා දීම සහ RAMIS හරහා සියලුම බදු එකතු කිරීමට කටයුතු කිරීම.

- රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට අනුව මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය රාමුව යටතේ ද.දේ.නි යෙන් සියයට 13.0 ට වඩා පහළ මට්ටමක පවත්වා ගත යුතු ප්‍රාථමික වියදම් සීමාවට පහළින් ප්‍රාථමික වියදම් කළමනාකරණය කිරීම.

- සමාජයේ වඩාත් අවදානමට ලක්විය හැකි කොටස් සඳහා සහන සැලසීම පිණිස සමාජ ආරක්ෂණ ජාල වැඩසටහන් ශක්තිමත් කිරීම අඛණ්ඩව සිදු කිරීම.

- 2025 සහ ඉන් ඔබ්බට රාජ්‍ය ආයෝජන ද.දේ. නි.යෙන්.සියයට 4 කට වඩා පවත්වා ගැනීම.

- සෞඛ්‍ය, අධ්‍යාපනය, යටිතල පහසුකම් සහ සමාජ ආරක්ෂණය ඇතුළු ප්‍රමුඛතා අංශ සඳහා වියදම් ප්‍රමාණවත් ලෙස වෙන් කර ඇති බව සහතික කරන අතරම අයවැය යටතේ අරමුදල් සපයනු ලබන රාජ්‍ය ආයෝජන සහ ව්‍යාපෘති සහ වැඩසටහන් තෝරා ගැනීම සඳහා නිසි අධ්‍යනයකින් අනතුරුව ප්‍රමුඛත්වය ලබා දීම.

- ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු පද්ධතිය සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම ඔස්සේ රජයේ මූල්‍ය බැඳීම් කළමනාකරණය සහ අධීක්ෂණය කිරීම රාජ්‍ය වියදම් ආශ්‍රිත විනය පවත්වා ගැනීම සඳහා ඉවහල් වනු ඇත.

- 2026 සහ ඉන් ඔබ්බට අයවැය හිඟය ද. දේ. නි.යෙන් ප්‍රතිශතයක් ලෙස සියයට 5 ට වඩා අඩු වන පරිදි ක්‍රමානුකූලව පාලනය කිරීම සහ එමගින් රජයේ දළ මූල්‍ය අවශ්‍යතා අඩු කිරීම.

- මාස 3ක නොගෙවූ බිල්පත් ශූන්‍ය කිරීම.

- රජයේ ඇපකරවලින් මතුවන පිටවන මූල්‍ය අවදානම් සීමා කිරීමේ අරමුණින් සෑම මූල්‍ය වර්ෂයක් අවසානයේදීම රජයේ ඇපකරවල සමස්ත තොගය අදාළ මූල්‍ය වර්ෂයේ සහ ඊට පෙර මූල්‍ය වසර දෙකක සාමාන්‍ය ද. දේ. නි.යෙන් සියයට 7.5 නොඉක්මවන ලෙස පවත්වා ගැනීම සඳහා රජයේ ඇපකර නිකුත් කිරීම අඩු කිරීම.

- ලංකා විදුලිබල මණ්ඩලයේ සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මනා මූල්‍ය කාර්ය සාධනය සහතික කිරීම සඳහා ස්වයංක්‍රීය ඉන්ධන සහ විදුලි මිලකරණ යාන්ත්‍රණයන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම.

- රජය සතු ව්‍යවසායයන්වල මූල්‍ය ශක්‍යතාව වැඩිදියුණු කිරීමට සහ ඔවුන්ගේ පාලනය ශක්තිමත් කිරීම සඳහා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සිදු කිරීම.

ඉහත දක්වා ඇති පරිදි, රාජ්‍ය මූල්‍ය ගමන් මඟ මූලික වශයෙන් පදනම් වී ඇත්තේ බදු ප්‍රතිපත්තිය මෙන්ම බදු පරිපාලනය සහ රාජ්‍ය වියදම් දූරදර්ශී ලෙස කළමනාකරණය කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් ආදායම් ඉහළ නැංවීමේ උපාය මාර්ග මත ය. රජය සතු ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීමේ ප්‍රයත්නයන්, ශක්තිමත් ආයතනික රාමුවක්, ඩිජිටල් පද්ධති සහ දත්ත ඩිජිටල්කරණය සහ ඒකාබද්ධ කිරීම, වැඩිදියුණු කළ පාලනය සහ වර්ධනය සහ ආර්ථිකයේ ස්ථාවරත්වය මූල්‍ය දැක්මට සහාය වනු ඇත.

### 1.4 මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව

මධ්‍ය කාලීන රාජ්‍ය මූල්‍ය රාමුව පහත සඳහන් කරුණු මත රඳා පවතී:

- 2025 වසරේ දී රාජ්‍ය ආදායම ද.දේ.නි.යෙන් සියයට 15 දක්වා ඉහළ නැංවීම සහ මධ්‍ය කාලීනව එය ක්‍රමයෙන් ඉහළ නැංවීම

- ප්‍රාථමික වියදම් ද.දේ.නි.යෙන් සියයට 13 ක් යටතේ පවත්වාගෙන යාම සහ රාජ්‍ය ආයෝජන ද.දේ.නි.යෙන් සියයට 4 කට වඩා මට්ටමක පවත්වා ගැනීම.

- 2025 වසරේ දී ද.දේ.නි.යෙන් සියයට 2.3 ක ප්‍රාථමික අතිරික්තයක් ලබා කර ගැනීම සහ කාලයත් සමඟ එම මට්ටම පවත්වා ගැනීම.

- 2026 වසර වන විට අයවැය හිඟය ද.දේ.නි.යෙන් සියයට 5 කට වඩා අඩු මට්ටමකට ගෙන ඒම.

- ණය තිරසාර මට්ටමකට ගෙන ඒම සඳහා මධ්‍යම රජයේ ණය ප්‍රමාණය ක්‍රමිකව අඩු කිරීම.

වගුව 1.1 : මධ්‍යකාලීන රාජ්‍ය මූල්‍ය රාමුව : 2024 -2029

*ද.දේ.නි.යෙහි ප්‍රතිශතයක් ලෙස*

| දර්ශකය | 2024 | 2025 | 2026 | 2027 | 2028 | 2029 |
|---|---|---|---|---|---|---|
| | තාවකාලික | ඇස්තමේන්තුව | පුරෝකථන | | | |
| **මුළු ආදායම හා ප්‍රදාන** | **13.6** | **15.1** | **15.1** | **15.2** | **15.3** | **15.3** |
| **මුළු ආදායම** | **13.4** | **15.0** | **15.0** | **15.1** | **15.2** | **15.2** |
| **බදු ආදායම** | **12.3** | **13.9** | **13.9** | **13.9** | **14.2** | **14.2** |
| ආදායම් බදු | 3.4 | 3.5 | 3.6 | 3.6 | 3.7 | 3.8 |
| භාණ්ඩ හා සේවා බදු | 7.3 | 8.4 | 8.7 | 8.7 | 8.7 | 8.7 |
| විදේශ වෙළඳාම සඳහා බදු | 1.6 | 2.0 | 1.6 | 1.6 | 1.7 | 1.7 |
| **බදු නොවන ආදායම** | **1.1** | **1.1** | **1.1** | **1.1** | **1.1** | **1.1** |
| **ප්‍රදාන** | **0.2** | **0.1** | **0.1** | **0.1** | **0.1** | **0.1** |
| **මුළු වියදම** | **20.4** | **21.8** | **19.6** | **19.1** | **19.0** | **18.8** |
| **වර්තන වියදම** | **17.8** | **17.8** | **15.5** | **15.0** | **14.8** | **14.7** |
| වැටුප් හා වේතන | 3.5 | 3.7 | 3.7 | 3.8 | 3.8 | 3.8 |
| භාණ්ඩ හා සේවා | 1.2 | 1.3 | 1.1 | 1.1 | 1.1 | 1.1 |
| පොලී ගෙවීම් | 9.0 | 8.9 | 6.8 | 6.2 | 6.1 | 5.9 |
| සහනාධාර සහ මාරුවීම් | 4.1 | 3.9 | 3.9 | 3.8 | 3.8 | 3.8 |
| **ප්‍රාග්ධන හා ශුද්ධ ණය දීම** | **2.6** | **4.0** | **4.1** | **4.1** | **4.2** | **4.2** |
| එයින් රාජ්‍ය ආයෝජන | 2.7 | 4.0 | 4.1 | 4.1 | 4.2 | 4.2 |
| **ජංගම ගිණුමේ හිඟය (-)/අතිරික්තය (+)** | **(4.4)** | **(2.8)** | **(0.5)** | **0.1** | **0.4** | **0.6** |
| **ප්‍රාථමික හිඟය (-)/අතිරික්තය (+)** | **2.2** | **2.3** | **2.3** | **2.3** | **2.4** | **2.4** |
| **අයවැය හිඟය (-)/අතිරික්තය (+)** | **(6.8)** | **(6.7)** | **(4.5)** | **(4.0)** | **(3.7)** | **(3.5)** |

*මූලාශ්‍ර : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, ජාතික අයවැය දෙපාර්තමේන්තුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි වැඩසටහනේ පරාමිතීන්*

# II කොටස

## අයවැය, ආර්ථිකය සහ මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව - 2025

### 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 49 වැනි වගන්තිය යටතේ ගරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා විසින් නිකුත් කරන ලදී.

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 49 වන වගන්තිය අනුව විසර්ජන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ දෙවන වර කියවීම සඳහා නියම කර ඇති දිනයේ දී මෙම වාර්තාව සෑම වසරකම පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට ගරු මුදල් ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් කටයුතු යෙදිය යුතුය.

ඊට අනෙකුත් තොරතුරුවලට අමතරව දළ දේශීය නිෂ්පාදිතය, පාරිභෝගික මිල ගණන්, රැකියාව සහ විරැකියාව, ගෙවුම් ශේෂය, ආදායම් හා වියදම්, ආණ්ඩුව විසින් ගනු ලබන ණය සම්බන්ධ ඇස්තමේන්තු හා ඉහත සඳහන් ඇස්තමේන්තු පදනම් වූ සාධක අන්තර්ගත වේ. මෙම වාර්තාවේ අන්තර්ගත තොරතුරු, හැකිතාක් දුරට, මූල්‍ය සහ ආර්ථික තත්ත්වය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කෙරෙන ආණ්ඩුවේ සියලුම තීරණ හා වෙනත් සියලු පරිවේෂණ සැලකිල්ලට ගෙන ඇත.

# රාජ්‍ය මූල්‍ය උපනතීන්, භාණ්ඩාගාර මෙහෙයුම් සහ විදේශ මූල්‍යයනය

# 02

## 2.1. සමාලෝචනය

රාජ්‍ය ආදායම වර්ධනය වීම සහ රාජ්‍ය වියදම් දූරදර්ශී ලෙස කළමනාකරණය කිරීම හේතුවෙන් 2024 වසරේ පළමු මාස දහය තුළ රජයේ මූල්‍ය මෙහෙයුම් වැඩි දියුණු විය. ඇස්තමේන්තු කල ප්‍රමාණයට වඩා ප්‍රාග්ධන වියදම් පහළ අගයක් ගැනීම හේතුවෙන් ප්‍රධාන වශයෙන් රාජ්‍ය වියදම් පාලනය වූ අතර, රාජ්‍ය ආදායම ඉහළ නැංවීම සඳහා වූ ආදායම් ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම හේතුවෙන් බදු ආදායම සැළකිය යුතු ලෙස වර්ධනය විය. රාජ්‍ය මූල්‍ය අංශයේ සිදු වූ මෙම සැළකිය යුතු වර්ධනය හේතුවෙන් ප්‍රාථමික අතිරික්තය 2023 වසරේ පළමු මාස දහය තුළ වූ රු. බිලියන 225.4 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 830.7 ක ප්‍රාථමික අතිරික්තයක් දක්වා වර්ධනය විය. 2024 වසරේ දී ප්‍රාථමික අතිරික්තය දළ දේශීය නිෂ්පාදිතයේ (ද.දේ.නි.යේ) ප්‍රතිශතයක් ලෙස සියයට 1.6 කට වඩා වැඩි අගයක් වනු ඇතැයි අපේක්ෂා කරන අතර, එය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීරණ ණය පහසුකම් වැඩසටහන යටතේ දක්වා ඇති සියයට 1.0 හි දර්ශකගත ඉලක්කයට (indicative target) වඩා බෙහෙවින් ඉහළ අගයක් වේ. පොලී සඳහා වන ගෙවීම්වල අඩුවීම පිළිබිඹු කරමින් 2023 වසරේ පළමු මාස දහය තුළ දී රු. බිලියන 1,547.0 ක් වූ සමස්ත අයවැය හිඟය 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 1,060.7 දක්වා සියයට 31.4 කින් අඩු විය.

ප්‍රදාන ද ඇතුළුව සමස්ත රාජ්‍ය ආදායම 2023 වසරේ පළමු මාස දහය තුළ වූ රු. බිලියන 2,434.0 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 3,266.9 දක්වා සියයට 34.2 කින් වර්ධනය විය. මෙය වාර්ෂික ඇස්තමේන්තුව වන රු. බිලියන 4,127.0 න් සියයට 79.2 කි. 2024 වසරේ පළමු මාස දහය තුළ දී බදු ආදායම රු. බිලියන 3,000.2 දක්වා සියයට 35.6 කින් වර්ධනය වූ අතර බදු නොවන ආදායම රු. බිලියන 255.5 දක්වා සියයට 20.3 කින් වර්ධනය විය.

**වගුව 2.1. රාජ්‍ය මූල්‍ය මෙහෙයුම් සාරාංශය**

*රු.මිලි.*

| අයිතම | ජන.- ඔක්. 2023 | ජන.- ඔක්. 2024[අ] |
|---|---|---|
| **ආදායම් හා ප්‍රදාන** | **2,434,032** | **3,266,944** |
| **ආදායම** | **2,424,833** | **3,255,711** |
| බදු | 2,212,514 | 3,000,245 |
| බදු නොවන | 212,320 | 255,466 |
| **ප්‍රදාන** | 9,199 | 11,234 |
| **වියදම්** | **3,981,050** | **4,327,692** |
| **පුනරාවර්තන** | **3,532,249** | **3,796,046** |
| වැටුප් | 774,315 | 839,000 |
| පොලී ගෙවීම් | 1,772,387 | 1,891,451 |
| අනෙකුත් | 985,547 | 1,065,595 |
| රාජ්‍ය ආයෝජන | 488,673 | 553,706 |
| අනෙකුත් | -39,872 | -22,060 |
| **ආදායම් හිඟය (-)/අතිරික්තය (+)** | **-1,107,416** | **-540,335** |
| **ප්‍රාථමික හිඟය (-)/අතිරික්තය (+)** | **225,369** | **830,704** |
| **සමස්ත අයවැය හිඟය (-)/අතිරික්තය (+)** | **-1,547,018** | **-1,060,747** |
| **මූල්‍යයනය** | **1,547,018** | **1,060,747** |
| විදේශ මූල්‍යයනය (ශුද්ධ) | 69,209 | 274,462 |
| දේශීය මූල්‍යයනය (ශුද්ධ) | 1,477,809 | 786,285 |

*මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

*[අ] තාවකාලික*

2023 සහ 2024 වසරවල දී හඳුන්වා දුන් බදු ප්‍රතිපත්ති මාලාව රාජ්‍ය ආදායම වර්ධනය වීමට බෙහෙවින් හේතු විය. බදු සඳහා සිදු කරන ලද මෙම සංශෝධනවලට පුද්ගල ආදායම් බදු ව්‍යුහය සඳහා හඳුන්වා දුන් සංශෝධන, සංස්ථාපිත ආදායම් බදු අනුපාතික ඉහළ නැංවීම, එක් එක් අංශ සඳහා විශේෂිත වූ සංස්ථාපිත ආදායම් බද්දට අදාළ සහන සහ නිදහස් කිරීම් ඉවත් කිරීම, අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද සහ රඳවා ගැනීමේ බදු යළි ස්ථාපිත කිරීම, එකතු කළ අගය මත බද්ද සඳහා අදාළ වන බදු අනුපාත ඉහළ නැංවීම සහ එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි වීමේ සීමාව පහත හෙලීම සහ බදු පරිපාලනය ශක්තිමත් කිරීම හා සම්බන්ධ ක්‍රියාමාර්ග වැඩිදියුණු කිරීම ආදිය ඇතුළත් වේ.

2024 වසරේ පළමු කාර්තු තුන තුළ ලද බදු ආදායම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි විස්තීරණ අරමුදල් පහසුකම හා සම්බන්ධ වැඩසටහන යටතේ එළැඹි ආදායම් ඉලක්ක ඉක්මවා යන ලදී. ඒ අනුව, 2024 වසරේ මාර්තු මස අවසානය, ජූනි මස අවසානය සහ සැප්තැම්බර් මස අවසානය වන විට බදු ආදායමෙහි ඉලක්ක පිළිවෙළින් රු. බිලියන 87 කින්, රු. බිලියන 209 කින් සහ රු. බිලියන 288 කින් ඉක්මවා යන ලදී. මේ සඳහා ප්‍රධාන වශයෙන්ම ආදායම් බදු, එකතු කල අගය මත බද්ද, නිෂ්පාදන බදු සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද මඟින් ලද ආදායම වර්ධනය වීම, බදු පරිපාලනය වැඩිදියුණු වීම සහ ආර්ථික ක්‍රියාකාරකම්වල පුනර්ජීවනය මඟින් ඇති වූ බලපෑම් හේතුවෙන් සාර්ව ආර්ථික විචල්‍යයන්හි සිදු වූ ධනාත්මක ප්‍රවණතාවයන් හේතු විය.

2023 සහ 2024 වසරවලට අදාළව ප්‍රකාශයට පත්කර ඇති අයවැය යෝජනාවලට අනුකූලව බදු පැහැර හැරීම සහ බදු මඟහැරීම වළක්වාලීම, තාක්ෂණය ඒකාබද්ධ කිරීම, රෙගුලාසි සහ ක්‍රියාවලි වැඩිදියුණු කිරීම සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව සහ සුරාබදු දෙපාර්තමේන්තුවට අදාළ ප්‍රධාන කාර්යසාධන දර්ශක (KPIs) හඳුන්වාදීම හරහා බදු අනුකූලතාව වැඩිදියුණු කිරීම ආදී අරමුණු ඇතිව, ආදායම් එකතු කිරීමේ ප්‍රධාන ආයතන තුන තුළ බදු පරිපාලන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කෙරේ.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන කාර්යසාධන දර්ශක හඳුන්වා දීම තුළින් විගණන ඵලදායිතාව ඉහළ නැංවීමට , බදු වාර්තා ගොනු කිරීම ඉහළ නැංවීමට, එකතු කළ හැකි ආදායම අයකර ගැනීමට සහ බදු සඳහා ලියාපදිංචිය ඉහළ නැංවීම ආදිය සඳහා පියවර ගෙන ඇත. වයස අවුරුදු 18 ට වැඩි සියලුම පුද්ගලයින් සඳහා බදු ලිපිගොනු විවෘත කිරීමේ ප්‍රතිපත්තිය අඛණ්ඩව පවත්වාගෙන යාම තුළින් බදු නොගෙවන්නන් බදු ජාලය තුළට ගෙන ඒම මඟින් බදු පදනම සහ බදු අනුකූලතාව තවදුරටත් පුළුල් කර ඇත. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තුළ ඉහළ ශුද්ධ ආදායම් උපයන පුද්ගලයින්ගේ ලිපිගොනු කළමනාකරණය කිරීම සඳහා වෙනම ඒකකයක් පිහිටුවීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇත.

සමස්ත රාජ්‍ය වියදම 2023 වසරේ පළමු මාස දහය තුළ වූ රු. බිලියන 3,981.1 සිට 2024 වසරේ සමාන කාල කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 4,327.7 දක්වා සියයට 8.7 කින් සුළු වශයෙන් වර්ධනය විය. එසේම පුනරාවර්තන වියදම් ද රු. බිලියන 3,796.0 ක් දක්වා සියයට 7.5 කින් සුළු වශයෙන් වර්ධනය වූ අතර ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය දීම් රු. බිලියන 531.6 දක්වා සියයට 18.5 කින් වර්ධනය විය. 2024 වසරේ පළමු මාස දහය තුළ දී පොලී ගෙවීම් සියයට 6.7 කින් සුළු වශයෙන් වර්ධනය විය. 2023 වසරේ පළමු මාස දහය තුළ රාජ්‍ය ආදායමෙන් සියයට 80.1 ක් වූ පොලී ගෙවීම්වලට සාපේක්ෂව 2024 වසරේ සමාන කාල කාලපරිච්ඡේදය තුළ දී එය සියයට 63.0 ක් විය. මෙම සාධනීය තත්ත්වය සඳහා බදු ආදායම සියයට 35.6 කින් වර්ධනය වීම හා වියදම් කළමනාකරණයෙන් ඇති වූ සංයුක්ත බලපෑම හේතු විය.

2024 වසර මැතිවරණ වසරක් වුවද, දූරදර්ශී මූල්‍ය කළමනාකරණ ක්‍රියාමාර්ග හේතුවෙන් ප්‍රාථමික වියදම් සාපේක්ෂව අඩු වේගයකින් වර්ධනය විය. ඒ අනුව, 2023 වසරේ පළමු මාස දහය තුළ රු. බිලියන 2,208.7 ක් වූ ප්‍රාථමික වියදම්වලට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළදී රු. බිලියන 2,436.2 දක්වා සියයට 10.3 කින් මධ්‍යස්ථ ලෙස වර්ධනය විය.

පුනරාවර්තන වියදම් 2023 වසරේ පළමු මාස දහය තුළ දී වූ රු. බිලියන 3,532.2 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 3,796.0 දක්වා සියයට 7.5 කින් සුළු වශයෙන් වර්ධනය විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පොලී ගෙවීම්, වැටුප් සහ වේතන සහ සහනාධාර සහ පැවරුම් සඳහා වන පිරිවැය වර්ධනය වීමයි. පොළී ගෙවීම්, 2023 වසරේ පළමු මාස දහයට සාපේක්ෂව 2024 සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 1891.5 දක්වා සියයට 6.7 කින් සුළු වශයෙන් වර්ධනය විය. 2024 වසරේ පළමු මාස දහය තුළ දී පොලී ගෙවීම්වලට අදාළ සමස්ත වියදමින් සියයට 94 කින් සමන්විත වූ දේශීය ණය ගැනීම් සඳහා වූ පොලී ගෙවීම් 2023 වසරේ පළමු මාස දහයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 1,776.0 දක්වා සියයට 5.5 කින් සුළු වශයෙන් වර්ධනය වූ අතර 2024 වසරේ පළමු මාස දහය තුළ දී විදේශ ණය ගැනීම් සඳහා වූ පොලී ගෙවීම් රු. බිලියන 115.4 දක්වා සියයට 29.6 කින් වර්ධනය විය. භාණ්ඩ හා සේවා සඳහා වන වියදම් රු. බිලියන 255.9 ක් දක්වා සියයට 12.0 කින් වර්ධනය විය. 2024 වසරේ පළමු මාස දහය තුළ සහනාධාර සහ පැවරුම් සඳහා දරන ලද වියදම රු. බිලියන 809.7 ක් දක්වා සියයට 6.9 කින් වර්ධනය විය. 2024 වසර මැතිවරණ වසරක් වීම හේතුවෙන් පොලිස් සහ සිවිල් ආරක්ෂාව සඳහා ඉහළ වියදමක් දැරීමට සිදු වූ බැවින් රාජ්‍ය සේවකයන්ගේ වැටුප් හා වේතන සඳහා වන වියදම් 2024 වසරේ පළමු මාස දහය තුළ දී රු. බිලියන 839.0 දක්වා සියයට 8.4 කින් වර්ධනය විය.

වගුව 2.2 : 2024 වාර්ෂික ඇස්තමේන්තුවෙන්, වර්ෂයේ පළමු මාස දහය තුළ ළඟා කරගත් තත්‍ය ආදායම හා වියදම

*රු. බිලි.*

| අයිතමය | වාර්ෂික ඇස්තමේන්තුව[අ] | ජන. - ඔක්.[ආ] | ඇස්තමේන්තුවෙන් ළඟා කර ගැනීම (%) |
|---|---|---|---|
| **මුළු ආදායම** | **4,107.0** | **3,255.7** | **79.3** |
| **බදු ආදායම** | **3,820.0** | **3,000.2** | **78.5** |
| **දේශීය ආදායම් දෙපාර්තමේන්තුව[ඇ]** | **2,015.0** | **1,556.1** | **77.2** |
| ආදායම් සහ ලාභ මත බද්ද | 1,080.0 | 815.6 | 75.5 |
| එකතු කල අගය මත බද්ද - දේශීය (ශුද්ධ) | 740.0 | 585.5 | 79.1 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (දේශීය) | 195.0 | 154.8 | 79.4 |
| **ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව[අ]** | **1,533.0** | **1,236.2** | **80.6** |
| එකතු කල අගය මත බද්ද - ආනයන (ශුද්ධ) | 660.0 | 481.9 | 73.0 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (ආනයන) | 55.0 | 49.2 | 89.5 |
| වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද | 175.0 | 143.8 | 82.2 |
| සෙස් බද්ද | 60.0 | 66.8 | 111.4 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද හා අනෙකුත් | 95.0 | 86.4 | 91.0 |
| ආනයන බද්ද | 175.0 | 89.8 | 51.3 |
| **නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද** | | | |
| දුම්වැටි | 143.0 | 88.1 | 61.6 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 135.0 | 176.1 | 130.5 |
| මෝටර් වාහන සහ අනෙකුත් | 35.0 | 54.0 | 154.2 |
| **සුරාබදු දෙපාර්තමේන්තුව** | **232.0** | **168.6** | **72.7** |
| මත්පැන්/දුම්කොළ | 232.0 | 168.6 | 72.7 |
| **අනෙකුත්** | **40.0** | **39.4** | **98.5** |
| විදුලි සංදේශ බද්ද | 18.5 | 13.6 | 73.3 |
| බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් | 21.5 | 25.8 | 120.1 |
| **බදු නොවන ආදායම** | **287.0** | **255.5** | **89.0** |
| **මුළු වියදම** | **6,527.8** | **4,327.7** | **66.3** |
| **වර්තන වියදම** | **5,277.0** | **3,796.0** | **71.9** |
| වැටුප් හා වේතන | 1,126.9 | 839.0 | 74.5 |
| පොලී ගෙවීම | 2,651.0 | 1,891.5 | 71.3 |
| විශ්‍රාම වැටුප් ගෙවීම | 402.2 | 323.8 | 80.5 |
| රාජ්‍ය සංස්ථා සහ ආයතනවලට පැවරුම් | 126.3 | 85.9 | 68.0 |
| අනෙකුත් | 970.6 | 656.0 | 67.6 |
| **ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණය** | **1,250.8** | **531.6** | **42.5** |

*මූලාශ්‍ර : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව හා ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

*(අ) රුපියල් බිලියන 450ක බැංකු ප්‍රාග්ධණීකරණය හැර*

*(ආ) තාවකාලික*

*(ඇ) ජාතිය ගොඩනැගීමේ බද්ද ඇතුළත්ව*

2023 වසරේ පළමු මාස දහය තුළ වූ රාජ්‍ය ආයෝජනවලට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී එය රු. බිලියන 553.7 දක්වා සියයට 13.3 කින් මධ්‍යස්ථ වශයෙන් වර්ධනය විය. කෙසේ වෙතත්, විදේශ ව්‍යාපෘති මූල්‍යකරණයේ හිඟය හේතුවෙන් රාජ්‍ය ආයෝජන වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 44.0 ක් පමණක් ලඟා කරගෙන ඇත.

සමස්ත අයවැය හිඟය 2023 වසරේ පළමු මාස දහය තුළ වූ රු. බිලියන 1,547.0 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 1,060.7 දක්වා සියයට 31.4 කින් අඩු විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ බදු පරිපාලනය සහ අනුකූලතාවය ඉහළ නැංවීම හේතුවෙන් ආදායම් එකතු කිරීම ඉහළ යාම, ආදායම් ක්‍රියාමාර්ගවල සම්පූර්ණ බලපෑම තහවුරු වීම සහ වියදම් තාර්කිකකරණය සඳහා ක්‍රියාවට නංවන ලද අඛණ්ඩ උත්සාහයන් හේතුවෙන් වියදම් අඩුවීම, දේශීය පොළී අනුපාත අඩුවීම හේතුවෙන් පොළී ගෙවීම්වල සිදු වූ සුළු වර්ධනය සහ මැතිවරණය හා සම්බන්ධ පිරිවැය නිසි පරිදි කළමනාකරණය කිරීමයි.

## 2.2 රාජ්‍ය ආදායම

බදු ආදායම රු. බිලියන 2,212.5 සිට රු. බිලියන 3,000.2 දක්වා සියයට 35.6 කින් වැඩිවීම හේතුවෙන් ප්‍රදාන රහිත රජයේ සමස්ථ ආදායම 2023 වසරේ පළමු මාස දහය තුල දී වූ රු. බිලියන 2,424.8 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාල පරිච්ඡේදය තුල දී රු. බිලියන 3,255.7 දක්වා සියයට 34.3 ක වර්ධනයක් පෙන්නුම් කරන අතර එය 2024 වසර සඳහා වන ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 79.3 ක සාක්ෂාත් කර ගැනීමකි. බදු ආදායම එකතු කිරීම සමස්ථ ආදායමෙන් සියයට 92.2 කට දායක වූ අතර එය 2024 සඳහා වූ ඇස්තමේන්තුවෙන් සියයට 78.5 ලඟා කර ගැනීමකි.

### බදු ආදායමේ ඉහළ යාමට හේතු වූයේ:

1. 2023 වසරේ ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක කරන ලද සංස්ථාපිත සහ පුද්ගල ආදායම් බදු, අත්තිකාරම් පුද්ගල ආදායම් බදු සහ රඳවා ගැනීමේ බදු සම්බන්ධයෙන් වන බදු ප්‍රතිපත්තීන්හි සිදුකළ වෙනස්කම්වල සම්පූර්ණ බලපෑම, රාජ්‍ය අංශයේ හා අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් වැඩිවීමේ බලපෑම, ආර්ථික ක්‍රියාකාරකම් වර්ධනයවීමේ ධනාත්මක බලපෑම, ආර්ථික වර්ධනයට නැවත එළඹීමේ බලපෑම සහ රජය විසින් ගනු ලැබූ බදු පරිපාලනය ශක්තිමත් කිරීමේ පියවර සහ නිවැරදි බදු ප්‍රතිපත්ති තීරණය කිරීම හේතුවෙන්, ආදායම් බද්දෙන් ලද ආදායම සියයට 9.5 කින් හෝ රු. බිලියන 70.8 කින් වැඩිවීම;
2. එකතුකළ අගය මත බදු ලියාපදිංචි කිරීමේ සීමාව වසරකට රු. මිලියන 80 සිට රු. මිලියන 60 දක්වා අඩු කිරීම, එකතුකළ අගය මත බදු නිදහස් කිරීම්වලින් අතිමහත් බහුතරයක් ඉවත් කිරීම, 2024 වසරේ ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 15 සිට සියයට 18 දක්වා වැඩි කිරීම සහ 2024 වසරේ පළමු මාස දහය තුළ ආනයන සියයට 10.7 කින් වැඩිවීම හේතුවෙන් එකතුකළ අගය මත බද්දෙන් ලද ආදායම සියයට 86.8 කින් හෝ රු. බිලියන 495.9 කින් වැඩිවීම;
3. 2023 වසරේ ජූනි මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි පෙට්‍රල් සහ ඩීසල් සඳහා වන බදු අනුපාත ලීටරයකට රු. 25/- කින් ඉහළ දැමීම සහ 2024 වසරේ ජනවාරි මස සිට ක්‍රියාත්මකවන පරිදි පෙට්‍රල් සඳහා ලීටරයකට රු. 5/- කින් සහ ඩීසල් සඳහා ලීටරයකට රු. 6/- කින් අඩු කිරීම සමග නිෂ්පාදන බදු අනුපාතවල වූ ශුද්ධ වැඩිවීම හේතුවෙන් ඛනිජ තෙල් මත නිෂ්පාදන බදු ආදායම සියයට 65.6 කින් හෝ රු. බිලියන 69.8 කින් වැඩිවීම;
4. 2024 වසරේ ජනවාරි මස 12 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි වාර්ෂික සුරාබදු බලපත්‍ර ගාස්තු සංශෝධනය කිරීම, 2024 වසරේ ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සුරා බද්ද උද්ධමනයට අනුකූලව දර්ශක ගත කිරීම සහ සියලුම වර්ගවල මත්පැන් සඳහා වන සුරාබදු අනුපාත සියයට 14 කින් ඉහළ දැමීම හේතුවෙන් සුරා බද්දෙන් ලද ආදායම සියයට 20.8 කින් හෝ රු. බිලියන 28.8 කින් වැඩිවීම;
5. සීනි සඳහා වන බදු අනුපාත කිලෝග්‍රෑමයකට රු. 50/- දක්වා සහ අර්තාපල් සඳහා වන බදු අනුපාත කිලෝග්‍රෑමයකට රු. 60/- දක්වා ඉහළ නැංවීම සහ ප්‍රධාන වෙළඳ භාණ්ඩවල ආනයන පරිමාව වැඩිවීම හේතුවෙන් විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙන් ලද ආදායම සියයට 97.7 කින් හෝ රු. බිලියන 42.7 කින් වැඩිවීම;
6. ආනයන සහ දේශීය ක්‍රියාකාරකම් යන දෙආකාරයෙන්ම ලැබෙන ආදායම වැඩිවීම සහ ලියාපදිංචිවීමේ සීමාව වසරකට 2024 ජනවාරි මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි රු. බිලියන 120 සිට වසරකට රු. මිලියන 60 දක්වා අඩුකිරීම හේතුවෙන් සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් ලද ආදායම සියයට 14.7 කින් හෝ රු. බිලියන 26.2 කින් වැඩිවීම;
7. 2023 වසරේ මාර්තු මස 28 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි රේගු ආනයන බදු අනුපාත

සියයට 0:10:15 සිට සියයට 0:15:20 දක්වා සංශෝධනය කිරීම හේතුවෙන් රේගු ආනයන බද්දෙන් ලද ආදායම සියයට 16.7 කින් හෝ රු. බිලියන 12.8 කින් වැඩිවීම; සහ

8. ආනයන වැඩිවීම හේතුවෙන් සෙස් බද්දෙන් ලද ආදායම සියයට 47.9 කින් හෝ රු. බිලියන 21.7 කින් වැඩිවීම හේතුවිය.

2024 වසරේ මුල් මාස දහය තුළ බදු නොවන ආදායම සියයට 20.3 කින් හෝ රු. බිලියන 43.1 කින් වැඩිවීම ද ආදායම වර්ධනයට ධනාත්මක බලපෑමක් ඇති කළේය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පොලී ආදායම, දඩ මුදල්, ගාස්තු මගින් ලද ආදායම සහ

**රූපසටහන 2.1 : මුළු ආදායම් සංයුතිය 2024 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා**




*මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

**වගුව 2.3 : රාජ්‍ය ආදායම් කාර්ය සාධනයේ සාරාංශය**

*රු.මිලි.*

| අයිතම | ජන. -ඔක්. 2023 | ජන. -ඔක්. 2024 (අ) | වෙනස (%) |
|---|---|---|---|
| **බදු ආදායම** | **2,212,514** | **3,000,245** | **35.6** |
| **ආදායම් බදු** | **744,749** | **815,591** | **9.5** |
| **දේශීය පරිභෝජනය මත පදනම් වූ බදු(ආ)** | **772,456** | **1,003,616** | **29.9** |
| එකතු කල අගය මත බද්ද (වැට්) | 394,674 | 585,524 | 48.4 |
| නිෂ්පාදන/සුරා බද්ද | 241,624 | 263,135 | 8.9 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බදු | 136,112 | 154,841 | 13.8 |
| **ආනයන මත පදනම් වූ බදු(ආ)** | **661,723** | **1,141,646** | **72.5** |
| ආනයන බද්ද | 76,965 | 89,813 | 16.7 |
| එකතු කල අගය මත බද්ද (වැට්) | 176,847 | 481,864 | 172.5 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බදු | 41,777 | 49,235 | 17.9 |
| වරාය සහ ගුවන් තොටුපල සංවර්ධන බද්ද | 142,928 | 143,765 | 0.6 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | 43,728 | 86,438 | 97.7 |
| නිෂ්පාදන බද්ද | 134,116 | 223,681 | 66.8 |
| සෙස් බද්ද | 45,190 | 66,845 | 47.9 |
| **බලපත්‍ර ගාස්තු සහ අනෙකුත්** | **33,585** | **39,392** | **17.3** |
| **බදුනොවන ආදායම** | **212,320** | **255,466** | **20.3** |
| **මුළු ආදායම** | **2,424,833** | **3,255,711** | **34.3** |

*මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

(අ) *තාවකාලික*

(ආ) *ජාතිය ගොඩනැඟීමේ බද්ද ඇතුළත්ව*

**රූපසටහන 2.2 : මූලාශ්‍ර අනුව මුළු බදු ආදායම (%) 2024 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා**




*මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

### ආදායම් බද්ද

2023 වසරේ පළමු මාස දහය තුළ රු. බිලියන 744.7 ක් වූ ආදායම් බද්දෙන් ලද ආදායම 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 815.6 ක් දක්වා වර්ධනය වූ අතර එය වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 75.5 ක ළඟා කර ගැනීමකි. ප්‍රධාන වශයෙන් අත්තිකාරම් පුද්ගල ආදායම් බදු සහ රඳවා ගැනීමේ බදු/අත්තිකාරම් ආදායම් බදු ආදායම ඉහළ යාම හේතුවෙන් ආදායම් බද්ද සියයට 9.5 ක සුළු වැඩිවීමක් පෙන්නුම් කළද, 2023 වසරට සාපේක්ෂව මෙම වර්ධනය මධ්‍යස්ථ මට්ටමක පවතී.

අත්තිකාරම් පුද්ගල ආදායම් බද්දෙන් ලද ආදායම 2023 වසරේ පළමු මාස දහය තුළ වාර්තා කළ රු. බිලියන 119.1 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 164.5 ක් දක්වා සියයට 38.1 කින් සැළකිය යුතු ලෙස වැඩි විය. 2023 වසරේ දී සිදු කරන ලද ආදායම් බදු අනුපාත සංශෝධනවලට අනුකූලතාවය දැක්වීම ඉහළ යාම මෙයට හේතු විය. 2024 වසරේ පළමු මාස දහය තුළ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්දෙන් එකතු වූ ආදායම වාර්ෂික ඇස්තමේන්තුව වූ රු. බිලියන 160.0 ඉක්මවා ගොස් ඇත.

2023 වසරේ පළමු මාස දහයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ පුද්ගල ආදායම් බද්ද සියයට 69.0 කින් වර්ධනය වී ඇත. කෙසේ වෙතත්, 2023 වසරේ පළමු මාස දහයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ සංස්ථාපිත බදු ආදායම රු. බිලියන 464.8 සිට රු. බිලියන 452.0 දක්වා බලාපොරොත්තු වූ මට්ටමට වඩා සුළු වශයෙන් අඩු වී ඇත.

2023 වසරේ පළමු මාස දහය තුළ රු. බිලියන 124.0 ක් වූ රඳවා ගැනීමේ බද්ද/අත්තිකාරම් ආදායම් බද්දෙන් ලද ආදායම 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 136.9 ක් දක්වා සියයට 10.4 කින් වර්ධනය විය. මෙය වාර්ෂික ඇස්තමේන්තුව වූ රු. බිලියන 160.0න් සියයට 85.5 ක ළඟා කර ගැනීමකි.

**වගුව 2.4 : ආදායම් බදු කාර්යසාධනය**

*රු.මිලි.*

| බදු පදනම | ජන. - ඔක්. | | වෙනස (%) |
|---|---|---|---|
| | 2023 | 2024 [අ] | |
| සංස්ථාපිත හා සංස්ථාපිත නොවන | 501,487 | 513,995 | 2.5 |
| උපයන විට ගෙවීම | 119,090 | 164,480 | 38.1 |
| පොළී ආදායම් මත බදු | 123,952 | 136,861 | 10.4 |
| ආර්ථික සේවා ගාස්තු | 220 | 255 | 15.9 |
| **එකතුව** | **744,749** | **815,591** | **9.5** |

*මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

[අ] *තාවකාලික*

### එකතු කළ අගය මත බද්ද

එකතු කළ අගය මත බද්දෙන් ලද රාජ්‍ය ආදායම, 2023 වසරේ පළමු මාස දහය තුළ වූ රු. බිලියන 571.5 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 1,067.4 දක්වා සියයට 86.8 කින් සැළකිය යුතු ලෙස වැඩි වූ අතර, එය 2024 වසර සඳහා ඇස්තමේන්තු කළ එකතු කළ අගය මත බදු ආදායමෙන් සියයට 76.2 කි.

2024 වසරේ පළමු මාස දහය තුළ දේශීය ක්‍රියාකාරකම් මඟින් සහ ආනයන මඟින් යන දෙආකාරයෙන්ම ලද එකතු කළ අගය මත බදු ආදායම වර්ධනය විය. දේශීය ක්‍රියාකාරකම් මඟින් ලද එකතු කළ අගය මත බදු ආදායම, 2023 වසරේ පළමු මාස දහය තුළ රු. බිලියන 394.7 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 585.5 දක්වා සියයට 48.4 කින් වැඩි වූ අතර, ආනයන මඟින් ලද එකතු කළ අගය මත බදු ආදායම, 2023 වසරේ පළමු මාස දහය තුළ රු. බිලියන 176.8 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 481.9 දක්වා සියයට 172.5 කින් සැළකිය යුතු ලෙස වැඩි විය.

2024 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සම්මත එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 15 සිට සියයට 18 දක්වා වැඩි කිරීම, එකතු කළ අගය මත බදු ලියාපදිංචි කිරීමේ සීමාව වසරකට රු. මිලියන 80 සිට රු. මිලියන 60 දක්වා අඩු කිරීම සහ එකතු කළ අගය මත බදු නිදහස් කිරීම් අති බහුතරයක් ඉවත් කිරීම එකතු කළ අගය මත බදු ආදායම වර්ධනය වීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ආනයන සීමා බහුතරයක් ඉවත් කිරීමේ බලපෑම සහ ඒ හා සමගාමීව ආනයන වැඩි වීම ද මෙසේ එකතු කළ අගය මත බදු ආදායම ඉහළ නැංවීම සඳහා දායක විය. මෙම ආදායම් ක්‍රියාමාර්ග හේතුවෙන් 2024 වසරේ පළමු මාස දහය තුළ සමස්ථ ආදායම් කාර්යය සාධනය සඳහා එකතු කළ අගය මත බදු ආදායමේ දායකත්වය සියයට 32.8 ක් විය.

**වගුව 2.5 : එකතු කළ අගය මත බදු කාර්යසාධනය**

*රු.මිලි.*

| බදු පදනම | ජන. - ඔක්. 2023 | ජන. - ඔක්. 2024 (අ) | වර්ධනය (%) |
|---|---|---|---|
| දේශීය | 394,674 | 585,524 | 48.4 |
| ආනයන | 176,847 | 481,864 | 172.5 |
| **ශුද්ධ ආදායම** | **571,521** | **1,067,387** | **86.8** |

*මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

*(අ) තාවකාලික*

### නිෂ්පාදන/ සුරා බද්ද

දුම්වැටි මඟින් ලද ආදායමේ සුළු අඩුවීමක් වාර්තා වුවද, මත්පැන්, ඛනිජ තෙල් නිෂ්පාදන සහ මෝටර් වාහනවලින් ලැබුණු ආදායම ඉහළයාම හේතුවෙන් සමස්ත නිෂ්පාදන/සුරා බදු ආදායම 2023 වසරේ පළමු මාස දහය තුළ වාර්තා වූ රු. බිලියන 375.7 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 486.8 ක් දක්වා සියයට 29.6 කින් වර්ධනය විය. මෙය වාර්ෂික ඇස්තමේන්තුගත නිෂ්පාදන/ සුරා බදු ආදායමෙන් සියයට 89.3 ක් සාක්ෂාත් කර ගැනීමක් වන අතර, 2024 වසරේ පළමු මාස දහය තුළ වාර්තා වූ මුළු ආදායමට සියයට 15.0 කින් දායක වූයේ නිෂ්පාදන/ සුරා බදු ආදායමයි.

ඛනිජ තෙල් නිෂ්පාදනවලින් ලද නිෂ්පාදන බදු ආදායම, 2023 වසරේ පළමු මාස දහය තුළ වාර්තා වූ රු. බිලියන 106.3 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 176.1 ක් දක්වා සියයට 65.6 කින් වර්ධනය වූ අතර, 2024 වසරේ ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පෙට්‍රල් ලීටරයක් රු. 5 බැගින් ද ඩීසල් ලීටරයක් රු. 6 බැගින් ද පහත හෙලීම සහ ඉන්පසු 2023 වසරේ ජූනි මස 1 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉන්ධන සඳහා වන නිෂ්පාදන බද්ද රු. 25 කින් ඉහළ නැංවීම ඇතුළු සංශෝධනවල සමස්ත බලපෑම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, 2024 වසරේ තුන්වන කාර්තුවේ දී ආර්ථික වර්ධනය ඉහළයාම නිසා සහ ඉන්ධන කෝටා ක්‍රමය ඉවත් කිරීම නිසා ඉන්ධන සඳහා ඉල්ලුම වැඩිවීම හේතුවෙන් ඉන්ධන ආනයනය ඉහළ යාම ද මෙලෙස සැලකිය යුතු ලෙස ආදායම් ඉහළ යාමට බලපාන ලදී.

දුම්වැටි මඟින් ලද නිෂ්පාදන බදු ආදායම 2023 වසරේ පළමු මාස දහය තුළ වාර්තා වූ රු. බිලියන 99.0 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 89.0 ක් දක්වා සියයට 10.1 කින් පහත වැටුණු අතර, 2023 වසරේ පළමු මාස දහය තුළ දී අළෙවි වූ දුම්වැටි මිලියන 1,992.0 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී අළෙවි වූ දුම්වැටි ප්‍රමාණය මිලියන 1,563.0 දක්වා සියයට 18.7 කින් පහත වැටීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. මෙලෙස දුම්වැටි අලෙවිය පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ 2024 වසරේ ජූලි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි දුම්වැටි සඳහා වන නිෂ්පාදන බද්ද සියයට 20 කින් ඉහළ නැංවීම සහ උද්ධමනයට අනුකූලව දුම්වැටිවල මිළ ගණන් සංශෝධනය කිරීමේ රජයේ ප්‍රතිපත්තිය යටතේ 2024 වසරේ ජනවාරි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි දුම්වැටි මිල සියයට 14 කින් ඉහළ නැංවීමයි. මෝටර් රථ මඟින් ලද නිෂ්පාදන බදු ආදායම ද 2023 වසරේ පළමු මාස දහය තුළ වාර්තා වූ රු. බිලියන 27.8 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 47.5 ක් දක්වා සියයට 71.2 කින් වර්ධනය විය.

**වගුව 2.6 : නිෂ්පාදන බදු/සුරාබදු කාර්යසාධනය**

*රු. මිලි.*

| බදු පදනම | ජන. - ඔක්. 2023 | ජන. - ඔක්. 2024[අ] | වර්ධනය (%) |
|---|---|---|---|
| මත්පැන් | 138,836 | 167,681 | 20.8 |
| දුම්වැටි/දුම්කොළ | 99,042 | 89,040 | -10.1 |
| මෝටර් වාහන | 27,778 | 47,542 | 71.2 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 106,338 | 176,139 | 65.6 |
| අනෙකුත් | 3,746 | 6,414 | 71.2 |
| **එකතුව** | **375,739** | **486,816** | **29.6** |

*මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

*[අ] තාවකාලික*

සුරා බදු ආදායම 2023 වසරේ පළමු මාස දහයේ වූ රු. බිලියන 138.8 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 167.7ක් දක්වා සියයට 20.8 කින් වැඩි විය. සුරා බදු ආදායම ඉහළ ගියද, එය සමස්ත නිෂ්පාදන/ සුරා බදු ආදායමෙන් සියයට 34.4 ක දෙවැනි විශාලම දායකත්වය ලෙස වාර්තා විය. නිෂ්පාදන බදු උද්ධමනය සමඟ ගැලපුම් කිරීමේ ප්‍රතිපත්තියට අනුව, 2024 ජනවාරි මස 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සුරා බදු සියයට 14.0 කින් ඉහළ නංවන ලදී. 2023 වසරේ පළමු මාස දහය තුළ සුරා බදු ආදායම 2024 වසරේ ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 72.9 ක ළඟා කර ගැනීමකි. 2023 වසරේ පළමු මාස දහය තුළ නිෂ්පාදනය වූ නිරපේක්ෂ මධ්‍යසාර ලීටර මිලියන 28.2 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ නිරපේක්ෂ මධ්‍යසාර නිෂ්පාදනය ලීටර මිලියන 27.2 දක්වා සියයට 9.5 කින් අඩු විය. ඉල්ලුමේ විචලනයන් අනුව සැර මත්පැන් නිෂ්පාදනය නිරපේක්ෂ ලීටර මිලියන 15.5 දක්වා සියයට 8.9 කින් අඩුවීමක් ද මෝල්ට් මත්පැන් නිෂ්පාදනය නිරපේක්ෂ ලීටර මිලියන 11.5 ක් දක්වා සියයට 3.6 කින් වැඩිවීමක් ද වාර්තා විය. බලපත්‍රලාභී නිෂ්පාදකයින් සහ ආනයනකරුවන් සඳහා 2022 ජනවාරි මස 03 දින සිට බලපැවැත්වෙන පරිදි ආරක්ෂිත සලකුණු සහ ආරක්ෂිත සලකුණු කළමනාකරණ පද්ධතිය සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වුව ද අපේක්ෂිත ආදායම ලබා ගැනීමට නොහැකි වන පරිදි ව්‍යාජ/ අනුකරණය කරන ලද ස්ටිකර් සොයාගත් අවස්ථා දිවයිනේ බොහෝ ප්‍රදේශවලින් වාර්තා විය.

**රූපසටහන 2.3 : නිෂ්පාදන බදු / සුරාබදු කාර්යසාධනය 2024 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා**




*මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

### සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද

2022 වසරේ ඔක්තෝබර් මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආනයනකරුවන්, නිෂ්පාදකයින්, සේවා සපයන්නන් සහ තොග සහ සිල්ලර වෙළෙන්දන්ගෙන් පිරිවැටුම මත සියයට 2.5 ක සමාජ ආරක්ෂණ දායකත්ව බද්දක් අය කරනු ලැබේ. 2024 වසරේ ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සමාජ ආරක්ෂණ දායකත්ව බද්දට යටත් වාර්ෂික පිරිවැටුමේ සීමාව රු. මිලියන 120 සිට රු. මිලියන 60 දක්වා අඩු කරන ලදී. සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් ලද ආදායම, 2023 වසරේ පළමු මාස දහය තුළ වූ රු. බිලියන 177.9 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ රු. මිලියන 204.1 දක්වා සියයට 14.7 කින් වර්ධනය වූ අතර, එය සමාජ ආරක්ෂණ දායකත්ව බදු ආදායම සඳහා වන 2024 වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 81.6 ක ළඟා කර ගැනීමකි.

### විදුලි සංදේශ බද්ද

විදුලි සංදේශ බද්දෙන් උපයන ලද ආදායම 2023 වසරේ පළමු මාස දහය තුළ වූ රු. බිලියන 15.0 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 13.6 ක් දක්වා සියයට 9.8 කින් අඩු විය.

### රේගු ආනයන බද්ද

රේගු ආනයන බද්දෙන් ලද ආදායම 2023 වසරේ පළමු මාස දහය තුළ වූ රු. බිලියන 77.0 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 89.8 ක් දක්වා සියයට 16.7 කින් වැඩි විය. ආනයනික ද්‍රව්‍ය බොහොමයක් සඳහා පනවා තිබූ ආනයන සීමාවන් ඉවත් කිරීම මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, තීරු බදු නොවන ආනයන බදු ක්‍රමිකව ඉවත් කිරීම මඟින් රාජ්‍ය ආදායමට වන බලපෑම අවම කිරීම සඳහා 2023 වසරේ මාර්තු මස 29 දින සිට ක්‍රියාත්මක වන පරිදි රේගු ආනයන බදු අනුපාත සියයට 0 සහ සියයට 10, සියයට 15 දක්වා සහ සියයට 15 සියයට 20 දක්වා ඉහළ නැංවීම රේගු ආනයන බද්දෙන් ලද ආදායම වැඩි කිරීමට ධනාත්මක ලෙස දායක විය.

**වගුව 2.7 : මෝටර් රථ වාහන ආනයන සහ නව ලියාපදිංචි කිරීම**

*ඒකකය : සංඛ්‍යාව*

| අයිතමය | ආනයන ජන. - ඔක්. | | | | නව ලියාපදිංචි කිරීම ජන.- ඔක්. | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2023 | 2024 | වෙනස | % | 2023 | 2024 | වෙනස | % |
| මෝටර් රථ | 848 | 1,182 | 334 | 39 | 1,505 | 1,405 | -100 | -7 |
| බස් රථ හා මගී වෑන් රථ | 385 | 33 | -352 | -91 | 598 | 120 | -478 | -80 |
| ත්‍රිරෝද රථ | - | 5 | 5 | - | 50 | 70 | 20 | 40 |
| යතුරු පැදි | 4,806 | 15,271 | 10,465 | 218 | 14,698 | 49,463 | 34,765 | 237 |
| භාණ්ඩ ප්‍රවාහන රථ (අ) | 117 | 309 | 192 | 164 | 384 | 1,006 | 622 | 162 |
| ඉඩම් වාහන (ආ) | 2,324 | 4,190 | 1,866 | 80 | 3,024 | 4,175 | 1,151 | 38 |
| අනෙකුත් (ඇ) | 18,362 | 31,692 | 13,330 | 73 | 407 | 855 | 448 | 110 |
| **එකතුව** | **26,842** | **52,682** | **25,840** | **96** | **20,666** | **57,094** | **36,428** | **176** |

*මූලාශ්‍ර :මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව*
*(අ) ලොරි රථ, වෙනත් භාණ්ඩ ප්‍රවාහන වාහන සහ විශේෂිත වාහන*
*(ආ) ට්‍රැක්ටර්, අත් ට්‍රැක්ටර්, ට්‍රේලර් සහ අනෙකුත් ඉඩම් වාහන*
*(ඇ) තනි කැබ් රථ, ද්විත්ව කාර්ය වාහන, ක්‍වාඩ්‍රි සයිකල් (Quadri Cycle) සහ මෝටර් නිවාස*

### විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද

විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දෙන් එකතු කරන ලද ආදායම 2023 වසරේ පළමු මාස දහය තුළ පැවති රු. බිලියන 43.7 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 86.4 ක් දක්වා සියයට 97.7 කින් සැලකිය යුතු ලෙස වැඩි විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ප්‍රධාන ආනයන භාණ්ඩවල ආනයන පරිමාව ඉහළ යාමයි.

**වගුව 2.8 : නිදහස් වෙළෙඳ ගිවිසුම් මගින් ආවරණය වන තීරු බදු සහන යටතේ ආනයනය/අපනයනය කරන ලද භාණ්ඩ හා වටිනාකම්**

| නිදහස් වෙළඳ ගිවිසුම | ජන. - නොවැ. 2024 | | |
|---|---|---|---|
| | තීරුබදු සහන සඳහා යටත්වන නිෂ්පාදන සංඛ්‍යා | ආනයන වටිනාකම (මි.ර.ගැ./ රු. මිලියන) | අපනයන වටිනාකම (නැ.තෙ.මි./ රු. මිලියන) |
| ආසියා - ශාන්තිකර වෙළඳ ගිවිසුම් (APTA) | 808 | 6,401 | 57,999 |
| ඉන්දියා - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) | 5,329 | 94,169 | 135,508 |
| පකිස්ථාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) | 6,200 | 6,653 | 12,877 |
| දකුණු ආසියා නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) | 5,932 | 3,753 | 46,465 |
| සිංගප්පූරු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (SSFTA) | 4,334 | - | 40 |
| **එකතුව** | | **110,976** | **252,889** |

*මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

### වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද

වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්දෙන් එකතු වූ මුළු ආදායම 2023 වසරේ පළමු මාස දහය තුළ වාර්තා වූ රු. බිලියන 142.9 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 143.8 ක් දක්වා සියයට 0.6 කින් වැඩි විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ප්‍රධාන ආනයන භාණ්ඩවල ආනයන පරිමාව ඉහළ යාමයි. වෙළඳාම සහ ආයෝජන වැඩි දියුණු කරන අතරම ආර්ථික තරගකාරිත්වයට සහාය වීම සඳහා තීරු බදු නොවන ආනයන බදු තාර්කිකකරණය කිරීම පිළිබඳ 2023 අයවැය යෝජනාවට අනුව වසර 05 ක් ඇතුළත වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද ඉවත් කිරීමේ අරමුණින් 2023 වසරේ අප්‍රේල් මස 04 දින සිට ක්‍රියාත්මක වන පරිදි වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්දට යටත් මුළු අයිතමවලින් සියයට 20 ක් හෝ අයිතම 1,631 ක වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද ඉවත් කිරීම හේතුවෙන් වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්දෙන් එකතු වූ මුළු ආදායමෙහි සැලකිය යුතු වැඩි වීමක් පෙන්නුම් කිරීමට නොහැකි විය.

### වෙළෙඳ භාණ්ඩ අපනයන සහනාධාර ක්‍රමය යටතේ වන බද්ද (සෙස් බද්ද)

සෙස් බද්දෙන් එකතු වූ ආදායම 2023 වසරේ පළමු මාස දහය තුළ දී වූ රු. බිලියන 45.2 ට සාපේක්ෂව 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 66.8 ක් දක්වා සියයට 47.9 කින් සැලකිය යුතු ලෙස වැඩි විය. බොහෝ ආනයනික භාණ්ඩ සඳහා පනවා තිබූ ආනයන සීමා ඉවත් කිරීම සහ ඇතැම් ආනයනික භාණ්ඩ මත සෙස් බදු ඉහළ නැංවීම මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

**වගුව 2.9 : ජාත්‍යන්තර වෙළදාමෙන් ලද සෙස් බදු ආදායම**

*රු.මිලි.*

| අයිතම | ජන. - ඔක්. | |
|---|---|---|
| | 2023 | 2024[අ] |
| **අපනයන සෙස් බද්ද** | **1,901** | **1,667** |
| තේ - ( බදු සහ අපනයන පාලන) පනත, තේ මණ්ඩල නීති යටතේ | 431 | 394 |
| රබර් - රබර් නැවත වගා කිරීමේ සහනාධාර පනත යටතේ | 5 | 12 |
| පොල් - පොල් සංවර්ධන අධිකාරී පනත යටතේ | 160 | 175 |
| අ.සං.ම. සෙස් බද්ද - ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ | 1,305 | 1,087 |
| **ආනයන සෙස් බද්ද - ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ** | **43,289** | **65,177** |
| **එකතුව** | **45,190** | **66,845** |

*මූලාශ්‍රය: රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

[අ] *තාවකාලික*

### බදු නොවන ආදායම

බදු නොවන ආදායම, 2023 වසරේ පළමු මාස දහය තුළ වූ රු. බිලියන 212.3 ට සපේක්ෂව 2024 වසරේ සමාන කාල පරිච්ඡේදයේ දී රු. බිලියන 255.5 ක් දක්වා සියයට 20.3 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත. බදු නොවන ආදායම සමස්ත ආදායමෙන් සියයට 7.8 ක දායකත්වයක් සපයයි. දඩ, ගාස්තු සහ අයකිරීම්, ලාභ සහ ලාභාංශ සහ පොලී ආදායම්වලින් ලද ආදායම වැඩි වීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය. ඒ අනුව, ප්‍රධාන වශයෙන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සහ පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ ගාස්තු සංශෝධනය හේතුවෙන් සමස්ත බදු නොවන ආදායමෙන් සියයට 48.5 ක දායකත්වයක් ලබා දෙමින් දඩ, ගාස්තු සහ අයකිරීම්වලින් ලද ආදායම 2023 වසරේ පළමු මාස දහය තුළ වූ රු. බිලියන 97.4 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී රු. බිලියන 124.0 ක් දක්වා සියයට 27.4 කින් වර්ධනය වී ඇත. පොලී ආදායම ලෙස ලද බදු නොවන ආදායම 2023 වසරේ පළමු මාස දහය තුළ දී වූ රු. බිලියන 18.0 සිට 2024 වසරේ සමාන කාල පරිච්ඡේදයේ දී රු. බිලියන 43.5 ක් දක්වා සියයට 141.1 කින් සැලකිය යුතු ලෙස වර්ධනය විය. සමාජ ආරක්ෂණ දායකත්වයෙන් ලද බදු නොවන ආදායම ද 2023 වසරේ පළමු මාස දහය තුළ වූ රු. බිලියන 29.6 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාල පරිච්ඡේදයේ දී රු. බිලියන 35.5 ක් දක්වා සියයට 19.9 කින් වැඩි වී ඇත. කෙසේ වුවද, රජය සතු ව්‍යවසායයන්ගෙන්, ලාභ සහ ලාභාංශ ලෙස ලද බදු නොවන ආදායම 2023 වසරේ පළමු මාස දහය තුළ දී වූ රු. බිලියන 36.2 ක සිට 2024 වසරේ සමාන කාල පරිච්ඡේදයේ දී රු. බිලියන 30.5 දක්වා සියයට 15.7 කින් පහත වැටී ඇත. කුලී ගාස්තු වලින් ලද බදු නොවන ආදායම ද 2023 වසරේ පළමු මාස දහය තුළ දී වූ රු. බිලියන 5.0 ක සිට 2024 වසරේ සමාන කාල පරිච්ඡේදයේ දී රු. බිලියන 4.5 දක්වා සියයට 10.3 කින් අඩු වී ඇත. 2024 වසරේ දී රු. බිලියන 287.0 ක් වූ බදු නොවන ආදායමෙහි වාර්ෂික ඇස්තමේන්තුවෙන් 2024 වසරේ පළමු මාස දහය තුළ දී සියයට 89.0 ක ප්‍රතිශතයක් ළඟා කරගෙන ඇත.

## වගුව 2.10 රාජ්‍ය ආදායමේ විචලතා විශ්ලේෂණය

| අයිතමය | රු. බිලි. 2023 ජන - ඔක් | 2024 ඇස්තමේන්තුව | 2024 ජන - ඔක්(අ) | විචලනය සඳහා ප්‍රධාන හේතු |
|---|---|---|---|---|
| ආදායම් බදු | 744.7 | 1,080.0 | 815.6 | වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 75.5 ක් ලඟා කර ගනිමින් පසුගිය වසරට සාපේක්ෂව 2024 වර්ෂයේ මුල් මාස දහය තුළ ආදායම් බදු ආදායම සියයට 9.5 ක වර්ධනයක් ලඟා කරගෙන ඇත. මේ සඳහා ප්‍රධාන වශයෙන් පහත සඳහන් හේතු බලපා ඇත.<br>- 2023 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්ති සංශෝධනයන්හි සම්පූර්ණ බලපෑම 2024 වර්ෂයේ මුල් මාස දහය සඳහා ලඟාකර ගැනීම<br>- රාජ්‍ය හා පෞද්ගලික අංශයේ වැටුප් ඉහළ යාම හා<br>- ආර්ථික ක්‍රියාකාරකම් ක්‍රමයෙන් සාමාන්‍යකරණය වීම<br>- කෙසේ වුවද, පොළී අනුපාතයන් හී පහළයාම මෙම විචලනය සඳහා සෘණාත්මකව බලපා ඇත. |
| එකතු කල අගය මත බද්ද | 571.5 | 1,400.0 | 1,067.4 | එකතු කළ අගය මත බදු ආදායම වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 76.2 ක් ලඟා කරගනිමින් පසුගිය වර්ෂයේ සමාන කාලයට සාපේක්ෂව 2024 වර්ෂයේ ජනවාරි - ඔක්තෝබර් දක්වා කාලය තුළ සියයට 86.8 ක සැලකියයුතු වර්ධනයක් අත්කරගෙන ඇත. මෙම ලඟා කරගැනීම සඳහා පහත සඳහන් හේතු ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.<br>- එකතු කළ අගය මත බදු අනුපාතය ඉහළ දැමීම<br>- එකතුකළ අගයමතවූබද්ද සඳහාලියාපදිංචිවීමේසීමාව පහත දැමීම<br>- වැට් බදු නිදහස් කිරීම්වලින් අතිමහත් බහුතරයක් ඉවත් කිරීම සහ<br>- ආනයන සියයට 10.7 කින් ඉහළ යාම |
| නිෂ්පාදන/ සුරා බදු | 375.7 | 545.0 | 486.8 | පෙර වර්ෂයේ සමාන කාලය හා සැසදීමේ දී නිෂ්පාදන බදු ආදායම 2024 වර්ෂයේ මුල් මාස දහය තුළ සියයට 29.6 කින් වර්ධනය වී ඇත. එය වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 89.3 ක ලඟාකර ගැනීමකි. මෙම කාර්සාධනය සඳහා පහත සඳහන් හේතු මූලික වශයෙන් බලපා ඇත.<br>- සියලු වර්ගවල පෙට්‍රල් සහ ඩීසල් ආනයනය කිරීමේ දී අදාළ වන නිෂ්පාදන බද්ද වැඩිකිරීම සහ පිරිපහදු කළ ඛනිජ තෙල් ආනයනය වැඩි වීම හේතුවෙන් ඛනිජ තෙල් මත වූ නිෂ්පාදන බදු ආදායම ආදායම වැඩිවීම.<br>- නිශ්චිත යෝජනා ක්‍රමයන් යටතේ මෝටර් රථ වාහන ආනයනය වැඩිවීමත් සමඟ මෝටර් රථ වාහන සඳහා වන නිෂ්පාදන බදු ආදායම ඉහළ යාම.<br>- 2023 ජූලි මාසයේ දී ක්‍රියාත්මක කරන ලද සුරාබදු අනුපාත සංශෝධනයන් හී සම්පූර්ණ බලපෑම සහ උද්ධමනයට ගැළපෙන පරිදි සුරාබදු අනුපාත ගැළපීම හේතුවෙන් මත්පැන් සඳහා වන සුරාබදු ආදායම ඉහළයාම.<br>- කෙසේ වුවද, නිෂ්පාදන බදු අනුපාත ඉහළ දැමීමෙහි ප්‍රතිඵලයක් ලෙස පහළ ගිය සිගරට් අලෙවිය මෙම විචලනය සඳහා සෘණාත්මකව බලපා ඇත. |
| ආනයන බදු | 77.0 | 175.0 | 89.8 | පෙර වර්ෂයේ සමාන කාලය හා සැසඳීමේදී 2024 වර්ෂයේ මුල් මාස දහය තුළ ආනයන බදු ආදායම සියයට 16.7 කින් ඉහළ ගොස් ඇති අතර, ආනයන බදු ආදායම වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 51.3 ක් ලඟා කරගෙන ඇත. මේ සඳහා ප්‍රධන වශයෙන්;<br>- ආනයන බදු ඉහළ දැමීමේ බලපෑම හා<br>- 2024 වර්ෂයේ මුල් මාස දහය තුළ සමස්ත ආනයන සියයට 10.7 කින් වැඩි වීම මේ සඳහා බලපා ඇත. |

| අයිතමය | රු. බිලි. 2023 ජන - ඔක් | 2024 ඇස්තමේන්තුව | 2024 ජන - ඔක්(අ) | විචලනය සඳහා ප්‍රධාන හේතු |
|---|---|---|---|---|
| වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්ද | 142.9 | 175.0 | 143.8 | වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු ආදායම පහත සඳහන් හේතු මධ්‍යයේ වුවද සියයට 0.6 ක ආන්තික වර්ධනයක් ලබාකරගෙන ඇත.<br>- වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු ක්‍රමිකව ඉවත් කිරීමේ එක් අදියරක් ලෙස 2023 වර්ෂයේ අප්‍රේල් මස හතර වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්දට යටත් වන අයිතම වලින් සියයට 20 ක් නිදහස් කිරීම සහ<br>- 2024 වසරේ මාර්තු මස 29 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි සිංගප්පූරු- ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුමේ විධිවිධානවලට අනුකූලව සිංගප්පූරුවෙන් භාණ්ඩ ආනයනය කරනු ලබන අවස්ථාවේ දී භාණ්ඩ වර්ග 595 ක් වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බද්දෙන් ඉවත් කිරීම හා තවත් භාණ්ඩ වර්ග 3,117 ක් සඳහා සහනදායී අනුපාත හඳුන්වා දීම.<br>- 2024 වර්ෂයේ මුල් මාස දහය තුළ ආනයන ප්‍රමාණය ඉහළයැමේ බලපෑම හේතුවෙන් වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු ආදායම වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 82.2 ක් ලබා කරගෙන ඇත. |
| විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද | 43.7 | 95.0 | 86.4 | වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් සියයට 91.0 ක් ලබා කරගනිමින් 2024 වර්ෂයේ මුල් මාස දහය තුළ විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මගින් ලද ආදායම රුපියල් බිලියන 86.4 දක්වා සියයට 97.7 කින් වර්ධනය වී ඇත. මේ සඳහා<br>- අර්තාපල් හා සීනි සඳහා වූ බදු අනුපාත ඉහළ දැමීම හා<br>- ප්‍රධාන පාරිභෝගික භාණ්ඩ ආනයන ඉහළ යාම ප්‍රධාන වශයෙන් බලපා ඇත. |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | 177.9 | 250.0 | 204.1 | සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද මගින් ලද ආදායම වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් සියයට 81.6 ක් ලබා කර ගැනීමට සමත් වී ඇති අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන්<br>- 2024 ජනවාරි මස පළමුවන දින සිට ක්‍රියාත්මක වන පරිදි සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා ලියාපදිංචි වීමේ සීමාව වර්ෂයකට රුපියල් මිලියන 120 සිට වර්ෂයකට රුපියල් මිලියන 60 දක්වා පහත දැමීම නිසා බදු ගෙවන්නන් ප්‍රමාණය වැඩිවීම සහ<br>- 2024 වර්ෂයේ මුල් මාස දහය තුළ ආනයන ඉහළ යාමේ බලපෑම හේතු වී ඇත. |
| වෙනත් බදු | 79.0 | 100.0 | 106.4 | 2024 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් සියයට 106.4 ක් ලබා කර ගනිමින් අනෙකුත් බදු මගින් ලද ආදායම රු. බිලියන 106.4 දක්වා සියයට 34.6 කින් වැඩි වී ඇති අතර මේ සඳහා ප්‍රධාන වශයෙන්<br>- ආනයන ඉහළයාම හේතුවෙන් සෙස් බදු මගින් ලද ආදායම සියයට 47.9 කින් වැඩිවීම; සහ<br>- අනෙකුත් බදු මගින් ලද ආදායම සියයට 39.3 කින් වැඩිවීම හේතු වී ඇත.<br>- කෙසේ වුවද, විදුලි සංදේශ බද්ද මගින් ලද අඩු ආදායම මෙම කාර්යසාධනය සඳහා අහිතකර ලෙස බලපා ඇත. |
| බදු නොවන ආදායම | 212.3 | 287.0 | 255.5 | පොලී ආදායම, සමාජ ආරක්ෂණ දායකත්ව ආදායම සහ දඩ, අයකිරීම් හා ගාස්තු ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු කොට ගෙන බදු නොවන ආදායම් මගින් ලද ආදායම සියයට 20.3 කින් සැළකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත.<br>ඒ අනුව, 2024 වසරේ පළමු මාස දහය තුළ බදු නොවන ආදායම මගින් ලද ආදායම 2024 වසරේ ආදායම් ඇස්තමේන්තුවෙන් සියයට 89.0 ක් ලබා කරගෙන ඇත. |
| එකතුව | **2,424.8** | **4,107.0** | **3,255.7** | |

*රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලදී.*

විශේෂ සටහන 2.1 ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ක්‍රියාමාර්ග : 2024 ජනවාරි සිට 2025 ජනවාරි දක්වා

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| **ආදායම් බද්ද - 2017 අංක 24 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත** | |
| 2024.04.01 | 2024.03.21 දිනැති අංක 2376/25 දරන ගැසට් නිවේදනය<br>- රාජ්‍ය ආයතන ඇතුළු පුද්ගලයන් විසින් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් (CGIR) වෙත නිතිපතා ලබාදිය යුතු තොරතුරු නියම කිරීම. |
| **2010 අංක 17 දරන කැසිනෝ ව්‍යාපාර (නියාමනය කිරීමේ) පනත** | |
| 2024.01.12 | 2024.01.12 දිනැති අංක 2366/33 දරන ගැසට් නිවේදනය<br>- 2022 අංක 1 දරන කැසිනෝ ව්‍යාපාර බලපත්‍ර රෙගුලාසියේ 5 වැනි වගන්තියට ආදේශ කිරීම සහ එහි දක්වා ඇති බලපත්‍ර ගාස්තු සහ බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු ව්‍යුහයන් සංශෝධනය කරමින් II වන උපලේඛනයක් ඇතුළත් කිරීම. |
| 2024.02.02 | 2024.02.02 දිනැති අංක 2369/42 දරන ගැසට් නිවේදනය<br>- රෙගුලාසියෙහි II උපලේඛනයේ දක්වා ඇති බලපත්‍ර ගාස්තු සහ බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු හා සම්බන්ධ ආයෝජන නිර්ණායක සංශෝධනය කිරීම. |
| 2024.04.22 | 2024.04.22 දිනැති අංක 2381/16 දරන ගැසට් නිවේදනය<br>- 2024 ජනවාරි 12 දිනැති අංක 2366/33 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ සහ 2024 පෙබරවාරි 02 දිනැති අංක 2369/42 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයේ සිංහල පරිවර්තන දෝෂ සංශෝධනය කිරීම. |
| 2024.05.29 | 2024.05.29 දිනැති අංක 2386/09 දරන ගැසට් නිවේදනය<br>- රෙගුලාසියෙහි II උපලේඛනයේ දක්වා ඇති බලපත්‍ර ගාස්තු සහ බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තු හා සම්බන්ධ ආයෝජන නිර්ණායක සංශෝධනය කිරීම. |
| **සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද - 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත** | |
| 2024.01.01 | 2024 අංක 15 දරන සමාජ ආරක්ෂණ දායකත්ව (සංශෝධන) බදු පනත<br>- සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) සඳහා අදාළ වන ලියාපදිංචි සීමාව වසරකට රු. මිලියන 120 සිට රු. මිලියන 60 දක්වා අඩු කිරීම. |
| **එකතු කළ අගය මත බද්ද - 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත** | |
| 2024.01.01 | 2023.12.19 දිනැති අංක 2363/22 දරන ගැසට් නිවේදනය<br>- එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 15 සිට සියයට 18ක් දක්වා වැඩි කිරීම. |
| 2024.01.01 | 2023 අංක 32 දරන එකතු කළ අගය මත (සංශෝධන) බදු පනත<br>- ප්‍රධාන අයිතම සඳහා අදාළ වන එකතු කළ අගය මත බදු නිදහස් කිරීම් බොහොමයක් ඉවත් කිරීම. |
| 2024.01.01 | 2024 අංක 16 දරන එකතු කළ අගය මත (සංශෝධන) බදු පනත<br>- එකතු කළ අගය මත බදු සඳහා වන ලියාපදිංචි සීමාව වසරකට රු. මිලියන 80 සිට වසරකට රු. මිලියන 60ක් දක්වා අඩු කිරීම. |
| **නිෂ්පාදන බද්ද - 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත** | |
| 2024.01.01 | 2023.12.31 දිනැති අංක 2364/36 දරන ගැසට් නිවේදනය<br>- සුවිගත කිරීමක් මත ඒකක අනුපාත සහිත බදු අයකළ හැකි සියලුම භාණ්ඩ වල නිෂ්පාදන බද්ද සියයට 14 කින් සංශෝධනය කිරීම සහ පෙට්‍රල් ලීටරයක නිෂ්පාදන බද්ද රුපියල් 5කින් සහ ඩීසල් ලීටරයක නිෂ්පාදන බද්ද රුපියල් 6කින් අඩු කිරීම. |
| 2025.01.11 | 2025.01.10 දිනැති අංක 2418/43 දරන ගැසට් නිවේදනය<br>- වාර්ෂික උද්ධමන ගැළපුම් දර්ශක මත පදනම්ව ඒකක අනුපාත සහිත බදු අයකළ හැකි සියලුම භාණ්ඩ වල (පෙට්‍රල් සහ ඩීසල් හැර ) නිෂ්පාදන බද්ද සියයට 5.9 කින් වැඩි කිරීම. |

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| 2025.02.01 | 2025.01.31 දිනැති අංක 2421/42 දරන ගැසට් නිවේදනය<br>- විදුලි වාහන සඳහා වන නිෂ්පාදන බද්ද වැඩි කිරීම. |
| **සුරා බද්ද - සුරාබදු ආඥා පනත (52 වන අධිකාරය)** | |
| 2024.01.01 | සුරාබදු නිවේදන අංක 04/2023 (2023.12.31 දිනැති අංක 2364/35 දරන ගැසට් නිවේදනය)<br>- සුරාබදු සඳහා වාර්ෂික උද්ධමන ගැලපීමක් හඳුන්වාදීමේ අරමුණ ඇතිව සියලු වර්ගවල මත්පැන් සඳහා සුරා බද්ද සියයට 14 කින් වැඩි කිරීම. |
| 2024.01.12 | සුරාබදු නිවේදන අංක 01/2024 (2024.01.12 දිනැති අංක 2366/38 දරන ගැසට් නිවේදනය)<br>- වාර්ෂික සුරාබදු බලපත්‍ර ගාස්තු සංශෝධනය කිරීම. |
| 2024.01.12 | සුරාබදු නිවේදන අංක 02/2024 (2024.01.12 දිනැති අංක 2366/39 දරන ගැසට් නිවේදනය)<br>- සුරාබදු නිවේදන අංක 902 හි විධිවිධාන සංශෝධනය කිරීම. |
| 2024.02.01 | සුරාබදු නිවේදන අංක 03/2024 (2024.02.01 දිනැති අංක 2369/32 දරන ගැසට් නිවේදනය)<br>- වාර්ෂික සුරාබදු බලපත්‍ර ගාස්තු සංශෝධනය කිරීම සහ කර්මාන්ත ප්‍රවේශය සඳහා එක් වරක් පමණක් ගෙවිය යුතු ගාස්තු හඳුන්වා දීම. |
| 2024.08.13 | සුරාබදු නිවේදන අංක 05/2024 (2024.08.13 දිනැති අංක 2397/22 දරන ගැසට් නිවේදනය)<br>- සුරාබදු නිවේදන අංක 666 හි විධිවිධාන සංශෝධනය කිරීම. |
| 2025.01.11 | සුරාබදු නිවේදන අංක 01/2025 (2025.01.10 දිනැති අංක 2418/42 දරන ගැසට් නිවේදනය)<br>- වාර්ෂික උද්ධමන ගැලපුම් දර්ශක මත පදනම්ව මත්පැන් මත සුරා බද්ද සියයට 5.9 කින් වැඩි කිරීම. |
| **වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බද්ද - 2011 අංක 18 දරන වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු පනත** | |
| 2024.01.01 | 2023.12.31 දිනැති අංක 2364/37 දරන ගැසට් නිවේදනය<br>- 2023 වසරේ අයවැය යෝජනා අංක 34.6 අනුව වසර පහක් ඇතුලත වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බද්ද සම්පූර්ණයෙන් ඉවත් කළ යුතු බැවින් පෙට්‍රල්, ඩීසල් සහ පොහොර ඇතුළු අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය 26ක වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බද්ද ඉවත් කිරීම. (තීරු බදු නොවන ආනයන බදු පියවරෙන් පියවර ඉවත් කිරීම). |
| 2024.03.29 | 2024.03.28 දිනැති අංක 2377/39 දරන ගැසට් නිවේදනය<br>- ශ්‍රී ලංකා-සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුමේ (SLSFTA) විධිවිධාන අනුව, අයිතම 3,117ක් සඳහා සහනදායී මිල ගණන් යෙදීමට සහ සිංගප්පූරුවෙන් එම භාණ්ඩ ආනයනය කිරීමේදී භාණ්ඩ 595ක් නිදහස් කිරීම. |
| **සෙස් බද්ද - 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත** | |
| 2024.01.06 | 2024.01.04 දිනැති අංක 2365/50 දරන ගැසට් නිවේදනය<br>- ශ්‍රී ලංකා සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම (SLSFTA) යටතේ සෙස් බද්දට අදාළ තීරුබදු ලිහිල්කරණ වැඩසටහන (TLP) ප්‍රකාශයට පත් කිරීම. |
| 2024.09.06 | 2024.09.05 දිනැති අංක 2400/25 දරන ගැසට් නිවේදනය<br>- 2024.08.26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක 24/1709/631/026-I සහ 2024.08.12 දිනැති අංක 24/1541/622/002- II දරන අමාත්‍ය මණ්ඩල තීරණ අනුව සෙස් බද්ද සංශෝධනය කිරීම පිළිබඳ ගැසට් නිවේදනය නිකුත් කිරීම. |
| **බදු නොවන (ගාස්තු සහ අය කිරීම්)- 2021 අංක 19 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභා පනත** | |
| 2024.02.01 | 2024.01.12 දිනැති අංක 2366/34 දරන ගැසට් නිවේදනය<br>- වෙළෙඳපොළ අතරමැදියන් සහ වෙළෙඳපොළ ආයතන සඳහා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් අය කරනු ලබන ගාස්තු සහ අය කිරීම් සංශෝධනය කිරීම. |

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| **බදු නොවන (ගාස්තු සහ අය කිරීම්)- 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනත** | |
| 2024.12.23 | 2024.12.22 දිනැති අංක 2415/79 දරන ගැසට් නිවේදනය<br>- ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාවට රක්ෂණ කර්මාන්ත නියාමනය සහ අධීක්ෂණය කිරීම සඳහා වන වියදම් පියවා ගැනීමට හැකි වන පරිදි රක්ෂණකරුවන් සඳහා අදාළ වන වාර්ෂික ගාස්තු රක්ෂණ ව්‍යාපාරවල දළ ලිඛිත වාරිකයෙන් සියයට 0.125 සිට සියයට 0.2 දක්වා වැඩි කිරීම. |
| **රේගු ආනයන බද්ද - 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත** | |
| 2024.01.06 | ආදායම් සංරක්ෂණ ආඥා අංක 06/2023 (2024.01.04 දිනැති අංක 2365/51 දරන ගැසට් නිවේදනය)<br>- ශ්‍රී ලංකා සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ තීරුබදු 1,222 ක රේගු ආනයන තීරුබදු ලිහිල් කිරීමේ වැඩසටහනේ (TLP) “6” කාණ්ඩය යටතේ වාර්ෂික වාරික හයෙන් දෙවන වාරිකය ඉවත් කිරීම. |
| 2025.01.27 | ආදායම් සංරක්ෂණ ආඥා අංක 01/2025 (2025.01.27 දිනැති අංක 2421/05 දරන ගැසට් නිවේදනය)<br>- 2023.03.24 දිනැති අංක 2324/49 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇති නිදහස් කිරීම් ලැයිස්තුවෙන් අංක 33 අයිතමය ඉවත් කිරීම. |
| **රේගු අධිභාරය - රේගු ආඥාපනත (235 වන අධිකාරය)** | |
| 2025.02.01 | 2025.01.31 දිනැති අංක 2421/43 දරන ගැසට් නිවේදනය<br>- මෝටර් වාහන ආනයනය සඳහා ආනයන බදු මත අධිභාරයක් පැනවීම. |
| **විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද - 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත** | |
| 2024.01.02 | 2024.01.02 දිනැති අංක 2365/04 දරන ගැසට් නිවේදනය<br>- 2024 ජනවාරි මස 02 වැනි දින සිට 21 වැනි දින දක්වා බලපැවැත්වෙන පරිදි සහල් ආනයනය මත කිලෝ ග්‍රෑමයකට රු. 64/-ක බදු සහනයක් සැලසීම. |
| 2024.01.08 | 2024.01.07 දිනැති අංක 2365/84 දරන ගැසට් නිවේදනය<br>- 2024 දෙසැම්බර් මස 31 දින දක්වා අර්තාපල් ආනයනය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අඛණ්ඩව පවත්වාගෙන යාම. |
| 2024.02.20 | 2024.02.19 දිනැති අංක 2372/06 දරන ගැසට් නිවේදනය<br>- බඩ ඉරිඟු, උඳු සහ මුං ඇට ආනයනය මත පවතින විශේෂ වෙළඳ භාණ්ඩ බද්දේ වලංගු කාලය දීර්ඝ කිරීමටත්, එහිදී කව්පි සහ කුරක්කන් මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝ ග්‍රෑමයකට රු.70/- සිට රු. 300/- දක්වා වැඩි කිරීම. |
| 2024.03.02 | 2024.03.01 දිනැති අංක 2373/42 දරන ගැසට් නිවේදනය<br>- 2024 අප්‍රේල් මස 11 දින දක්වා රාමසාන් උත්සව සමය පිළිබඳ සළකා රටඉඳි ආනයනය මත කිලෝ ග්‍රෑමයකට රු. 199/-ක බදු සහනයක් සැළසීම. |
| 2024.03.27 | 2024.03.26 දිනැති අංක 2377/17 දරන ගැසට් නිවේදනය<br>- උත්සව සමය පිළිබඳ සළකා අනෙකුත් එළඹු ආනයනය සඳහා කිලෝ ග්‍රෑමයකට රු. 10/-ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දේ සහනදායී බදු අනුපාතයක් අය කිරීම සහ 2024.01.02 සිට 2024.01.21 දක්වා සහල් ආනයනය මත කිලෝ ග්‍රෑමයකට රු. 64/-ක බදු සහනයක් සැළසීම. |
| 2024.05.18 | 2024.05.17 දිනැති අංක 2384/31 දරන ගැසට් නිවේදනය<br>- 2024 දෙසැම්බර් 31 දක්වා තවත් වසරක කාලයක් සඳහා අයිතම 34ක් සඳහා පනවා ඇති විශේෂ වෙළඳ භාණ්ඩ බද්දේ වලංගු කාලය දීර්ඝ කිරීම. |

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| 2024.07.31 | 2024.07.31 දිනැති අංක 2395/32 දරන ගැසට් නිවේදනය<br>- 2024 දෙසැම්බර් 31 දක්වා ඖෂධ නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ලුණු ආනයනය මත තීරුබදු නිදහස් කිරීම අඛණ්ඩව පවත්වාගෙන යාම සහ භාණ්ඩ 6ක් සඳහා වලංගු කාලය දීර්ඝ කිරීම. |
| 2024.10.03 | 2024.10.02 දිනැති අංක 2404/19 දරන ගැසට් නිවේදනය<br>- දේශීය අස්වනු නෙලීමේ කාලය සැලකිල්ලට ගනිමින් අර්තාපල් සහ බොම්බයි ළූණු ආනයනය කිරීම මත විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද පිළිවෙලින් කිලෝ ග්‍රෑමයකට රු.60/-ක් හා රු.30/- ක් බැගින් වැඩි කිරීම. |
| 2024.10.14 | 2024.10.14 දිනැති අංක 2406/02 දරන ගැසට් නිවේදනය<br>- මාළු, උම්බලකඩ, පරිප්පු, මැන්ගුස් සහ කිවි පළතුරු ආනයනය සඳහා පවතින විශේෂ වෙළඳ භාණ්ඩ බද්දේ වලංගු කාලය 2024 දෙසැම්බර් මස 31 දින දක්වා දීර්ඝ කිරීම සහ දේශීය ටින් මාළු කර්මාන්තයේ භාවිතය සඳහා මැකරල් මාළු ආනයනය සඳහා තීරු බදු සහනය දීර්ඝ කිරීම. |
| 2024.12.02 | 2024.11.01 දිනැති අංක 2408/15 දරන ගැසට් නිවේදනය<br>- 2024 දෙසැම්බර් මස 31 දින දක්වා ආනයනික සුදු සීනි මත රු. 50/- ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද අඛණ්ඩව පවත්වාගෙන යාම. |
| 2024.12.01 | 2024.11.30 දිනැති අංක 2412/38 දරන ගැසට් නිවේදනය<br>- ආනයනික අර්තාපල් සඳහා පනවා ඇති විශේෂ වෙළඳ භාණ්ඩ බදු අනුපාතය අඛණ්ඩව පවත්වාගෙන යාම සහ 2024 දෙසැම්බර් මස 31 දක්වා ආනයනික ලොකු ළූණු සඳහා පනවා ඇති විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝ ග්‍රෑමයකට රු. 30/- සිට රු. 10/- දක්වා අඩු කිරීම. |
| 2025.01.01 | 2024.12.31 දිනැති අංක 2417/20 දරන ගැසට් නිවේදනය<br>- 2025 ජනවාරි මස 01 සිට 2025 දෙසැම්බර් මස 31 දක්වා කාලසීමාවක් සඳහා විශේෂ වෙළඳ භාණ්ඩ බද්දට යටත්ව අයිතම 63 ක් ඇතුළත් කර තනි ගැසට් පත්‍රයක් ප්‍රකාශයට පත් කිරීම. |
| 2025.01.28 | 2025.01.27 දිනැති අංක 2421/03 දරන ගැසට් නිවේදනය<br>- 2025 මාර්තු මස 03 දින දක්වා රාමසාන් උත්සව සමය පිළිබඳ සළකා රටඉඳි ආනයනය මත කිලෝ ග්‍රෑමයකට රු. 199/-ක බදු සහනයක් සැලසීම. |
| **ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි - 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත** | |
| 2024.01.11 | 2024 අංක 01 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2024.01.11 දිනැති අංක 2366/19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය )<br>- රාජ්‍ය ආයතන කිහිපයක නිශ්චිත අවශ්‍යතා සපුරාලීම සඳහා තාවකාලිකව අත්හිටුවා ඇති, තෝරාගත් මෝටර් රථ වර්ග ආනයනය කිරීම සඳහා අවසර ලබා දීම. |
| 2024.02.07 | 2024 අංක 02 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2024.02.07 දිනැති අංක 2370/15 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය )<br>- 2023 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසිවල (2023.01.01 දිනැති අංක 2312/78 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති) අංක 12 (අ) රෙගුලාසිය සංශෝධනය කිරීම මගින් විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකිකයන් සඳහා පූර්ණ විදුලි වාහන ආනයනය කිරීමට අවසර දී ඇති කාලය 2024.08.31 දක්වා දීර්ඝ කිරීම.* |
| 2024.02.19 | 2024 අංක 03 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2024.02.19 දිනැති අංක 2372/04 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය )<br>- අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද "අනුමත ව්‍යවසායයක්" සඳහා සැකසීම සහ ප්‍රති-අපනයන අරමුණු උදෙසා, 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල (2023.01.01 දිනැති අංක 2312/77 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති) V වන උපලේඛනයේ වර්ගීකරණය කොට ලැයිස්තුගත කර ඇති තෝරාගත් කුළුබඩු (උදා: ගම්මිරිස්, සාදික්කා, සහ වසාවාසි ආදිය) ආනයනය කිරීමට අවසර දීම.** |

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| 2024.02.29 | 2024 අංක 04 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2024.02.28 දිනැති අංක 2373/28 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය )<br>- පිළිගැනීම් මත ලේඛන (DA) සහ ගෙවීම් මත ලේඛන (DP) ගෙවීම් ක්‍රමවල පූර්ව අනුමත කිරීමේ අවශ්‍යතාවයට අදාළ 2022 අංක 07 දරන ආනයන පාලන රෙගුලාසිවල (2024.05.06 දින අංක 2278/21 අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති) අංක 6 දරන රෙගුලාසිය ඉවත් කිරීම. |
| 2024.03.19 | 2024 අංක 05 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2024.03.19 දිනැති අංක 2376/14 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය )<br>- රාජ්‍ය ආයතන කිහිපයක නිශ්චිත අවශ්‍යතා සපුරාලීම සඳහා, තාවකාලිකව අත්හිටුවන ලද තෝරාගත් මෝටර් රථ ආනයනය කිරීමට අවසර දීම. |
| 2024.04.08 | 2024 අංක 06 දරන ආනයන සහ අපනයන (පාලන) රෙගුලාසි (2024.04.08 දිනැති අංක 2379/03 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය )<br>- ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව (STC), ජාතික ආහාර ප්‍රවර්ධන මණ්ඩලය සහ ශ්‍රී ලංකා හදබිම අධිකාරිය සඳහා 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල (2023.01.01 දිනැති අංක 2312/77 අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති) V වන උපලේඛනයේ වර්ගීකරණය කොට ලැයිස්තුගත කර ඇති උඳු මෙට්‍රික් ටොන් 2,000ක් ආනයනය කිරීමට අවසර දීම. |
| 2024.05.17 | 2024 අංක 07 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2024.05.17 දිනැති අංක 2384/34 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- සංචාරක අංශය සඳහා, තාවකාලිකව අත්හිටුවන ලද තෝරාගත් මෝටර් රථ ආනයනය කිරීමට අවසර දීම. |
| 2024.05.17 | 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ වන ප්‍රමිතිකරණ සහ තත්ත්ව පාලන රෙගුලාසි (2024.05.17 දිනැති අංක 2384/35 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- තෝරාගත් ආනයනික භාණ්ඩ සඳහා ශ්‍රී ලංකා ප්‍රමිති නියම කිරීම. |
| 2024.06.06 | 2024 අංක 08 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2024.06.06 දිනැති අංක 2387/35 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද "අනුමත ව්‍යවසායයක්" සඳහා සැකසීම සහ ප්‍රති-අපනයන අරමුණු උදෙසා, 2023 අංක 01 විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල (2023.01.01 දින අංක 2312/77 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති) V වන උපලේඛනයේ වර්ගීකරණයකොට ලැයිස්තුගත කර ඇති පුවක් ආනයනය කිරීමට අවසර දීම. ** |
| 2024.06.28 | 2024 අංක 09 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2024.06.28 දිනැති අංක 2390/19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- ආහාරයට ගත හැකි තෝරාගත් ධාන්‍ය සඳහා ආනයන පාලන බලපත්‍ර (ICL) අවශ්‍යතාවය ඉවත් කිරීම සහ මිනිසුන් රහිත ගුවන් යාත්‍රා සඳහා ආනයන පාලන බලපත්‍ර (ICL) අවශ්‍යතාවය පැනවීම. |
| 2024.07.18 | 2024 අංක 10 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2024.07.18 දිනැති අංක 2393/36 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද "අනුමත ව්‍යවසායයක්" සඳහා සැකසීම සහ ප්‍රති-අපනයන අරමුණු උදෙසා, 2023 අංක 01 දරන විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල (2023.01.01 දිනැති අංක 2312/77 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කර ඇති) V වන උපලේඛනයේ වර්ගීකරණය කොට ලැයිස්තුගත කර ඇති තෝරාගත් කුළුබඩු (උදා: ගම්මිරිස්, සාදික්කා සහ වසාවාසි, ආදිය) ආනයනය කිරීමට අවසර දීම. |

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| 2024.08.21 | 2024 අංක 11 දරන ගෙවීම් ක්‍රම සඳහා වූ ආනයන පාලන රෙගුලාසි (2024.08.21 දිනැති අංක 2398/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- 2021 අංක 11 දරන කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනතේ විධිවිධානවල අර්ථය තුළ බලයලත් පුද්ගලයන්ට විවෘත ගිණුම් ගෙවීම් ක්‍රමය යටතේ භාණ්ඩ ආනයනය කිරීමට අවසර දීම. |
| 2024.09.11 | 2024 අංක 12 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2024.09.11 දිනැති අංක 2401/21 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- අමාත්‍ය මණ්ඩලය විසින් නිසි පරිදි අනුමත කරන ලද ගිවිසුම් සහිතව ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන මෝටර් රථ එකලස් කිරීමේ ව්‍යාපෘති සඳහා නවතම අර්ධ වශයෙන් එකලස් කළ (SKD) කට්ටල ආනයනය කිරීමට අවසර දීම. |
| 2024.12.04 | 2024 අංක 13 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2024.12.04 දිනැති අංක 2413/37 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- සහල් ආනයනය සඳහා වන ආනයන පාලන බලපත්‍ර (ICL) අවශ්‍යතාවය, 2024 දෙසැම්බර් 20 වන දින දක්වා ඉවත් කිරීම.* |
| 2024.12.18 | 2024 අංක 14 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2024.12.18 දිනැති අංක 2415/35 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- පොදු ප්‍රවාහන කටයුතු සඳහා යොදා ගන්නා රථ, විශේෂ කාර්යයන් සඳහා යොදා ගන්නා රථ සහ අනෙකුත් මෝටර් එන්ජින් භාවිතා නොවන අයිතම ආනයනය කිරීමට අදාළ තාවකාලික ආනයන අත්හිටුවීම ඉවත් කිරීම. |
| 2024.12.24 | 2024 අංක 15 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2024.12.24 දිනැති අංක 2416/11 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- 2024.12.04 දිනැති අංක 2413/37 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සිදු කරන ලද සහල් ආනයනය සඳහා වන ආනයන පාලන බලපත්‍ර (ICL) අවශ්‍යතාවය ඉවත් කිරීම, 2025 ජනවාරි මස 10 වන දින දක්වා අඛණ්ඩව සිදු කිරීම.* |
| 2025.01.28 | 2025 අංක 01 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2025.01.27 දිනැති අංක 2421/04 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- වාණිජමය හෝ භාණ්ඩ ප්‍රවාහන කාර්යයන් සඳහා යොදා ගන්නා වාහන ආනයනය කිරීමට අදාළ තාවකාලික ආනයන අත්හිටුවීම ඉවත් කිරීම.* |
| 2025.02.01 | 2025 අංක 02 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි (2025.01.31 දිනැති අංක 2421/44 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)<br>- පුද්ගලික භාවිතය සඳහා යොදා ගන්නා මෝටර් වාහන (කාර්, වෑන්, සපෝර්ට් යුටිලිටි වාහන ආදිය) ආනයනය කිරීමට අදාළ තාවකාලික ආනයන අත්හිටුවීම ඉවත් කිරීම සහ උපරිම වයස් සීමාවන් ඉක්මවන මෝටර් රථ සඳහා ආනයන පාලන බලපත්‍ර (ICL) අවශ්‍යතාවය පැනවීම. |
| **අපගමන බද්ද - 2003 අංක 25 දරන මුදල් පනත** | |
| 2024.02.01 | 2024.02.01 දිනැති අංක 2369/27 දරන ගැසට් නිවේදනය<br>- කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපල-රත්මලානෙන් සහ යාපනය ජාත්‍යන්තර ගුවන් තොටුපලින් ගුවන් ගමන් මෙහෙයුම් ආරම්භ කර, ගුවන් යානා මගින් ශ්‍රී ලංකාවෙන් පිටවන පුද්ගලයන් සඳහා, අදාළ වන අපගමන බද්ද වන ඇ.එ.ජ. ඩොලර් 60න් ඇ.එ.ජ. ඩොලර් 30ක සහනදායී අනුපාතයක් ලබාදීම වසරක කාලයක් දක්වා දීර්ඝ කිරීම. |

| ක්‍රියාත්මක වන දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| 2024.03.07 | 2024.03.06 දිනැති අංක 2374/19 දරන ගැසට් නිවේදනය<br>- 2024 මාර්තු මස 07 දින සිට 2026 දෙසැම්බර් මස 31 දින දක්වා ක්‍රියාත්මක වන පරිදි වසර තුනක පමණ කාලයක් සඳහා ඇ.එ.ජ. ඩොලර් 60/-ක බද්ද වෙනුවට, මගී යාත්‍රා ප්‍රවාහනය මඟින් ශ්‍රී ලංකාවෙන් පිටව යන මගියෙකුගෙන් අය කරන අපගමන බද්ද ඇ.එ.ජ. ඩොලර් 5/-ක් ලෙස සහනදායී අනුපාතයක් සහ මගී නෞකාවක් මඟින් ශ්‍රී ලංකාවෙන් පිටව යන මගියෙකුගෙන් අය කරන අපගමන බද්ද ඇ.එ.ජ. ඩොලර් 20/-ක් ලෙස සහනදායී අනුපාතයක් ප්‍රදානය කිරීම. |
| 2025.01.31 | 2025.01.31 දිනැති අංක 2421/30 දරන ගැසට් නිවේදනය<br>- මෙහෙයුම් ආරම්භ කළ දින සිට වසර තුනක කාලයක් සඳහා මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපලෙන් ගුවන් ගමන් මෙහෙයුම් ආරම්භ කර, ගුවන් යානා මඟින් ශ්‍රී ලංකාවෙන් පිටවන පුද්ගලයන් සඳහා, බදු නිදහස් කිරීමේ කාලය දීර්ඝ කිරීම.<br>- කොළඹ ජාත්‍යන්තර ගුවන්තොටුපල-රත්මලානෙන් සහ යාපනය ජාත්‍යන්තර ගුවන්තොටුපලින් ගුවන් ගමන් මෙහෙයුම් ආරම්භ කර, ගුවන් යානා මඟින් ශ්‍රී ලංකාවෙන් පිටවන පුද්ගලයන් සඳහා, අදාළ වන අපගමන බද්ද වන ඇ.එ.ජ. ඩොලර් 60න් ඇ.එ.ජ. ඩොලර් 30ක සහනදායී අනුපාතයක් ලබාදීම වසරක කාලයක් දක්වා දීර්ඝ කිරීම. |
| **මෝටර් රථ සඳහා සුඛෝපභෝගී බද්ද - 2018 අංක 35 දරන මුදල් පනත** | |
| 2024.01.24 | 2024.01.24 දිනැති අංක 2368/24 දරන ගැසට් නිවේදනය<br>- 2023.02.10 දිනැති අංක 2318/53 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත්කරන ලද ප්‍රේෂණය කිරීම, ණයවර ලිපි පිහිටුවීම සහ මෝටර් වාහන ලියාපදිංචි කිරීම සලකා බැලීමේ කාලය තව දුරටත් දීර්ඝ කිරීම. (සංක්‍රමණික සේවකයින් සඳහා පූර්ණ විදුලි මෝටර් රථ වල බදු රහිත සීමාව රු. මිලියන 6 සිට රු. මිලියන 12 දක්වා වැඩි කිරීම.) |
| 2025.02.01 | 2024.12.31 දිනැති අංක 2421/41 දරන ගැසට් නිවේදනය<br>- මෝටර් රථ සඳහා වන සුඛෝපභෝගී බද්ද සඳහා සීමාව සංශෝධනය කිරීම. |

*** – දැනට බල නොපැවැත්වේ.**
**** – දැනට වලංගු නොවේ.**

## 2.3 රජයේ වියදම

2024 වසරේ පළමු මාස දහය තුළ රජයේ වියදම රු. බිලියන 4,327.7 ක් වූ අතර, ඉන් රු. බිලියන 3,796.0 ක් පුනරාවර්තන වියදම් සහ රු. බිලියන 531.6 ක් ප්‍රාග්ධන හා ශුද්ධ ණය දීමේ වියදම් විය. රජයේ වියදම් සඳහා වාර්ෂිකව පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු අතර, ඒ අනුව, 2024 වසරේ රජයේ වියදම් දැරීම සඳහා 2023 අංක 34 දරන විසර්ජන පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලදී.

**වගුව 2.11 : රාජ්‍ය වියදම් කාර්යසාධනය**

*රු.මිලි.*

| අයිතම | ජන. - ඔක්. | |
|---|---|---|
| | 2023 | 2024 (අ) |
| **පුනරාවර්තන වියදම්** | **3,532,249** | **3,796,046** |
| වැටුප් | 774,315 | 839,000 |
| විශ්‍රාම වැටුප් | 294,560 | 323,756 |
| පොලී ගෙවීම | 1,772,387 | 1,891,451 |
| වෙනත් | 690,987 | 741,839 |
| **මූලධන වියදම හා ශුද්ධ ණය ගෙවීම** | **448,801** | **531,645** |
| **මුළු වියදම** | **3,981,050** | **4,327,692** |

*මූලාශ්‍ර : ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

*(අ) තාවකාලික*

**පුද්ගල පඩිනඩි හා විශ්‍රාම වැටුප්**

2024 වසරේ පළමු මාස දහය තුළ දී පළාත් සභා සේවකයින් ඇතුළු රාජ්‍ය සේවකයින්ගේ පුද්ගලික වැටුප් සඳහා වන වියදම 2023 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ රු. බිලියන 774.3 සිට රු. බිලියන 839.0 දක්වා සියයට 8.4 කින් වැඩිවී තිබේ. මේ අතර විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා වන වියදම 2023 වසරේ පළමු මාස දහය තුළ දී වාර්තා වූ රු. බිලියන 294.6 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 323.8 ක් දක්වා සියයට 9.9 කින් ඉහළ ගොස් ඇති අතර, එය ජීවන වියදම් දීමනාව ඉහළ නැංවීමට ගත් ප්‍රතිපත්තිමය තීරණය සහ හිඟ පාරිතෝෂික මුදල් නියමිත වේලාවට ගෙවීම හේතුවෙන් සිදු වී ඇත.

**පොලී ගෙවීම්**

දේශීය හා විදේශීය ණය සඳහා පොලී ගෙවීම්, 2023 වසරේ පළමු මාස දහයේ දී රු. බිලියන 1,772.4 ක්ව පැවති අතර එය 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 1,891.5 ක් දක්වා සියයට 6.7කින් වැඩි වී ඇත.

2023 වසරේ පළමු මාස දහය තුළ දේශීය හා විදේශීය යන දෙඅංශයේම පොලී ගෙවීම් හා සැසඳීමේදී, 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී එම අගයන් පිළිවෙලින් සියයට 5.5 කින් හා සියයට 29.6 කින් වර්ධනය වී ඇත. ඒ අනුව, 2023 වසරේ පළමු මාස දහය හා සසඳීමේ දී 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී දේශීය ණය සඳහා පොලී ගෙවීම් රු. බිලියන 1,683.4 සිට රු. බිලියන 1,776.0 දක්වා ද, විදේශීය ණය සඳහා පොලී ගෙවීම් රු. බිලියන 89.0 සිට රු. බිලියන 115.4 දක්වා ද වැඩි වී ඇත.

**වගුව 2.12 : රජයේ සුරැකුම්පත් මත ගෙවන පොලී අනුපාතයන්හි සහ විනිමය අනුපාතයන්හි හැසිරීම (%) 2023 සිට 2024**

| කාලපරිච්ඡේදය | | භාණ්ඩාගාර බිල්පත් (%) | | | භාණ්ඩාගාර බැඳුම්කර (%) | | | | සාමාන්‍ය විනිමය අනුපාතය රු./ ඇ.ඩො. |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | දින 91 | දින 182 | දින 364 | වසර 2 | වසර 3 | වසර 4 | වසර 5 | |
| 2023 | ජනවාරි | 29.91 | 28.72 | 27.78 | 32.19 | 30.85 | 29.21 | 29.79 | 362.42 |
| | පෙබරවාරි | 29.72 | 28.67 | 27.67 | - | - | 29.37 | - | 361.98 |
| | මාර්තු | 25.99 | 25.79 | 24.31 | 29.99 | - | 28.11 | - | 329.47 |
| | අප්‍රේල් | 25.74 | 25.27 | 23.00 | - | - | - | - | 321.42 |
| | මැයි | 25.65 | 25.29 | 22.91 | - | - | - | - | 310.16 |
| | ජූනි | 23.00 | 19.49 | 16.99 | - | - | - | - | 301.26 |
| | ජූලි | 19.96 | 17.69 | 14.29 | - | - | - | 15.74 | 319.29 |
| | අගෝස්තු | 18.48 | 15.36 | 13.58 | - | 15.80 | - | 15.03 | 321.58 |
| | සැප්තැම්බර් | 17.42 | 15.13 | 13.30 | - | 15.64 | - | 14.52 | 322.77 |
| | ඔක්තෝබර් | 16.10 | 14.93 | 13.02 | - | 15.24 | - | - | 324.73 |
| | නොවැම්බර් | 14.86 | 14.52 | 12.89 | - | 14.48 | 14.52 | 14.52 | 328.25 |
| | දෙසැම්බර් | 14.51 | | 12.93 | | 14.52 | | | 326.74 |
| 2024 | ජනවාරි | 11.97 | 12.20 | 12.00 | 13.83 | 13.08 | 14.21 | 13.65 | 321.17 |
| | පෙබරවාරි | 9.87 | 9.95 | 10.05 | - | 10.81 | - | 11.90 | 312.58 |
| | මාර්තු | 10.07 | 10.23 | 10.28 | - | 11.33 | - | 12.25 | 305.67 |
| | අප්‍රේල් | 9.61 | 9.89 | 9.99 | - | 11.44 | 11.72 | 12.37 | 299.42 |
| | මැයි | 8.62 | 9.04 | 9.18 | - | - | 11.01 | - | 299.69 |
| | ජූනි | 10.07 | 10.19 | 10.31 | - | 10.69 | 11.90 | 11.78 | 303.81 |
| | ජූලි | 9.14 | 9.34 | 9.95 | - | 12.07 | - | - | 303.76 |
| | අගෝස්තු | 9.49 | 9.84 | 10.01 | - | - | - | 12.98 | 300.69 |
| | සැප්තැම්බර් | 10.49 | 10.72 | 10.05 | - | 13.79 | - | 13.98 | 301.15 |
| | ඔක්තෝබර් | 9.35 | 9.68 | 9.95 | - | 11.79 | 11.84 | - | 293.79 |
| | නොවැම්බර් | 8.73 | 8.97 | 9.08 | 11.63 | 10.62 | - | 11.28 | 292.01 |
| | දෙසැම්බර් | 8.62 | 8.77 | 8.96 | - | - | 10.42 | 10.75 | 291.68 |

*මූලාශ්‍ර : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව*

### සුභසාධන වියදම

සමාජය තුළ අවදානමට ලක්විය හැකි සහ ආන්තිකරණයට ලක් වූ සමාජ කණ්ඩායම් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, සියලුම පුරවැසියන් වෙත සාධාරණ සහයෝගයක් ලබා දීම මෙන්ම ඔවුන් සවිබලගැන්වීම තහවුරු කිරීම පිළිබඳව වන සමාජ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමෙහි ලා රජය කැපවී සිටියි. සියල්ල ඇතුළත් ආර්ථික ප්‍රතිසාධනයක් සහ තිරසාර වර්ධනයක් අත්කරගැනීම පිණිස ශක්තිමත් පදනමක් ගොඩනැගීම මෙමඟින් අරමුණු කෙරේ.

සමාජ සුභසාධනය, සමාජ ආරක්ෂණය, අධ්‍යාපනය, සෞඛ්‍ය හා පෝෂණය, නිෂ්පාදන හා ශ්‍රම වෙළඳපළ සඳහා සංවර්ධන සහායයන් හා සහනාධාර ඇතුළු ප්‍රධාන සුභසාධන වියදම් සඳහා 2024 වසරේ මුල් මාස දහය තුළ රු. බිලියන 670.2ක් වැය දරා ඇති අතර, එය පසුගිය වසරේ සමාන කාලපරිච්ඡේදයේ වියදම වන රු. බිලියන 610 ට සාපේක්ෂව සියයට 9.9 ක වැඩිවීමක් පෙන්නුම් කෙරේ. 2024 වසරේ ජනවාරි මස සිට ඔක්තෝබර් මස දක්වා කාලසීමාව තුළ සමාජ සුබසාධන සහ සමාජ ආරක්ෂණ ජාල සම්බන්ධිත වියදම් සඳහා රු. බිලියන 506.9 ක් වැය කර ඇති අතර, ඒ තුළ වැඩිහිටි දීමනාව, ආබාධිත පුද්ගලයින් සඳහා දීමනා, වකුගඩු රෝගීන්ට ගෙවනු ලබන දීමනාව ඇතුළුව “අස්වැසුම” වැඩසටහනට අදාළ රු. බිලියන 141 ක වියදම ඇතුළත් වේ. එය 2023 වසරේ එම කාලසීමාවේ වියදමට සාපේක්ෂව සියයට 35 ක වර්ධනයකි.

තවද, 2024 ජනවාරි මස සිට ඔක්තෝබර් මස දක්වා කාලසීමාව තුළ සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන් සඳහා වන රජයේ සුභ සාධන වියදම රු. බිලියන 116 දක්වා වැඩි වී ඇති අතර, එය පසුගිය වසරේ සමාන කාලපරිච්ඡේදයට අදාළ වියදම වන රු. බිලියන 96 ට සාපේක්ෂව සියයට 20ක වැඩිවීමකි.

**වගුව 2.13 : සුභසාධන වියදම - 2024**

*රු.මිලි.*

| අයිතමය | ජන - ඔක් | |
|---|---|---|
| | 2023 | 2024(අ) |
| **සෞඛ්‍ය හා පෝෂණ** | **96,269** | **116,483** |
| සැමට නොමිලේ ඖෂධ | 76,675 | 92,888 |
| පාසල් පෝෂණ වැඩසටහන | 14,961 | 15,435 |
| ත්‍රිපෝෂ වැඩසටහන | 1,306 | 1,794 |
| පෙර පාසල් දරුවන් සඳහා උදෑසන ආහාරය | 308 | 950 |
| පෝෂණ මල්ල | 3,019 | 5,416 |
| **අධ්‍යාපන** | **29,513** | **18,085** |
| නොමිලේ පෙළපොත් | 18,159 | 4,573 |
| නොමිලේ පාසල් නිල ඇඳුම් | 2,537 | 1,085 |
| නොමිලේ වාර ප්‍රවේශපත්‍ර | 6,000 | 7,773 |
| දුෂ්කර හා අතිදුෂ්කර ප්‍රදේශ පාසල් සිසුන්ට පාවහන් | - | 858 |
| 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව | 603 | 704 |
| මහපොළ ශිෂ්‍යත්ව | 1,576 | 2,250 |
| පෙරපාසල් ගුරුවරුන් සඳහා දීමනා “ගුරු අභිමානී” | 276 | 414 |
| දහම් පාසල් ගුරුවරුන් සඳහා ආධාර | 362 | 428 |
| **ජීවනෝපාය සහායයන්** | **45,509** | **28,611** |
| පොහොර සහනාධාරය | 43,395 | 26,436 |
| නැවත වගා කිරීම සඳහා සහනාධාර (තේ/රබර්/පොල්/කජු සහ අනෙකුත් වගාවන්) | 836 | 1,163 |
| අපනයන භෝග සංවර්ධනය සඳහා ගොවීන්ට ආධාර කිරීම | 198 | 170 |
| ලෝක ආහාර වැඩසටහන | 1,080 | 842 |
| **සමාජ සුභසාධනය සහ ආරක්ෂණ ජාලය** | **438,818** | **506,990** |
| අස්වැසුම මුදල් ප්‍රදානය | 85,294 | 121,070 |
| විශේෂ හැකියා ඇති පුද්ගලයින් හා වකුගඩු රෝගීන් සඳහා ආධාර | 3,731 | 6,573 |
| වැඩිහිටි පුද්ගලයින් සඳහා ආධාර | 14,883 | 12,926 |
| රණවිරු මාපිය සමාජ සත්කාර | 1,856 | 1,763 |
| ආහාර ආධාර, ගංවතුර හා නියං සහනාධාර | 59 | 283 |
| ආර්ථික වශයෙන් වාසිදායක නොවන මාර්ගවල බස් සේවා | 2,800 | 1,725 |
| විශ්‍රාම වැටුප් | 294,557 | 323,756 |
| මියගිය සහ තුවාල ලැබූ සොල්දාදුවන් සඳහා සේවා වන්දි | 35,638 | 38,894 |
| **එකතුව** | **610,109** | **670,169** |

*මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

*(අ) තාවකාලික*

### රාජ්‍ය ආයෝජන

යටිතල පහසුකම් සඳහා වියදම ආසන්න වශයෙන් රු. බිලියන 553.7 ක් වූ අතර පහත සඳහන් අංශ වෙත සිදු කරන ලද ආයෝජනයන් ඊට ඇතුළත් වේ. එනම්,

1. ග්‍රාමීය මාර්ග, පාලම්, මහාමාර්ග සහ අධිවේගී මාර්ග නඩත්තු කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා රු. බිලියන 181.0 ක්,
2. නාගරික ප්‍රදේශවල නල ජලය සැපයීමේ යෝජනා ක්‍රම සංවර්ධනය කිරීම සහ පුළුල් කිරීම, නිවාස යෝජනා ක්‍රම සංවර්ධනය කිරීම සහ පහසුකම් සැලසීම සඳහා රු. බිලියන 35.3ක්,
3. දුම්රිය ඇණිය, දුම්රිය මාර්ග පිළිසකර කිරීම හා වැඩිදියුණු කිරීම සහ ප්‍රවාහන ජාලය වැඩිදියුණු කිරීම සඳහා රු. බිලියන 15.8 ක්,
4. නවීන තාක්ෂණය හඳුන්වා දීම තුළින් කෘෂිකාර්මික අගය දාමයේ ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා රු. බිලියන 21.0 ක්,
5. ඉහළ ඇළහැර, කළු ගඟ මොරගහකන්ද හුවමාරු ඇළ සහ වයඹ පළාත් ඇළ ආදී ඇළ මාර්ග ඉදිකිරීම මඟින් කෘෂිකාර්මික කටයුතු සම්බන්ධයෙන් ජල සුරක්ෂිතතාව සහතික කිරීම සඳහා රු. බිලියන 43.0 ක්,
6. අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමේ අරමුණින් පාසල්, උසස් අධ්‍යාපන ආයතන, වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ ගුරු පුහුණු වැඩසටහන් සඳහා රු. බිලියන 20.8 ක්,
7. රෝහල් වෙත උපකරණ සැපයීම තුළින් රෝහල් නඩත්තු කිරීම සහ සංවර්ධනය කිරීම සඳහා රු. බිලියන 16.4 ක්,
8. විදුලිබලය සැපයීමට අදාළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රු. බිලියන 14.7 ක් සහ
9. පළාත් සභා සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල යටතේ පවතින ග්‍රාමීය සහ ප්‍රාදේශීය ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා රු. බිලියන 35.9 ක් ද වේ.

## 2.4 භාණ්ඩාගාර මෙහෙයුම්

### මහා භාණ්ඩාගාරයේ මුදල් ප්‍රවාහයේ කාර්යසාධනය

රජය විසින් ක්‍රියාත්මක කරන ලද ආදායම් මත පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාමාර්ග පිළිබිඹු කරමින් රු. බිලියන 3,377.2 ක ඇස්තමේන්තුවට සාපේක්ෂව ආදායම සහ අනෙකුත් ලැබීම් වශයෙන් භාණ්ඩාගාරයේ මුදල් ප්‍රවාහයට රු. බිලියන 3,188.3 ක් ලැබී ඇත. මෙය 2024 වසරේ පළමු මාස දහය තුළ ඇස්තමේන්තුවෙන් සියයට 94.4 ක සාක්ෂාත් කර ගැනීමකි. 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ලබාගත් රු. බිලියන 2375.5 ට සාපේක්ෂව එම ආදායම සියයට 34ක වැඩිවීමකි. මේ අතර, 2024 වසරේ පළමු මාස දහය තුළ දී පුනරාවර්තන සහ රාජ්‍ය ආයෝජන සඳහා මුදල් පිටතට ගලායාම රු. බිලියන 4,554.8 ක් වන අතර, එය 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ රු. බිලියන 4,229 ට සාපේක්ෂව සියයට 7.7 ක වැඩිවීමකි.

2023 වසරේ ඔක්තෝබර් මස අවසානය වන විට පැවති රු. බිලියන 1,854.0 හා සැසඳීමේදී ආදායම ඉහළ යාමේ ප්‍රතිලාභයක් ලෙස, 2024 ඔක්තෝබර් මස 31 වන දිනට ශුද්ධ මුදල් හිඟය රු. බිලියන 1,366.5 ක් දක්වා සියයට 26.3 කින් අඩුවිය. ඒ ආකාරයෙන්ම, වසර ආරම්භයේ දී පැවති රු. බිලියන 401 ක ධනාත්මක බැංකු ශේෂය 2024 වසරේ ඔක්තෝබර් මස අවසානය වන විට රු. බිලියන 1,005.1 ක ධනාත්මක ශේෂයක් දක්වා ඉහළ ගොස් ඇති අතර, එයට බහුපාර්ශ්වික පරිත්‍යාගශීලීන්ගෙන් සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙතින් ණයට ගැනීමෙන් ලැබුණු ඩොලර් ආදායම වන රු. බිලියන 259 ද ඇතුළත් වේ.

**2.14 : රජයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

*රු.බිලි.*

| අයිතමය | ජන. - ඔක්. | | |
|---|---|---|---|
| | 2023 | 2024 | |
| | සත්‍ය | ඇස්තමේන්තුව | තාවකාලික |
| ආරම්භක මුදල් ශේෂය | -84.2 | 599.5 | 599.5 |
| ආදායම් හා වෙනත් ලැබීම් මඟින් සමස්ථ මුදල් ගලා ඒම | 2,375.5 | 3,377.2 | 3,188.3 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වල සමස්ථ මුදල් ගලා යෑම් | -3,633.0 | -4,113.3 | -3,734.7 |
| ආයෝජන කටයුතු සඳහා සමස්ථ මුදල් ගලායාම්* | -596.5 | -1,464.1 | -820.1 |
| ශුද්ධ මුදල් අතිරික්තය / (හිඟය) | -1,854.0 | -2,200.2 | -1,366.5 |
| දළ ණය ගැනීම්* | 10,091.4 | 3,355.6 | 2,940.0 |
| ණය ආපසු ගෙවීම් | -7,752.8 | -1,050.0 | -1,121.5 |
| ශුද්ධ ණය ගැනීම් | 2,338.7 | 2,305.6 | 1,818.4 |
| ගැලපීම් ගිණුමේ ශේෂය (TEB/ ශුද්ධ තැන්පතු, අනෙකුත් හුවමාරු යනාදිය) | 0.5 | - | -46.3 |
| **අවසාන මුදල් ශේෂය** | **401.0** | **704.9** | **1,005.1** |

*මූලාශ්‍රය : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව*

**2024 ඔක්තෝබර් 31 දක්වා ලැබුණු වැඩසටහන් හා ව්‍යාපෘති ණය ඇතුලත් වේ.*

### රාජ්‍ය ණය කළමනාකරණය

2024 වසර සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද මුළු ණය ගැනීමේ සීමාව රු. බිලියන 7,350 කි. 2024 වසරේ ජනවාරි මස 01 දින සිට ඔක්තෝබර් මස 31 දින දක්වා රජයේ ණය ගැනීම් භාවිතා කිරීම රු. බිලියන 2,507.8 කි (පොත් වටිනාකම් අගය). වැඩි දියුණු වූ කාර්ය සාධනය තුළින්, මෙම කාලය තුළ දේශීය ණය සේවා ගෙවීම්වලින් කොටසක් මූල්‍යකරණය කිරීම සඳහා අතිරික්ත ආදායමෙන් රු. බිලියන 454 ක් සපයා දීමට හැකි විය. 2024 වසරේ ඔක්තෝබර් මස 31 වන දිනට මුදල් ප්‍රවාහ මෙහෙයුම් සඳහා මූල්‍යකරණය කිරීම සඳහා දේශීය හා විදේශීය ණය ගැනීම් ඇතුළුව මුළු ණය ගැනීමේ භාවිතය පිළිවෙලින් රු. බිලියන 2,104.8 ක් සහ රු. බිලියන 417.0 ක් විය.

**වගුව 2.15 : දළ දේශීය ණය - 2024 ජනවාරි සිට ඔක්තෝබර්**

*රු. බිලි.*

| මූලාශ්‍ර | ජන. - ඔක්. 2024 |
|---|---|
| භාණ්ඩාගාර බැඳුම්කර | 2,031.1 |
| භාණ්ඩාගාර බිල්පත් (ශුද්ධ) | 73.7 |
| **එකතුව** | **2,104.8** |

*මූලාශ්‍රය : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව*

## 2.5 විදේශ මූල්‍යනය

### සමාලෝචනය

2024 වසරේ දී සාර්ව ආර්ථික ස්ථාවරත්වය ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා අත්‍යාවශ්‍ය වන ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කිරීමට ශ්‍රී ලංකාවට හැකි විය. 2024 වසරේ ජූනි මාසයේ දී ශ්‍රී ලංකාවේ ප්‍රධාන ද්විපාර්ශ්වික ණය හිමියන්ගේ නිල ණයහිමි කමිටුවේ (OCC) සාමාජික රටවල් සමඟ සිය ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ අවසන් ගිවිසුමකට එළඹීමට රජයට හැකිවූ අතර, ශ්‍රී ලංකාව විසින් ගෙවිය යුතු ණය සම්බන්ධයෙන් චීන එක්සිම් බැංකුව සමඟ ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ ද්විපාර්ශ්වික ගිවිසුම් ද අත්සන් කරන ලදී. ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර හිමියන් සමඟ දළ වශයෙන් ඇ.ඩො. බිලියන 14.2 ක ස්වෛරීත්ව ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ ප්‍රතිපත්තිමය වශයෙන් එකඟතාවන්ට එළඹීමට 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාවට හැකි විය. මෙම බැඳුම්කර හුවමාරුව සාර්ථකව නිම කිරීම තුළින් ශ්‍රී ලංකාවට ස්වෛරී ණය තිරසාරත්වය ලඟා කර ගැනීමට සහ රටේ ආර්ථික ප්‍රකෘතිය වේගවත් කිරීමට හැකියාව ලැබේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම් වැඩසටහනේ වසර 4 ක කාල සීමාව තුළ, දළ වශයෙන් ඇ.ඩො. බිලියන 9.5 ක ණය

**රූපසටහන 2.4 : දළ දේශීය ණය ගැනීම් 2024 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා**




*මූලාශ්‍රය : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව*

සේවා ගෙවීම් අඩු කර ගැනීම, ශ්‍රී ලංකා බැඳුම්කරවල කූපන් අනුපාතය සියයට 31 කින් සියයට 4.4 දක්වා අඩු කර ගැනීම සහ සාමාන්‍ය පරිණත කාලය වසර 5 කට වඩා අගයකින් දීර්ඝ කර ගැනීම යන අරමුණු ශ්‍රී ලංකාව අත්කරගනු ඇත. එමෙන්ම බැඳුම්කර හුවමාරුව සාර්ථකව නිමකිරීම මඟින් බැඳුම්කර හිමියන් සමඟ පවතින සබඳතා සාමාන්‍ය තත්ත්වයට පත් කර ගැනීමට ශ්‍රී ලංකාවට හැකිවනු ඇත.

### විදේශ මූල්‍යන එකඟතා

2024 වසරේ ජනවාරි මස සිට ඔක්තෝබර් මස දක්වා ශ්‍රී ලංකා රජය විදේශ සංවර්ධන පාර්ශවකරුවන් හා ණය දෙන ආයතන සමඟ විදේශ මූල්‍යන ගිවිසුම් දාසයක් මඟින් ඇ.ඩො. මිලියන 955.5 ක එකඟතා ඇතිකරගෙන ඇති අතර, එයින් ඇ.ඩො. මිලියන 904.7 ක් ණය වශයෙන් ලබාගෙන ඇත. රටේ පවතින ආර්ථික තත්ත්වය අනුව, එම මුළු එකඟතාවලින් සියයට 43 ක් එනම් ඇ.ඩො. මිලියන 408 ක් අයවැය මූල්‍යකරණ අරමුණු සඳහා ලබාගෙන ඇත.

එම මුළු ණයවලින් ඇ.ඩො. මිලියන 511.5 ක් සහ ඇ.ඩො. මිලියන 393 ක් පිළිවෙලින් ලෝක බැංකුවෙන් සහ ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබා ගෙන ඇත.

ණය ගිවිසුම්වලට අමතරව, වසරේ පළමු මාස දහය තුළ දී ජපාන රජය, ඕස්ට්‍රේලියානු රජය සහ යුරෝපා සංගමය සමඟ නිල සංවර්ධන සහයෝගිතා යටතේ, පූර්ණ ප්‍රදාන එකඟතා ගිවිසුම් අටක් මඟින් ඇ.ඩො. මිලියන 50.8 ක් ලබාගෙන ඇත.

## වගුව 2.16 : අදාළ මූල්‍ය කොන්දේසි සමඟ 2024 ජනවාරි 01 සිට ඔක්තෝබර් 31 දක්වා එළඹි විදේශ මූල්‍යන එකඟතා

| සංවර්ධන පාර්ශ්වකරු/ණය දෙන ආයතනය | ණය හෝ ප්‍රදානය | එකඟතා ගිවිසුම අත්සන් කරන ලද දිනය) | ව්‍යාපෘතිය වැඩසටහන හෝ ණය | එකඟතා ප්‍රමාණය (මිලියන) | | | | මූල්‍ය කොන්දේසි | | | | වෙනත් කොන්දේසි | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | ඒකකය | අත්සන් කරන ලද ඒකකයෙන් | රුපියල් | ඇ.ඩො. | පොලිය | | | වෙනත් ගාස්තු | සහන කාලය (වර්ෂ) | පරිණත කාලය/ උපයෝජ්‍යතා කාලය (ගිවිසුම්ගත දිනයේ සිට) (වර්ෂ) |
| | | | | | | | | වර්ගය | ධාර්මික අනුපාතය (සියයට) | සීමාන්තිකය (පදනම් අංක සියයට) | | | |
| **ද්විපාර්ශවික** | | | | | | | | | | | | | |
| ඕස්ට්‍රේලියාව | ප්‍රදාන | 30/01/2024 | වර්ධනය සඳහා යහපාලන වැඩසටහන | ඕස්ට්‍රේලියන් ඩොලර් | 30.0 | 6,307.2 | 19.8 | | | අදාළ නොවේ | | | 3 |
| ඕස්ටේලියාව | ප්‍රදාන | 30/01/2024 | වෙළෙඳපොළ සංවර්ධන පහසුකම් වැඩසටහන - 2 අදියර | ඕස්ට්‍රේලියන් ඩොලර් | 12.1 | 2,543.9 | 8.0 | | | අදාළ නොවේ | | | 3 |
| ජපානය | ප්‍රදාන | 14/02/2024 | පුනර්ජනනීය බලශක්ති භාවිතයෙන් ශ්‍රී ලංකාවේ රෝහල්වල බලශක්ති සැපයුම ස්ථායීකරණය කිරීමේ ව්‍යාපෘතිය | ජපන් යෙන් | 1,230.0 | 2,560.6 | 8.2 | | | අදාළ නොවේ | | | 3 |
| ජපානය | ප්‍රදාන | 18/03/2024 | උතුරු පළාතේ ප්‍රධාන රෝහල්වල මාතෘ හා ළමා ප්‍රතිකාර සඳහා ආධාරක උපකරණ සැපයීම | ජපන් යෙන් | 404.0 | 827.2 | 2.7 | | | අදාළ නොවේ | | | 3 |
| ජපානය | ප්‍රදාන | 18/03/2024 | ශ්‍රී ලංකා වෙරළාරක්ෂක බලකායේ තෙල් කාන්දු ප්‍රතිචාරය සහ කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | ජපන් යෙන් | 1,000.0 | 2,047.6 | 6.7 | | | අදාළ නොවේ | | | 1 |
| ජපානය | ප්‍රදාන | 18/03/2024 | උතුරු සහ නැගෙනහිර පළාතේ ධීවරයින්ගේ ආරක්ෂාව සඳහා ආධාරක උපකරණ ලබාදීමේ ව්‍යාපෘතිය | ජපන් යෙන් | 200.0 | 409.5 | 1.3 | | | අදාළ නොවේ | | | 3 |
| ජපානය | ප්‍රදාන | 19/07/2024 | මානව සම්පත් සංවර්ධන ශිෂ්‍යත්වය සඳහා වන ජපන් ආධාර වැඩසටහන | ජපන් යෙන් | 304.0 | 587.1 | 1.9 | | | අදාළ නොවේ | | | 7 |
| **බහුපාර්ශ්වීය** | | | | | | | | | | | | | |
| ආසියානු සංවර්ධන බැංකුව | ණය | 25/03/2024 | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් පුනර්ජීවනය සඳහා මූල්‍ය සහ මූල්‍ය නොවන සහයන් සැපයීම. | ඇ.ඩො. | 100.0 | 30,354.9 | 100.0 | ස්ථාවර | 2 | අදාළ නොවේ | අදාළ නොවේ | 5 | 25 |
| ආසියානු සංවර්ධන බැංකුව | ණය | 05/08/2024 | බලශක්ති අංශයේ ප්‍රතිසංස්කරණ සහ මූල්‍ය තිරසාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම. උපවැඩසටහන 1 | ඇ.ඩො. | 100.0 | 30,208.9 | 100.0 | ස්ථාවර | 2 | අදාළ නොවේ | අදාළ නොවේ | 5 | 25 |

| සංවර්ධන පාර්ශ්වකරු/ණය දෙන ආයතනය | ණය හෝ ප්‍රදානය | එකඟතා ගිවිසුම අත්සන් කරන ලද දිනය) | ව්‍යාපෘතිය වැඩසටහන හෝ ණය | එකඟතා ප්‍රමාණය (මිලියන) | | | | මූල්‍ය කොන්දේසි | | | | වෙනත් කොන්දේසි | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | පොලිය | | | | | |
| | | | | විනිමය | අත්සන් කරන ලද විනිමයෙන් | රුපියල් | ඇ.ඩො. | වර්ගය | වාර්ෂික අනුපාතය (සියයට) | සීමාන්තිකය (පදනම් අංශ සියයට) | වෙනත් ගාස්තු | සහන කාලය (වර්ෂ) | පරිණත කාලය/ ආපසුගෙවීම් කාලය (ගිවිසුමේ දිනයේ සිට) (වර්ෂ) |
| ආසියානු සංවර්ධන බැංකුව | ණය | 20/09/2024 | ජල සම්පාදන සහ සනීපාරක්ෂක ප්‍රතිසංස්කරණ වැඩසටහන - උපවැඩසටහන 1 | ඇ.ඩො. | 100.0 | 30,455.0 | 100.0 | ස්ථාවර | 2 | අදාළ නොවේ | අදාළ නොවේ | 5 | 25 |
| ආසියානු සංවර්ධන බැංකුව | ණය | 20/09/2024 | මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන වැඩසටහන - 3 වන වාරිකය | ඇ.ඩො. | 93.0 | 28,323.2 | 93.0 | විචල්‍ය | SOFR | 0.7 | පොරොන්දු ගාස්තු 0.15% | 8 | 29 |
| යුරෝපා සංගමය | ප්‍රදාන | 12/8/2024 | ශ්‍රී ලංකාවේ සමාජ සහජීවනය සහ සාමය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය | යුරෝ | 2.0 | 656.2 | 2.2 | | | අදාළ නොවේ | | | 5 |
| ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය | ණය | 31/01/2024 | මූල්‍ය අංශයේ ආරක්ෂණ ජාලය ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය | වි.ගැ.හි. (SDR) | 112.8 | 47,614.7 | 150.0 | ස්ථාවර | 1.25 | අදාළ නොවේ | පොරොන්දු ගාස්තු 0.5%<br>සේවා ගාස්තු 0.75% | 5 | 30 |
| ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය | ණය | 10/09/2024 | ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර සේවා පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (Credit A) | වි.ගැ.හි. (SDR) | 38.0 | 15,368.1 | 51.2 | ස්ථාවර | 1.25 | අදාළ නොවේ | පොරොන්දු ගාස්තු 0.5%<br>සේවා ගාස්තු 0.75% | 5 | 30 |
| ලෝක බැංකුවේ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය | ණය | 07/10/2024 | ආර්ථික ස්ථායීකරණ හා ප්‍රතිසාධන වැඩසටහන - සංවර්ධන ප්‍රතිපත්ති මූල්‍යකරණ වැඩසටහන 2 | වි.ගැ.හි. (SDR) | 150.6 | 61,149.4 | 208.1 | ස්ථාවර | 1.25 | අදාළ නොවේ | පොරොන්දු ගාස්තු= 0.5%<br>සේවා ගාස්තු 0.75% | 5 | 30 |
| ලෝක බැංකුවේ ප්‍රතිසංස් - කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව | ණය | 10/09/2024 | ප්‍රාථමික සෞඛ්‍ය සත්කාර සේවා පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (Credit B- SML) | වි.ගැ.හි. (SDR) | 75.9 | 30,695.8 | 102.3 | | පොළී රහිත | | පොරොන්දු ගාස්තු 0.5% | 6 | 12 |
| | | **එකතුව** | | | | **290,109.2** | **955.5** | | | | | | |

*මූලාශ්‍රය: රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය*

*සටහන්: SOFR = Secured Overnight Financing Rate*

*එක් එක් විදේශ විනිමයෙන් සටහන් වන එකඟතා අගයයන් ඇ.ඩො. හා රුපියල් බවට හැරවීමේ දී අදාළ ගිවිසුම් අත්සන් කරන ලද දිනයේ පැවති විනිමය අනුපාතිකයන් භාවිත කර ඇත.*

*විශේෂ ගැනුම් හිමිකම් විනිමය ඇ.ඩො. බවට හැරවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද පෙර මාසයේ අවසානයේ පැවති මාසික විනිමය අනුපාතිකයන් භාවිත කර ඇත.*

### විදේශ මූල්‍යාන ප්‍රතිලබ්ධි හා උපයෝජනය

2024 වසරේ ජනවාරි මස 1 දින සිට ඔක්තෝබර් මස 31 දින දක්වා ලද මුළු විදේශ ප්‍රතිලබ්ධි ප්‍රමාණය ඇ.ඩො. මිලියන 1,482.3 කි. එම ප්‍රතිලබ්ධි ප්‍රමාණයෙන් ඇ. ඩො. මිලියන 1,458.4 ක් ණය ගිවිසුම් අනුව සිදුවූ ප්‍රතිලබ්ධි වන අතර, ඇ. ඩො. මිලියන 23.9 ක් පූර්ණ ප්‍රදාන ලෙස ලද ප්‍රතිලබ්ධි විය.

මෙම ප්‍රතිලබ්ධිවලින් ඉහළම ප්‍රමාණය ආසියානු සංවර්ධන බැංකුවෙන් ලද අතර, එය සමස්තයෙන් ආසන්න වශයෙන් සියයට 37 ක් ද, අනතුරුව ඉහළම ප්‍රමාණයක් පිළිවෙලින් ලෝක බැංකුව (සියයට 33) සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (සියයට 23) සමඟ අත්සන් කරන ලද ණය ගිවිසුම් අනුව සිදුවූ ප්‍රතිලබ්ධි වේ.

මෙම ප්‍රතිලබ්ධිවලින් සියයට 50 කට ආසන්න ඉහළ ප්‍රමාණයක් අයවැය මූල්‍යකරණය සඳහා උපයෝජනය කර ඇති අතර, අනතුරුව ජල සම්පාදන හා සනීපාරක්ෂක අංශයේ සියයට 8 ක්ද, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාවසාය සංවර්ධන අංශයේ ව්‍යාපෘතිවල සියයට 7 ක්ද, මූල්‍ය අංශයේ ව්‍යාපෘතිවල සියයට 5 බැගින්වූ ප්‍රමාණයක් ද උපයෝජනය කර ඇත.

**වගුව : 2.17 : එක් එක් සංවර්ධන පාර්ශ්වකරු විසින් 2024 ජනවාරි 1 සිට ඔක්තෝබර් 31 දක්වා සිදු කරන ලද විදේශ මූල්‍යාන ප්‍රතිලබ්ධි.**

| සංවර්ධන පාර්ශවකරු/ ණය දෙන ආයතනය | ප්‍රතිලබ්ධි ප්‍රමාණය* (ඇ.ඩො. මිලියන) | | |
|---|---|---|---|
| | ණය | ප්‍රදාන | එකතුව |
| **ද්වීපාර්ශ්වික** | **45.5** | **4.7** | **50.2** |
| ජපානය | 24.4 | 2.0 | 26.4 |
| අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ සෞදි අරමුදල | 17.0 | - | 17.0 |
| ජර්මනිය | | 2.7 | 2.7 |
| නෙදර්ලන්තය | 2.1 | - | 2.1 |
| කොරියාව | 2.0 | - | 2.0 |
| **බහුපාර්ශ්වික** | **1,412.8** | **19.3** | **1,432.1** |
| ආසියානු සංවර්ධන බැංකුව | 549.5 | 2.3 | 551.8 |
| ලෝක බැංකුව | 469.1 | 17.0 | 486.1 |
| **ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | 334.0 | - | 334.0 |
| ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව | 40.7 | - | 40.7 |
| ඔපෙක් අරමුදල | 15.5 | - | 15.5 |
| කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල | 4.0 | - | 4.0 |
| **එකතුව** | **1,458.4** | **23.9** | **1,482.3** |

*මූලාශ්‍රය: රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය*

** තාවකාලික අගයයන් , ප්‍රතිව්‍යුහගතකරණය කළ ණයවල ඇ.ඩො. මිලියන 200.9 ක ප්‍රාග්ධනීකරණය කළ නොගෙවූ පොලී සහ දඩ පොලිය ඇතුළත් නොවේ.*

*එක් එක් විදේශ විනිමයෙන් සටහන් වන ප්‍රතිලබ්ධි අගයයන් ඇ.ඩො බවට පරිවර්තනයේ දී එක් එක් ප්‍රතිලබ්ධීන් සිදුවූ දිනයන්හි පැවති විනිමය අනුපාතිකයන් භාවිත කර ඇත.*

*** විශේෂ ගැනුම් හිමිකම් විනිමය ඇ.ඩො හා රුපියල් බවට හැරවීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද පෙර මාසයේ අවසානයේ පැවති මාසික විනිමය අනුපාතිකයන් භාවිතා කර ඇත.*

**රූපසටහන 2.5 : 2024 ජනවාරි 01 සිට ඔක්තෝබර් 31 දක්වා ප්‍රතිලබ්ධි - සංවර්ධන පාර්ශ්වකරු/ ණය දෙන ආයතන - ණය දීමේ නියෝජිතායතන අනුව (ඇ.ඩො. මිලියන)**




*මූලාශ්‍රය: රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය*

*වෙනත්: ජර්මනිය, නෙදර්ලන්තය, කොරියාව*

**රූපසටහන 2.6 : 2024 ජනවාරි 01 දින සිට ඔක්තෝබර් 31 දක්වා ප්‍රධාන ආර්ථික අංශ අනුව උපයෝජනය කරන ලද ප්‍රතිලබ්ධි (ඇ.ඩො. මිලියන)**




*මූලාශ්‍රය: රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය*

*** වෙනත් = අධ්‍යාපනික හා පුහුණු, වාරිමාර්ග, නිවාස හා නාගරික සංවර්ධනය, කෘෂිකර්මාන්තය, විද්‍යාව හා තාක්ෂණය, ඉඩම් සංවර්ධනය, ධීවර හා වැවිලි*

## විදේශ ණය ප්‍රමාණය හා විදේශ ණය සේවාකරණය

2024 වසරේ ඔක්තෝබර් මස 31 දින වන විට රජය විසින් ලබාගත් විදේශ ණය මූල්‍යනයන් සඳහා ආපසු ගෙවීමට එකතු වී තිබූ විදේශ ණය ප්‍රමාණය ඇ.ඩො. බිලියන 38.2[1] ක අගයක් විය.

2024 වසරේ ජනවාරි මස 1 දින සිට ඔක්තෝබර් මස 31 දින දක්වා සිදු කරන ලද ණය සේවාකරණය[2] ඇ.ඩො. මිලියන 812.8 කි. මෙයින්, ඇ.ඩො. මිලියන 424.7 ක් ණය වාරික ආපසු ගෙවීම සඳහා යොදවා ඇති අතර, ඉතිරිය වන ඇ.ඩො. මිලියන 388.1 ක ප්‍රමාණය[3] පොලී ගෙවීම සඳහා යොදවා ඇත.

රජය විසින් අනුගමනය කරන ලද අතුරු ප්‍රතිපත්තියට අනුකූලව, බලපෑමට ලක් වූ ද්විපාර්ශ්වික සහ වාණිජ ණයහිමියන්ගේ විදේශ ණය සේවාකරණය 2022 වසරේ අප්‍රේල් මස 12 වන දින සිට අන්තර්කාලීනව තාවකාලිකව අත්හිටුවන ලදී. ඒ අනුව, 2022 වසරේ අප්‍රේල් මස 12 දින සිට 2024 වසරේ ඔක්තෝබර් මස 31 දින දක්වා නොපියවා ඇති ණය වාරික ප්‍රමාණය ඇ.ඩො. මිලියන 6,095 ක්ද, පොලී ප්‍රමාණය ඇ.ඩො. මිලියන 2,986 ක්ද විය.

---

*1. තාවකාලික අගයයන්, ණය සේවාකරණය තාවකාලිකව නතරකිරීමේ ප්‍රතිපත්තිමය තීරණයෙන් පසු එකතුවූ නොගෙවූ ණය වාරිකද ඇතුළුව මධ්‍යම රජයේ විදේශ ණය ප්‍රමාණය පමණක් නිරූපණය වේ.*

*- භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කරයන්හි විදේශ ආයෝජන ඇතුළත් නොවේ.*

*- ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර අන්තර්ගත වේ. එසේ වුවද, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරයන්හි ගෙවීමට ඇති ණය ප්‍රමාණය එහි වත්මන් හිමිකාරිත්වයේ නේවාසික/ අනේවාසික තත්ත්වය මත වර්ගීකරණය කර නොමැතග ඒ අනුව, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර විදේශ ණය තොගය යටතේ වාර්තාගත කර ඇත.*

*- චීන එක්සිම් බැංකුව විසින් ප්‍රතිව්‍යුහගතකරණය කරන ලද ණය 39 ක ප්‍රාග්ධනීකරණය කරන ලද පොලී සහ දඩ පොලී හේතුවෙන් එකතු වූ ඩොලර් මිලියන 200.9 ක ප්‍රමාණය ඇතුළත් වේ.*

*2. ණය සේවාකරණය = ණය ආපසු ගෙවීම + පොලී ගෙවීම*

*3. ඉදිරියේදී පැවැත්වීමට නියමිත ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ සම්මුති සාකච්ඡාවලදී එක් එක් ණයහිමියා සමඟ සැසඳීමට යටත් වේ*

# ආර්ථික උපනතීන් 03

## 3.1 සමාලෝචනය

දේශීය මෙන්ම විදේශීය වශයෙන් වූ අභියෝග රැසකට මුහුණපෑමෙන් අනතුරුව ශ්‍රී ලංකාවේ ආර්ථිකය ස්ථාවර මට්ටමකට ළඟා වී ඇත. කෘෂිකර්මාන්තය, කර්මාන්ත සහ සේවා යන ක්ෂේත්‍රයන්ගේ සැලකියයුතු මට්ටමේ පුනර්ජීවනයක් ඇතිවීමත් සමඟ විශේෂයෙන්ම 2024 වසර අග භාගයේ දී ආර්ථිකය සියයට 5 ඉක්මවා ප්‍රසාරණය විය. එමෙන්ම, 2025 වසර සහ ඉන් ඔබ්බට ද ශක්තිමත් ආර්ථික පුනර්ජීවනයක් අපේක්ෂා කෙරේ. 2022 වසරේ සැප්තැම්බර් මාසයේ සියයට 70 කට ආසන්න උපරිමයකට ළඟා වූ උද්ධමනය 2024 වසර අවසාන භාගයේ දී ඍණාත්මක කලාපයකට අවතීර්ණ විය. 2025 වසරේ දී උද්ධමනය තනි ඉලක්කමක මැදි අගයකට ළඟා වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2024 වසර අවසානයේ දළ නිල සංචිත ප්‍රමාණය ඇ.ඩො. බිලියන 6.1 ක් වූ අතර, සංචාරක ව්‍යාපාරය සහ සේවක ප්‍රේෂණ හේතුවෙන් ශක්තිමත් වූ විදේශ අංශයේ ජංගම ගිණුම 2024 වසරේ ද.දේ.නි.යෙන් සියයට 1.4 ක අතිරික්තයක් ළඟා කර ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. ආදායම් ඉපැයීමේ වැඩපිළිවෙළ ශක්තිමත් ලෙස ක්‍රියාත්මක කිරීමත් සමඟම 2024 වසරේ දී බදු ආදායම ද.දේ.නි.යෙන් සියයට 12.4 ක් දක්වා වැඩි විය. ආදායම් ඉපැයීමේ නව ක්‍රියාමාර්ග ඇතුළුව බදු පරිපාලනය ශක්තිමත් කිරීම තුළින් 2025 වසරේ දී ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස බදු ආදායම සියයට 13.9 ක් කරා ළඟාවනු ඇතැයි අපේක්ෂා කෙරේ. ණය ප්‍රතිව්‍යුහගත කිරීම අවසන් කිරීම මඟින් ණය තිරසාර බව තහවුරු කිරීමට අපේක්ෂා කෙරේ. මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගැනීම බැංකු අංශයේ ප්‍රාග්ධන ස්වාරක්ෂක වැඩි කිරීමට උපකාරී විය. CCC+ මට්ටමේ ශ්‍රේණිගත කිරීම තුළින් පිළිබිඹු වන පරිදි ආයෝජකයින්ගේ විශ්වාසය වැඩිදියුණු වී ඇත. විශ්වාසය ප්‍රතිෂ්ඨාපනය කිරීමට සහ සැමට ප්‍රතිලාභ හිමිවන ආර්ථික සංවර්ධනයක් ළඟා කර ගැනීම සඳහා අත්‍යවශ්‍ය හා බොහෝ කලක සිට අපේක්ෂා කරන ලද දූෂණ විරෝධී සහ ආර්ථික වර්ධනය වේගවත් කරනු ලබන වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වෙමින් පවතී.

**රූපසටහන 3.1 : දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය**




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

ශ්‍රී ලංකාවේ ආර්ථිකය 2023 වසරේ පළමු මාස නවය තුළ වූ සියයට 4.5 ක සංකෝචනයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ සියයට 5.2 කින් ප්‍රසාරණය විය. ආර්ථිකයේ ප්‍රධාන අංශ තුනම ධනාත්මක වර්ධනයක් වාර්තා කරන ලදී. ප්‍රධාන වශයෙන් ධාන්‍ය වගාව (වී හැර), සත්ත්ව නිෂ්පාදනය, කරදිය ධීවර කර්මාන්තය සහ කරදිය ජලජීව වගාව වැනි උප අංශවල ධනාත්මක වර්ධනය හේතුවෙන්, 2024 වසරේ පළමු මාස නවය තුළ කෘෂිකාර්මික අංශය සියයට 1.9 කින් වර්ධනය විය. ඉදිකිරීම් කර්මාන්තයේ සහ පතල් හා කැණීම් කටයුතුවල කැපී පෙනෙන වර්ධනයක් පිළිබිඹු කිරීම හේතුවෙන් කර්මාන්ත අංශය, 2023 වසරේ පළමු මාස නවය තුළ වූ සියයට 13.3 ක සංකෝචනයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ සියයට 11.2 කින් සැලකිය යුතු ලෙස ප්‍රසාරණය විය. ප්‍රධාන වශයෙන් සංචාරක ව්‍යාපාර ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ රක්ෂණ කටයුතු ව්‍යාප්ත වීම හේතුවෙන් සේවා අංශය ද 2023 වසරේ පළමු මාස නවය තුළ වූ සියයට 1.3 ක සංකෝචනයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ සියයට 2.6 කින් ප්‍රසාරණය විය.

**රූපසටහන 3.2 : දළ දේශීය නිෂ්පාදිතයේ සංයුතිය - 2024 පළමු මාස නවය**




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

2024 වසරේ පළමු කාර්තුවේ වාර්තා වූ සියයට 4.5 ක් වූ සේවා වියුක්ති අනුපාතයට සාපේක්ෂව එම වසරේ දෙවන කාර්තුවේ දී සේවා වියුක්තිය සියයට 4.7 දක්වා වැඩි විය. මේ අතර, ශ්‍රම බලකායේ සහභාගීත්ව අනුපාතය 2024 වසරේ පළමු කාර්තුවේ වූ සියයට 47.1 ට සාපේක්ෂව 2024 වසරේ දෙවන කාර්තුවේදී සියයට 47.8 ක් දක්වා සුළු වශයෙන් වැඩි විය.

2024 වසරේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලිහිල් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයක් පවත්වා ගන්නා ලදී. 2024 වසරේ නොවැම්බර් මස 27 වන දින සිට බලපැවැත්වෙන පරිදි මහ බැංකුව විසින් ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදය වෙනුවට තනි ප්‍රතිපත්ති පොලී අනුපාතික ක්‍රමවේදයක් අනුගමනය කරන ලදී. සියයට 8.0 ක් ලෙස තීරණය කර ඇති එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය ඉදිරියේදී මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැනුම් දීම සඳහා සහ ක්‍රියාත්මක කිරීම සඳහා මහ බැංකුවේ ප්‍රධාන මුදල් ප්‍රතිපත්ති උපකරණය ලෙස භාවිතා වේ. ඒ අනුව, ප්‍රතිපත්ති පොලී අනුපාතිකයෙහි අඩු වීම බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකයෙහි

දැනට පවතින මට්ටම හා සාපේක්ෂව පදනම් අංක 50 ක් පමණ වේ. නම්‍යශීලී උද්ධමන ඉලක්ක කරණ රාමුව තුළ මෙහෙයුම් ඉලක්කය ලෙස බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය තවදුරටත් පවතී.

කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද., 2021=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2025 වසරේ ජනවාරි මාසය වන විට සියයට -4.0 ක් දක්වා තවදුරටත් අඩු විය. ඒ අයුරින්ම, ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (ජා.පා.මි.ද., 2021=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2024 වසරේ දෙසැම්බර් මාසය වන විට සියයට -2.0 ක් දක්වා අඩු විය. විදුලිය, ඉන්ධන සහ ප්‍රවාහන පිරිවැය සැලකියයුතු මට්ටමින් අඩු වීම ඇතුළුව නිරන්තර මිල උච්ඡාවචනයන්ට ලක්වන ආහාරවල මිල ගණන් අඩු වීම හේතුවෙන් ඉදිරි මාස කිහිපය තුළ මතුපිට උද්ධමනය ඍණාත්මක කලාපයක පවතිනු ඇත.

දැනට ක්‍රියාත්මක ආර්ථික වැඩපිළිවෙළ සහ දූෂණවිරෝධී වැඩපිළිවෙළ මගින් ආයෝජකයින්ගේ විශ්වාසය ඉහළ නැංවීම හේතුවෙන් 2024 වසරේ දී කොටස් වෙළෙඳපොළ ශක්තිමත් වර්ධනයක් පිළිබිඹු කරන ලදී. සමස්ත කොටස් මිල දර්ශකය (1985 = 100), 2023 වසර අවසානයේ දී පැවති ඒකක 10,654 ට සාපේක්ෂව 2024 වසර අවසානය වන විට ඒකක 15,945 දක්වා සියයට 49.6 කින් වර්ධනය විය.

ආනයනයන්ගේ සියයට 10.4 ක වර්ධනයක් සමඟින් අපනයන, ශ්‍රමික ප්‍රේෂණ සහ සංචාරක කර්මාන්තය ශක්තිමත්ව වර්ධනය වීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ විදේශ අංශය 2024 වසරේ පළමු මාස එකොළහ තුළ විශිෂ්ට කාර්යයසාධනයක් පෙන්නුම් කරන ලදී. 2024 වසරේ පළමු මාස එකොළහ තුළ අපනයන ආදායම ඇ.ඩො. මිලියන 11,670.2 ක් දක්වා සියයට 7.0 කින් වැඩි වූ අතර, ආනයන වියදම ඇ.ඩො. මිලියන 16,916.9 ක් දක්වා සියයට 10.4 කින් වැඩි විය. සංචාරක පැමිණීම් සංඛ්‍යාවේ වැඩිවීම හේතුවෙන් 2024 වසරේ පළමු මාස එකොළහ තුළ සංචාරක ඉපැයීම් ඇ.ඩො. මිලියන 2,806.5 දක්වා සියයට 56.0 කින් ඉහළ ගොස් ඇති අතර, විදේශ රැකියා සඳහා පිටත්වයැම් සංඛ්‍යාවේ වර්ධනයත් සමඟ 2024 පළමු මාස එකොළහ තුළ ශ්‍රමික ප්‍රේෂණ ඇ.ඩො. මිලියන 5,961.6 දක්වා සියයට 10.4 කින් ඉහළ ගියේය. සමස්ත ගෙවුම් ශේෂය, 2023 වසරේ පළමු මාස එකොළහ තුළ වාර්තා කරන ලද ඇ.ඩො. මිලියන 1,908.0 ක අතිරික්තයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ.ඩො. මිලියන 2,912.5 ක අතිරික්තයක් වාර්තා කර ඇත.

කොළඹ කොටස් වෙළෙඳපොළ ශුද්ධ ලැබීම්, 2023 වසරේ පළමු මාස එකොළහ තුළ වාර්තා කරන ලද ඇ.ඩො. මිලියන 19.9 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ඇ.ඩො. මිලියන 34.5 ක වර්ධනයක් වාර්තා කරන ලදී. 2024 වසර අවසානය වන විට දළ නිල සංචිත ප්‍රමාණය, චීන මහජන බැංකුවේ විදේශ විනිමය හුවමාරු පහසුකමද ඇතුලත්ව ඇ.ඩො. බිලියන 6.1 ක් විය. මේ අතර, 2024 වසර අවසාන වන විට ශ්‍රී ලංකාවේ රුපියල ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව සියයට 10.7 කින් අධිප්‍රමාණය විය.

### 3.2 ආර්ථික වර්ධනය

කෘෂිකර්මාන්ත, කර්මාන්ත සහ සේවා යන අංශ තුනෙහිම සිදුවූ ධනාත්මක වර්ධනය හේතුවෙන් 2024 වසරේ පළමු මාස නවය තුළ දී ශ්‍රී ලංකාවේ ආර්ථිකය සියයට 5.2 කින් ප්‍රසාරණය විය. කෘෂිකාර්මික අංශය, 2023 වසරේ පළමු මාස නවය තුළ දී වාර්තා වූ සියයට 3.3 ක වර්ධනයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 1.9 කින් සුළු වශයෙන් වර්ධනය විය. කර්මාන්ත අංශය, 2023 වසරේ පළමු මාස නවය තුළ දී වාර්තා වූ සියයට 13.3 ක සංකෝචනයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 11.2 කින් වර්ධනය විය.

සේවා අංශය, 2023 වසරේ පළමු මාස නවය තුළ දී වාර්තා වූ සියයට 1.3 ක සංකෝචනයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 2.6 කින් සුළු වශයෙන් වර්ධනය විය. අගය එකතු කළ වටිනාකම අනුව නිෂ්පාදන සඳහා බදු සහ සහනාධාර අතර වෙනස, 2023 වසරේ පළමු මාස නවය තුළ දී වාර්තා වූ සියයට 1.2 ක අඩුවීමට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 8.8 කින් වැඩි විය.

**වගුව 3.1 ස්ථාවර (2015) මිල ගණන් අනුව ද.දේ.නි. යේ ආංශික සංයුතිය**

*රු. මිලි.*

| | අංශය | 2021 | 2022 (අ) | 2023(අ) | පළමු මාස නවය 2023(අ) | පළමු මාස නවය 2024(ආ) | වර්ධනය (%) 2023(අ) | වර්ධනය (%) 2024(ආ) |
|---|---|---|---|---|---|---|---|---|
| | **කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය** | 950,548 | 910,842 | 934,248 | 687,832 | 701,121 | 3.3 | 1.9 |
| 1 | ධාන්‍ය (වී හැර) | 21,949 | 16,507 | 16,989 | 11,027 | 14,243 | -3.7 | 29.2 |
| 2 | වී වගාව | 107,359 | 94,730 | 113,690 | 74,476 | 75,672 | 31.2 | 1.6 |
| 3 | එළවළු වගාව | 109,147 | 103,161 | 106,494 | 84,023 | 83,635 | 5.8 | -0.5 |
| 4 | උක් වගාව දුම්කොළ වගාව සහ වෙනත් බහු වාර්ෂික නොවන භෝග | 3,729 | 3,797 | 3,507 | 2,646 | 2,645 | (9.0) | -0.1 |

*රු. මිලි.*

| | අංශය | 2021 | 2022 (අ) | 2023(අ) | පළමු මාස නවය | | වර්ධනය (%) | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | 2023(අ) | 2024(ආ) | 2023(අ) | 2024(ආ) |
| 5 | පළතුරු වගාව | 72,949 | 73,310 | 78,566 | 62,593 | 65,709 | 7.4 | 5.0 |
| 6 | තෙල් සහිත පළතුරු භෝග වගාව (පොල් තැඹිලි සහ ඔයිල් පාම් වගාව) | 102,490 | 111,196 | 107,223 | 80,481 | 77,582 | -4.3 | -3.6 |
| 7 | තේ වගාව | 74,604 | 62,867 | 61,912 | 46,895 | 47,014 | -2.8 | 0.3 |
| 8 | වෙනත් පානීය භෝග වගාවන් (කෝපි කොකෝවා ආදී) | 1,352 | 1,229 | 1,135 | 852 | 831 | -7.6 | -2.4 |
| 9 | කුළුබඩු , සුවඳ දෙන භෝග බෙහෙත් සහ ඖෂධීය පැලෑටි වගාව | 97,767 | 101,234 | 99,559 | 68998 | 71,220 | (0.1) | 3.2 |
| 10 | රබර් වගාව | 26,464 | 23,871 | 22,025 | 18131 | 15,983 | 0.5 | -11.9 |
| 11 | වෙනත් බහු වාර්ෂික භෝග වගාව | 26,963 | 27,533 | 29,979 | 23108 | 21,946 | 10.5 | -5.0 |
| 12 | සත්ව නිෂ්පාදනයන් | 94,039 | 83,322 | 84,812 | 63021 | 70,317 | -1.6 | 11.6 |
| 13 | පැල බෝ කිරීම | 813 | 965 | 727 | 624 | 512 | 15.2 | -18.0 |
| 14 | කෘෂිකාර්මික කටයුතු සඳහා වන ආධාරක කාර්යයන් | 29,019 | 33,062 | 33,569 | 24514 | 24,170 | 2.1 | -1.4 |
| 15 | වන වගාව දැව හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන | 44,348 | 50,931 | 47,221 | 34,752 | 33,310 | -5.7 | -4.1 |
| 16 | කරදිය ධීවර කර්මාන්තය සහ කරදිය ජලජීවී වගාව | 112,814 | 95,447 | 100,099 | 72,506 | 76,830 | 3.7 | 6.0 |
| 17 | මිරිදිය ධීවර කර්මාන්තය හා මිරිදිය ජලජීවී වගාව | 24,742 | 27,682 | 26,739 | 19,184 | 19,503 | -5.0 | 1.7 |
| | **කර්මාන්ත** | **3,937,895** | **3,308,578** | **3,003,096** | **2,313,194** | **2,572,159** | **-13.3** | **11.2** |
| 18 | පතල් හා කැණීම් කර්මාන්තය | 287,969 | 198,612 | 154,291 | 117,894 | 143,471 | -28.1 | 21.7 |
| 19 | ආහාර, බීම සහ දුම් කොළ නිෂ්පාදනය | 1,014,150 | 869,373 | 899,777 | 682,512 | 725,331 | 0.8 | 6.3 |
| 20 | රෙදිපිළි, නිමිඇඳුම් සහ සම්භාණ්ඩ නිෂ්පාදනය | 473,911 | 511,863 | 450,498 | 394,878 | 432,124 | 12.0 | 9.4 |
| 21 | ගෘහ භාණ්ඩ හැර දැව හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 35,579 | 29,758 | 23,807 | 15,797 | 17,608 | -25.9 | 11.5 |
| 22 | කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන, මුද්‍රණ කටයුතු සහ දෘශ්‍ය හා ශ්‍රවණ තැටි නැවත නිෂ්පාදනය | 56,811 | 52,069 | 47,259 | 36,925 | 38,132 | -8.3 | 3.3 |
| 23 | අඟුරු සහ ඛනිජතෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන | 15,492 | 6,474 | 21,895 | 16,170 | 13,981 | 194.2 | -13.5 |
| 24 | රසායනික ද්‍රව්‍ය නිෂ්පාදනය, ඖෂධ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 95,793 | 82,349 | 82,949 | 63,082 | 72,654 | -3.6 | 15.2 |
| 25 | රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 97,436 | 67,505 | 56,157 | 44,734 | 48,483 | -21.4 | 8.4 |
| 26 | ලෝහමය නොවන වෙනත් ඛනිජ නිෂ්පාදන | 119,973 | 85,182 | 84,671 | 60,129 | 61,972 | -7.4 | 3.1 |
| 27 | ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 81,174 | 58,780 | 60,303 | 34,723 | 44,160 | -16.9 | 27.2 |
| 28 | යන්ත්‍රෝපකරණ නිෂ්පාදන | 73,090 | 59,181 | 50,229 | 33,394 | 34,564 | -19.4 | 3.5 |
| 29 | ගෘහ භාණ්ඩ නිෂ්පාදන | 82,694 | 60,837 | 56,089 | 46,027 | 48,069 | -14.1 | 4.4 |
| 30 | කර්මාන්ත, යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව හා සවිකිරීම | 101,048 | 79,088 | 66,747 | 53,505 | 57,905 | -18.3 | 8.2 |

රු. මිලි.

| අංශය | 2021 | 2022 (අ) | 2023(අ) | පළමු මාස නවය 2023(අ) | පළමු මාස නවය 2024(ආ) | වර්ධනය (%) 2023(අ) | වර්ධනය (%) 2024(ආ) |
|---|---|---|---|---|---|---|---|
| 31 විදුලිය, ගෑස්, වායු හා වායු සමීකරණ සැපයීම | 188,924 | 178,057 | 174,018 | 129,591 | 151,007 | -5.9 | 16.5 |
| 32 ජලය එක් රැස් කිරීම, පිරිසිදු කිරීම සහ බෙදාහැරීම | 13,099 | 14,059 | 11,590 | 9,561 | 10,058 | -14.4 | 5.2 |
| 33 මලාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය | 27,992 | 28,070 | 27,955 | 21,334 | 21,245 | -0.8 | -0.4 |
| 34 ඉදිකිරීම් කර්මාන්තය | 1,172,761 | 927,321 | 734,859 | 552,938 | 651,395 | -26.5 | 17.8 |
| **සේවාවන්** | **7,410,705** | **7,218,205** | **7,200,438** | **5,256,350** | **5,393,082** | **-1.3** | **2.6** |
| 35 තොග හා සිල්ලර වෙළඳාම | 1,675,083 | 1,675,534 | 1,677,928 | 1,266,181 | 1,278,860 | 0.0 | 1.0 |
| 36 මගීන් හා භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම | 1,325,233 | 1,364,679 | 1,418,410 | 1,024,454 | 1,051,235 | 4.4 | 2.6 |
| 37 තැපැල් හා කුරියර් සේවාවන් | 18,886 | 19,780 | 20,349 | 14,632 | 15,827 | 2.4 | 8.2 |
| 38 නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් | 130,743 | 166,030 | 209,140 | 152,457 | 194,668 | 21.2 | 27.7 |
| 39 ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශනය සහ එම නිෂ්පාදන කටයුතු | 42,161 | 37,350 | 36,551 | 27,598 | 28,640 | -6.1 | 3.8 |
| 40 විදුලි සංදේශ සේවාවන් | 131,952 | 140,524 | 137,403 | 102,573 | 106,590 | -3.3 | 3.9 |
| 41 පරිගණක වැඩසටහන් සම්පාදනය පිළිබඳ උපදේශන සේවාවන් හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් | 243,971 | 238,455 | 187,341 | 142,283 | 153,343 | -22.5 | 7.8 |
| 42 මූල්‍ය සේවා ක්‍රියාකාරකම් හා අතිරේක මූල්‍ය සේවා | 596,106 | 529,907 | 477,047 | 355,732 | 369,575 | -14.6 | 3.9 |
| 43 රක්ෂණය, ප්‍රතිරක්ෂණය හා විශ්‍රාම අරමුදල් | 148,658 | 78,728 | 99,192 | 71,477 | 80,822 | 19.3 | 13.1 |
| 44 නිවාස අයිතිය හා දේපල වෙළඳාම | 630,570 | 554,456 | 521,465 | 386,206 | 401,648 | -9.4 | 4.0 |
| 45 වෘත්තියමය සේවාවන් | 301,890 | 248,468 | 254,360 | 175,503 | 179,064 | -2.0 | 2.0 |
| 46 රාජ්‍ය පරිපාලනය හා ආරක්ෂාව, අත්‍යාවශ්‍ය සමාජ ආරක්ෂාව | 621,834 | 629,031 | 618,542 | 443,156 | 429,853 | -1.5 | -3.0 |
| 47 අධ්‍යාපනය | 290,475 | 302,435 | 307,740 | 230,175 | 235,151 | 2.1 | 2.2 |
| 48 සෞඛ්‍ය, නේවාසික රැකවරණ සේවාවන් සහ සමාජ සේවාවන් | 260,482 | 237,677 | 236,092 | 171,283 | 169,910 | -1.7 | -0.8 |
| 49 වෙනත් පෞද්ගලික සේවාවන් | 992,662 | 995,154 | 998,877 | 692,637 | 697,895 | 0.5 | 0.8 |
| **සමස්ත එකතුකළ අගය (GVA), මූලික මිළ ගණන් අනුව** | **12,299,149** | **11,437,626** | **11,137,782** | **8,257,375** | **8,666,362** | **-4.7** | **5.0** |
| **(+) භාණ්ඩ හා සේවා මත අයකරන බදු (-) සහනාධාර** | **826,356** | **723,576** | **743,954** | **536,372** | **583,456** | **-1.2** | **8.8** |
| **දළ දේශීය නිෂ්පාදිතය (GDP), වෙළඳපොළ මිල** | **13,125,505** | **12,161,202** | **11,881,736** | **8,793,747** | **9,249,818** | **-4.5** | **5.2** |

*මූලාශ්‍රය :ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

*(අ) සංශෝධිත*

*(ආ) තාවකාලික*

### කෘෂිකර්මාන්තය

ද.දේ.නි.යෙන් සියයට 8.6 ක් සඳහා දායකත්වය දක්වන කෘෂිකාර්මික අංශය, 2023 වසරේ පළමු මාස නවය තුළ දී වාර්තා වූ සියයට 3.3 ක වර්ධනයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 1.9 කින් සුළු වශයෙන් වර්ධනය විය. ධාන්‍ය වගාව (වී හැර), සත්ත්ව නිෂ්පාදනය, කරදිය ධීවර කර්මාන්තය සහ කරදිය ජලජීවී වගාව, සහ පළතුරු වගාව වැනි උප අංශයන්හි ධනාත්මක වර්ධනය මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ නමුත්, රබර් වගාව, සහ පැල බෝ කිරීම වැනි උප අංශ මෙම කාලපරිච්ඡේදය තුළ දී සැලකිය යුතු ලෙස සංකෝචනය විය.

**රූපසටහන 3.3 : කෘෂිකාර්මික අංශයේ සංයුතිය - 2024 පළමු මාස නවය**




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

### වී වගාව

වී වගාව යන උප අංශය, 2023 වසරේ පළමු මාස නවය තුළ දී වාර්තා වූ සියයට 31.2 ක ප්‍රසාරණයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 1.6 කින් සුළු වශයෙන් ප්‍රසාරණය විය. 2024 වසරේ මාර්තු මස අවසානය වන විට වාර්තා වී ඇති වපුරන ලද බිම් ප්‍රමාණය මත පදනම්ව ගත් විට, 2023/2024 මහ කන්නයේ වී නිෂ්පාදනය වී මෙට්‍රික් ටොන් මිලියන 2.63 ක් වන අතර, එය සහල් මෙට්‍රික් ටොන් මිලියන 1.65 ක් පමණ වේ. එය 2022/2023 මහ කන්නයේ අස්වැන්නට සාපේක්ෂව සියයට 2.4 ක පහත වැටීමකි. එසේ වුවද, 2024 වසරේ සැප්තැම්බර් මස අවසන් වන විට වාර්තා වී ඇති වපුරන ලද බිම් ප්‍රමාණය මත පදනම්ව ගත් විට, 2024 යල කන්නයේ අපේක්ෂිත වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 2.02 ක් වන අතර, එය 2023 යල කන්නයේ අස්වැන්නට සාපේක්ෂව සියයට 11.4 ක ඉහළ යාමකි. 2024/2025 මහ කන්නයේ වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් මිලියන 2.56ක් ලෙස ගණනය කර ඇත.

### තේ, රබර් සහ පොල්

අගය එකතු කළ වටිනාකම අනුව තේ නිෂ්පාදනය 2023 වසරේ පළමු මාස නවය තුළ සියයට 2.8 කින් ආන්තික ලෙස සංකෝචනය වූ අතර ඊට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 0.3 කින් ආන්තික වශයෙන් වර්ධනය විය. 2023 වසරේ පළමු මාස නවය තුළ දී වාර්තා වූ කිලෝග්‍රෑම් මිලියන 191.7 ක තේ නිෂ්පාදනයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 195.6 ක් විය. අයහපත් කාලගුණික තත්ත්වයන් මධ්‍යයේ වුවද තේ නිෂ්පාදනය මෙලෙස සුළු වශයෙන් ඉහළයාමට හේතු වූයේ රසායනික පොහොර තහනම ඉවත් කිරීමත් සමඟ තේ කර්මාන්තය ක්‍රමයෙන් යථා තත්ත්වයට පත්වීමයි. රබර් වගාව යන උප අංශය 2023 වසරේ පළමු මාස නවය තුළ දී වාර්තා වූ සියයට 0.5 ක ආන්තික වර්ධනයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 11.9 කින් සංකෝචනය විය. 2023 වසරේ පළමු මාස නවය තුළ දී වාර්තා වූ කිලෝග්‍රෑම් මිලියන 53.8 ක රබර් නිෂ්පාදනයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රබර් නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 49.6 ක් දක්වා පහත වැටී ඇත. තවද, තෙල් සහිත පළතුරු භෝග වගාව (පොල්, තැඹිලි සහ ඔයිල් පාම් වගාව) යන උප අංශය ද 2023 වසරේ පළමු මාස නවය තුළ දී වාර්තා වූ සියයට 4.3 ක සංකෝචනයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 3.6 කින් ආන්තික වශයෙන් සංකෝචනය විය. ඒ අනුව, 2023 වසරේ පළමු මාස නවය තුළ දී වාර්තා වූ ගෙඩි මිලියන 2,381 ක පොල් නිෂ්පාදනයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී පොල් නිෂ්පාදනය ගෙඩි මිලියන 2,286 ක් දක්වා සියයට 4.0 කින් අඩු විය.

### ධාන්‍ය වර්ග, එළවළු, පළතුරු, කුළුබඩු සහ ඖෂධ භෝග

ධාන්‍ය වගාව (වී හැර) යන උප අංශය 2023 වසරේ පළමු මාස නවයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 29.2 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇති අතර රසායනික පොහොර ලබා ගැනීමේ හැකියාව ඉහළ යාම මේ සඳහා හේතු විය. අගය එකතු කළ වටිනාකම අනුව එළවළු වගාව යන උප අංශය 2023 වසරේ පළමු මාස නවය තුළ දී වාර්තා වූ සියයට 5.8 ක වර්ධනයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 0.5 කින් සුළු වශයෙන් සංකෝචනය වූ අතර, පළතුරු වගාව යන උප අංශය 2023 වසරේ පළමු මාස නවය තුළ දී වාර්තා වූ සියයට 7.4 ක වර්ධනයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 5.0 කින් වර්ධනය විය. අගය එකතු කළ වටිනාකම අනුව කුළුබඩු, සුවඳ දෙන භෝග, බෙහෙත් සහ ඖෂධීය පැලෑටි නිෂ්පාදනය 2024 වසරේ පළමු මාස නවය තුළ දී සියයට 3.2 කින් ආන්තික වශයෙන් වැඩි විය.

### ධීවර හා පශු සම්පත්

අගය එකතු කළ වටිනාකම අනුව, කරදිය ධීවර කර්මාන්තය සහ කරදිය ජලජීවී වගාව යන උප අංශය 2023 වසරේ පළමු මාස නවය තුළ දී වාර්තා වූ සියයට 3.7 ක ආන්තික වර්ධනයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 6.0 කින් වර්ධනය විය. අගය එකතු කළ වටිනාකම අනුව, මිරිදිය ධීවර කර්මාන්තය සහ මිරිදිය ජලජීවී වගාව යන උප අංශය 2023 වසරේ පළමු මාස නවය තුළ දී වාර්තා වූ සියයට 5.0 ක සංකෝචනයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 1.7 කින් ආන්තික ලෙස වර්ධනය විය. සමස්ත මත්ස්‍ය නිෂ්පාදනය (කරදිය සහ මිරිදිය) 2023 වසරේ පළමු මාස නවය තුළ වූ කිලෝග්‍රෑම් මිලියන 294 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී කිලෝග්‍රෑම් මිලියන 308 ක් දක්වා සුළු වශයෙන් වැඩි විය. අගය එකතු කළ වටිනාකම අනුව, සත්ත්ව නිෂ්පාදනය යන උප අංශය 2023 වසරේ පළමු මාස නවය තුළ දී වාර්තා වූ සියයට 1.6 ක ආන්තික සංකෝචනයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 11.6 කින් වර්ධනය විය.

### කර්මාන්ත හා නිෂ්පාදන

ද.දේ.නි.යෙන් සියයට 26.4 ක් සඳහා දායකත්වය දක්වන කර්මාන්ත අංශය, 2023 වසරේ පළමු මාස නවය තුළ දී වාර්තා වූ සියයට 13.3 ක සෘණාත්මක වර්ධනයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 11.2 ක ධනාත්මක වර්ධනයක් වාර්තා කරන ලදී. ඉදිකිරීම් කර්මාන්තය, පතල් හා කැණීම් කර්මාන්තය, ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන, රසායනික ද්‍රව්‍ය සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන, ඖෂධ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන, සහ විදුලිය, ගෑස්, වායු හා වායු සමීකරණ සැපයීම යන උප අංශ පිළිවෙළින් සියයට 17.8, සියයට 21.7, සියයට 27.2, සියයට 15.2, හා සියයට 16.5 ක් ලෙස ධනාත්මක වර්ධනයන් වාර්තා කිරීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

මීට අමතරව ආහාර, බීම සහ දුම්කොළ නිෂ්පාදනය (සියයට 6.3), රෙදිපිළි, නිමිඇඳුම් සහ සම්භාණ්ඩ නිෂ්පාදනය (සියයට 9.4), ගෘහභාණ්ඩ හැර දැව හා ඒ ආශ්‍රිත නිෂ්පාදන (සියයට 11.5), කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන, මුද්‍රණ කටයුතු සහ දෘෂ්‍ය හා ශ්‍රව්‍ය තැටි නැවත නිෂ්පාදනය (සියයට 3.3), රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන (සියයට 8.4), ලෝහමය නොවන වෙනත් ඛනිජ නිෂ්පාදන (සියයට 3.1), යන්ත්‍රෝපකරණ නිෂ්පාදන (සියයට 3.5), ගෘහ භාණ්ඩ නිෂ්පාදන (සියයට 4.4), වෙනත් නිෂ්පාදන කර්මාන්ත (සියයට 8.2), සහ ජලය එක් රැස් කිරීම, පිරිසිදු කිරීම සහ බෙදා හැරීම (සියයට 5.2) යන උප අංශ ද 2023 වසරේ පළමු මාස නවයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී වර්ධනය වී ඇත.

**රූපසටහන 3.4 : කර්මාන්ත අංශයේ සංයුතිය - 2024 පළමු මාස නවය**




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

කෙසේ නමුත්, අඟුරු සහ ඛනිජතෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන යන උප අංශය 2023 වසරේ පළමු මාස නවය තුළ දී වාර්තා වූ සියයට 194.2 ක ශක්තිමත් වර්ධනයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 13.5 කින් සංකෝචනය විය. තවද, මලාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය ද 2023 වසරේ පළමු මාස නවය තුළ දී වාර්තා වූ සියයට 0.8 ආන්තික වර්ධනයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 0.4 කින් ආන්තික ලෙස සංකෝචනය විය.

සමස්ත බලශක්ති උත්පාදනය, 2023 වසරේ පළමු මාස නවය තුළ දී වාර්තා වූ ගිගාවොට් පැය 11,740 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ගිගාවොට් පැය 12,565 ක් දක්වා සියයට 7.0 කින් වැඩි විය. කර්මාන්ත අංශයේ ක්‍රියාකාරකම්වල ප්‍රසාරණය හේතුවෙන්, කර්මාන්ත අංශයට අලෙවි කළ විදුලි ඒකක ගණන, 2023 වසරේ පළමු මාස නවය තුළ දී වාර්තා වූ ගිගාවොට් පැය 3,185 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ගිගාවොට් පැය 3,459 ක් දක්වා සියයට 8.6 කින් වැඩි විය.

**රූපසටහන 3.5 : නිෂ්පාදන අංශයේ සංයුතිය - 2024 පළමු මාස නවය**




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

ජල විදුලිය මඟින් විදුලිය උත්පාදනය, 2023 වසරේ පළමු මාස නවය තුළ දී වාර්තා වූ ගිගාවොට් පැය 2,552 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ගිගාවොට් පැය 3,848 ක් දක්වා සියයට 50.8 කින් සැලකිය යුතු ලෙස වැඩි විය. ගල් අඟුරු මඟින් විදුලිය උත්පාදනය ද 2023 වසරේ පළමු මාස නවය තුළ දී වාර්තා වූ ගිගාවොට් පැය 3,909 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ගිගාවොට් පැය 4,397 ක් දක්වා සියයට 12.5 කින් වැඩි විය. කෙසේ නමුත්, 2024 වසරේ පළමු මාස නවය තුළ දී ඉන්ධන මඟින් විදුලි උත්පාදනය සියයට 36.3 කින් සැලකිය යුතු ලෙස අඩු වී ඇති අතර, සුළං මඟින් විදුලිය නිෂ්පාදනය ද සියයට 3.2 කින් සුළු වශයෙන් අඩු වී ඇත.

### සේවා අංශය

ද.දේ.නි.යෙන් සියයට 56.7 ක් සඳහා දායකත්වය දක්වන සේවා අංශය, 2023 වසරේ පළමු මාස නවය තුළ දී වාර්තා වූ සියයට 1.3 ක ආන්තික සංකෝචනයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී සියයට 2.6 කින් ආන්තික ලෙස වර්ධනය විය. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන්, සහ රක්ෂණය, ප්‍රතිරක්ෂණය හා විශ්‍රාම අරමුදල් යන උප අංශ පිළිවෙලින් සියයට 27.7 කින් සහ සියයට 13.1 කින් ප්‍රසාරණය වීමයි.

මීට අමතරව 2024 වසරේ පළමු මාස නවය තුළ දී, තොග හා සිල්ලර වෙළෙඳාම (සියයට 1.0), මඟීන් හා භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම (සියයට 2.6), තැපැල් හා කුරියර් සේවාවන් (සියයට 8.2), ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශනය සහ එම නිෂ්පාදන කටයුතු (සියයට 3.8), විදුලි සංදේශ සේවාවන් (සියයට 3.9), පරිගණක වැඩසටහන් සම්පාදනය පිළිබඳ උපදේශන සේවාවන් හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් (සියයට 7.8), මූල්‍ය සේවා ක්‍රියාකාරකම් හා අතිරේක මූල්‍ය සේවා (සියයට 3.9), නිවාස අයිතිය හා දේපල වෙළෙඳාම (සියයට 4.0), වෘත්තීයමය සේවාවන් (සියයට 2.0), අධ්‍යාපනය (සියයට 2.2) සහ වෙනත් පෞද්ගලික සේවාවන් (සියයට 0.8) යන උප අංශ ද ප්‍රසාරණය විය. කෙසේ නමුත්, 2024 වසරේ පළමු මාස නවය තුළ දී, රාජ්‍ය පරිපාලනය හා ආරක්ෂාව, අත්‍යවශ්‍ය සමාජ ආරක්ෂාව (සියයට 3.0) සහ සෞඛ්‍ය, නේවාසික රැකවරණ සේවාවන් සහ සමාජ සේවාවන් (සියයට 0.8) යන උප අංශයන්ගේ පසුබෑමක් වාර්තා විය.

### ප්‍රවාහන හා තොටුපොළ සේවා

ප්‍රවාහන අංශය, 2024 වසරේ පළමු මාස නවය තුළ දී සියයට 2.6 ක වර්ධනයක් වාර්තා කරන ලදී. 2023 වසරේ පළමු මාස නවය තුළ දී 17,547 ක් වූ නව වාහන ලියාපදිංචි කිරීම් සංඛ්‍යාව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී 49,053 ක් දක්වා සියයට 179.6 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත.

2024 වසරේ පළමු මාස නවය තුළ දී ත්‍රීරෝද රථ (සියයට 8.2), ද්විත්ව කාර්යය රථ (සියයට 101.6), යතුරුපැදි (සියයට 239.1), භාණ්ඩ ප්‍රවාහන රථ (සියයට 192.3), සහ ගොඩබිම් වාහන (සියයට 52.8) ලියාපදිංචි කිරීම් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති නමුත්, 2024 වසරේ පළමු මාස නවය තුළ දී බස් රථ (සියයට 79.3) සහ මෝටර් රථ (සියයට 13.4) ලියාපදිංචි කිරීම් පහළ ගොස් ඇත.

2023 වසරේ පළමු මාස නවය තුළ දී මෙහෙයවන ලද මුළු බහාලුම් සංඛ්‍යාව වන අඩි 20 බහාලුම් ඒකක (TEUs) මිලියන 5.3 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී එම සංඛ්‍යාව අඩි 20 බහාලුම් ඒකක මිලියන 5.8 ක් දක්වා සියයට 9.9 කින් වැඩි වී ඇත. 2024 වසරේ පළමු මාස නවය තුළ දී මෙහෙයවන ලද දේශීය බහාලුම් සංඛ්‍යාව සියයට 19.8 කින් ද, ප්‍රතිනැව්ගත කිරීම් සඳහා මෙහෙයවන ලද බහාලුම් සංඛ්‍යාව සියයට 6.7 කින් ද, නැවත ගබඩා කිරීම සඳහා මෙහෙයවන ලද බහාලුම් සංඛ්‍යාව සියයට 64.7 කින් ද ඉහළ ගොස් ඇත.

සමස්ත භාණ්ඩ මෙහෙයුම් සංඛ්‍යාව 2023 වසරේ පළමු මාස නවය තුළ දී වාර්තා කළ මෙට්‍රික් ටොන් මිලියන 78.7 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී මෙට්‍රික් ටොන් මිලියන 89.5 ක් දක්වා සියයට 13.7 කින් ඉහළ ගොස් ඇත. මුදාහරින ලද භාණ්ඩ ප්‍රමාණය, 2023 වසරේ පළමු මාස නවය තුළ දී වාර්තා කළ මෙට්‍රික් ටොන් මිලියන 42.5 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී මෙට්‍රික් ටොන් මිලියන 49.2 ක් දක්වා සියයට 15.9 කින් ඉහළ ගොස් ඇත. එමෙන්ම පටවන ලද භාණ්ඩ ප්‍රමාණය ද, 2023 වසරේ පළමු මාස නවය තුළ දී වාර්තා කළ මෙට්‍රික් ටොන් මිලියන 36.2 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී මෙට්‍රික් ටොන් මිලියන 40.2 ක් දක්වා සියයට 11.1 කින් ඉහළ ගොස් ඇත.

රූපසටහන **3.6 : සේවා අංශයේ සංයුතිය 2024 පළමු මාස නවය**




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

**වගුව 3.2 : සේවා අංශයේ තෝරාගත් දර්ශකයන්**

| දර්ශකය | 2020 | 2021 | 2022 | 2023(w) | 2023 ^w& | 2024 ^w& |
|---|---|---|---|---|---|---|
| **වරාය සේවා** | | | | | **ජන. - ඔක්.** | **ජන. - ඔක්.** |
| පැමිණි නැව් සංඛ්‍යාව | 4,337 | 4,180 | 4,073 | 4,809 | 4,016 | 3,780 |
| මෙහෙයවන ලද මුළු භාණ්ඩ (මෙ.ටො. 000) | 102,908 | 109,356 | 100,376 | 103,794 | 86,481 | 99,794 |
| මෙහෙයවන ලද මුළු බහළුම් (TEU 000) | 6,855 | 7,249 | 6,862 | 6,950 | 5,796 | 6,461 |
| ප්‍රති නැව්ගත කිරීම (TEU 000) | 5,765 | 6,050 | 5,832 | 5,754 | 4,844 | 5,248 |
| **විදුලි සංදේශ අංශය** | | | | | **ජන.- සැප්.** | **ජන.- සැප්.** |
| ස්ථාවර දුරකථන (සංඛ්‍යාව ‘000) | 2,613 | 2,852 | 2,651 | 2,308 | 2,389 | 2,526 |
| ජංගම දුරකථන (සංඛ්‍යාව ‘000) | 28,739 | 29,959 | 28,838 | 28,986 | 29,035 | 28,884 |
| රැහැන් රහිත දුරකථන (සංඛ්‍යාව ‘000) | 1,367 | 1,587 | 1,388 | 1,163 | 1,211 | 1,449 |
| අන්තර්ජාල හා විද්‍යුත් තැපැල් ග්‍රාහකයන් (සංඛ්‍යාව ‘000) | 17,524 | 22,106 | 21,668 | 22,864 | 22,084 | 22,958 |
| **සෞඛ්‍ය අංශය** | | | | | | |
| පෞද්ගලික රෝහල් | 217 | 243 | 250 | ලැ.නො | ලැ.නො | ලැ.නො. |
| රජයේ රෝහල් | 609 | 618 | 617 | ලැ.නො | ලැ.නො | ලැ.නො. |
| ඇඳන් සංඛ්‍යාව (රජයේ) | 77,121 | 78,228 | 78,228 | ලැ.නො | ලැ.නො | ලැ.නො. |
| වෛද්‍යවරුන් සංඛ්‍යාව (රජයේ) | 18,218 | 20,209 | 21,045 | ලැ.නො | ලැ.නො | ලැ.නො. |
| හෙදියන් සංඛ්‍යාව | 37,133 | 39,091 | 40,775 | ලැ.නො | ලැ.නො | ලැ.නො. |
| **මූල්‍ය අංශය** | | | | | **සැප්.** | **සැප්.** |
| බැංකු ශාඛා හා අනෙකුත් සේවා මධ්‍යස්ථාන | 7,406 | 7,369 | 7,378 | 7,522 | 7,523 | 7,526 |
| ලියාපදංචි මූල්‍ය සමාගම් (ඉ) | 40 | 39 | 37 | 33 | 33 | 32 |
| ලියාපදිංචි කල්බදු සමාගම් | 3 | 3 | 1 | 1 | 1 | 1 |
| **ණය කාඩ්පත් (ක්‍රියාකාරී)** | 1,984,525 | 2,054,985 | 2,054,896 | 1,987,857 | 1,989,403 | 1,950,204 |
| **සංචාරක අංශය** | | | | | **ජන. - නො.** | **ජන. - නො.** |
| පැමිණි සංචාරක සංඛ්‍යාව | 507,704 | 194,495 | 719,978 | 1,487,303 | 1,276,951 | 1,804,873 |
| සංචාරක ඉපැයීම් (ඇ.ඩො. මිලියන) | 682 | 507 | 1,136 | 2,068 | 1,799 | 2,807 |
| හෝටල් කාමර නැවතුම් අනුපාතය | 15.0 | 18.6 | 30.4 | 39 | ලැ.නො | ලැ.නො. |
| **ප්‍රවාහන සේවා (අලුතින් ලියාපදංචි කිරීම)** | | | | | **ජන. - ඔක්.** | **ජන. - ඔක්.** |
| බස් රථ | 578 | 281 | 404 | 685 | 598 | 120 |
| මෝටර් කාර් | 21,021 | 3,495 | 1,489 | 1,816 | 1,505 | 1,405 |
| භාණ්ඩ ප්‍රවාහන රථ (ඈ) | 3,941 | 4,432 | 1,833 | 523 | 378 | 995 |
| යතුරුපැදි | 151,634 | 8,011 | 9,060 | 20,200 | 14,698 | 49,463 |
| ත්‍රිරෝද රථ | 7,150 | 2,093 | 36 | 60 | 30 | 62 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| ට්‍රැක්ටර් සහ ට්‍රේලර්ස් (ඈ) | 8,302 | 14,764 | 6,929 | 4,020 | 3,096 | 4,175 |
| වෙනත්(ඊ) | 10,002 | 774 | 760 | 586 | 361 | 874 |

*මූලාශ්‍රය - ශ්‍රී ලංකා මහ බැංකුව*

*(අ) තාවකාලික*

*(ආ) නැවත (ඇසිරීම්) ඇතුලත් වේ.*

*(ඇ) විශේෂ කාර්ය වාහන,මෝටර් ලොරි සහ ලොරි අනෙකුත්*

*(ඈ) රෝද හතරේ ට්‍රැක්ටර්, අත් ට්‍රැක්ටර් සහ ට්‍රේලර්ස් මෙහි ඇතුළත් වේ.*

*(ඉ) ETI මූල්‍ය සමාගම ඇතුළත් නෙවේ.*

*(ඊ) තනි කැබ්රථ, ද්විත්ව කාර්යය වාහන, ක්වඩ්‍රිසයිකල් සහ මෝටර් නිවාස ඇතුළුව*

## විදුලි සංදේශ

අගය එකතු කළ වටිනාකම අනුව, විදුලි සංදේශ යන උප අංශය, 2024 වසරේ පළමු මාස නවය තුළ දී සියයට 3.9 ක වර්ධනයක් වාර්තා කරන ලදී. සෙලියුලර් දුරකථන ඇතුළු දුරකථන ඝනත්වය, 2023 වසරේ පළමු මාස නවය තුළ දී පැවැති පුද්ගලයන් 100 කට 142.6 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී පුද්ගලයන් 100 කට 143.3 ක් දක්වා සියයට 0.5 කින් ආන්තික ලෙස වැඩි වී ඇත. ජංගම අන්තර්ජාල සම්බන්ධතා ඇතුළු අන්තර්ජාල ග්‍රාහකයන් සංඛ්‍යාව, 2024 වසරේ පළමු මාස නවය තුළ දී මිලියන 22.9 ක් දක්වා සියයට 4.0 කින් වැඩි වී ඇත. භාවිතයේ පවතින ස්ථාවර දුරකථන සංඛ්‍යාව 2024 වසරේ පළමු මාස නවය තුළ දී සියයට 5.7 කින් ඉහළ ගොස් ඇති නමුත් එම කාලපරිච්ඡේදය තුළ දී, භාවිතයේ පවතින සෙලියුලර් දුරකථන සංඛ්‍යාව සියයට 0.5 කින් ආන්තික ලෙස පහත වැටී ඇත.

**වගුව 3.3 : සංචාරක අංශයේ කාර්යසාධනය**

| මාසය | සංචාරකයින්ගේ පැමිණීම | | | | | සංචාරක ඉපයීම් (ඇ.ඩො. මිලියන) | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2020 | 2021 | 2022 | 2023 | 2024(අ) | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
| ජනවාරි | 228,434 | 1,682 | 82,327 | 102,545 | 208,253 | 307.0 | 4.4 | 151.7 | 153.5 | 341.8 |
| පෙබරවාරි | 207,507 | 3,366 | 96,507 | 107,639 | 218,350 | 278.9 | 8.8 | 169.4 | 161.6 | 345.7 |
| මාර්තු | 71,370 | 4,581 | 106,500 | 125,495 | 209,181 | 95.9 | 11.9 | 161.2 | 188.8 | 338.4 |
| අප්‍රේල් | 0 | 4,168 | 62,980 | 105,498 | 148,867 | 0.0 | 10.9 | 108.70 | 148.2 | 225.7 |
| මැයි | 0 | 1,497 | 30,207 | 83,309 | 112,128 | 0.0 | 3.9 | 43.52 | 100.0 | 154.0 |
| ජුනි | 0 | 1,614 | 32,856 | 100,388 | 113,470 | 0.0 | 4.2 | 45.0 | 122.9 | 151.1 |
| ජූලි | 0 | 2,429 | 47,293 | 143,039 | 187,810 | 0.0 | 6.3 | 85 | 219.0 | 328.3 |
| අගෝස්තු | 0 | 5,040 | 37,760 | 136,405 | 164,609 | 0.0 | 13.1 | 67.90 | 210.5 | 282.1 |
| සැප්තැම්බර් | 0 | 13,547 | 29,802 | 111,938 | 122,140 | 0.0 | 35.3 | 40.50 | 152.2 | 181.0 |
| ඔක්තෝබර් | 0 | 22,771 | 42,026 | 109,199 | 135,907 | 0.0 | 59.3 | 54.93 | 136.7 | 185.6 |
| නොවැම්බර් | 0 | 44,294 | 59,759 | 151,496 | 184,158 | 0.0 | 115.4 | 81.00 | 205.3 | 272.9 |
| දෙසැම්බර් | 393 | 89,506 | 91,961 | 210,352 | 248,592 | 0.5 | 233.3 | 127.4 | 269.3 | 362.1 |
| **එකතුව** | **507,704** | **194,495** | **719,978** | **1,487,303** | **2,053,465** | **682.4** | **506.8** | **1,136.3** | **2,068.0** | **3,168.6** |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය*

*(අ) තාවකාලික*

## සේවා වියුක්තිය

සේවා වියුක්ති අනුපාතය 2024 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා වූ සියයට 4.5 ට සාපේක්ෂව එම වසරේ දෙවන කාර්තුවේ දී සියයට 4.7 ක් දක්වා වැඩි විය. 2024 වසරේ දෙවන කාර්තුවේ දී කාන්තාවන් සහ පිරිමින් අතර සේවා වියුක්ති අනුපාතය පිළිවෙළින් සියයට 7.0 ක් සහ සියයට 3.6 ක් ලෙස වාර්තා විය. මෙ අතර, 2024 වසරේ දෙවන කාර්තුව තුළ තරුණ වයස් කාණ්ඩයේ (වයස අවුරුදු 15 - 24) සේවා

වියුක්ති අනුපාතය සියයට 25.4 ක් වූ අතර, එය සියලුම වයස් කාණ්ඩ අතුරින් වාර්තා වූ ඉහළම සේවා වියුක්ති අනුපාතය සනිටුහන් කරයි. සියලුම වයස් කාණ්ඩවල කාන්තාවන් අතර සේවා වියුක්තිය පිරිමින්ට වඩා වැඩිය.

මේ අතර, ශ්‍රම බලකායේ සහභාගීත්ව අනුපාතය 2024 වසරේ පළමු කාර්තුවේ දී වාර්තා වූ සියයට 47.1 ට සාපේක්ෂව 2024 වසරේ දෙවන කාර්තුවේ දී සියයට 47.8 ක් දක්වා සුළු වශයෙන් වැඩි විය. 2024 වසරේ දෙවන කාර්තුවේ දී කාන්තාවන් සහ පිරිමින් අතර ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය පිළිවෙළින් සියයට 30.0 ක් සහ සියයට 68.1 ක් ලෙස වාර්තා විය.

**රූපසටහන 3.7 : ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය සහ සේවා වියුක්තිය**




*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

**වගුව 3.4 : ද.දේ.නි. වර්ධනයේ ආංශික ව්‍යාප්තිය (%)**

| අංශය | 2019 | 2020 | 2021 | 2022 | 2023(අ) | පළමු මාස නවය | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | 2023(අ) | 2024(ආ) |
| **කෘෂිකර්මාන්තය** | **0.5** | **-0.9** | **1.0** | **-4.2** | **2.6** | **3.3** | **1.9** |
| තේ වගාව | -3.3 | -6.5 | 9.8 | -15.7 | -1.5 | -2.8 | 0.3 |
| වී වගාව | 6.2 | 7.7 | -11.8 | -11.8 | 20.0 | -29.2 | 1.6 |
| රබර් වගාව | -7.8 | 0.2 | 9.9 | -9.8 | -7.7 | 0.5 | -11.9 |
| ධාන්‍ය වගාව | -9.0 | 59.8 | 2.8 | -24.8 | 2.9 | -3.7 | 29.2 |
| එළවළු වගාව | -2.9 | 8.9 | -1.7 | -5.5 | 3.2 | 5.8 | -0.5 |
| සත්ත්ව නිෂ්පාදන | -4.5 | -3.7 | 8.2 | -11.4 | 1.8 | -1.6 | 11.6 |
| වන වගාව, දැව හා වනාන්තර | -3.3 | -1.3 | 4.1 | 14.8 | -7.3 | -5.7 | -4.1 |
| ආශ්‍රිත නිෂ්පාදන | -4.4 | -17.0 | 1.5 | -10.5 | 3.0 | 1.7 | 5.1 |
| **කර්මාන්ත** | **-4.1** | **-5.3** | **5.7** | **-16.0** | **-9.2** | **-13.3** | **11.2** |
| පතල් හා කැණීම් | -1.2 | -10.9 | 1.4 | -31.0 | -22.3 | -28.1 | 21.7 |
| නිෂ්පාදන ක්‍රියාකාරකම් | 2.0 | -2.6 | -46.2 | -12.2 | -3.2 | -6.4 | 7.6 |
| අනෙකුත් කර්මාන්ත | 4.3 | -1.3 | 2.2 | -4.3 | -3.0 | -5.8 | 13.6 |
| ඉදිකිරීම් | -14.8 | -9.4 | 4.4 | -20.9 | -20.8 | -26.5 | 17.8 |
| **සේවා** | **2.9** | **-1.9** | **3.4** | **-2.6** | **-0.2** | **-1.3** | **2.6** |
| තොග හා සිල්ලර වෙළඳාම | 3.6 | 0.9 | 1.5 | 0.0 | 0.1 | 0.0 | 1.0 |
| ප්‍රවාහනය හා ගබඩා කිරීම | 2.0 | -6.1 | 0.9 | 3.0 | 3.9 | 4.4 | 2.6 |
| නවාතැන් හා ආහාර සැපයීමේ ක්‍රියාකාරකම් | -6.0 | -40.8 | 1.7 | 27.0 | 26.0 | 21.2 | 27.7 |
| තොරතුරු හා සන්නිවේදන | 17.6 | 15.0 | 11.0 | 6.5 | -2.2 | -3.3 | 3.9 |
| මූල්‍ය හා රක්ෂණ ක්‍රියාකාරකම් | 1.2 | 7.0 | 10.3 | -18.3 | -5.3 | -10.4 | 5.4 |
| නිශ්චල දේපල ක්‍රියාකාරකම් | 5.1 | -1.0 | 4.4 | -12.1 | -6.0 | -9.4 | 4.0 |
| වෘත්තීමය සේවා | 5.4 | -3.3 | 4.9 | -17.7 | 2.4 | -2.0 | 2.0 |
| අධ්‍යාපන, සෞඛ්‍ය හා සාමාජයීය ක්‍රියාකාරකම් | 4.6 | 2.5 | 3.7 | -2.0 | 0.7 | 0.5 | 0.9 |
| රාජ්‍ය පරිපාලන හා ආරක්ෂාව | 0.8 | 1.7 | 0.9 | 1.2 | -1.7 | -1.5 | -3.0 |
| අනෙකුත් සේවා (ස්වයං සේවා හැර) | 2.0 | -6.6 | 0.9 | 0.3 | 0.4 | 0.5 | 0.8 |
| **ද.දේ.නි.** | **-0.2** | **-4.6** | **4.2** | **-7.3** | **-2.3** | **-4.5** | **5.2** |

*මූලාශ්‍රය: ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව*

*(අ) සංශෝධිත*

*(ආ) තාවකාලික*

## 3.3 මුදල් අංශයේ වර්ධනයන්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR), නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) සහ ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR), 2023 වසරේ නොවැම්බර් මාසයේ සිට පැවති අගයන්ගේම, එනම් පිළිවෙළින් සියයට 9.00, සියයට 10.00 සහ සියයට 2.00 ලෙසම පවත්වා ගෙන යෑමට 2024 වසරේ ජනවාරි මාසයේ සිට ද කටයුතු කරන ලදී. 2024 වසරේ මාර්තු මාසයේ දී නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, පදනම් අංක 50 බැගින් පිළිවෙළින් සියයට 8.50 සහ සියයට 9.50 දක්වා අඩු කරන ලදී. ඉන් පසුව, 2024 වසරේ ජූලි මාසයේ දී, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය පදනම් අංක 25 බැගින් පිළිවෙළින් සියයට 8.25 සහ සියයට 9.25 දක්වා තවදුරටත් අඩු කරන ලද අතර, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය සියයට 2.00 ලෙසම පැවතිණි.

2024 වසරේ නොවැම්බර් මස 27 වන දින සිට බලපැවැත්වෙන පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුව ද්විත්ව ප්‍රතිපත්ති පොලී අනුපාත ක්‍රමවේදය වෙනුවට තනි ප්‍රතිපත්ති පොලී අනුපාත ක්‍රමවේදයකට සංක්‍රමණය විය. ඒ අනුව, සියයට 8.00 ක් ලෙස තීරණය කර ඇති එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය (OPR) ඉදිරියේදී මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දැනුම් දීම සඳහා සහ ක්‍රියාත්මක කිරීම සඳහා මහ බැංකුව භාවිතා කරන ප්‍රධාන මුදල් ප්‍රතිපත්ති මෙවලම බවට පත්විය. මීට අමතරව, මෙලෙස තනි ප්‍රතිපත්ති පොලී අනුපාත ක්‍රමවේදයකට සංක්‍රමණය වීමත් සමඟ, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය මහ බැංකුවේ ප්‍රතිපත්ති පොලී අනුපාත ලෙස තවදුරටත් නොසැලකේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මූල්‍ය ආයතනවලට සපයන සේවාවන්ට අදාළ එක් දින ගනුදෙනු සඳහා අදාළ වූ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය, වර්තමානයේ දී පදනම් අංක ± 50 ක ආන්තිකයක් සමඟ එක්දින ප්‍රතිපත්ති පොලී අනුපාතිකය සමඟ සම්බන්ධ කර ඇත. ඒ අනුව, නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සියයට 7.50 ක් ද, නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය සියයට 8.50 ක් ද වනු ඇත.

**රූපසටහන 3.8 : පොලී අනුපාතය, මුදල් සමස්ථයන්, මුදල් සැපයුම සහ පෞද්ගලික අංශයට ලබා දුන් ණයෙහි වර්ධනය**




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*

2023 වසරේ ඔක්තෝබර් මාසයේ දී සියයට 15.18 ක් වූ බරිත සාමාන්‍ය ණය පොලී අනුපාතිකය (AWLR) 2024 වසරේ නොවැම්බර් මාසයේ දී සියයට 12.09 ක් දක්වා පදනම් අංක 309 කින් අඩු වූ අතර, 2023 වසරේ නොවැම්බර් මාසයේ දී සියයට 12.11 ක් වූ බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) 2024 වසරේ නොවැම්බර් මාසයේ දී සියයට 7.59 ක් දක්වා පදනම් අංක 452 කින් අඩු විය.

පුළුල් මුදල් (M2b) සැපයුම 2024 වසරේ ජනවාරි මස ආරම්භයේ දී වාර්තා වූ රු. බිලියන 13,189 ක සිට 2024 වසරේ ඔක්තෝබර් මස අවසානයේ දී රු. බිලියන 14,009 ක් දක්වා සියයට 6.2 කින් වැඩි වූ අතර, පුද්ගලික අංශයට ලබාදුන් ණය 2024 වසරේ ජනවාරි මස ආරම්භයේ දී වාර්තා වූ රු. බිලියන 7,314 ක සිට 2024 වසරේ ඔක්තෝබර් මස අවසානයේ දී රු. බිලියන 7,871 ක් දක්වා සියයට 6.9 කින් වැඩි විය. කෙසේ නමුත්, රාජ්‍ය අංශයට ලබාදුන් ණය 2024 වසරේ ජනවාරි මස ආරම්භයේ දී වාර්තා වූ රු. බිලියන 8,285 ක සිට 2024 වසරේ ඔක්තෝම්බර් මස අවසානයේ දී රු. බිලියන 7,954 ක් දක්වා සියයට 4.0 කින් අඩු විය.

### උද්ධමනය

කොළඹ පාරිභෝගික මිල දර්ශකයෙහි (කො.පා.මි.ද., 2021=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මඟින් මනිනු ලබන මතුපිට උද්ධමනය, 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 0.5 ක අවධමනයක් වාර්තා කරන ලදී. එලෙස උද්ධමනයේ ඍණාත්මක අගයක් වාර්තා වූයේ 2015 වසරේ සැප්තැම්බර් මාසයෙන් පසු ප්‍රථම වරටය. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වූයේ බලශක්ති මිල ගණන් හිතකර ලෙස සංශෝධන වීම, ශක්තිමත් මූර්ත විනිමය අනුපාතිකය සහ සැපයුම් දාමයන් වැඩිදියුණු වීමයි. වසරේ ඉතිරි කාලය සඳහා ද උද්ධමනය ඍණාත්මක අගයයන් වාර්තා කළ අතර 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී සියයට -1.7 ක උද්ධමනයක් වාර්තා විය. 2025 වසරේ ජනවාරි මාසයේ දී එය සියයට -4.0 ක් දක්වා තවදුරටත් පහත වැටුණි එලෙසම, ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි (ජා.පා.මි.ද., 2021=100) වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මඟින් මනිනු ලබන මතුපිට උද්ධමනය ද, 2024 වසරේ සැප්තැම්බර් මාසයේ දී සියයට 0.2 ක අවධමනයක් වාර්තා කරන ලද අතර වසරේ ඉතිරි

කාලය සඳහා ද සෘණාත්මක අගයයන් වාර්තා විය. ඒ අනුව 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී සියයට -2.0 ක උද්ධමනයක් වාර්තා විය. මෙම උද්ධමනය අඩුවීමේ ප්‍රවණතාවයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ විදුලි ගාස්තු, ඉන්ධන සහ ද්‍රවීකෘත පෙට්‍රෝලියම් ගෑස් මිල පහත දැමීමය. මෙයට අමතරව, දේශීය ආහාර නිෂ්පාදනය ඉහළ යාම, ගෝලීය සැපයුම් දාමයන් යථා තත්ත්වයට පත්වීම සහ ඉල්ලුම අඩුවීම හේතුවෙන් ආහාර ද්‍රව්‍යවල මිල මධ්‍යස්ථ මට්ටමකට පැමිණීම ද උද්ධමනය අඩු වීම සඳහා හේතු විය.

ආර්ථිකයේ නිතර මිල උච්ඡාවචනය වන අයිතම වන ආහාර, බලශක්තිය සහ ප්‍රවාහනය යන කාණ්ඩ බැහැර කිරීම මඟින් ආර්ථිකයේ යටිදැරි උද්ධමන ප්‍රවණතා පිළිබිඹු කරනු ලබන, මූලික උද්ධමනය සැළකූ විට, කො.පා.මි.ද. (2021=100) යෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මඟින් මනිනු ලබන මූලික උද්ධමනය, 2024 වසරේ ජනවාරි මාසයේ දී වාර්තා කරන ලද සියයට 2.2 ක සිට 2025 වසරේ ජනවාරි මාසයේ දී සියයට 1.2 ක් දක්වා අඩු විය. එසේම, ජා.පා.මි.ද. (2021=100) යෙහි වාර්ෂික ලක්ෂ්‍යමය වෙනස මගින් මනිනු ලබන මූලික උද්ධමනය ද 2024 වසරේ ජනවාරි මාසයේ දී පැවති සියයට 2.2 ක සිට 2024 වසරේ දෙසැම්බර් මාසයේ දී සියයට 1.3 ක් දක්වා අඩු විය.

**රූපසටහන 3.9: මතුපිට, මූලික සහ ආහාර උද්ධමනයේ විචලතා**




*මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

*(2022 මැයි මස සිට 2023 ජනවාරි තෙක් පදනම් වර්ෂය 2013=100 සහ 2023 පෙබරවාරි සිට පදනම් වර්ෂය 2021=100)*

**වගුව 3.5 : පාරිභෝගික මිල දර්ශකය**

| මාසය | 2023 (පදනම් වර්ෂය 2021=100) | | | | 2024 (පදනම් වර්ෂය 2021=100) | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | මතුපිට උද්ධමනය (%) | | මූලික උද්ධමනය (%) | | මතුපිට උද්ධමනය (%) | | මූලික උද්ධමනය (%) | |
| | ලක්ෂ්‍යමය | | ලක්ෂ්‍යමය | | ලක්ෂ්‍යමය | | ලක්ෂ්‍යමය | |
| | කො.ප. මි.ද. | ජා.පා. මි.ද. | කො.ප. මි.ද. | ජා.පා. මි.ද. | කො.ප. මි.ද. | ජා.පා. මි.ද. | කො.ප. මි.ද. | ජා.පා. මි.ද. |
| ජනවාරි | 54.2* | 53.2 | 45.6* | 52.0 | 6.4 | 6.5 | 2.2 | 2.2 |
| පෙබරවාරි | 50.6 | 53.6 | 43.6 | 50.1 | 5.9 | 5.1 | 2.8 | 2.7 |
| මාර්තු | 50.3 | 49.2 | 39.1 | 44.2 | 0.9 | 2.5 | 3.1 | 3.4 |
| අප්‍රේල් | 35.3 | 33.6 | 27.8 | 31.8 | 1.5 | 2.7 | 3.4 | 3.0 |
| මැයි | 25.2 | 22.1 | 20.3 | 21.6 | 0.9 | 1.6 | 3.5 | 3.1 |
| ජුනි | 12.0 | 10.8 | 9.8 | 11.3 | 1.7 | 2.4 | 4.4 | 3.9 |
| ජූලි | 6.3 | 4.6 | 5.9 | 6.3 | 2.4 | 2.5 | 4.4 | 3.0 |
| අගෝස්තු | 4.0 | 2.1 | 4.6 | 4.1 | 0.5 | 1.1 | 3.6 | 2.3 |

| මාසය | 2023 (පදනම් වර්ෂය 2021=100) | | | | 2024 (පදනම් වර්ෂය 2021=100) | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | මතුපිට උද්ධමනය (%) | | මූලික උද්ධමනය (%) | | මතුපිට උද්ධමනය (%) | | මූලික උද්ධමනය (%) | |
| | ලක්ෂ්‍යමය | | ලක්ෂ්‍යමය | | ලක්ෂ්‍යමය | | ලක්ෂ්‍යමය | |
| | කො.ප. මි.ද. | ජා.පා. මි.ද. | කො.ප. මි.ද. | ජා.පා. මි.ද. | කො.ප. මි.ද. | ජා.පා. මි.ද. | කො.ප. මි.ද. | ජා.පා. මි.ද. |
| සැප්තැම්බර් | 1.3 | 0.8 | 1.9 | 1.7 | -0.5 | -0.2 | 3.3 | 1.9 |
| ඔක්තෝබර් | 1.5 | 1.0 | 1.2 | 0.6 | -0.8 | -0.7 | 3.0 | 1.7 |
| නොවැම්බර් | 3.4 | 2.8 | 0.8 | 0.8 | -2.1 | - 1.7 | 2.7 | 1.5 |
| දෙසැම්බර් | 4.0 | 4.2 | 0.6 | 0.9 | -1.7 | - 2.0 | 2.7 | 1.3 |

*මූලාශ්‍රය: ජන හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව*

** පදනම් වර්ෂය 2013=100*

මීන් පෙර ප්‍රක්ෂේපණය කළ අගයයන්ට වඩා විශාල පහත වැටීමක් සමඟ ඉදිරි මාසවලදී ද මතුපිට උද්ධමනය ඍණාත්මක අගයක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතුවූයේ බලශක්ති මිල ගණන් සහ ප්‍රවාහන වියදම් සැලකිය යුතු ලෙස පහත වැටීම සහ නිතර මිල වෙනස්වන ආහාර ද්‍රව්‍යවල මිල ගණන් අඩුවීමයි. සුදුසු පරිදි ප්‍රතිපත්ති සංශෝධනය කිරීම මඟින් 2025 වසරේ මැද භාගය වන විට උද්ධමනය ධනාත්මක අතට හැරී ඉන්පසු ක්‍රමයෙන් මධ්‍ය කාලීනව ඉලක්කගත සියයට 5 ක අගය දක්වා අභිසාරී වනු ඇතැයි මහ බැංකුව අපේක්ෂා කරයි. ඉදිරි මාසවල දී මූලික උද්ධමනය තවදුරටත් මන්දගාමී වනු ඇතැයි අපේක්ෂා කළ ද, මෙම ප්‍රවණතාවයේ ආපසු හැරීමක් ඇතිවී මූලික උද්ධමනය මධ්‍ය කාලීනව ස්ථාවර වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 3.4 කොටස් වෙළෙඳපොළ

ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම සහ මූල්‍ය වෙළෙඳපොළවලට දුෂ්කරතාවලින් නැඟී සිටීමට ඇති හැකියාව කෙරෙහි ආයෝජකයින්ගේ විශ්වාසය වැඩිදියුණු වීමත් සමඟ කොටස් වෙළෙඳපොළ ශීඝ්‍රයෙන් වර්ධනය විය. සමස්ත කොටස් මිල දර්ශකය (1985 = 100) 2023 වසර අවසානයේ දී පැවති ඒකක 10,654 ට සාපේක්ෂව 2024 වසරේ දෙසැම්බර් මස අවසානයේ දී ඒකක 15,944 ක් දක්වා සියයට 49.6 කින් කැපීපෙනෙන ලෙස ඉහළ ගියේය. මැතිවරණයෙන් පසුව, 2024 වසරේ නොවැම්බර් මස 13 වන දින සමස්ත කොටස් මිල දර්ශකය, 2022 වසරේ ජනවාරි මස 31 දිනෙන් පසු පළමු වරට ඒකක 13,000 සීමාව ඉක්මවා ගියේය. 2024 වසරේ දෙසැම්බර් මස 23 වැනි දින ඉතිහාසයේ ප්‍රථම වතාවට සමස්ත කොටස් මිල දර්ශකය ඒකක 15,000 සීමාව පසු කිරීමත් සමඟ කොටස් වෙළෙඳපොළ මේ වන විට ශක්තිමත්ව පවතී.

වඩාත්ම ද්‍රවශීල කොටස් නියෝජනය කරනු ලබන ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් ශ්‍රී ලංකා 20 (2004 = 1,000) දර්ශකය ද 2023 වසරේ දෙසැම්බර් මාසය අග දී වාර්තා වූ ඒකක 3,068 ක සිට 2024 වසරේ දෙසැම්බර් මස අවසානයේ දී ඒකක 4,862 ක් දක්වා සියයට 58.5 කින් කැපීපෙනෙන ලෙස ඉහළ ගියේය. ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් ශ්‍රී ලංකා 20 (2004 = 1,000) දර්ශකය, 2024 වසරේ දෙසැම්බර් මස 31 වන දින එහි වසරේ ඉහළම අගය වන ඒකක 4,862 දක්වා ළඟා වූ අතර 2024 වසරේ ජනවාරි මස 31 වන දින එහි වසරේ අඩුම අගය වන ඒකක 2,896 වාර්තා කරන ලදී.

වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය සැලකීමේ දී එය 2023 වසරේ දෙසැම්බර් මස අවසානයේ දී වාර්තා වූ රු. බිලියන 4,249 ට සාපේක්ෂව 2024 වසරේ දෙසැම්බර් මස අවසානයේ දී රු. බිලියන 5,695 ක් දක්වා සියයට 34.0 කින් ඉහළ ගියේය. විදේශ ආයෝජන, 2023 වසරේ දෙසැම්බර් මස අවසානයේ දී වාර්තා වූ රු. මිලියන 62.9 සිට 2024 වසරේ දෙසැම්බර් මස අවසානයේ දී රු. මිලියන 355.9 ක් දක්වා සියයට 465.8 කින් කැපීපෙනෙන ලෙස ඉහළ ගියේය. එසේම, කොටස්වල විදේශීය විකුණුම් ද 2023 වසරේ දෙසැම්බර් මස අවසානයේ දී වාර්තා වූ රු. මිලියන 41.2 සිට 2024 වසරේ දෙසැම්බර් මස අවසානයේ දී රු. මිලියන 226.0 ක් දක්වා සියයට 448.5 කින් කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය.

2024 වසරේ දෙසැම්බර් මස අවසානය වන විට කොළඹ කොටස් වෙළෙඳපොළ සාමාන්‍ය දෛනික පිරිවැටුම, 2023 වසරේ එම කාලය තුළ වාර්තා වූ රු. මිලියන 642.4 ට සාපේක්ෂව රු. මිලියන 7,756.4 ක් දක්වා කැපීපෙනෙන ලෙස ඉහළ ගියේය.

වගුව 3. 6 : ප්‍රාග්ධන වෙළෙඳපොළ වෙනස්වීම්

| දර්ශකය | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | නොවැම්බර් අවසානයට 2023 | නොවැම්බර් අවසානයට 2024[අ] |
|---|---|---|---|---|---|---|---|---|
| සමස්ත කොටස් මිල දර්ශකය (1985 = 100) | 6,052 | 6,129 | 6,774 | 12,226 | 8,490 | 10,654 | 10,594 | 13,189 |
| එස් ඇන්ඩ් පී එස් එල් 20 දර්ශකය | 3,135 | 2,937 | 2,638 | 4,233 | 2,636 | 3,068 | 3,010 | 3,905 |
| වෙළඳපොළ ප්‍රාග්ධනීකරණය (රු.බිලි.) | 2,840 | 2,851 | 2,961 | 5,489 | 3,847 | 4,249 | 4,261 | 4,782 |
| ලැයිස්තුගත සමාගම් සංඛ්‍යාව | 297 | 289 | 283 | 296 | 290 | 290 | 290 | 284 |
| වාර්ෂික පිවැටුම (රු.බිලි.) | 200 | 171 | 397 | 1173 | 687 | 411 | 388 | 405 |
| විදේශ විකුණුම් (රු.මිලි.) | 100,316 | 68,272 | 104,165 | 86,689 | 36,863 | 37,088 | 34,810 | 52,441 |
| විදේශ ගැනුම් (රු.මිලි.) | 77,067 | 56,537 | 52,889 | 39,410 | 67,488 | 41,451 | 39,826 | 42,524 |
| ශුද්ධ ගැනුම් (රු.මිලි.) | -23,249 | -11,735 | -51,276 | -47,279 | 30,625 | 4,363 | 5,017 | -9,917 |

*මූලාශ්‍ර : කොළඹ කොටස් වෙළඳපොළ හා ශ්‍රී ලංකා මහ බැංකුව*

*(අ) තාවකාලික*

## 3.5 විදේශ අංශයේ වර්ධනයන්

ශ්‍රී ලංකාවේ විදේශ අංශය 2024 වසරේ පළමු මාස එකොළහ තුළ අපනයනවලින් ලද ඉපැයීම් ඉහළ යාම, සේවක ප්‍රේෂණවලින් ලද ලැබීම් සහ සංචාරක අංශයෙන් ලද ඉපැයීම් ඉහළ යාම සමඟ ධනාත්මක ප්‍රවණතාවයක් පෙන්නුම් කළේය. අපනයන ඉපැයීම් ඇ.ඩො. මිලියන 11,670.2 දක්වා සියයට 7.0 කින් වැඩි වීමේ සහ ආනයන වියදම ඇ.ඩො. මිලියන 16,916.9 දක්වා සියයට 10.4 කින් ඉහළ යාමේ ප්‍රතිඵලයක් ලෙස වෙළෙඳ හිඟය 2023 වසරේ පළමු මාස එකොළහ තුළ වූ ඇ.ඩො. මිලියන 4,413.6 ක සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 5,246.7 ක් දක්වා පුළුල් විය. කෙසේ වෙතත්, ජනවාරි, අප්‍රේල් සහ නොවැම්බර් මාසයන් හැර 2024 වසරේ පළමු මාස එකොළහ තුළ මාසික අපනයන ආදායම ඇ.ඩො බිලියන 1.0 ඉක්මවන ලදී. සංචාරක පැමිණීම් වැඩිවීම හේතුවෙන් සංචාරක ඉපැයීම් 2023 වසරේ පළමු මාස එකොළහ තුළ වූ ඇ.ඩො. මිලියන 1,798.7 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 2,806.5 දක්වා සියයට 56.0 කින් වැඩි විය. මේ අතර, විදේශ රැකියා සඳහා පිටත්වීම් ඉහළ යාමත් සමඟ සේවක ප්‍රේෂණ 2023 වසරේ පළමු මාස එකොළහ තුළ වූ ඇ.ඩො. මිලියන 5,399.8 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 5,961.6 දක්වා සියයට 10.4 කින් වැඩි විය.

රූපසටහන 3.10 : වෙළඳ ශේෂය සහ විනිමය අනුපාත වෙනස් වීම




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*

සමස්ත ගෙවුම් ශේෂය (BoP) 2023 වසරේ පළමු මාස එකොළහ තුළ දී වූ ඇ.ඩො. මිලියන 1,908.0 ක අතිරික්තයට සාපේක්‍ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 2,912.5 ක අතිරික්තයක් වාර්තා කරන ලදී. කොළඹ කොටස් වෙළෙඳපොළෙහි, 2023 වසරේ පළමු මාස එකොළහ තුළ වූ ඇ.ඩො. මිලියන 19.9 ක ශුද්ධ ලැබීම්වලට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 34.5 දක්වා ශුද්ධ ලැබීම්වල වැඩිවීමක් වාර්තා කළේය. රාජ්‍ය සුරැකුම්පත් වෙළෙඳපොළෙහි 2023 වසරේ පළමු මාස එකොළහ තුළ වූ ඇ.ඩො. මිලියන 232.7 ක ලැබීම්වලට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 197.3 ක ශුද්ධ පිටතට ගලායාමක් වාර්තා විය. චීන මහජන බැංකුවේ විදේශ විනිමය හුවමාරු පහසුකම ද ඇතුළුව දළ නිල සංචිත (GOR) 2024 වසරේ දෙසැම්බර් මස අවසානය වන විට ඇ.ඩො. බිලියන 6.1 ක් විය. 2024 වසරේ නොවැම්බර් මාසයේදී මහ බැංකුව විසින් ශුද්ධ පදනම මත දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙන් ඇ.ඩො. මිලියන 327 ක් වූ විදේශ විනිමය ශුද්ධ මිලදී ගැනීම් දළ නිල සංචිත ඉහළ යාමට හේතු විය. තවද, ලෝක බැංකුවෙන් සහ ආසියානු සංවර්ධන බැංකුවෙන් ලැබුණු අරමුදල් දළ නිල සංචිතයන්හි වැඩිවීමට දායක විය.

### අපනයන

ආර්ථිකය යථා තත්ත්වයට පත් වීමත් සමඟ ප්‍රධාන වශයෙන් කාර්මික හා කෘෂිකාර්මික අපනයනවලින් ලද ඉපැයීම් ඉහළ යාම හේතුවෙන් අපනයන ඉපැයීම්, 2023 වසරේ පළමු මාස එකොළහ තුළ වාර්තා වූ ඇ.ඩො. මිලියන 10,908.9 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 11,670.2 දක්වා සියයට 7.0 කින් ඉහළ ගියේ ය. කාර්මික අපනයන ඉපැයීම්, මුළු අපනයන ආදායමට සියයට 78.0 ක දායකත්වයක් ලබා දී ඇති අතර කෘෂිකාර්මික හා ඛනිජ අපනයන සමස්ත අපනයන ආදායමෙන් පිළිවෙළින් සියයට 21.6 ක් සහ සියයට 0.2 ක් විය.

ප්‍රධාන වශයෙන් රෙදිපිළි හා ඇඟලුම්, ඛනිජ තෙල් නිෂ්පාදන, රබර් නිෂ්පාදන, ආහාර පාන වර්ග සහ දුම්කොළ නිෂ්පාදන අපනයන ආදායම වැඩිවීම හේතුවෙන් කාර්මික අපනයන ආදායම 2023 වසරේ පළමු මාස එකොළහ තුළ දී ලද ඇ.ඩො. මිලියන 8,486.8 ක සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 9,105.3 ක් දක්වා සියයට 7.3 කින් වැඩි විය. ඒ අනුව, 2024 වසරේ පළමු මාස එකොළහ තුළ රෙදිපිළි සහ ඇඟලුම් අපනයන ආදායම ඇ.ඩො. මිලියන 4,613.4 දක්වා සියයට 3.9 කින් ඉහළ ගොස් ඇති අතර ඛනිජ තෙල් නිෂ්පාදන අපනයන ආදායම ඇ.ඩො. මිලියන 975.5 දක්වා සියයට 104.0 කින් ඉහළ ගියේය. තේ, කුළු බඩු, පොල් සහ එළවළුවලින් ලද අපනයන ඉපැයීම් වැඩිවීමත් සමඟ කෘෂිකාර්මික අපනයන ආදායම 2023 වසරේ පළමු මාස එකොළහ තුළ දී වූ ඇ.ඩො. මිලියන 2,359.9 ක සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 2,517.9 ක් දක්වා සියයට 6.7 කින් ඉහළ ගියේය. තේ අපනයන පරිමාවේ වැඩිවීමත් සමඟ තේ අපනයන ඉපැයීම් 2023 වසරේ පළමු මාස එකොළහ තුළ දී වූ ඇ.ඩො. මිලියන 1,198.8 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 1,304.3 දක්වා සියයට 8.8 කින් වැඩි විය. මීට අමතරව, 2024 වසරේ පළමු මාස එකොළහ තුළ දී රබර් අපනයනයෙන් ලද අපනයන ආදායම ඇ.ඩො. මිලියන 23.6 දක්වා සියයට 11.2 කින් අඩු වූ අතර, කුළුබඩු අපනයනයෙන් ඇ.ඩො. මිලියන 407.9 දක්වා සියයට 12.8 කින් ද, පොල් අපනයනයෙන් ඇ.ඩො. මිලියන 380.5 දක්වා සියයට 21.3 කින් ද, එළවළු අපනයනයෙන් ඇ.ඩො. මිලියන 25.6 දක්වා සියයට 1.3 කින් ද අපනයන ආදායමේ ඉහළ යාමක් වාර්තා විය. මේ අතර, ඛනිජ අපනයනයෙන් ලද ඉපැයීම් 2023 වසරේ පළමු මාස එකොළහ තුළ දී වූ ඇ.ඩො. මිලියන 36.5 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 23.0 ක් දක්වා සියයට 37.1 කින් අඩු විය.

**රූපසටහන 3.11: අපනයන සංයුතිය**




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*

### ආනයන

ආර්ථික ක්‍රියාකාරකම්හි පුනර්ජීවනය සහ භාණ්ඩ ආනයනය කිරීමේ සීමාවන් ඉවත් කිරීමත් සමඟ ඉහළ ගිය පාරිභෝගික ඉල්ලුම සහ විදේශ වෙළෙඳපොළ තුළ භාණ්ඩ මිල ඉහළ යාමේ බලපෑමත් හේතුවෙන් පාරිභෝගික, අතරමැදි සහ ආයෝජන භාණ්ඩ සඳහා ආනයන වියදම් ඉහළ යාම හේතුවෙන්, ආනයන වියදම 2023 වසරේ පළමු මාස එකොළහ තුළ දී වූ ඇ.ඩො. මිලියන 15,322.6 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 16,916.9 දක්වා සියයට 10.4 කින් වැඩි විය. පාරිභෝගික, අතරමැදි සහ ආයෝජන භාණ්ඩ මත ආනයන වියදම් මුළු ආනයන වියදමෙන් පිළිවෙළින් සියයට 18.1 ක්, සියයට 63.8 ක් සහ සියයට 18.0 ක් විය.

පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම 2023 වසරේ පළමු මාස එකොළහ තුළ දී වූ ඇ.ඩො. මිලියන 2,771.2 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 3,068.1 දක්වා සියයට 10.7 කින් ඉහළ ගොස් ඇති අතර, ආහාර පාන සහ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩයන්හි ආනයන වියදම් වැඩි වීම මෙයට හේතු විය. එළවළු, මුහුදු ආහාර සහ ධාන්‍ය වර්ග සහ ඇඹරුම් කර්මාන්ත නිෂ්පාදන වලින් වාර්තා වූ ආනයන වියදම වැඩි වීමත් සමඟ ආහාර පාන ආනයන වියදම 2023 වසරේ පළමු මාස එකොළහ තුළ දී වූ ඇ.ඩො. මිලියන 1,541.0 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 1,671.8 දක්වා සියයට 8.5 කින් වැඩි විය. බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිතයන්හි ආනයන වියදම් අඩු වුවද, රෙදිපිළි හා උපාංග, ගෘහ උපකරණ, විදුලි සංදේශ උපකරණ, ගෘහ හා දැව භාණ්ඩ සහ පෞද්ගලික රථවාහන ආනයන වියදම් ඉහළ යාම හේතුවෙන් ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම ඇ.ඩො. මිලියන 1,230.1 සිට ඇ.ඩො. මිලියන 1,396.3 දක්වා සියයට 13.5 කින් ඉහළ යන ලදී.

**රූපසටහන 3.12 : ආනයන සංයුතිය**




*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*

රෙදිපිළි සහ රෙදිපිළි උපාංග, රසායනික නිෂ්පාදන, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදන, මූල ලෝහ සහ කඩදාසි හා සන කඩදාසි සහ උපාංග ආනයන වියදම් ප්‍රධාන වශයෙන් වැඩි වීම හේතුවෙන් අතරමැදි භාණ්ඩ මත ආනයන වියදම 2023 වසරේ පළමු මාස එකොළහ තුළ දී වූ ඇ.ඩො. මිලියන 10,058.2 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 10,789.7 දක්වා සියයට 7.3 කින් වැඩි විය. රෙදිපිළි හා රෙදිපිළි උපාංග සඳහා ආනයන වියදම 2023 වසරේ පළමු මාස එකොළහ තුළ දී වූ ඇ.ඩො. මිලියන 2,188.0 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 2,594.5 දක්වා සියයට 18.6 කින් වැඩි විය. පිරිපහදු කළ ඛනිජතෙල් සඳහා වන වියදම ඇ.ඩො. මිලියන 2,910.6 දක්වා සියයට 1.7 කින් වර්ධනය වීමක් පිළිබිඹු කෙරුනද, ගල් අඟුරු ආනයන වියදම ඇ.ඩො. මිලියන 260.1 දක්වා සියයට 39.6 කින් සැළකිය යුතු ලෙස අඩු වීම සහ බොරතෙල් ආනයන වියදම ඇ.ඩො. මිලියන 749.8 ක් දක්වා සියයට 24.7 කින් අඩු වීම හේතුවෙන් සමස්ත ඉන්ධන ආනයන වියදම 2024 වසරේ පළමු මාස එකොළහ තුළ දී ඇ.ඩො. මිලියන 3,920.4 දක්වා සියයට 8.6 කින් අඩු වී ඇත. ආයෝජන භාණ්ඩ ආනයන වියදම 2023 වසරේ පළමු මාස එකොළහ තුළ දී වූ ඇ.ඩො. මිලියන 2,477.5 සිට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 3,051.6 දක්වා සියයට 23.2 කින් වර්ධනය විය. විදේශ වෙළෙඳපොළ තුළ උපකරණයන්හි මිල ගණන් ඉහළ යාම සහ ආර්ථිකයේ පුනර්ජීවනයත් සමඟ ආයෝජන කටයුතු වර්ධනය වීම හේතුවෙන් යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ සඳහා වන ආනයන වියදම ඇ.ඩො. මිලියන 2,072.8 දක්වා සියයට 22.4 කින් ද, ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම ඇ.ඩො. මිලියන 838.1 දක්වා සියයට 18.8 කින් ද, ප්‍රවාහන උපකරණ ආනයන වියදම ඇ.ඩො. මිලියන 137.8 දක්වා සියයට 80.7 කින් ද ඉහළ යාම මෙයට ප්‍රධාන වශයෙන් හේතු විය.

වගුව 3.7 : විදේශීය වෙළෙඳාම

ඇ. ඩො. මිලියන

| අයිතමය | 2021 | 2022 | 2023(අ) | ජන. නොවැ. 2023(අා) | ජන. නොවැ. 2024 (අ) |
|---|---|---|---|---|---|
| **අපනයන** | **12,502** | **13,106** | **11,911** | **10,909** | **11,670** |
| **කෘෂිකාර්මික අපනයන** | **2,730** | **2,568** | **2,567** | **2,360** | **2,518** |
| තේ | 1,324 | 1,259 | 1,310 | 1,199 | 1,304 |
| අනෙකුත් කෘෂිකාර්මික අපනයන | 1,406 | 1,309 | 1,257 | 1,161 | 1,214 |
| **කාර්මික අපනයන** | **9,705** | **10,465** | **9,278** | **8,487** | **9,105** |
| රෙදිපිළි හා ඇඟළුම් | 5,435 | 5,952 | 4,879 | 4,439 | 4,613 |
| ආහාරපාන සහ දුම්කොළ | 587 | 520 | 539 | 495 | 594 |
| රබර් නිෂ්පාදන | 1,050 | 977 | 902 | 824 | 897 |
| යන්ත්‍ර සූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 501 | 581 | 598 | 555 | 446 |
| ඛනිජ තෙල් නිෂ්පාදන | 506 | 568 | 539 | 478 | 976 |
| අනෙකුත් කාර්මික අපනයන | 1,626 | 1,867 | 1,821 | 1,696 | 1,579 |
| **ඛනිජමය අපනයන** | **45** | **50** | **39** | **37** | **23** |
| **වර්ගීකරණය නොකළ අපනයන** | **23** | **23** | **28** | **26** | **24** |
| **ආනයන** | **20,637** | **18,291** | **16,811** | **15,323** | **16,917** |
| **පාරිභෝගික භාණ්ඩ** | **3,849** | **2,813** | **3,044** | **2,771** | **3,068** |
| ආහාර සහ පාන | 1,667 | 1,608 | 1,693 | 1,541 | 1,672 |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 2,182 | 1,205 | 1,351 | 1,230 | 1,396 |
| **අතරමැදි භාණ්ඩ** | **12,309** | **12,439** | **11,007** | **10,058** | **10,790** |
| ඛනිජතෙල් | 3,743 | 4,897 | 4,703 | 4,289 | 3,920 |
| රෙදිපිළි හා ඇඟළුම් | 3,067 | 3,065 | 2,371 | 2,188 | 2,595 |
| තිරිඟු සහ බඩ ඉරිඟු | 418 | 303 | 338 | 318 | 324 |
| අනෙකුත් | 5,081 | 4,174 | 3,595 | 3,263 | 3,951 |
| **ආයෝජන භාණ්ඩ** | **4,463** | **3,030** | **2,745** | **2,478** | **3,052** |
| යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ | 2,810 | 1,969 | 1,868 | 1,693 | 2,073 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 1,249 | 926 | 775 | 706 | 838 |
| ප්‍රවාහන උපකරණ | 399 | 132 | 99 | 76 | 138 |
| අනෙකුත් | 6 | 3 | 3 | 3 | 3 |
| **වර්ගීකරණය නොකළ ආනයන** | **17** | **9** | **16** | **16** | **8** |
| **වෙළඳ හිඟය** | **-8,139** | **-5,185** | **-4,900** | **-4,414** | **-5,247** |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*

*(අ) තාවකාලික*

*(ආ) සංශෝධිත*

**සංචාරක ඉපැයීම් සහ සේවක ප්‍රේෂණ**

සංචාරක පැමිණීම් 2023 වසරේ පළමු මාස එකොළහ තුළ දී වූ පුද්ගලයින් 1,276,951 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී පුද්ගලයින් 1,804,873 දක්වා සියයට 41.3 කින් සැලකිය යුතු ලෙස වර්ධනය වීම හේතුවෙන් සංචාරක ඉපැයීම්, 2023 වසරේ පළමු මාස එකොළහ තුළ දී ලද ඇ.ඩො. මිලියන 1,798.7 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 2,806.5 දක්වා සියයට 56.0 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය විය. ඉන්දියාව, රුසියාව, එක්සත් රාජධානිය, ජර්මනිය, චීනය, ඕස්ට්‍රේලියාව සහ ප්‍රංශය යන රටවලින් වැඩිම සංචාරක පැමිණීම් වාර්තා විය. මේ අතර, විදේශ රැකියා සඳහා පිටත්වීම් ඉහළ යාම සහ විධිමත් මාර්ග හරහා මුදල් ප්‍රේෂණය දිරිමත් කිරීම සඳහා රජය විසින් ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සමඟ විධිමත් මාර්ග හරහා සේවක ප්‍රේෂණ ලැබීම හේතුවෙන් සේවක ප්‍රේෂණ 2023 වසරේ පළමු මාස එකොළහ තුළ දී වූ ඇ.ඩො. මිලියන 5,399.8 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී ඇ.ඩො. මිලියන 5,961.6 දක්වා සියයට 10.4 කින් වර්ධනය විය. විදේශ රැකියා සඳහා පිටත්ව යන පුද්ගලයන් සංඛ්‍යාව 2023 වසරේ පළමු මාස එකොළහ තුළ දී වූ පුද්ගලයින් 274,562 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී පුද්ගලයින් 283,618 ක් දක්වා සියයට 3.2 කින් වර්ධනය විය.

### 3.6 ලෝක ආර්ථික සන්දර්භය

2024 වසරේ දී ආර්ථික ස්ථාවරත්වය සහ ඔරොත්තු දීමේ හැකියාව පෙන්නුම් කරමින් ලෝක ආර්ථිකය සියයට 3.2 කින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2025 වසරේ ජනවාරි මස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් යාවත්කාලීන කරන ලද ලෝක ආර්ථික දැක්මෙහි සඳහන් පරිදි, 2025 සහ 2026 යන වසර දෙකෙහිදීම ගෝලීය ආර්ථිකය සියයට 3.3 ක වර්ධනයක් සහිතව බොහෝ දුරට ස්ථාවරව පවතී. මේ අතර, 2025 වසරේ දී ගෝලීය උද්ධමනය සියයට 4.2 ක් දක්වා සහ 2026 වසරේ දී එය තවදුරටත් සියයට 3.5 ක් දක්වා අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මූල්‍ය තත්ත්වය කලාප හරහා වෙනස් විය හැකි වුවද බොහෝ දුරට ලිහිල්ව පවතී. ව්‍යාපාර සඳහා හිතකාමී ප්‍රතිපත්ති අපේක්ෂාවන් හේතුවෙන් දියුණු ආර්ථිකයන්හි හිමිකම් සඳහා ඉහළ මිලක් නියම වී ඇත. කෙසේ වෙතත්, එක්සත් ජනපදයේ නව තීරුබදු සහ ඉහළ පොලී අනුපාත පිළිබඳ අපේක්ෂාවන් හමුවේ එක්සත් ජනපද ඩොලරය ශක්තිමත් වීම හේතුවෙන් නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වන ආර්ථිකයන් තුළ හිමිකම් තක්සේරු කිරීම් පහත වැටී ඇති අතර, මූල්‍ය තත්ත්වයන් දැඩි වී ඇත.

විශේෂයෙන් වෙළඳ සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ලොව පුරා එක් එක් ප්‍රදේශයන්ට වෙනස් ආකාරයෙන් ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ අවිනිශ්චිතතාවය තියුණු ලෙස වැඩි වී ඇත. 2024 වසරේ දී බොහෝ රටවල අලුතින් තේරී පත් වූ ආණ්ඩු යටතේ අපේක්ෂිත ප්‍රතිපත්ති වෙනස්කම්, සමහරක් ආසියානු සහ යුරෝපීය රටවල පවතින අස්ථායී වෙළඳපොළ සහ මැද පෙරදිග භූ දේශපාලන ආතතීන් ආදිය හේතුවෙන් මෙම අවිනිශ්චිතතාවයන් බොහෝ දුරට පැන නැගී ඇත.

#### කලාපීය පුරෝකථනයන්

විවිධ මට්ටම්වලින් වුවද, දියුණු ආර්ථිකයන්ගේ වර්ධනයේ ඉදිරි දැක්ම ශක්තිමත්ව පවතී. ශක්තිමත් ශ්‍රම වෙළඳපොළ සහ ආයෝජනයන් වැඩිදියුණු වීම හේතුවෙන් එක්සත් ජනපද ආර්ථිකය 2024 වසරේ දී ළඟා කර ගනු ඇතැයි ඇස්තමේන්තුගත සියයට 2.8 ක ශක්තිමත් වර්ධනය තවදුරටත් පිළිබිඹු කරමින් 2025 වසරේ දී සියයට 2.7 කින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇත. 2025 වසරේ දී නිෂ්පාදනය දුර්වල වීම සහ ප්‍රතිපත්ති අවිනිශ්චිතතාවයන් හේතුවෙන් යුරෝ කලාපය සියයට 1.0 ක වර්ධනයක් පෙන්නුම් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, 2026 වසරේ දී දේශීය ඉල්ලුම ශක්තිමත් වීම, මූල්‍ය තත්වයන් ලිහිල් වීම, වෙළඳපොළ විශ්වාසය වැඩි දියුණු වීම සහ අවිනිශ්චිතතාවයන් අඩු වීම සමඟ යුරෝ කලාපය තුළ වර්ධනයේ වැඩිවීමක් අපේක්ෂා කෙරේ.

2024 වසරේ දී සියයට 4.2 ක ඇස්තමේන්තුගත වේගයකින් වර්ධනය වූ නැගී එන වෙළෙඳපොළ සහ සංවර්ධනය වන ආර්ථිකයන් 2025 වසරේ දී සියයට 4.2 ක වර්ධනයක් සහ 2026 වසරේ දී සියයට 4.3 ක වර්ධනයක් ලෙස සාමාන්‍යයෙන් එම වර්ධන වේගයම පවත්වා ගෙන යනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2024 වසරේ දී සියයට 4.8 ක ඇස්තමේන්තුගත වේගයකින් වර්ධනය වූ චීන ආර්ථිකය, 2025 වසරේ දී සියයට 4.6 කින් සහ 2026 වසරේ දී සියයට 4.5 කින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2024 වසර තුළ ඇස්තමේන්තුගත සියයට 6.5 ක වර්ධනයක් සමඟින්, ඉන්දියානු ආර්ථිකය 2025 සහ 2026 වසර දෙක තුළදීම සියයට 6.5 ක වර්ධන වේගයක් පවත්වා ගනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මැදපෙරදිග සහ මධ්‍යම ආසියාව, 2024 වසරේ දී පෙන්නුම් කරන ලද සියයට 2.4 ක ඇස්තමේන්තුගත වර්ධනයට සාපේක්ෂව 2025 වසරේ දී සියයට 3.6 ක් සහ 2026 වසරේ දී සියයට 3.9 ක් දක්වා වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ලතින් ඇමරිකානු සහ කැරිබියානු කලාපයේ වර්ධනය 2024 වසරේ දී සියයට 2.4 ක සිට 2025 වසරේ දී සියයට 2.5 ක් දක්වා සහ 2026 වසරේ දී සියයට 2.7 ක් දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2024 වසර තුළ ඇස්තමේන්තුගත වර්ධනයට සාපේක්ෂව උප සහරානු අප්‍රිකාව 2025 සහ 2026 යන වසර දෙක තුළදීම සියයට 4.2 කින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2024 වසර තුළ ඇස්තමේන්තුගත සියයට 3.2 ක වර්ධනයට සාපේක්ෂව 2025 වසරේ දී සහ 2026 වසරේ දී පිළිවෙළින් සියයට 2.2 සහ සියයට 2.4 ක් ලෙස, නැගී එන සහ සංවර්ධනය වෙමින් පවතින යුරෝපයේ වර්ධනය පසුගාමී වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

#### ගෝලීය වෙළඳාම සහ පාරිභෝගික භාණ්ඩ වෙළඳපොළ

2024 වසරේ දී භාණ්ඩ වෙළඳාම ඉහළ යාමත් සමඟ ගෝලීය වෙළඳාමේ වර්ධනය ප්‍රකෘතිමත් වීමේ සලකුණු පෙන්නුම් කරන ලදී. ගෝලීය වෙළඳ පරිමාව 2025 වසරේ දී සහ 2026 වසරේ දී වැඩි වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, සංරක්ෂණවාදී ප්‍රතිපත්ති තීව්‍ර වීම මධ්‍යයේ ඇති වී ඇති ප්‍රතිපත්ති අවිනිශ්චිතතාවය වෙළඳාමට අහිතකර ලෙස බලපානු ඇත. 2024 වසර තුළ දී නව වෙළඳ සීමාවන් ක්‍රියාත්මක කිරීම 2010-2019 යන කාලසීමාව තුළ පැවති සාමාන්‍යයට වඩා පස් ගුණයකින් වැඩි විය.

2024 වසරේ දී ප්‍රධාන වශයෙන් බලශක්ති සහ ආහාර භාණ්ඩ සඳහා පැවති හිතකර සැපයුම් තත්ත්ව හේතුවෙන් භූ දේශපාලනික ආතතීන් මධ්‍යයේ වුවද, භාණ්ඩ මිල සියයට 3 කින් පමණ අඩු විය. වෙළඳ භාණ්ඩ මිල ගණන් පහත වැටීමේ ප්‍රවණතාවය නොකඩවා පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. දුර්වල ගෝලීය ඉල්ලුම සහ ඔපෙක් සංවිධානයෙන් පිටත රටවල ශක්තිමත් සැපයුම හේතුවෙන් තෙල් මිලෙහි අපේක්ෂා කළ හැකි පහත වැටීමත් සමඟ 2025 වසරේ දී බලශක්ති භාණ්ඩ මිල සියයට 2.6 කින් පහත වැටෙනු ඇතැයි පුරෝකථනය කර ඇත. කෙසේ වෙතත්, කාලගුණික තත්ත්වයන් සහ මැදපෙරදිග

හු දේශපාලනික ආතතීන් හේතුවෙන් ගෑස් මිල ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මේ අතර, ආහාර පාන නිෂ්පාදන විශාල වශයෙන් සිදු වන කලාප තුළ පවතින අයහපත් කාලගුණික තත්ත්ව හේතුවෙන් ආහාර පාන මිල ඉහළ යාම නිසා ඉන්ධන නොවන භාණ්ඩ මිල සියයට 2.5 කින් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### ගෝලීය ආර්ථික දැක්ම හමුවේ ප්‍රතිපත්ති

ආර්ථික ඉදිරි දැක්ම කෙරෙහි බලපෑ හැකි අවිනිශ්චිතතාවයන් හේතුවෙන්, සූක්ෂම ප්‍රතිපත්ති ප්‍රතිචාර අත්‍යවශ්‍ය වේ. ආර්ථික ක්‍රියාකාරකම් සහ රැකියා සඳහා සහාය වන අතරම මිල ස්ථායිතාව තහවුරු කළ හැකි මුදල් ප්‍රතිපත්ති සැලසුම් කළ යුතු අතර එක් එක් රටට විශේෂිත උද්ධමන තත්ත්වයන් මත පදනම්ව එවැනි ප්‍රතිපත්ති අනුගමනය කළ යුතු වේ.

රාජ්‍ය ණය තිරසාර බව සහතික කිරීමටත්, ආර්ථික වර්ධනයට බාධාවකින් තොරව රාජ්‍ය මූල්‍ය ස්වාරක්ෂක ගොඩනැගීමටත් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ව්‍යුහගත කිරීම අවශ්‍ය වේ. ආර්ථික ගතිකත්වය වැඩි දියුණු කිරීමට, සැපයුම් අංශය ශක්තිමත් කිරීමට සහ ආර්ථික අවදානම් සඳහා විසඳුම් සෙවීමට වර්ධනය වේගවත් කරනු ලබන ප්‍රතිපත්ති අවශ්‍ය වේ.

සංරක්ෂණවාදී ප්‍රතිපත්ති දැඩිවීම, භූ දේශපාලනික ආතතීන්, නැවත ඇතිවිය හැකි උද්ධමන පීඩනයන් සහ සමහර රටවල මූල්‍ය තිරසාරභාවය සහ මූල්‍ය ස්ථාවරත්වය පිළිබඳ අවිනිශ්චිතතා වැනි අවදානම් මතු විය හැකිය. මේ අනුව, ප්‍රතිපත්ති සම්පාදකයින් හට උද්ධමනය පාලනය ආර්ථික වර්ධනය සමඟ තුලනය කිරීමේ අභියෝගයට මුහුණ දීමට සිදු වනු ඇත. එබැවින් මෙම අභියෝගවලට මුහුණ දීම සඳහා සහ ආර්ථික වශයෙන් වෙන්ව සිටීම අවම කරගැනීම සඳහා ශක්තිමත් බහුපාර්ශ්වික සහයෝගීතාවයන් අවශ්‍ය වේ.

**වගුව 3.8 : ලෝක ආර්ථිකය පිළිබඳ ප්‍රධාන ආර්ථික දර්ශක - 2024 (පුරෝකතන)**

| රට | ද. දේ. නි. වර්ධනය (වාර්ශික %) | උද්ධමනය % | සේවා වියුක්තිය % | මූල්‍ය හිඟය (ද. දේ. නි.% ලෙස) | දළ ණය (ද. දේ.නි. % ලෙස) |
|---|---|---|---|---|---|
| ආජන්ටිනාව | -3.5 | 229.8 | 8.2 | -0.1 | 91.5 |
| ඕස්ට්‍රේලියාව | 2.0 | 3.3 | 4.1 | -1.7 | 49.3 |
| බ්‍රසීලය | 3.0 | 4.3 | 7.2 | -6.9 | 87.6 |
| කැනඩාව | 1.3 | 2.4 | 6.2 | -2.0 | 106.1 |
| චිලී | 2.5 | 3.9 | 8.5 | -2.3 | 41.0 |
| චීනය | 4.8 | 0.4 | 5.1 | -7.4 | 90.1 |
| ප්‍රංශය | 1.1 | 2.3 | 7.4 | -6.0 | 112.3 |
| ජර්මනිය | 0.0 | 2.4 | 3.4 | -2.0 | 62.7 |
| ග්‍රීසිය | 2.3 | 2.9 | 10.5 | -1.0 | 159.0 |
| ඉන්දියාව | 7.0 | 4.4 | - | -7.8 | 83.1 |
| ඉන්දුනීසියාව | 5.0 | 2.5 | 5.2 | -2.7 | 40.5 |
| ඉතාලිය | 0.7 | 1.3 | 7.0 | -4.0 | 136.9 |
| ජපානය | 0.3 | 2.2 | 2.5 | -6.1 | 251.2 |
| කොරියාව | 2.5 | 2.5 | 2.9 | -0.5 | 52.9 |
| මැලේසියාව | 4.8 | 2.8 | 3.5 | -3.6 | 68.4 |
| මෙක්සිකෝව | 1.5 | 4.7 | 3.0 | -5.9 | 57.7 |
| රුසියාව | 3.6 | 7.9 | 2.6 | -1.9 | 19.9 |
| සිංගප්පූරුව | 2.6 | 2.6 | 1.9 | 4.5 | 175.2 |
| දකුණු අප්‍රිකාව | 1.1 | 4.7 | 33.7 | -6.2 | 75.0 |
| ස්පාඤ්ඤය | 2.9 | 2.8 | 11.6 | -3.0 | 102.3 |
| ශ්‍රී ලංකාව | 2.6 | 3.5 | 4.4 | -6.8 | 93.3 |
| තායිලන්තය | 2.8 | 0.5 | 1.1 | -2.4 | 65.0 |
| එක්සත් රාජධානිය | 1.1 | 2.6 | 4.3 | -4.3 | 101.8 |
| ඇමරිකා එක්සත් ජනපදය | 2.8 | 3.0 | 4.1 | -7.6 | 121.0 |
| වියට්නාමය | 6.1 | 4.1 | 2.1 | -2.6 | 33.8 |

*මූලාශ්‍ර : World Economic Outlook, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, 2024 ඔක්තෝබර්, Fiscal Monitor, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, 2024 ඔක්තෝබර්, මුදල් අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා මහ බැංකුව*

# 04

# රජය සතු ව්‍යවසායයන්හි කාර්යසාධනය

## 4.1 සමාලෝචනය

ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් 52 විසින් 2023 වසරේ පළමු මාස දහය තුළ වාර්තා කළ රු. බිලියන 312.7 ක සමස්ත ලාභයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 428.5 ක සමස්ත ලාභයක් වාර්තා කරමින් ලාභදායිත්වය අතින් ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කළේය. මෙයට ප්‍රධාන වශයෙන් විදුලිය සහ ඉන්ධන සඳහා පිරිවැය පිළිබිඹු කරන මිලකරණය හඳුන්වාදීම, තෝරාගත් ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන්හි ශේෂපත්‍ර ප්‍රතිව්‍යුහගත කිරීම ඇතුළු රාජ්‍ය ව්‍යවසායයන්හි ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ප්‍රතිසංස්කරණ සහ සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ රුපියලේ අගය ඉහළ යාම සහ පොළී අනුපාත අඩු කිරීම වැනි හිතකර බාහිර සාධක හේතු විය.

ලංකා විදුලිබල මණ්ඩලයේ උත්පාදන, සම්ප්‍රේෂණ සහ බෙදා හැරීම් සඳහා වැඩි මෙහෙයුම් සහ මූල්‍ය ස්වාධීනත්වයක් ඇති කරන අතරම, රටේ විදුලිබල අංශයේ කාර්යක්ෂමතාව, විනිවිදභාවය සහ වගවීම වැඩිදියුණු කිරීමත් සමඟ පෞද්ගලික අංශයේ සහභාගීත්වයට ඉඩ සලසමින්, 2024 අංක 36 දරන විදුලිබල පනත 2024 වසරේ ජූනි මාසයේදී බලාත්මක කරන ලදී. 2024 වසරේ දෙසැම්බර් මාසයේදී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කළ පරිදි, 2024 අංක 36 දරන විදුලිබල පනත සංශෝධනය කිරීමෙහිලා අධ්‍යයනය කිරීම, උපදෙස් ලබා දීම සහ නිර්දේශ ලබා දීම සඳහා කමිටුවක් පත් කර ඇත. මේ අතර, 2024 වසරේ සැප්තැම්බර් මාසයේදී යුනයිටඩ් පෙට්‍රෝලියම් සමාගම විසින් මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීමත් සමඟ ඛනිජ තෙල් සිල්ලර වෙළෙඳපොළේ තරඟකරුවන් සංඛ්‍යාව පහ දක්වා වැඩි විය. පෞද්ගලික අංශය සඳහා නිදහස් කරන ලද ඛනිජ තෙල් සිල්ලර වෙළෙඳපොළ තුළින් පාරිභෝගිකයින්ට පිරිවැය ප්‍රතිලාභ සහ ඉහළ සේවා ප්‍රමිතීන් ගෙන එනු ඇත.

2024 වසරේ අප්‍රේල් මාසයේදී අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව රාජ්‍ය බැංකු සඳහා විනිවිදභාවයෙන් යුතු ක්‍රියාපටිපාටියක් යටතේ ස්වාධීන අධ්‍යක්ෂවරුන් තෝරා ගැනීම සඳහා කමිටුවක් පත් කරන ලද අතර, ලංකා බැංකුව, මහජන බැංකුව සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව සඳහා අපේක්ෂකයින් තෝරා ගැනීමේ ක්‍රියාවලිය මේ වන විට සිදු කරමින් පවතී. තවද, රාජ්‍ය බැංකු සඳහා වන ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්තිය යටතේ, සියලුම රාජ්‍ය බැංකු අධීක්ෂණය කිරීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව යටතේ විශේෂිත ඒකකයක් ස්ථාපිත කරන ලද අතර, රාජ්‍ය බැංකුවල රජයේ කොටස් හිමිකාරිත්වය කළමනාකරණය කිරීම සහ ඒවායේ ක්‍රියාකාරිත්වය සුපරීක්ෂණය කිරීම සහ වාර්තා කිරීම එම ඒකකයේ වගකීම වේ.

රාජ්‍ය ව්‍යවසායයන්ගෙන් 2023 වසරේ පළමු මාස දහය තුළ අයබදු සහ ලාභාංශ එකතු කිරීම රු. බිලියන 36.1 ක් වූ අතර, එය 2024 වසරේ පළමු මාස දහය තුළ රු. බිලියන 30.5 ක් දක්වා අඩු විය.

## 4.2 රජය සතු ප්‍රධාන ව්‍යවසායයන් දහය පිළිබඳ සමාලෝචනය

### ලංකා බැංකුව

2023 වසර අවසානය වන විට රු. බිලියන 4,412 ක් වූ ලංකා බැංකුවේ වත්කම් පදනම 2024 ඔක්තෝබර් මාසය අවසානය වන විට රු. බිලියන 4,720 ක් දක්වා සියයට 7.0 කින් ඉහළ ගොස් ඇත. 2023 වසර අවසානය වන විට රු. බිලියන 3,882 ක් වූ ලංකා බැංකුවේ තැන්පතු පදනම 2024 වසරේ පළමු මාස දහය තුළ රු. බිලියන 4,123 ක් දක්වා සියයට 6.2 කින් ඉහළ ගොස් ඇත. 2023 වසර අවසානය වන විට සියයට 5.07 ක් වූ අදියර III ණය අනුපාතය, 2024 ඔක්තෝබර් මාසය අවසානය වන විට සියයට 6.02 ක් දක්වා පිරිහීමට ලක් වී ඇත. 2023 වසරේ පළමු මාස දහය සඳහා වාර්තා කරන ලද රු. බිලියන 29.4 ක බදු පෙර ලාභයට සාපේක්ෂව ලංකා බැංකුව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 44.4 ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇත. ශුද්ධ පොළී ආදායමේ හා පොළී නොවන ආදායමේ කැපීපෙනෙන ඉහළ යාම මෙයට හේතු වී ඇත.

### මහජන බැංකුව

2023 වසර අවසානය වන විට රු. බිලියන 3,038 ක් වූ මහජන බැංකුවේ වත්කම් පදනම 2024 ඔක්තෝබර් මාසය අවසානය වන විට රු. බිලියන 3,285 ක් දක්වා සියයට 8.1 කින් වර්ධනය වී ඇත. 2023 වසර අවසානය වන විට රු. බිලියන 2,653 ක් වූ බැංකුවේ තැන්පතු පදනම 2024 ඔක්තෝබර් මාසය අවසානය වන විට රු. බිලියන 2,890 ක් දක්වා සියයට 8.9 කින් ඉහළ ගොස් ඇත. 2023 වසර අවසානය වන විට රු. බිලියන 1,709 ක් ලෙස පැවති ණය හා අත්තිකාරම් 2024 ඔක්තෝබර් මාසය අවසානය වන විට රු. බිලියන 1,736 ක් දක්වා සුළු වශයෙන් ඉහළ ගොස් ඇත. 2023 වසර අවසානය වන විට සියයට 8.8 ක් වූ අදියර III ණය අනුපාතය 2024 ඔක්තෝබර් මාසය අවසානය වන විට සියයට 9.4 ක් දක්වා පිරිහීමට ලක්ව ඇත. 2024 වසරේ පළමු මාස දහය තුළ මහජන බැංකුව රු. බිලියන 32.2 ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇති අතර, එය 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ වාර්තා කළ රු. බිලියන 8.7 ට සාපේක්ෂව සියයට 270 ක සැලකිය යුතු ඉහළ යාමකි.

### ජාතික ඉතිරිකිරීමේ බැංකුව

2023 වසර අවසානය වන විට රු. බිලියන 1,687 ක් වූ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ වත්කම් පදනම 2024 ඔක්තෝබර් මාසය අවසානය වන විට රු. බිලියන 1,710 ක් දක්වා සුළු වැඩිවීමක් වාර්තා කර ඇත. 2023 වසර අවසානය වන විට රු. බිලියන 1,483 ක්ව පැවති තැන්පතු පදනම 2024 ඔක්තෝබර් මාසය අවසානය වන විට රු. බිලියන 1,516 ක් දක්වා සියයට 2.2 කින් වර්ධනය වී ඇත. 2023 වසර අවසානය වන විට රු. බිලියන 527 ක් ලෙස පැවති ණය හා අත්තිකාරම්

කළඹ 2024 ඔක්තෝබර් මාසය අවසානය වන විට රු. බිලියන 518 ක් දක්වා සියයට 1.7 කින් පහළ ගොස් ඇත. 2023 වසරේ පළමු මාස දහය තුළ වාර්තා කළ රු. බිලියන 1.9 ක් වූ බදු පෙර ලාභය හා සසඳන විට 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ජාතික ඉතිරිකිරීමේ බැංකුව රු. බිලියන 28.5 ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇති අතර, ශුද්ධ පොළී ආදායම සැලකිය යුතු ලෙස වැඩිවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

### සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

2011 අංක 03 දරන රක්ෂණ කර්මාන්ත (සංශෝධිත) පනතේ දක්වා ඇති රෙගුලාසිවලට අනුකූලව, සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙහි ජීවිත සහ සාමාන්‍ය රක්ෂණ මෙහෙයුම් එහි පූර්ණ අයිතිය සහිත පරිපාලිත සමාගම්වලට, එනම් සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව යටතේ සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා ජීවිත සමාගම හා සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සාමාන්‍ය සමාගම වශයෙන් වෙන් කිරීම 2024 වසරේ ජනවාරි මාසය අවසානය වන විට අවසන් කරන ලදී.

ඒ අනුව, 2024 වසරේ පළමු මාස දහය තුළ සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව රු. බිලියන 2.5 ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇත. තවද, පරිපාලිත සමාගම් වශයෙන් වෙන්වීමෙන් පසු මාස නවයක කාලය තුළ, සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා සාමාන්‍ය සමාගම සහ සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථා ජීවිත සමාගම පිළිවෙලින් රු. බිලියන 2.5 ක හා රු. බිලියන 22.6 ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇත.

රාජ්‍ය ව්‍යවසායයන් ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩපිළිවෙල යටතේ සීමාසහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ පරිපාලිත සමාගමක් වන කැන්විල් හෝල්ඩින්ග්ස් (පෞද්ගලික) සමාගමෙහි කොටස් හිමිකාරිත්වය 2024 වසරේදී භාණ්ඩාගාර ලේකම් වෙත පවරන ලදී.

### ලංකා විදුලිබල මණ්ඩලය

2024 වසරේ පළමු මාස දහය තුළ විදුලිබලය සඳහා වූ ඉල්ලුම 2023 වසරේ පළමු මාස දහය හා සැසඳීමේදී ගිගාවොට් පැය 11,825 ක සිට ගිගාවොට් පැය 12,686 ක් දක්වා සියයට 7.2 කින් ඉහළ ගියද, 2024 වසරේ සිදු කළ අඛණ්ඩ විදුලි ගාස්තු අඩු කිරීම් දෙක හේතුවෙන් 2023 වසරේ පළමු මාස දහය හා සැසඳීමේදී 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ විදුලි අලෙවියෙන් උපයාගත් ආදායම රු. බිලියන 498.1 සිට රු. බිලියන 472.8 ක් දක්වා සියයට 5.1 කින් සුළු වශයෙන් පහළ ගොස් ඇත. පැවති හිතකර කාලගුණික තත්ත්වය හේතුවෙන් 2023 වසරේ පළමු මාස දහය හා සැසඳීමේදී 2024 වසරේ සමාන කාලපරිච්ඡේදයේ දී ලංකා විදුලිබල මණ්ඩලයේ (ලංවිම) ඍජු උත්පාදන පිරිවැය රු. බිලියන 379.8 සිට රු. බිලියන 260.7 ක් දක්වා සියයට 31.4 ක සැළකිය යුතු අගයකින් පහළ ගොස් ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස ලංවිම 2023 වසරේ පළමු මාස දහය තුළ වාර්තා කළ රු. බිලියන 41.1 ක දළ ලාභයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 112 ක දළ ලාභයක් වාර්තා කර ඇත. 2023 වසරේ පළමු මාස දහය තුළ රු. මිලියන 362.3 ක් වූ ශුද්ධ අලාභයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ලංවිමෙහි පරිපාලිත සමාගමක් වන ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් ලිමිටඩ් හි කොටස් විකිණීමෙන් ලද රු. බිලියන 26 ක ලාභය සහ විදේශ විනිමය හුවමාරු ලාභ මඟින් ලද රු. බිලියන 10 සමඟ මූල්‍ය පිරිවැය රු. බිලියන 30.6 කින් පහළ යාමේ ප්‍රතිලාභ හේතුවෙන් ලංවිම විසින් රු. බිලියන 139.4 ක බදු පෙර ශුද්ධ ලාභයක් වාර්තා කර ඇත.

2023 වසරේ පළමු මාස දහය තුළ උත්පාදන සංයුතිය තාප (ගල් අඟුරු): ජල: සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති, සුළං සහ වහළ මත සවිකල සූර්ය බලශක්තිය: තාප (ඉන්ධන) සියයට 33: 24: 20: 23 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය සඳහා 34: 30: 21: 15 වශයෙන් වාසිදායක ලෙස වෙනස් වී ඇත. ඒ අනුව, විකුණුම් ස්ථානයේ ඒකකයක පිරිවැය 2023 වසරේ පළමු මාස දහය තුළ පැවති කි.වො. පැයට රු. 43.28 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ කි.වො. පැයට රු. 30.75 ක් දක්වා සැලකිය යුතු ලෙස අඩු වී ඇත.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට සහ ස්වාධීන බලශක්ති ගැනුම්කරුවන් සඳහා 2023 වසර අවසන් වන විට ගෙවිය යුතුව පැවති රු. බිලියන 79.2 ක් වූ සමස්ත හිඟ මුදල් 2024 වසරේ ඔක්තෝබර් මාසය අවසානය වන විට සියයට 74 කින් රු. බිලියන 20.5 ක් දක්වා සැලකිය යුතු ලෙස අඩු වී ඇත. කෙසේ වුවද, 2023 වසර අවසානය වන විට රු. බිලියන 224.7 ක් වූ බැංකු වලට ගෙවිය යුතු ණය, ව්‍යාපෘති ණය වැඩිවීම හේතුවෙන් 2024 වසරේ ඔක්තෝබර් මාසය අවසානය වන විට සියයට 13.2 කින් රු. බිලියන 254.3 ක් දක්වා වැඩි වී ඇත.

2024 වසරේ සිදුකල ගාස්තු සංශෝධනයන් දෙක හේතුවෙන් 2024 වසරේ මාර්තු මස සියයට 21.9 කින් සහ 2024 වසරේ ජූලි මස සියයට 22.5 කින් සාමාන්‍ය පිරිවැය පිළිබිඹු කරන විදුලි ගාස්තුව අඩු වී ඇත.

වගුව 4.1: විදුලි උත්පාදනය සහ ධාරිතාවයේ සංයුතිය

| | 2023 ජන.- ඔක්. විදුලි උත්පාදනය | | | 2024 ජන.-ඔක්. (තාවකාලික) විදුලි උත්පාදනය | | |
|---|---|---|---|---|---|---|
| | ස්ථාපිත ධාරිතාවය මෙ.වො. | සමස්ත උත්පාදන ප්‍රතිශතයක් ලෙස (%) | ශුද්ධ උත්පාදන ගි.වො.පැ. | ස්ථාපිත ධාරිතාව මෙ.වො. | සමස්ත උත්පාදන ප්‍රතිශතයක් ලෙස (%) | ශුද්ධ උත්පාදන ගි.වො.පැ. |
| ජල විදුලිය | 1,413 | 24 | 3,099 | 1,413 | 30 | 4,237 |
| තාප විදුලිය - ලංවිම- ඉන්ධන | 811 | 15 | 1,944 | 801 | 10 | 1,399 |
| තාප විදුලිය - ස්වාධීන තාප විදුලි උත්පාදකයන් - ඉන්ධන | 386 | 8 | 1,114 | 482 | 5 | 698 |
| සුළං - ලංවිම | 104 | 3 | 351 | 104 | 3 | 347 |
| තාප විදුලිය -ගල් අඟුරු | 900 | 33 | 4,264 | 900 | 34 | 4,795 |
| සම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය සහ සුළං | 774 | 13 | 1,733 | 784 | 13 | 1,832 |
| පියසි මත ඉදිකරන සූර්ය පැනල | 631 | 4 | 532 | 1,031 | 5 | 693 |
| **එකතුව** | **5,019** | **100** | **13,037** | **5,515** | **100** | **14,001** |

*මූලාශ්‍රය: ලංකා විදුලිබල මණ්ඩලය*

### ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

නව තරඟකරුවන් තිදෙනෙකු ඛනිජ තෙල් සිල්ලර වෙළෙඳපොළට ඇතුළු වීම හේතුවෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි 2023 වසරේ පළමු මාස දහය සඳහා ආදායම වූ රු. බිලියන 1,132.6 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ආදායම රු. බිලියන 843 ක් දක්වා සියයට 25.6 කින් අඩු වී ඇත. ආදායම අඩුවීමේ ප්‍රතිඵලයක් ලෙස, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ 2023 වසරේ පළමු මාස දහය සඳහා රු. බිලියන 146.4 ක් වූ දළ ලාභයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දළ ලාභය රු. බිලියන 65.7 ක් දක්වා සියයට 55 කින් අඩු වී ඇත.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ 2023 වසරේ පළමු මාස දහය තුළ රු. බිලියන 106.7 ක් වූ ශුද්ධ ලාභයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ශුද්ධ ලාභය රු. බිලියන 25.1 ක් දක්වා සියයට 76 කින් අඩු වී ඇත. 2024 වසරේ පළමු මාස දහය තුළ මූල්‍ය වියදම් රු. බිලියන 23.2 කින් රු. බිලියන 1.1 ක් දක්වා පහළ ගියද, විකුණුම් ආදායමේ සැලකිය යුතු පහත වැටීම ශුද්ධ ලාභයේ අඩු වීමට ප්‍රධාන වශයෙන් හේතුවී ඇත.

ජාතික ඉරාන තෙල් සමාගමට ගෙවිය යුතු මුදල 2023 වසර අවසානයේ පැවති ඇ. ඩො. මිලියන 230.9 සිට 2024 වසරේ ඔක්තෝබර් මාසය අවසන් වන විට ඇ. ඩො. මිලියන 170.9 ක් දක්වා අඩු වී ඇති අතර, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ලංකා බැංකුව වෙත ගෙවිය යුතු ආනයන බිල්පත්වල වටිනාකම 2024 වසරේ ඔක්තෝබර් මස අවසන් වන විට ඇ. ඩො. මිලියන 53 ක් විය.

2024 වසරේ පළමු මාස දහය තුළ, ඒකාබද්ධ අරමුදලට රු. බිලියන 10 ක අයබදු ගෙවීමෙන් සිය රාජ්‍ය මූල්‍ය වගකීම් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ඉටුකර ඇත.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි සමස්ත හිඟ වෙළඳ ණය ප්‍රමාණය 2023 වසර අවසන් වන විට පැවති රු. බිලියන 17.7 ට සාපේක්ෂව 2024 වසරේ ඔක්තෝබර් මාසය අවසානය වන විට රු. බිලියන 7.1 ක් දක්වා සියයට 60 කින් අඩු වී ඇත. ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ශ්‍රී ලංකා යුධ හමුදාව ඇතුළු ප්‍රධාන ගැනුම්කරුවන් විසින් ගෙවිය යුතු මුදල් පියවීම මෙම අඩු වීමට හේතු වී ඇත.

### ශ්‍රී ලංකන් ගුවන් සමාගම

ශ්‍රී ලංකන් ගුවන් සමාගම ප්‍රතිව්‍යුහගත කිරීමට සහ පෞද්ගලීකරණය කිරීම සඳහා රජය මීට පෙර උත්සාහ දරා ඇත. කෙසේ වෙතත්, නව රජය පත් වීමත් සමඟ, ජාතික ආර්ථිකයට ගුවන් සමාගම විසින් ලබා දෙන සැලකිය යුතු දායකත්වය සැලකිල්ලට ගනිමින්, පෞද්ගලීකරණයකින් තොරව ගුවන් සේවය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අවශ්‍ය හොඳම විකල්ප ක්‍රමවේදය අධ්‍යයනය කිරීම තුළින් ශ්‍රී/ස ශ්‍රීලංකන් ගුවන් සමාගමට සහාය දීමට තීරණය කරන ලදී. ඒ අනුව, ශ්‍රී/ස ශ්‍රීලංකන් ගුවන් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රතිශෝධිත ව්‍යාපාරික සැලැස්මක් අනුමත කර ඇත.

2023 වසරේ අප්‍රේල් සිට ඔක්තෝබර් දක්වා වූ මාස හතක කාලය තුළ දී ගුවන් සමාගම විසින් වාර්තා කළ රු. මිලියන 4,133 ක බදු පෙර ලාභයට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී

රු. මිලියන 1,960 ක බදු පෙර අලාභයක් වාර්තා කර ඇත. 2023 වසරේ අප්‍රේල් සිට ඔක්තෝබර් දක්වා කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ රු. මිලියන 178,818 ක් වූ ශුද්ධ ගමනාගමන ආදායම 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. මිලියන 152,322 ක් දක්වා සියයට 14.9 කින් පහත වැටීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. ජාතික ගුවන් සේවය ආරක්ෂා කර ගැනීම උදෙසා සමාගමේ වර්තමාන මූල්‍ය ප්‍රවාහ ගැටළු සඳහා සහාය වීම පිණිස 2024 වසර තුළ රජය විසින් රු. බිලියන 9.8 ක ප්‍රාග්ධන දායකත්වයක් ලබා දී ඇත. තවද, සමාගමේ ඇ.ඩො.මිලියන 175 ක ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා රජය විසින් සහය ලබා දෙන අතර, ඒ සඳහා අවශ්‍ය ක්‍රමවේද අවසන් කිරීමට නියමිතව ඇත.

## ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය

2023 වසරේ ඔක්තෝබර් මාසය අවසානය වන විට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිදු කළ නළ ජල සැපයුම හා ආරක්ෂිත පානීය ජල සැපයුම පිළිවෙලින් සියයට 61.4 සහ සියයට 97.1 ක් වූ අතර, එයට සාපේක්ෂව 2024 වසරේ ඔක්තෝබර් මාසය අවසානය වන විට නළ ජල සැපයුම හා ආරක්ෂිත පානීය ජල සැපයුම පිළිවෙළින් සියයට 62.7ක් සහ සියයට 98.4 ක් දක්වා ඉහළ නැංවීමට සමත් වී ඇත.

2024 වසරේ ඔක්තෝබර් මාසය අවසානය වන විට සමස්ත ජල සම්බන්ධතා සංඛ්‍යාව මිලියන 3.12 ක් දක්වා ඉහළ නංවමින් 2024 වසරේ පළමු මාස දහය තුළ නව ජල සම්බන්ධතා ආසන්න වශයෙන් 120,260 ක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් පද්ධතියට එකතු කරන ලදී. 2024 වසරේ අගෝස්තු මස ජලය සඳහා නව ගාස්තු සංශෝධනයක් ක්‍රියාත්මක කිරීමත් සමඟ, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය 2024 වසරේ පළමු මාස දහය තුළ රු. බිලියන 70.8 ක ආදායමක් වාර්තා කර ඇති අතර, එය 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ආදායම වූ රු. බිලියන 49 ට සාපේක්ෂව සියයට 44.6 ක වර්ධනයකි. 2024 වසරේ පළමු මාස දහය තුළ විකුණුම් පිරිවැය 2023 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව සුළු වශයෙන් වැඩිවීම හේතුවෙන්, සලකා බලන මෙම කාලපරිච්ඡේදය තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට රු. බිලියන 44.3 ක දළ ලාභයක් වාර්තා කිරීමට හැකි වී ඇති අතර, එය 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේදී සියයට 94 ක වැඩිවීමකි. එහි ප්‍රතිඵලයක් ලෙස, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය 2023 වසරේ පළමු මාස දහය තුළ වාර්තා කර ඇති රු. බිලියන 9.5 ක ශුද්ධ ලාභයට සාපේක්ෂව, 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 21.7 ක ශුද්ධ ලාභයක් වාර්තා කර ඇත.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් 2023 වසරේ පළමු මාස දහය තුළ නිෂ්පාදනය කළ ජලය ඝන මීටර් මිලියන 672 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ජලය ඝන මීටර් මිලියන 695 ක් නිෂ්පාදනය කර ඇති අතර, 2023 වසරේ පළමු මාස දහය තුළ සිදු කළ ඝන මීටර් මිලියන 503 ක ජල අලෙවියට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ ජල අලෙවිය ඝන මීටර් මිලියන 524 කි. තවද, ආදායම් නොලබන ජලය පසුගිය වසරට සාපේක්ෂව මෙම කාලසීමාව තුළ පහත වැටීමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර, එය 2023 වසරේ පළමු මාස දහය තුළ වාර්තා කළ සියයට 25.2 ට සාපේක්ෂව සමාලෝචිත කාලපරිච්ඡේදය තුළදී සියයට 24.65 ක් ලෙස වාර්තා වී ඇත. එසේම, 2024 වසර තුළ දේශීය බැංකුවල ණය ආපසු ගෙවීම සඳහා සහ දැනට ක්‍රියාත්මක ව්‍යාපෘතිවල වගකීම් පියවීමට සහාය වීම සඳහා මහා භාණ්ඩාගාරය රු. බිලියන 21.4 ක හිමිකම් ප්‍රාග්ධන දායකත්වයක් ලබා දී ඇත.

තවද, මහා භාණ්ඩාගාරය, ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර ඇති කර ගත් ත්‍රෛපාර්ශවික ගිවිසුමක් වන සාමූහික අභිප්‍රාය ප්‍රකාශයේ පළමු කාර්තුවේ ප්‍රගතිය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ඉදිරිපත් කර ඇත. ඒ අනුව, එම කාල සීමාව තුළ දක්වා ඇති ප්‍රධාන කාර්ය සාධන දර්ශක සඳහා ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සාධනීය ප්‍රගතියක් පෙන්නුම් කර ඇත.

## ශ්‍රී ලංකා වරාය අධිකාරිය

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සතු කොළඹ වරාය ජාත්‍යන්තර නාවික වෙළෙඳාමෙහි සුවිශේෂී සන්ධිස්ථානයක් ලෙස සැලකේ. ඇල්ෆා ලයිනර් ශ්‍රේණිගත කිරීම්වලට අනුව කොළඹ වරාය, ගෝලීය වශයෙන් සියලුම වරායන් අතුරින් 23 වන ස්ථානයට පත්ව ඇත. නැගෙනහිර බහාලුම් පර්යන්තය සහ කොළඹ බටහිර ජාත්‍යන්තර පර්යන්තය වැනි අභිලාෂකාමී මේ වනවිට ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන්, දැනට මිලියන 8.5 ක් වන වරායෙහි අඩි විස්සේ බහාලුම් හැසිරවීමේ ධාරිතාව මිලියන 14 ක් දක්වා ඉහළ යනු ඇත. ගෝලීය සැපයුම් දාමය තුළ වරායෙහි අඛණ්ඩ පැවැත්ම තහවුරු කිරීම සඳහා මෙම දැවැන්ත ව්‍යාපෘතීන් හේතු වනු ඇත. රතු මුහුදේ අර්බුදය සහ එහි බලපෑම ඇතුළු විවිධ සාධක හේතුවෙන් 2024 වසරේ පළමු මාස දහය තුළ වරාය අධිකාරිය විසින් බහළුගත නැව් බඩු අඩි විස්සේ බහාලුම් ඒකක මෙට්‍රික් ටොන් 1,985,870 ක් සහ සාම්ප්‍රදායික නැව් බඩු අඩි විස්සේ බහාලුම් ඒකක මෙට්‍රික් ටොන් 8,372,734 ක් හසුරුවන ලද අතර එය පිළිවෙළින් සියයට 20 ක සහ සියයට 22 ක වර්ධනයකි.

2024 වසරේ පළමු මාස දහය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් රු. බිලියන 73.5 ක ආදායමක් උපයා ඇති අතර, 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ උපයන ලද රු. බිලියන 62.7 ට සාපේක්ෂව සියයට 17 ක වර්ධනයක් පෙන්නුම් කරයි. 2023 වසරේ පළමු

මාස දහය තුළ රු. බිලියන 33.8 ක් වූ මෙහෙයුම් වියදම 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 40 ක් දක්වා සියයට 18.3 කින් ඉහළ යාම හේතුවෙන් 2023 වසරේ පළමු මාස දහය තුළ වාර්තා කළ රු. බිලියන 35.7 ක් වූ බදු පෙර ලාභය 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 34.6 ක් දක්වා සියයට 3 කින් පහත වැටී ඇත.

**ගුවන්තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම**

ගුවන්තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පෞද්ගලික) සමාගම ශ්‍රී ලංකාවේ ගුවන් සේවා යටිතල පහසුකම් ශක්තිමත් කිරීම සඳහා සංවර්ධන කාර්යයන් සහ තාක්ෂණික වර්ධනයන් ඉහළ නැංවීම වෙනුවෙන් අඛණ්ඩව කටයුතු කරනු ලබයි. බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපළෙහි දැනට පවතින ධාරිතාව වර්තමාන ඉල්ලුම සපුරාලීමට ප්‍රමාණවත් නොවන බැවින්, අර්ධ වශයෙන් නිම කර අතරමග නතර කරන ලද 2 වැනි පර්යන්ත ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් කටයුතු සමාගමෙහි අරමුදල් උපයෝගී කර ගනිමින්, මූලික ව්‍යාපෘති උපදේශකවරයාගේ අධීක්ෂණය යටතේම සිදු කිරීමට ගුවන්තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා ) (පෞද්ගලික) සමාගම විසින් කටයුතු කරමින් සිටී.

2023 වසරේ පළමු මාස දහය තුළ සමාගම විසින් උපයන ලද රු. බිලියන 31.9 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී රු. බිලියන 35.5 ක ආදායමක් ගුවන්තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා ) (පෞද්ගලික) සමාගම විසින් උපයා ගෙන ඇති අතර, ඉන් රු. බිලියන 28.9 ක් ගුවන් යානා නොවන ආදායම ද, රු. බිලියන 6.4 ක් ගුවන් යානා ආදායම ද වේ. එම කාලපරිච්ඡේදය තුළ දී දරන ලද සමස්ත මෙහෙයුම් වියදම රු. බිලියන 19.4 ක් වූ අතර, 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ දී එය රු. බිලියන 14.2 කි. ඒ අනුව, 2023 වසරේ පළමු මාස දහය තුළ දී රු. බිලියන 17.7 ක්ව පැවති සමාගමෙහි මෙහෙයුම් ලාභය 2024 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ රු. බිලියන 16.1 ක් දක්වා සියයට 9 කින් පහත වැටී ඇත.

ශුද්ධ මූල්‍ය ආදායම හා විනිමය ඉපයීම් ගැලපූ විට 2024 වසරේ පළමු මාස දහය තුළ සමාගම විසින් රු. බිලියන 24.3 ක බදු පෙර ලාභයක් උපයා ඇති අතර, 2023 වසරේ සමාන කාලපරිච්ඡේදය තුළ පැවති රු. බිලියන 33 ක බදු පෙර ලාභය සමඟ සැසඳීමේදී එය සියයට 26.4 ක අඩු වීමකි.

**වගුව 4.2: ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායයන් 52 හි බද්දට පෙර ලාභය**

*රු. මිලි.*

| | රාජ්‍ය ව්‍යවසාය | 2022 | 2023 (තාවකාලික) | 2024 ජන - ඔක් (තාවකාලික) |
|---|---|---|---|---|
| 1 | ලංකා බැංකුව | 30,977 | 40,342 | 44,350 |
| 2 | මහජන බැංකුව | 21,338 | 15,345 | 32,209 |
| 3 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 4,510 | 4,287 | 28,458 |
| 4 | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | (89) | (1,165) | 76 |
| 5 | නිවාස සංවර්ධන හා මූල්‍ය සංස්ථා බැංකුව | 303 | 2,800 | 289[අ] |
| 6 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 359 | 1,183 | 1,100 |
| 7 | සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් මණ්ඩලය | 43,428 | 64,959 | 50,497 |
| 8 | සීමා සහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 23,494 | 10,704 | 2,510 |
| 9 | ජාතික රක්ෂණ භාර අරමුදල | 8,530 | 12,547 | 14,212 |
| 10 | ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | 711 | 1,056 | 805 |
| 11 | කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය | 2,651 | (3,885) | 1,442 |
| 12 | ලංකා විදුලිබල මණ්ඩලය | (298,189) | 61,236 | 139,363 |
| 13 | ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව | (617,588) | 120,346 | 25,118 |
| 14 | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 57,027 | 40,359 | 34,582 |
| 15 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | (2,701) | 5,287 | 21,741 |
| 16 | සීමා සහිත ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රීලංකා) (පුද්ගලික) සමාගම | 6,434 | 33,639 | 24,318 |
| 17 | සීමා සහිත ශ්‍රී ලංකන් ගුවන් සමාගම | (73,264) | 1,124 | (1,960)[අ] |
| 18 | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | 1,421 | 2,189 | (1,024) |
| 19 | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව | (1,269) | (2,458) | (601) |
| 20 | ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය | 69 | 748 | 354 |
| 21 | රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව | 27 | (2,261) | (485) |
| 22 | සීමා සහිත මිල්කෝ (පුද්ගලික) සමාගම | (392) | (216) | 63 |
| 23 | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය | 133 | (122) | 440 |
| 24 | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | 19 | (93) | (67) |
| 25 | ජනතා වතු සංවර්ධන මණ්ඩලය | 20 | (156) | 6 |

රු. මිලි.

| | රාජ්‍ය ව්‍යවසාය | 2022 | 2023 (තාවකාලික) | 2024 ජන - ඔක් (තාවකාලික) |
|---|---|---|---|---|
| 26 | සීමා සහිත කුරුණෑගල වැව්ලි සමාගම | 511 | 534 | 335 |
| 27 | සීමා සහිත හලාවත වැව්ලි සමාගම | 514 | 303 | 201 |
| 28 | සීමා සහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලාව | 346 | 94 | 32 |
| 29 | ශ්‍රී ලංකා කජු සංස්ථාව | 17 | (5) | 5 |
| 30 | සීමා සහිත ලංකා ඛනිජ වැලි සමාගම | 6,160 | 4,051 | (37) |
| 31 | සීමා සහිත ලංකා පොස්පේට් සමාගම | 61 | 363 | 353 |
| 32 | සීමා සහිත කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම | 57 | 28 | 23 |
| 33 | සංවර්ධන ලොතරැයි මණ්ඩලය | 3,267 | 3,516 | 3,373 |
| 34 | ජාතික ලොතරැයි මණ්ඩලය | 1,390 | 845 | 1,241 |
| 35 | රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව | 1,586 | 2,173 | 2,568 |
| 36 | ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව | (26) | 218 | 338 |
| 37 | රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | (2,285) | 1,268 | 1,719 |
| 38 | ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල | 247 | (2,139) | 769 |
| 39 | සීමා සහිත ස්වාධීන රූපවාහිනී ජාලය | (370) | (205) | (24) |
| 40 | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | (541) | (360) | (174) |
| 41 | ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව | (235) | (532) | (81) |
| 42 | ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය | (99) | 57 | 68 |
| 43 | රාජ්‍ය දැව සංස්ථාව | 1,016 | 1,274 | 449 |
| 44 | ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව | 735 | 901 | 238 |
| 45 | සීමා සහිත ලංකා සතොස සමාගම | (687) | 115 | (311) |
| 46 | රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව | (380) | 2,794 | 437 |
| 47 | ලංකා ධීවර සංස්ථාව | (193) | 4 | (7) |
| 48 | ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව | 364 | 637 | 43 |
| 49 | සීමා සහිත ලංකා පොහොර සමාගම | 113 | 61 | (154)(ඇ) |
| 50 | සීමා සහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | 501 | 162 | (41)(ඇ) |
| 51 | සීමා සහිත හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) සමාගම | (633) | (784) | (344) |
| 52 | සීමා සහිත ලංකා සීනි සමාගම | 6,045 | 2,828 | (307) |
| **එකතුව** | | **(774,560)** | **425,996** | **428,506** |

*මූලාශ්‍ර : රාජ්‍ය ව්‍යවසායයන් සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව*
*(අ) 2024 ජන - සැප්*
*(ආ) 2024 අප්‍රේ - ඔක්*
*(ඇ) 2024 අප්‍රේ - ජූනි*

## වගුව 4.3: රාජ්‍ය ව්‍යවසායයන් වෙතින් ලද අය බදු/ලාභාංශ ආදායම

රු.මිලි.

| | 2022 | 2023 | 2024.10.31 දක්වා | 2025 | 2026 |
|---|---|---|---|---|---|
| | සත්‍ය | | | පුරෝකථන | |
| **අයබදු** | **22,004** | **60,497** | **27,645** | **49,610** | **52,091** |
| මහජන බැංකුව | 441 | – | – | - | - |
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | – | 5,000 | 10,000 | 15,000 | 15,750 |
| ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසම | 13,200 | 23,000 | 9,000 | 12,700 | 13,335 |
| රාජ්‍ය දැව සංස්ථාව | 320 | 641 | – | 100 | 105 |
| රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව | 100 | 300 | – | 300 | 315 |
| ජාතික රක්ෂණ භාර අරමුදල | 1,608 | 2,000 | 2,189 | 4,000 | 4,200 |
| භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය | 1,000 | 2,000 | 1,018 | 2,000 | 2,100 |
| ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | 35 | 390 | 25 | 50 | 53 |
| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය | 416 | 533 | 467 | 500 | 525 |
| ජාතික ලොතරැයි මණ්ඩලය | 361 | 1,000 | 1,060 | 500 | 525 |
| ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | 10 | 40 | 13 | – | – |

රු.මිලි.

| | 2022 | 2023 | 2024.10.31 දක්වා | 2025 | 2026 |
|---|---|---|---|---|---|
| | සත්‍ය | | | පුරෝකථන | |
| ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | 50 | 620 | 35 | 150 | 159 |
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | – | 500 | 500 | 600 | 630 |
| සිවිල් ගුවන් සේවා අධිකාරිය | 1,000 | 4,000 | – | 1,000 | 1,050 |
| රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව | 350 | – | 100 | 100 | 105 |
| ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය | 290 | 150 | 700 | 250 | 263 |
| ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය | 1,200 | 7,000 | – | 1,000 | 1,050 |
| ජාතික ගමනාගමන කොමිෂන් සභාව | 10 | 300 | 200 | 250 | 262 |
| ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය | – | 75 | – | – | – |
| ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීම් හා සංවර්ධන අධිකාරිය | – | 500 | – | 50 | 52 |
| ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 1,015 | 8,066 | 607 | 10,000 | 10,500 |
| ජාතික ඖෂධ නියාමන අධිකාරිය | 400 | 646 | 861 | 85 | 89 |
| මාර්ග සංවර්ධන අධිකාරිය | – | 75 | – | – | – |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම | – | 350 | 15 | 500 | 525 |
| සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය | 50 | 200 | – | 15 | 16 |
| ව්‍යාපාර කළමනාකරණ පිළිබඳ ජාතික ආයතනය | 33 | 115 | 85 | 30 | 31 |
| පශ්චාත් උපාධි අධ්‍යයන කළමනාකරණ ආයතනය | 90 | 25 | 4 | 30 | 31 |
| නාගරික සංවර්ධන අධිකාරිය | – | – | 345 | 125 | 131 |
| වෙනත් රාජ්‍ය ව්‍යවසායයන් | 25 | 2,971 | 421 | 275 | 289 |
| **ලාභාංශ** | **6,087** | **15,204** | **2,853** | **6,218** | **6,529** |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 60 | 30 | – | – | – |
| ලංකා බැංකුව | 346 | 173 | – | – | – |
| මහජන බැංකුව | 316 | 158 | – | – | – |
| ජාතික සංවර්ධන බැංකුව | 1 | – | 2 | – | – |
| සීමා සහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 1,511 | 2,272 | – | 2,000 | 2,100 |
| සීමා සහිත ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) (පුද්ගලික) සමාගම | 500 | 5,500 | – | 1,300 | 1,365 |
| සීමා සහිත ලංකා ඛනිජ වැලි සමාගම | 759 | 2,500 | – | 1,200 | 1,260 |
| සීමා සහිත ලංකා පොස්පේට් සමාගම | 20 | 220 | 75 | 100 | 105 |
| සීමා සහිත ලංකා ලේලන්ඩ් සමාගම | 13 | 6 | – | 3 | 3 |
| සීමා සහිත රක්නා ආරක්ෂක ලංකා සමාගම | – | 125 | 75 | 50 | 53 |
| සීමා සහිත මන්තායි සෝල්ට් සමාගම (සී/ස ජාතික ලුණු සමාගම) | – | 120 | – | 5 | 5 |
| සීමා සහිත ලංකා පොහොර සමාගම | 15 | 22 | – | – | – |
| සීමා සහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | 10 | 60 | – | – | – |
| සීමා සහිත පරන්තන් කෙමිකල් සමාගම | 50 | 305 | 49 | 60 | 63 |
| සීමා සහිත රජයේ වාණිජ නීතිගත සංස්ථාව | 11 | 150 | 50 | 50 | 53 |
| සීමා සහිත ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම | 1,805 | 223 | – | 200 | 210 |
| සීමා සහිත ඩී ලා රූ ලංකා පුද්ගලික සමාගම | 313 | – | 1,324 | 350 | 368 |
| සීමා සහිත ලංකා විදුලිබල සමාගම | 218 | 697 | 436 | 350 | 368 |
| සීමා සහිත ලංකා කාර්මික වතු සමාගම | – | 174 | – | 100 | 105 |
| සීමා සහිත ලංකා කෘෂි කර්මාන්ත සමාගම | 24 | 167 | 202 | – | – |
| වැවිලි සමාගම් | 95 | 554 | 540 | 295 | 309 |
| සීමා සහිත ලංකා සීනි සමාගම | – | 1,597 | – | – | – |
| ලංකා ත්‍රිපෝෂ සමාගම | 10 | 75 | 100 | 10 | 10 |
| වෙනත් රාජ්‍ය ව්‍යවසායයන් | 10 | 75 | – | 145 | 152 |
| **එකතුව** | **28,091** | **75,701** | **30,498** | **55,828** | **58,619** |

*මූලාශ්‍ර : රාජ්‍ය ව්‍යවසායයන් සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව*

# 2025 අයවැය සැකසීම සඳහා පදනම් වූ සාධක

# 05

## 5.1 සමාලෝචනය

2025 වසරේ අයවැයෙහි සාර්ව ආර්ථික සහ මූල්‍ය ඇස්තමේන්තු, මුදල් අමාත්‍යාංශය එය සකස් කිරීමේදී කරන ලද විශ්ලේෂණයන් සහ ඇගයීම්වලින් ලබාගෙන ඇති අතර, ඒවා උපකල්පන මාලාවක් මත පදනම් වේ.

මෙම කොටස මඟින් දළ දේශීය නිෂ්පාදිතය, උද්ධමනය, විදේශ අංශයේ වර්ධනයන් සහ සේවා වියුක්තිය ඇතුළු ආදායම් සහ වියදම් ඇස්තමේන්තු සකස් කිරීම සඳහා සලකා බලනු ලබන ප්‍රධාන සාර්ව ආර්ථික දර්ශක ගෙනහැර දක්වන අතර ඇස්තමේන්තුවල සංවේදීතාවයන් ඉස්මතු කරයි.

## 5.2 දළ දේශීය නිෂ්පාදිතය

වසර දෙකක ආර්ථික අර්බුදයෙන් පසු ශ්‍රී ලංකාවේ ආර්ථිකය ස්ථාවර වූ අතර කෘෂිකාර්මික, කර්මාන්ත සහ සේවා වැනි අංශයන්හි විශාල වශයෙන් ප්‍රසාරණය වීමක් පිළිබිඹු විය. 2024 වසරේ තුන්වන කාර්තුවේදී ශ්‍රී ලංකාවේ ආර්ථිකය සියයට 5.5 කින් වර්ධනය වී ඇත. 2025 වසරේ දී දළ දේශීය නිෂ්පාදිතයේ සියයට 3 - 5 ක වර්ධනයක් අපේක්ෂිත අතර, ආර්ථිකය යථා තත්ත්වයට පත්වීම සඳහා සැලකිය යුතු ප්‍රගතියක් අත්කර ගැනීමට 2025 වසරේ දී අපේක්ෂා කෙරේ. දේශීය ආර්ථික ක්‍රියාකාරකම්වල පුනර්ජීවනය, විදේශ අංශයේ වැඩිවන ඉල්ලුම, වැඩිදියුණු වූ සැපයුම් තත්ත්වයන් සහ සංචාරක අංශයේ පුනර්ජීවනය මගින් ආර්ථිකයේ සියලුම අංශයන්හි පුළුල්ව පැතිරුනු ධනාත්මක වර්ධනයක් අපේක්ෂා කෙරේ.

ආර්ථිකය තුළ කෘෂිකාර්මික අංශයේ තීරණාත්මක කාර්යභාරය රජය විසින් පිළිගෙන ඇති අතර, එම අංශයේ වර්ධනය සඳහා පර්යේෂණාගාර සහ නව බීජ ප්‍රභේදවල වැදගත්කම හඳුනාගෙන ඇත. මෙවැනි ක්‍රියාමාර්ග මගින් කෘෂිකාර්මික ඵලදායීතාවය ඉහළ නැංවීමට අපේක්ෂා කරන අතර එමඟින් දේශීය ඉල්ලුම සපුරාලීම සඳහා පමණක් නොව, නවෝත්පාදන හරහා අපනයන වෙළඳපොළට පහසුකම් සැලසීම සඳහා නිෂ්පාදනය ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ. මෙම මූලික ක්‍රියාමාර්ග මඟින් සමස්ත ආර්ථික වර්ධනයට සැලකිය යුතු දායකත්වයක් ලබා දෙමින් කෘෂිකාර්මික අංශයට නැවුම් ජවයක් ලබා දීමට අපේක්ෂා කෙරේ. 2022 වසරේ ආර්ථික හා මූල්‍ය අර්බුදයෙන් දේශීය ක්‍රියාකාරකම් යථා තත්ත්වයට පත්වීමේදී කාර්මික අංශය සැලකිය යුතු ලෙස ව්‍යාප්ත වනු ඇතැයි පුරෝකථනය කර ඇත. විදේශීය හා දේශීය වෙළෙඳාම, විදුලි සංදේශ, සංචාරක, ප්‍රවාහන, මූල්‍ය සේවා සහ දේපොළ වෙළඳාම වර්ධනය වීම හේතුවෙන් දළ දේශීය නිෂ්පාදිතයට විශාලතම දායකත්වය සපයන සේවා අංශය ස්ථාවර වර්ධනයක් පවත්වා ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. ප්‍රවාහනය, ස්වයංක්‍රීයකරණය සහ සේවා ඩිජිටල්කරණය වැනි ක්ෂේත්‍ර සඳහා රාජ්‍ය ආයෝජන වැඩි වශයෙන් ලබා දීම මඟින් ඊට දායකත්වය ලබාදෙනු ඇත. මීට අමතරව, වැඩි කාර්යක්ෂමතාවයකින්, විනිවිදභාවයකින් සහ වගවීමෙන් යුතුව සේවා සැපයීමේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම, මහජන විශ්වාසය ඉහළ නැංවීම සඳහා උපකාරී වන අතර එමඟින් සේවා අංශයේ වර්ධනය තවදුරටත් ශක්තිමත් කෙරේ.

## 5.3 පාරිභෝගික මිල ගණන්

2024 වසරේ සැප්තැම්බර් මාසයේ සිට අඛණ්ඩව මාස පහකදී ශ්‍රී ලංකාවේ අවධමනයක් වාර්තා වූ අතර, 2025 වසරේ ජනවාරි මාසයේදී එය සියයට -4.0 ක් කරා ළඟා විය. බලශක්ති මිල අඩු වීම, මූර්ත විනිමය අනුපාතය ශක්තිමත්වීම සහ වැඩිදියුණු කළ සැපයුම් තත්ත්වයන් අවධමනය සඳහා බලපා ඇත. 2025 වසරේ ජනවාරි මාසය වන විට ආහාර නොවන කාණ්ඩයේ අවධමනය සියයට 4.7 ක් වූ අතර ආහාර කාණ්ඩයේ අවධමනය සියයට 2.6 ක් විය.

යෝග්‍ය මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවල සහාය ඇතිව 2025 වසරේ මැද භාගය වන විට ඉලක්කගත උද්ධමන අනුපාතය සියයට 5 ක ස්ථාවර මට්ටමක පවත්වා ගැනීමට පෙර අවධමන ප්‍රවණතාව 2025 වසරේ මාස කිහිපයක් අඛණ්ඩව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. භූ දේශපාලනික ආතතීන් සහ ගෝලීය ප්‍රතිපත්ති වෙනස්වීම් මධ්‍යයේ ගෝලීයව ආහාර මිල ඉහළ යාම, වැටුප් වැඩිවීම්, කෘෂිකාර්මික නිෂ්පාදනයට බලපාන අයහපත් කාලගුණික තත්ත්වයන් සහ ඉහළ ගෝලීය උද්ධමනය සමඟ උද්ධමනය ද ඉහළ යනු ඇතැයි අපේක්ෂිතය.

## 5.4 සේවා නියුක්තිය හා සේවා වියුක්තිය

සේවා වියුක්ති අනුපාතය 2023 වසරේ තුන්වන කාර්තුව තුළ වාර්තා කරන ලද සියයට 4.7 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ සියයට 4.1 දක්වා අඩු වී ඇත. කෙසේ වෙතත්, ශ්‍රම බලකායේ සහභාගීත්ව අනුපාතයද 2023 වසරේ තුන්වන කාර්තුව තුළ වාර්තා කරන ලද සියයට 48.9 ට සාපේක්ෂව 2024 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ සියයට 46.6 දක්වා අඩු වී ඇත.

ආර්ථිකයේ අංශ තුනේම අපේක්ෂිත ව්‍යාප්තියත් සමඟ ආර්ථිකය ක්‍රමානුකූලව යථා තත්ත්වයට පත්වනවිට, 2025 වසරේ සේවා වියුක්ති අනුපාතය තවදුරටත් අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 5.5 විදේශ අංශය

අඛණ්ඩව දෙවන වසර සඳහා ද ජංගම ගිණුම වෙත ගලා ඒම් වේගවත්ව සිදු වීම සහ විදේශ සංචිත ශක්තිමත් වීම හේතුවෙන් ශ්‍රී ලංකාවේ විදේශ අංශය 2024 වසරේ දී සැලකිය යුතු දියුණුවක් පෙන්නුම් කරන ලදී. 2024 වසරේ දී, අපනයන ආදායමේ වර්ධනය අභිබවා ආනයන වියදම විශාල වශයෙන් ප්‍රසාරණය වීමත් සමඟ වෙළඳ හිඟය 2023 වසරේ දී ඇ.ඩො. මිලියන 4,900 සිට 2024 වසරේ දී ඇ.ඩො.

මිලියන 6,069 දක්වා පුළුල් විය. 2024 වසරේ දී සංචාරක ඉපැයීම් ඇ.ඩො. මිලියන 3,169 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය 2023 වසරේ වාර්තා කරන ලද ඇ.ඩො. මිලියන 2,068 ට සාපේක්ෂව සියයට 53.2 ක වර්ධනයකි. අනෙකුත් සේවා අංශයේ ගලා ඒම් 2023 වසරේ දී වූ ඇ.ඩො. මිලියන 3,348 ට සාපේක්ෂව ඇ.ඩො. මිලියන 3,714 ක් දක්වා වැඩි විය. මුහුදු මාර්ග ප්‍රවාහන සේවා සහ පරිගණක හා තොරතුරු තාක්‍ෂණ/ ව්‍යාපාර ක්‍රියාවලි බාහිර මූලාශ්‍ර වෙත පැවරීම ආශ්‍රිත සේවාවන් 2024 වසරේ දී ගලා ඒම් සඳහා ප්‍රධාන දායකත්වයක් ලබා දී ඇත. ශ්‍රමික ප්‍රේෂණ, 2023 වසරේ දී වාර්තා කළ ඇ.ඩො. මිලියන 5,970 ට සාපේක්‍ෂව 2024 වසරේ දී ඇ.ඩො. මිලියන 6,575 ක් දක්වා සියයට 10.1 කින් වර්ධනය විය. මහ බැංකුව විසින් විදේශ විනිමය වෙළෙඳපොළෙන් දේශීයව වාර්තාගත ඉහළම ශුද්ධ මිලදී ගැනීම් ප්‍රමාණයක් සිදු කිරීම සහ බහුපාර්ශ්වික ආයතනවලින් ගලා ඒම් හේතුවෙන් දළ නිල සංචිත ප්‍රමාණය 2023 වසර අවසානයේ වාර්තා කරන ලද ඇ.ඩො. බිලියන 4.4 සිට 2024 වසර අවසානය වන විට ඇ.ඩො. බිලියන 6.1 ක් දක්වා ළඟා විය.

වාහන ආනයනය සඳහා පනවා ඇති තාවකාලික තහනම ඉවත් කිරීමත් සමඟ 2025 වසරේ දී වෙළඳ හිඟය තවදුරටත් පුළුල් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, අපනයන ඉපැයීම්, සංචාරක ආදායම සහ ශ්‍රමික ප්‍රේෂණ තවදුරටත් ඉහළ නැංවීම තුළින් විදේශ අංශයේ කාර්යසාධනය ධනාත්මක ලෙස තිරසාර මට්ටමකට යනු ඇතැයි අපේක්ෂා කෙරේ. තවද, ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ ක්‍රියාවට නැංවීම සහ හිතකර ආර්ථික පරිසරය හේතුවෙන් ඍජු විදේශ ආයෝජන වැනි අනෙකුත් ණය නොවන ගලා ඒම් ද නැවත වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මීට අමතරව, 2025 වසරේ දී බහුපාර්ශ්වික නියෝජිතායතනවලින් ශ්‍රී ලංකාව වෙත ගලා ඒම් නොකඩවා ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ. ඒ අනුව, විනිමය අනුපාතය 2025 දී ස්ථාවර වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 5.6 මුදල් සමස්තයන්

මුදල් සැපයුම යෝග්‍ය මට්ටමක පවත්වා ගැනීමට අපේක්ෂා කෙරේ. 2025 වසරේ දී අපේක්ෂිත ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 15.0 ක් දක්වා ඉහළ නැංවීම සහ අපේක්ෂිත අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6.7 ක් දක්වා අඩු කිරීමත් සමඟ රජයේ දළ මූල්‍යන අවශ්‍යතා අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙය පෞද්ගලික අංශයේ ආයෝජන සඳහා වඩාත් හිතකර පරිසරයක් නිර්මාණය කරනු ඇත.

## 5.7 ආදායම

ආදායම් ඇස්තමේන්තු සකස් කිරීම සඳහා භාවිතා කළ උපකල්පන ඇමුණුම III හි දක්වා ඇත.

## 5.8 වියදම

වියදම් ඇස්තමේන්තු සකස් කිරීමට යොදාගත් උපකල්පන පහත සඳහන් වේ:

- **වැටුප් සහ වේතන**: ඇස්තමේන්තු පදනම් වී ඇත්තේ දළ වශයෙන් මිලියන 1.3 ක සේවක සංඛ්‍යාවක් සිටින රාජ්‍ය අංශයේ ශ්‍රම බලකාය මතය. 2025 වසරේ නව බඳවා ගැනීම් හරහා රාජ්‍ය අංශයේ සේවක සංඛ්‍යාව සැලකිය යුතු ලෙස වැඩි නොවනු ඇතැයි උපකල්පනය කෙරේ. තවද, රාජ්‍ය අංශයේ සේවකයින්ට හිමි විය හැකි වැටුප් වැඩිවීම් සමඟ වාර්ෂික වැටුප් වර්ධක ඇස්තමේන්තුවට ගණනය කර ඇත.

- **විශ්‍රාම වැටුප් ගෙවීම්** : විශ්‍රාම වැටුප් සඳහා වන වියදම් ඇස්තමේන්තු පදනම් වන්නේ ඇස්තමේන්තුගත විශ්‍රාමිකයින් සංඛ්‍යාව 723,000 ක් සහ 2025 වසරේ දී විශ්‍රාම වැටුප් වැඩි වීම මත ය.

- **පොලී ගෙවීම්** : භාණ්ඩාගාර ඇපකර ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියේ බලපෑම මත 2025 වසරේ පොලී ගෙවීම සඳහා වන වියදම වැඩි වනු ඇත.

- **භාණ්ඩ හා සේවා** : භාණ්ඩ හා සේවා සඳහා වන වියදම රු. බිලියන 416 ක් දක්වා වර්ධනය වනු ඇත.

- **කුටුම්භ සඳහා සහනාධාර** : අස්වැසුම වැඩසටහන සහ වැඩිහිටියන්, ආබාධිතයන් සහ නිදන්ගත වකුගඩු රෝගීන් වැනි අනෙකුත් කාණ්ඩ ඉලක්ක කරගත් වැඩසටහන් ද ඇතුළුව සමාජ ආරක්‍ෂණ ජාල වැඩසටහන් සඳහා ප්‍රතිපාදන වැඩි වශයෙන් වෙන් කිරීමත් සමඟ සමාජ ආරක්‍ෂණ ජාල සඳහා වන වියදම වැඩිවනු ඇත. තවද, පාසල් සිසුන් සඳහා ආධාර (නිල ඇඳුම් සහ පෙළපොත්), විශේෂ අවශ්‍යතා සහිත සෙබළුන්, ගැබිනි මවුවරුන් සඳහා පෝෂණ වැඩසටහන්, නොමිලේ ඖෂධ සහ ආහාර සුරක්‍ෂිතතාව සඳහා පොහොර සහනාධාර වැනි අනෙකුත් ප්‍රධාන සුබසාධන වැඩසටහන් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය වැඩි කරමින් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට අපේක්‍ෂා කෙරේ.

- **රාජ්‍ය ආයතන සහ සංස්ථා සඳහා වන පැවරුම්** : රජය සතු ප්‍රධාන ව්‍යවසායය ප්‍රතිව්‍යුහගත කිරීම සහ ඒවායේ මූල්‍ය තත්ත්වයන් වැඩිදියුණු කිරීම හේතුවෙන් එම වියදම්වල සුළු වැඩිවීමක් පමණක් දැකිය හැකිය.

- **රාජ්‍ය ආයෝජන** : ප්‍රමුඛතා නොවන සහ අත්‍යවශ්‍ය නොවන වියදම් අඩු කිරීම සහ ප්‍රමුඛතා අංශ වෙත ආයෝජන යොමු කිරීම හේතුවෙන් 2025 වසරේ දී රාජ්‍ය ආයෝජන දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 4.0 ක් පමණ වනු ඇත.

- **රාජ්‍ය ආයෝජනවල කාර්යක්‍ෂමතාව** : 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත මගින් රාජ්‍ය ආයෝජන කමිටුව පිහිටුවීම සහ පනතේ නිශ්චිතව දක්වා ඇති අනෙකුත් පාලන ක්‍රියාමාර්ග හරහා රාජ්‍ය ආයෝජනවල කාර්යක්‍ෂමතාවය ඉහළ නංවනු ඇත.

- **2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත** : මෙම පනත 2024 වසරේ අගෝස්තු මස 8 දින සිට බලාත්මක වූ අතර 2025 වසරේ දෙසැම්බර් මස අවසාන වන විට සම්පූර්ණයෙන්ම ක්‍රියාත්මක වනු ඇත. වියදම් කළමනාකරණයද ඇතුළුව පනත යටතේ හඳුන්වා දී ඇති ව්‍යුහාත්මක, ක්‍රියාපටිපාටි සහ ආයතනික සංශෝධනයන් අන්‍යෝන්‍ය වශයෙන්, රාජ්‍ය මූල්‍ය කළමනාකරණයේ විනිවිදභාවය, වගවීම, විනය, ඵලදායීතාවය, කාර්යක්‍ෂමතාවය සහ ආර්ථිකය ඉහළ නංවනු ඇත.

- **තොරතුරු තාක්‍ෂණ සහ ඩිජිටල් විසඳුම්** : සියලු රාජ්‍ය ගෙවීම් ඩිජිටල්කරණය කිරීම සඳහා 'GovPay' වේදිකාව හඳුන්වාදීමත් සමඟ රට ඩිජිටල් සමාජයක් බවට පරිවර්තනය කිරීමට දරන ප්‍රයත්නයන් රාජ්‍ය සේවා සැපයීම මෙන්ම මෙහෙයුම් කාර්යක්‍ෂමතාවයද ඉහළ නංවයි.

- **නියෝජිතායතන සම්බන්ධීකරණය සහ අධීක්‍ෂණය**: රාජ්‍ය ආයතන අතර සහයෝගීතාවය වැඩිදියුණු කිරීම සහ මනා සුපරීක්‍ෂණය මගින් එකම කාර්යය දෙවරයක් සිදු කිරීම වළක්වාලන අතරම අයවැය ප්‍රතිපාදනවල සඵලතාවය තහවුරු කරනු ඇත.

- **ගෙවීම් පාලන යාන්ත්‍රණය** : 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත මගින් මූල්‍ය සහ මුදල් ප්‍රවාහ කළමනාකරණය ශක්තිමත් කිරීම සඳහා ඵලදායී ගෙවීම් පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා විධිවිධාන සලසා ඇත.

## 5.9 ණය ගැනීම්

2025 වසරේ දී රජයේ දළ ණය ගැනීමේ අවශ්‍යතා පිළිබඳ ඇස්තමේන්තුව රු. බිලියන 4,000 කි. රජයේ අයවැය හිඟය, 2024 වසරේ දී තාවකාලික වශයෙන් වාර්තා වූ සියයට 6.8 ට සාපේක්ෂව 2025 වසරේ දී සියයට 6.7 ක් දක්වා අයවැය හිඟය සියයට 0.1 කින් අඩු වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

තවද, රාජ්‍ය ණය කළමනාකරණය, ණය ඇපකර නිකුත් කිරීම සහ කළමනාකරණය, ණය දීමේ මෙහෙයුම් කළමනාකරණය සහ රාජ්‍ය ණය සටහන් කර ගැනීම සහ වාර්තා කිරීම යන ප්‍රධාන වගකීම් සහිතව රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය පිහිටුවා ඇත. රාජ්‍ය ණය කළමනාකරණ කාර්යාලය විසින් කාර්යක්ෂම සහ විනිවිදභාවයෙන් යුත් ණය ගැනීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීම තහවුරු කරනු ඇත.

## 5.10 ඇස්තමේන්තුවල සංවේදීතාව

ආර්ථික පුරෝකථන සඳහා අවදානම් සහ අභියෝග කිහිපයක් බලපෑ හැකිය, එනම්:

- **බාහිරව ඇතිවන කම්පන** : භූ-දේශපාලනික ආතතීන්ගෙන් පැන නැඟිය හැකි ගෝලීය ආර්ථික කම්පනවලට ඔරොත්තු දීම අභියෝගාත්මක වනු ඇත. මෙසේ බාහිරව ඇති වන කම්පන දේශීය ජාත්‍යන්තර වෙළඳාම, උද්ධමනය සහ සමස්ත ආර්ථික වර්ධනයට බලපෑ හැකිය.

- **ස්වභාවික විපත් සහ අයහපත් කාලගුණික තත්ත්වයන්**: අයහපත් කාලගුණය කෘෂි-කර්මාන්තයට, ජලවිදුලි උත්පාදනයට සහ රාජ්‍ය මූල්‍යනයට අහිතකර ලෙස බලපෑ හැකිය.

- **පරිපාලන සහ ප්‍රසම්පාදන කටයුතු හා සම්බන්ධ ප්‍රමාදවීම්** : නිලධාරිවාදී අකාර්යක්ෂමතා සහ ප්‍රමාදයන් ආර්ථික ප්‍රගතිය සහ මූල්‍ය මෙහෙයුම් මන්දගාමී කළ හැකිය.

- **ව්‍යවස්ථාදායක කටයුතු හා සම්බන්ධ ප්‍රමාදවීම්** : පාර්ලිමේන්තුවේ මූල්‍ය සම්බන්ධ ප්‍රධාන පනත් අනුමත කිරීම ප්‍රමාද වීම රජයේ මූල්‍ය තත්ත්වයට දැඩි ලෙස බලපෑ හැකිය.

- **රජය සතු ව්‍යවසායයන්හි කාර්යසාධනය** : රජය සතු ව්‍යවසායයන්ගේ ඌන-කාර්යසාධනය සහ ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලීන්ගේ ප්‍රමාදයන් ආර්ථික කාර්යක්ෂමතාවයට සහ මූල්‍ය ඒකාග්‍රතාවයට බාධාවක් විය හැකිය.

# III කොටස

# බදු ආදායම් අහිමිවීම පිළිබඳ ප්‍රකාශය - 2023/2024

## 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 20 වැනි වගන්තිය යටතේ ගරු මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා විසින් නිකුත් කරන ලදී.

වාර්ෂික අයවැය සමග ඉදිරිපත් කළ යුතුව ඇති බදු සහන ලබාදීම හේතුවෙන් මේ දක්වා අහිමි වූ ආදායම සහ නව සහන ලබාදීම හේතුවෙන් අහිමි විය හැකි ආදායම ඇතුළුව මුළු ආදායම් අහිමිවීම පිළිබඳ ප්‍රකාශයක් මෙම වාර්තාවේ ඇතුළත් වේ.

# 2023/2024 | 06

# බදු ආදායම් අභිමිවීම පිළිබඳ ප්‍රකාශය

## 6.1 හැඳින්වීම

මෙම බදු ආදායම් අහිමි වීමේ ප්‍රකාශය මඟින් බදු සහන ලබාදීම හේතුවෙන් අහිමි වූ ආදායම් ඇස්තමේන්තු පිළිබඳව වාර්තා කරන අතර එමඟින් විනිවිදභාවයෙන් යුතු වාර්තාකරණයක් ස්ථාපිත කර පුද්ගලයන්, කුටුම්භ සහ ව්‍යාපාර ඇතුළු සමස්ත සමාජයට, රාජ්‍ය ප්‍රතිපත්තිවල බලපෑම තේරුම් ගැනීමට අවස්ථාවක් සපයනු ලබයි.

මෙම ඇස්තමේන්තුව සකස් කිරීමට භාවිත කළ ක්‍රමවේදය, බදු ආදායම අහිමිවීම පිළිබඳ රාජ්‍ය මූල්‍ය පිරිවැයට අදාළ නවතම ඇස්තමේන්තු සහ උපකල්පන මෙම වාර්තාව මඟින් ඉදිරිපත් කෙරේ. 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත යටතේ ප්‍රකාශයට පත් කරන ලද පළමු ප්‍රකාශය මෙය වන අතර අතර 2026 අයවැය සමඟ වඩාත් සවිස්තරාත්මක ආදායම් අහිමිවීමේ ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කෙරේ.

රජයේ අයවැය මූල්‍යයනය කිරීම සඳහා ප්‍රමාණවත් ආදායමක් උත්පාදනය කිරීම බදුකරණයේ මූලික අරමුණ වේ. එසේ වුවද, ඉලක්කගත බදු නිදහස් කිරීම්, අඩුකිරීම්, කල් දැමීම්, දීමනා සහ වෙනත් බදු වගකීම් සහ සහනදායි බදු අනුපාත මඟින් විවිධ සමාජ ආර්ථික අරමුණු සාක්ෂාත් කර ගැනීමට රජය අපේක්ෂා කරයි. බදු ආදායම් අහිමිවීම යනු එවැනි බදු නිදහස් කිරීම්, දීමනා, බදු බැර කිරීම් සහන අනුපාත, බදු විලම්බන වැනි බදු සම්බන්ධ ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස අහිමිවන සමස්ත ආදායමේ ඇස්තමේන්තුව වේ.

**වගුව 6.1 : බදු ආදායම් අහිමිවීම් වර්ගීකරණය**

| බදු ආදායම් අහිමිවීම් අයිතම | බදු වර්ගය අනුව බදු ආදායම් අහිමිවීම | | | |
|---|---|---|---|---|
| | පුද්ගල ආදායම් බද්ද | ආදායම් බද්ද සංස්ථාපිත | පරිභෝජන බදු (එකතු කළ අගය මත බද්ද) | රේගු බදු |
| වරණීය බදු අනුපාත | √ | √ | √ | |
| බදු විරාම | | √ | | |
| විශේෂ කළාප | | √ | √ | √ |
| ප්‍රාග්ධනය ප්‍රතිපූර්ණය කිරීමේ දීමනා | | √ | | |
| නිදහස් කිරීම් | √ | √ | | √ |
| ආයෝජන සහනාධාර | | √ | | |
| බදු අත්හිටුවීම් | | √ | √ | √ |
| නිස්සාරන කර්මාන්තය සඳහා රාජ්‍ය මූල්‍ය තන්ත්‍රය මගින් සලසන වාසි | | √ | √ | √ |

**වගුව 6.2 : බදු වර්ගය අනුව අහිමිවන බදු ආදායම**

| බදු ආදායම් අහිමිවීම් අයිතම | වාර්තා කිරීමේ කාල සීමාව | බදු අහිමිවීම (රු. මිලියන) |
|---|---|---|
| පුද්ගල ආදායම් බද්ද | 2023/24 | 12,248 |
| සංස්ථාපිත ආදායම් බද්ද | 2023/24 | 243,224 |
| එකතු කළ අගය මත බද්ද | 2024 | 333,104 |
| රේගු ආනයන බදු | 2024 | 375,116 |
| මෝටර් රථ සඳහා සුඛෝපභෝගී බද්ද | 2024 | 1,928 |

## 6.2 බදු ආදායම අහිමිවීමේ ප්‍රකාශ, සම්මතයන් සමඟ සංසන්දනය කිරීමෙන් අනතුරුව මිණුම් සලකුණු (Benchmarks) කිරීම.

බදු ආදායම් අහිමිවීම පිළිබඳ ප්‍රකාශයන්හි සම්මත සමඟ සංසන්දනය කිරීමෙන් අනතුරුව මිණුම් සළකුණු කිරීම (Benchmarking) යනු බදු ආදායම් අහිමිවීම ලෙස හඳුනාගෙන ඇති නිදහස් කිරීම්, අඩු කිරීම්, බදු බැර කිරීම්, විලම්භනය කිරීම සහ වරණීය අනුපාත වැනි අපගමනයන් නොමැති සම්මත බදු ක්‍රමයක් නිර්වචනය කිරීම වේ. ව්‍යුහාත්මක බදු ප්‍රතිපාදන සහ ප්‍රතිපත්ති පාදක සහන වෙන්කර දැක්වීමට මෙම මිණුම් සලකුණු කිරීම තුළින් කටයුතු කෙරේ.

පැහැදිලි ලෙස අර්ථ දක්වා ඇති සංසන්දනය සඳහා භාවිතා කරන මිණුම් සළකුණු කිරීමක, පහත සඳහන් දේ ඇතුලත් වේ;

1. **බදු පදනම** – සම්මත බදු මූලධර්ම වලට අනුව, සමස්ථ ආදායම, පරිභෝජනය සහ අනෙකුත් බදු පදනම්.

2. **බදු අනුපාත** – වරණීය සැලකිල්ලකින් තොරව ඒකාකාරීව අදාළ කරනු ලබන ව්‍යවස්ථාපිත අනුපාත

3. **ව්‍යුහාත්මක අංග** – අලාභ ඉදිරියට ගෙන යාමේ ප්‍රතිපාදන සහ උද්ධමන ගැලපුම් වැනි බදු පරිපාලනය සඳහා අවශ්‍ය මූලිකාංග

එබැවින්, සම්මත බදු ක්‍රමයේ සළකුණු කරන ලද මිණුම් අපගමනය කෙරෙන පහත සඳහන් ප්‍රතිපාදන, බදු ආදායම් අහිමිවීම් වලට ඇතුලත් වේ.

- නිදහස් කිරීම් (උදා. බදු නිදහස් සීමාවන් හෝ ක්ෂේත්‍ර වලට විශේෂිත වූ නිදහස් කිරීම්)
- වරණීය බදු අනුපාත (උදා. විශේෂිත කර්මාන්ත හෝ ආදායම් මූලාශ්‍ර සඳහා අඩු ආදායම් බදු අනුපාත)
- අඩු කිරීම් සහ දීමනා (උදා. ආයෝජන දීමනා, වැඩිකල ප්‍රාග්ධන දීමනා)
- බදු බැර කිරීම් (උදා. පර්යේෂණ සහ සංවර්ධන වියදම් සඳහා බදු බැර, සේවා නියුක්තිය හා සම්බන්ධ දීමනා)
- විලම්භනයන් (උදා. ප්‍රාග්ධන ලාභ මත බදු විලම්භනය)

ජාත්‍යන්තර ගිවිසුම් යටතේ වන බදු සහන - උදාහරණ ලෙස ප්‍රතිපත්තිමය තීරණ හරහා ලබා දෙන නිදහස් වෙළෙඳ ගිවිසුම් යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපාර සඳහා ලබා දෙන වරණීය බදු සහන හෝ ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම් යටතේ සිදු කරන විශේෂ සැලකීම්, සම්මත බදු ක්‍රමයේ කොටසක් ලෙස සැලකිය හැකි බැවින් බදු ආදායම් අහිමි වීම ගණනය කිරීමේදී නොසැලකේ.

එසේම, ශ්‍රී ලංකාවේ ප්‍රගතිශීලී ආදායම් බදු ක්‍රමයක් පවතින බැවින්, සමානාත්මතාවය තහවුරු කිරීම උදෙසා බදු නොගෙවන ආදායමේ කොටස එනම් බදු නිදහස් සීමාව, සම්මත සමහ සැසඳීමෙන් අනතුරුව මිණුම් සළකුණු කිරීමේ කොටසක් ලෙස සළකුණු ලබන අතර එය බදු ආදායම් අහිමිවීමක් ලෙස නොසැලකේ. තවද, බදු නිදහස් සීමාවක් පනවා ඇත්තේ අභිමතය පරිදි සැලසෙන සහනයක් ලෙස නොව, අඩු ආදායම්ලාභීන්ගේ මත පැටවෙන බදු බර අඩුකිරීම සඳහාය. ඉහත කරුණු සැලකිල්ලට ගනිමින් බදු නිදහස් සීමාව සම්මත බදු ක්‍රමයේම කොටසක් ලෙස සැලකිය හැක.

### 6.3 බදු ආදායමේ අහිමිවීම ගණනය කිරීමේ පදනම

මෙම බදු ආදායම් අහිමිවීමේ ප්‍රකාශය පහත සඳහන් පදනම් මත සකස් කර ඇත.

a) අහිමිවන බදු ආදායම තක්සේරු කිරීම සඳහා ප්‍රධාන ප්‍රවේශයන් තුනක් ඇත.

   i) බදු සහන ලබාදීමෙන් අහිමිවන බදු ආදායම

   ii) බදු සහන ලබාදීමෙන් ලැබෙන අමතර බදු ආදායම

   iii) වියදම් හා සමාන - ලබා දී ඇති බදු සහන වෙනුවට ඒ හා සමාන මූල්‍ය ප්‍රතිලාභයක් ලබා දීම සඳහා රජයට වැයවෙන සෘජු වියදම

මෙම ඇස්තමේන්තුව සඳහා "ආදායම් අහිමිවීම" ක්‍රමවේදය භාවිතා කරන අතර එය බදු සහන සැලසීමෙන් රජයට සිදුවී ඇති ආදායම් අලාභය පිළිබඳ එම අලාභයෙන් පසු ගණනය කිරීමේ ක්‍රියාවලියකි. බදු සහන ඉවත්කළ ද ඊට ප්‍රතිචාර ලෙස බදු ගෙවන්නන්ගේ හැසිරීමෙහි වෙනසක් සිදු නොවන බවට මෙහිදී උපකල්පනය කෙරේ.

b) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සිදුකළ ගණනය කිරීම් ගොනු කරන ලද බදු වාර්තා මත පදනම් වී ඇත.

c) තක්සේරු ගැටළු, කාර්ය පටිපාටිමය දෝෂ, ආයතන හරහා භාණ්ඩ හුවමාරුවේ දී සිදුවන මිලකරණ දෝෂ සහ අනනුකූලතාවයන් හේතුවෙන් සිදුවන ආදායම් පදනම ඛාදනය වීම් පිළිබඳව සලකා නොමැත.

d) රජය විසින් නොමිලේ ලබාදෙන සේවා මත බදු ආදායම් අහිමිවීම් පිළිබඳ සැලකිල්ලට ගෙන නොමැත.

e) පුද්ගල ආදායම් බද්ද සහ සංස්ථාපිත ආදායම් බද්ද සඳහා වන බදු ආදායම් අහිමිවීම ගණනය කිරීම සඳහා 2023/24 තක්සේරු වර්ෂ සඳහා වූ සත්‍ය දත්ත සහ ඇස්තමේන්තු පදනම් කරගෙන ඇත.

f) එකතු කල අගය මත බද්ද සහ ආනයන බද්ද සඳහා වන බදු ආදායම් අහිමිවීම ගණනය කිරීම 2024 වසර සඳහා වූ සත්‍ය දත්ත මත පදනම් වේ.

g) මෝටර් රථ සඳහා සුඛෝපභෝගී බද්ද සඳහා වන බදු ආදායම් අහිමිවීම ගණනය කිරීම 2024 වසර දෙසැම්බර් මස අවසානය දක්වා වූ සත්‍ය දත්ත මත පදනම් වේ.

h) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ උපලේඛනවලින් සිදුවන අපගමනයන් බදු ආදායම් අහිමිවීම් ලෙස සැලකේ;

1 වන උපලේඛනය = බදු අනුපාත

2 වන උපලේඛනය = ආයෝජන සඳහා දිරිදීමනා

3 වන උපලේඛනය = බදුකරණයෙන් නිදහස් මුදල් ප්‍රමාණ

4 වන උපලේඛනය = ප්‍රාග්ධන දීමනා, බදු සඳහා අදාළ වන මිල සහ විකුණුම් මිල තුලනය කිරීම සඳහා ලබාදෙන දීමනා සහ බදු අය කළ හැකි ආදායමට නැවත එකතු වන ගාස්තු

5 වන උපලේඛනය = සුදුසුකම් ලබන ගෙවීම් සහ සහන

6 වන උපලේඛනය = තාවකාලික බදු සහන

i) ආනයන අවස්ථාවේ දී බදු ආදායම් අහිමිවීම ගණනය කිරීමෙ දී ආයෝජන මණ්ඩල ව්‍යාපෘති සඳහා දී ඇති බදු සහන ද සලකා බලා ඇත.

j) පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීම සඳහා විදෙස්ගතව සේවය කරන ශ්‍රී ලාංකිකයන් සඳහා වාහන ආනයන බලපත්‍ර ලබා දීමේ යෝජනා ක්‍රමය යටතේ අහිමිවී ඇති මෝටර් රථ සඳහා සුඛෝපභෝගී බදු ආදායම බදු ආදායම් අහිමිවීම ගණනය කිරීමේදී සලකා බලා ඇත. (විදෙස්ගත ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ යෝජනා ක්‍රමය)

## 6.4 අහිමිවන බදු ආදායම් ඇස්තමේන්තු

### පුද්ගල ආදායම් බද්ද (PIT)

2023 වසරේ ජනවාරි මස 01 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි පුද්ගල ආදායම් බද්ද සඳහා වන බදු නිදහස් කිරීමේ සීමාව වර්ෂයකට රුපියල් මිලියන 3.0 සිට රුපියල් මිලියන 1.2 දක්වා අඩු කරන ලද අතර වර්ෂයට රුපියල් මිලියන 1.2 ක් දක්වා ලබා දී තිබූ වියදම් සහනය ද ඉවත් කරන ලදී. රුපියල් 500,000 බැගින් වූ ස්ථර 6 ක් යටතේ සියයට 6, සියයට 12, සියයට 18, සියයට 24, සියයට 30 සහ සියයට 36 යන ක්‍රමයෙන් වැඩිවෙන අනුපාතයන්ට පුද්ගල ආදායම් බද්ද පනවන ලදි.

බදු නිදහස් සීමාව අඩුකිරීම, වියදම් සහනය ඉවත් කිරීම, බදු නිදහස් කිරීම් ඉවත් කිරීම සහ බදු ස්ථර හකුලුවාලීම යනාදී බදු ප්‍රතිපත්තිමය සංශෝධන හේතුවෙන් 2023/24 තක්සේරු වර්ෂයේ සිට පුද්ගල ආදායම් බදු අහිමි වන ප්‍රමාණය සැලකිය යුතු ලෙස අඩුවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2025 වසරේ අප්‍රේල් මස 01 වන දින සිට පහත සඳහන් පුද්ගල ආදායම් බදු අනුපාත ව්‍යුහය ක්‍රියාත්මක කිරීමට යෝජනා වී ඇත.

**වගුව 6.3 : යෝජිත පුද්ගල ආදායම් බදු ව්‍යුහය**

| ආන්තික බදු අනුපාතය (%) | බදු ස්ථරය (රු.) |
|---|---|
| 0 | මිලියන 1.8 දක්වා |
| 6 | මිලියන 1.8 - 2.8 |
| 12 | - |
| 18 | මිලියන 2.8 - 3.3 |
| 24 | මිලියන 3.3 - 3.8 |
| 30 | මිලියන 3.8 - 4.3 |
| 36 | මිලියන 4.3 ඉක්මවන |

2022/23 සහ 2023/24 තක්සේරු වර්ෂ සඳහා පුද්ගල ආදායම් බදු අහිමිවන ප්‍රමාණය 6.4 වගුවේ දක්වා ඇත.

**වගුව 6.4 : අහිමිවන පුද්ගල ආදායම් බදු ප්‍රමාණය**

| වියදම් වර්ගය | බදු අහිමිවීම (රු. මිලියන) 2023/24 |
|---|---|
| සහන සහ සුදුසුකම් ලබන ගෙවීම් | 938 |
| නිදහස් කිරීම් | 11,310 |
| **එකතුව** | **12,248** |

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

### සංස්ථාපිත ආදායම් බද්ද (CIT)

2022 වසරේ ඔක්තෝබර් මස 01 වන දින සිට සංස්ථාපිත ආදායම් බදු අනුපාතය සියයට 24 සිට සියයට 30 දක්වා වැඩි කරන ලද අතර විවිධ අංශ සඳහා ලබා දී තිබූ සහනදායී බදු අනුපාත ඉවත් කරන ලදී. මෙම සංශෝධන 2022/23 තක්සේරු වර්ෂයේ කාර්තු දෙකක් තුළ දී පමණක් මුළුමනින්ම ක්‍රියාත්මක විය. එසේ වුවත්, සංස්ථාපිත ආදායම් බදු මත සිදු කරන ලද වෙනස්කම් වල පූර්ණ බලපෑම 2023/24 තක්සේරු වර්ෂයේ අහිමිවන සංස්ථාපිත බදු ආදායම තුළින් නිරූපණය වේ.

**වගුව 6.5 : 2023/24 සඳහා අහිමිවන සංස්ථාපිත බදු ආදායම**

| අංශ | | ආදායම අහිමිවන ආකාරය | අහිමිවන බදු ආදායම (රු. මිලියන) |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල සමාගම් | ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති | සහනදායී බදු අනුපාතය | - |
| | | බදු නිදහස් කිරීම | 123 |
| | ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති නොවන | සහනදායී බදු අනුපාතය<br>බදු නිදහස් කිරීම | 41,682 |
| ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල නොවන සමාගම් | | සහනදායී බදු අනුපාතය<br>බදු නිදහස් කිරීම | 201,419 |

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

### එකතු කල අගය මත බද්ද (VAT)

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ සමාගම් සමඟ සංසන්දනය කර බලන විට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ නොවන සමාගම්වලින් අහිමිවන එකතු කල අගය මත බදු ආදායම සාපේක්ෂව ඉහළ අගයක් ගනී. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල සමාගම් අතරින් නිෂ්පාදන අංශය සහ සේවා සහ උපයෝගීතා අංශය වැඩි වශයෙන් එකතු කළ අගය මත බදු සහනවල ප්‍රතිලාභ හිමිකර ගෙන ඇත. බැංකු සහ මූල්‍ය අංශය විසින් සපයනු ලබන මූල්‍යමය සේවාවන් එකතු කළ අගය මත බද්දට යටත් වන බැවින් එම බදු බැඳියාව සලකා නොමැත.

2024 වසරේ ජනවාරි මස 01 වෙනිදා සිට එකතු කළ අගය මත බදු නිදහස් කිරීම් විශාල ප්‍රමාණයක් ඉවත් කළ අතර බද්ද සඳහා ලියාපදිංචි වීමේ සීමාව වර්ෂයකට රුපියල් මිලියන 80 සිට වර්ෂයකට රුපියල් මිලියන 60 දක්වා අඩු කරන ලදී.

**වගුව 6.6 : අංශ අනුව 2023/24 සඳහා අහිමිවන එකතු කල අගය මත බදු ආදායම**

